# ග්‍රාමීය කාන්තා ව්‍යවසායකත්වය ප්‍රවර්ධනය සඳහා කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහන් හි දායකත්වය හා වැඩි දියුණු කිරීමේ අවස්ථා

**එම්.ඩී.සුසිලා ලූර්දු**

**සිංහල පර්යේෂණ වාර්තා: 63**

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය
අංක **114,** විජේරාම මාවත
කොළඹ **07.**

ප්‍රථම මුද්‍රණය : 2016

© හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

සියලුම හිමිකම් ඇවිරිණි

ISBN 978-955-612-202-2

පරිගණක පිටු සැකසුම : ඒ.පී. උදේනි කරුණාරත්න

පරිගණකගත කිරීම : කේ.එස්. නම්මුනි ආරච්චි

# පෙරවදන

**1970 දශකයේ පටන් අද දක්වා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති හා පුහුණු අංශය මඟින් කාන්තා කෘෂිකර්ම ව්‍යාප්තිය වෙනුවෙන් ක්‍රියාත්මක වන විශේෂ වැඩසටහනක් ලෙසින් "කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහන්" හඳුන්වා දිය හැකිය. ග්‍රාමීය අංශය තුළ සුලභව පවතින කාන්තා ශ්‍රමය ආර්ථිකමය වශයෙන් සක්‍රීය කිරීමේ කාර්යය සඳහා වර්තමාන රාජ්‍ය අංශය ද වැඩි නැඹුරුවක් දක්වන බැවින් කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහනෙ හි වර්තමාන ක්‍රියාකාරීත්වය ඇගයීමට ලක් කෙරී ඇති අතර එහි සාමාජික කාන්තාවන් තිරසාර ව්‍යවසායකයින් ලෙසත් සමාජීය හා ආර්ථික ලෙස බලගැන්වීම කෙසේ සිදු විය යුතු ද යන්න සඳහා තීරණ ගැනීමට අදහස් හා යෝජනා ඉදිරිපත් කිරීමත් මෙම අධ්‍යයනය තුළින් සිදු කෙරී ඇත.**

**ග්‍රාමීය අංශයේ පවතින කාන්තා හා තරුණ ශ්‍රමය හඳුනාගෙන ඔවුන් තිරසාර ආදායම් උත්පාදන කාර්යයන් හි නියුතු කර සමාජීය-ආර්ථික වශයෙන් බලගැන්වීම සඳහා ඔවුන් වෙත සමීප විය හැකි උචිත ප්‍රවේශයක් ලෙසින් මෙම කාන්තා වැඩසටහන් වැදගත් බව අධ්‍යයනය පෙන්වා දෙන අතර ග්‍රාමීය අංශයේ ප්‍රවර්ධනයට මහත් වූ සේවාවක් සිදු කිරීමට හැකි වැඩසටහනක් ලෙසින් එය ඵලදායක මට්ටමට ගෙන ඒමට ඉදිරි පියවර ගැනීම සඳහා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ අනෙකුත් අදාළ පාර්ශවයන්ට මෙම අධ්‍යයන වාර්තාවෙහි අන්තර්ගතය ප්‍රබල දායකත්වයක් සපයනු ඇතැයි අපේක්ෂා කරමි.**

**හපුතන්ත්‍රී ධර්මසේන**

**අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී**

**හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය**

# ස්තුතිය

අධ්‍යයනය සඳහා අවශ්‍ය මූල්‍යමය හා ආයතනික පහසුකම් සපයමින් අප දිරිමත් කළ හිටපු අධ්‍යක්ෂ ඊ්.එම්.අභයරත්න මහතාටත්, ප්‍රකාශනයක් ලෙසින් එළිදැක්වීමට අනුමැතිය හා සහයෝගය ලබාදුන් වත්මන් අධ්‍යක්ෂ හපුතන්ත්‍රී ධර්මසේන මහතාටත්, පර්යේෂණ කාර්යය සාර්ථක කරගැනීමට නිරතුරු අප දිරිමත් කළ අතිරේක අධ්‍යක්ෂ ජේ.කේ.එම්.ඩී.චන්ද්‍රසිරි මහතාට සහ අංශ ප්‍රධාන ආර්.එල්.එන්.ජයතිස්ස මහතාටත්, දළ වාර්තා සටහන කියවා බලා ඵලදායක අදහස් සැපයූ ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරිනී රේණුකා වීරක්කොඩි මහත්මියටත් විශේෂ ස්තුතිය පිරිනැමේ.

තිරසාර කාන්තා ව්‍යවසායකයින් බිහි කර පවුල තුළ හා සමාජය තුළ කාන්තාවන් බලගැන්වීමේ කාර්යය කෙරෙහි වර්තමාන රාජ්‍ය අංශයේ දැඩි අවධානයක් යොමු වී ඇති බැවින් එයට පිටිවහලක් සැපයීම සඳහා මෙවැනි අධ්‍යයනයක අවශ්‍යතාවය පෙන්වා දීමෙන් සහ වාර්තාවේ නිවැරදි කළ යුතු තැන් පෙන්වා දී එය සකස් කිරීමට උපදෙස් ලබාදුන් විශ්‍රාමික අතිරේක කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් ඩබ්.ජී.එම්.ජී.දයාවංශ මහතාට අපගේ හෘදයාගම ස්තුතිය පුද කෙරේ.

අධ්‍යයන වාර්තාව විමර්ශනය කරමින් පර්යේෂණ වාර්තාවක් ලෙසින් උසස් තත්ත්වයකට ගෙන ඒමට ඵලදායී අදහස් හා යෝජනා සැපයූ රුහුණු විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය මහින්ද විජේරත්න මහතා සහ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යා අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය කාලිංග ටියුඩර් සිල්වා මහතාත් ස්තුති පූර්වකව සිහිපත් කරන්නෙමි.

අධ්‍යයනය සඳහා මූලික තොරතුරු සපයා ගැනීමේ දී සහාය දැක් වූ කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති මූලස්ථානයේ නිලධාරී මහත්මීන්, විශ්‍රාමලත් රෝස් සැමුවෙල් රූපසිංහ මහත්මිය, හෙළ බොජුන්හලේ කටයුතු කරන මහත්මීන්, ක්ෂේත්‍රයේ තොරතුරු රැස් කිරීමේ දී සහය දැක් වූ කෘෂිකර්ම උපදේශක මහත්ම මහත්මීන් සහ අනෙකුත් ක්ෂේත්‍ර නිලධාරීන් මේ සඳහා දැක් වූ සහාය ස්තුති පූර්වකව අගය කරන්නෙමි.

ක්ෂේත්‍ර දත්ත රැස් කිරීමේ දී හා දත්ත විශ්ලේෂණ කටයුතු සිදු කිරීමේ දී සංඛ්‍යාන නිලධාරී කේ.පී.අයි.යූ. ප්‍රනාන්දු මහතා සහ සංඛ්‍යාන සහකාර නිලධාරිනී කේ.ඩී.අයි. සිල්වා මෙනවිය දැක් වූ විශේෂ දායකත්වය ස්තුති පූර්වකව සිහිපත් කරන අතර ක්ෂේත්‍රයේ දත්ත රැස් කළ උපාධිධාරී

අනියම් විමර්ශක විමර්ශිකාවන් වූ එම්.ඩබ්.එච්.ගයාන්, ඩබ්.එස්.එම්.පී. ප්‍රියමාලි සහ කේ.ඒ.ඩී.යූ.රංගිකා පෙරේරා යන මහත්ම මහත්මීන්ට ද මාගේ ස්තුතිය පිරිනැමීමට කැමැත්තෙමි.

වාර්තා පිටපත මැනෙවින් පරිගණක ගත කළ කේ.එස්.නම්මුනි ආරච්චි මෙනවියටත් පරිසනක පිටු සැකසුම්කරණය කළ උදේනි කරුණාරත්න මහත්මියටත් අවංක ස්තුතිය පුද කරන අතර, සෝදුපත් කියවීමෙන් සහාය වූ ප්‍රවෘත්ති හා ප්‍රකාශන ඒකකයේ වසන්ති රාජපක්ෂ මහත්මියටත්, මුද්‍රණ අංශයේ ඩී.ජී.ධර්මපාල මහතා ඇතුළු කාර්ය මණ්ඩලයටත්, ප්‍රවාහන අංශයේ සියලු කාර්ය මණ්ඩලයටත් මාගේ කෘතඥතාවය පිරිනමන්නෙමි.

එම්.ඩී.සුසිලා ලූර්දු
ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී
අධ්‍යයනයේ සම්බන්ධීකාරක

## සංක්ෂිප්තය

සමාජයේ කුඩාම ඒකකය වන පවුල ආර්ථික හා සමාජීය වශයෙන් සවිබල ගැන්වීම හරහා රටේ සමස්ත සමාජ- ආර්ථික හා මානව සංවර්ධනය ඉහළ නැංවීමත්, ග්‍රාමීය අංශය තුළ සුලභව පවතින කාන්තා ශ්‍රමය ආර්ථිකමය වශයෙන් සක්‍රීය කිරීමේ කාර්යය සඳහාත් වර්තමාන රාජ්‍ය අංශයේ වැඩි නැඹුරුවක් පවතී. අතීතයේ පටන්ම ශ්‍රී ලාංකීය කාන්තාව ගෘහස්ථ පරිපාලනය හා ආදායම් ඉපැයීමේ කාර්යය සමබරව පවත්වා ගනිමින් පවුල තුළ ආර්ථික හා සමාජීය සහජීවනය පවත්වා ගැනීමට ප්‍රබල දායකත්වයක් සපයන අතර කෘෂිකාර්මික කාර්යයන්හි දී ද ඉදිරියෙන් සිටී.

කාන්තා කෘෂිකර්ම ව්‍යාප්තිය සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති හා පුහුණු අංශය මගින් 1970 දශකයේ පටන් වර්තමානය දක්වා ක්‍රියාත්මක කෙරෙන විශේෂ වැඩසටහනක් වන කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහනෙහි වර්තමාන ක්‍රියාකාරීත්වය සහ එහි සාමාජික කාන්තාවන් තිරසාර ව්‍යවසායකයින් ලෙසත් සමාජීය වශයෙනුත් බලගැන්වීමට දක්වන දායකත්වය පිළිබඳවත් එම වැඩසටහන තවදුරටත් දියුණු කිරීම කෙසේ සිදු විය යුතු ද යන්න පිළිබඳව සොයා බැලීමේ පුළුල් අරමුණින් 2014 වර්ෂයේ දී මෙම කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහන විධිමත් ඇගයීමකට ලක් කරන ලදී.

අධ්‍යයනය සඳහා තොරතුරු සපයා ගැනීමට කුරුණෑගල, මොණරාගල, අනුරාධපුරය සහ මහනුවර යන දිස්ත්‍රික්කයන්ට අයත් තෝරාගත් ගොවි කාන්තා සමිති 50න් අහඹු ලෙස තෝරා ගනු ලැබූ ගොවි කාන්තාවන් 325 දෙනෙකු සමීක්ෂණයට ලක් කළ අතර මෙයට අදාළ නිලධාරීන් හා කෙරුණු සාකච්ඡා මගින් ද දත්ත හා තොරතුරු සපයා ගන්නා ලදී.

අධ්‍යයනයේ ප්‍රධාන සොයා ගැනීම් අනුව, ගොවි කාන්තා සමිතිවල වැඩි සාමාජික සංඛ්‍යාවක් (54%) වයස අවුරුදු 30-50 අතර වයස් කාණ්ඩයටත් 7%ක් අවුරුදු 30 ට අඩු තරුණ කණ්ඩායමටත් අයත් වූ 45%ක් සාමාන්‍ය පෙළ සමතුන් වූ හා 28%ක් උසස් පෙළ සමත් වූවෝ වෙති. සමිති හරහා විවිධ විෂයයන් යටතේ කාන්තාවන්ට පුහුණු වීම් ලබා දී ඇති අතර ඔවුන් අතරින් 72% ගේම ජනප්‍රිය පුහුණු ක්ෂේත්‍රය, ආහාර නිෂ්පාදනය පිළිබඳ වූ පුහුණුවයි. නවීන ව්‍යවසායකත්ව ක්‍රියාවන් පිළිබඳව පුහුණුව ලැබීමේ අවශ්‍යතාව 95%කට පැවතිණි. අධ්‍යයනයට සහභාගී වූ සමස්ත කාන්තාවන්ගෙන් සමිතිය හරහා 44%ක් ස්වයං රැකියාවන් හි නියුක්ත වෙති. එයින් 27%ක් ආහාර සකස් කර අලෙවි කිරීමේ කර්මාන්තයේ ද 17%ක් මල් හා විසිතුරු පත්‍ර වගාව හා අලෙවියේ ද නියැළෙති. ආහාර සකස් කර අලෙවි කිරීම ඒ සඳහා වැඩි නැඹුරුවක්

දැක්වීමට හේතු වී ඇත්තේ, පවුල හා සමාජය තුළ කාන්තාවන්ගේ තෙවැදෑරුම් කාර්යභාරයට හානි නොවන පරිදි අලෙවි ගැටලුවලින් තොරව, අමුද්‍රව්‍ය සපයාගැනීමේ දුෂ්කරතාවන්ගෙන් තොරව හා පවුලේ ශ්‍රමය භාවිතයෙන් කළ හැකි උචිතම ස්වයං රැකියාවන් ලෙස එය හඳුනාගෙන තිබීමත් කාන්තාවන්ගේ සාමාන්‍ය ජීවන රටාවට එම කාර්යය වඩාත් හුරුපුරුදු භාවයෙන් යුක්තවීම නිසාත් ය. ඔවුන්ගෙන් 70%කගේ ම මුළු මාසික ආදායම රු.10,000 හෝ ඊට අඩු වන නමුත් එය පවුලේ ප්‍රධාන ආදායමට ඉහළ දායකත්වයක් සපයන බවත් පවුලේ ප්‍රවර්ධනය හා සහජීවනය ඒ හරහා තීව්‍ර වන බවත් හෙළි විය.

අනාවරණිත කරුණු අනුව පෙනීයන්නේ, ග්‍රාමීය ප්‍රදේශයන්හි කාන්තාවන්ට ආදායම් උත්පාදන කාර්යයන්හි වඩාත් සාර්ථකව නියැළීමට මෙන් ම සමාජීය වශයෙන් බලගැන්වීමට ඉහළ පිටිවහලක් සැපයීමට ඔවුන් වෙත සමීප විය හැකි උචිත ප්‍රවේශයක් ලෙසින් එම වැඩසටහන් වැදගත් වන අතර ග්‍රාමීය අංශය තුළ සුලභව පවතින කාන්තා හා තරුණ ශ්‍රමය හඳුනාගැනීමටත් ප්‍රදේශයට සුදුසු ස්වයං රැකියා නිර්ණය කිරීමටත් ඒ සඳහා අවශ්‍ය නව පුහුණු වැඩසටහන් හා ණය වැඩසටහන් සැලසුම් කිරීමටත් මෙම වැඩසටහන් උපයෝගී කරගත හැකි බවය.

ඒ අනුව අධ්‍යයනය නිර්දේශ කරනු ලබන්නේ, ග්‍රාමීය මට්ටමේ දී දියත් කෙරෙන සංවර්ධන ව්‍යාපෘති හා වැඩසටහන් සඳහා හැකි සෑම අවස්ථාවකදී ම ගොවි කාන්තා සමිති සහභාගීත්වය ලබාගැනීමට කටයුතු කිරීමත් එම සංවර්ධන ව්‍යාපෘති සහ වැඩසටහන් හරහා රජය විසින් ලබා දෙන ප්‍රතිපාදන (පුහුණුව, ණය ආධාර, ද්‍රව්‍යාධාර) වලින් යම් ප්‍රතිශතයක් (අවම ලෙස 5%ක් වත්) කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහනට අයත් ගොවි කාන්තා සමිති සාමාජිකාවන්ට ලබා දීමට කටයුතු කිරීමත්, කාන්තාවන්ට සුදුසු හා උචිත ස්වයං රැකියා ප්‍රවර්ධනයට මෙන් ම තරුණ දායකත්වය ඉහළ නැංවීමට (මල් හා විසිතුරු පත්‍ර වගාව, කොම්පෝස්ට් නිෂ්පාදනය හා අලෙවිය, ගෙවතු වගාව) පුහුණුවීම (දැනුම් පමණක් පදනම් කර නොගත් හා ප්‍රායෝගිකව යොදාගත හැකි) හා අඩු පොළී ණය ආධාර ලබා දීම සමිති හරහා විධිමත් ක්‍රමවේදයකට ක්‍රියාත්මක කිරීමත් මේ සඳහා වර්තමානයේ ක්‍රියාත්මක වන කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ පවතින ගොවි භාරකාර අරමුදලේ ඇති මුදල් 2%ක් වැනි අඩු පොළියට ගොවීන්ට ණය සැපයීම සඳහා ගොවි බැංකු වෙත ලබා දීමේ ක්‍රමවේදය වැනි ක්‍රමවේදයක් කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති සංවිධාන සඳහා ද ක්‍රියාත්මක කිරීමේ හැකියාව සොයා බැලීමත් ය. එසේම කාන්තාව ව්‍යවසායිකාවක් කළ හැකි මට්ටමේ පුහුණුවීම් සකස් කිරීමටත්, ව්‍යවසායිකාවන් පිළිබඳ පසු විමර්ශනය, දිරිගැන්වීම හා ඔවුන් රැකබලා ගැනීමටත් ඒ සඳහාම වෙන් වූ පර්යේෂණ හා සංවර්ධන ඒකයක් ස්ථාපිත කිරීමත් කළ යුතු බවයි.

# පටුන

| | | |
|---|---|---|
| | | පිටු අංකය |
| පෙරවදන | | i |
| ස්තුතිය | | ii |
| සංක්ෂිප්තය | | iv |
| පටුන | | vi |
| වගු සටහන් ලැයිස්තුව | | x |
| ප්‍රස්තාර සටහන් ලැයිස්තුව | | xi |
| පළමු පරිච්ඡේදය | | 01 |
| හැඳින්වීම | | 01 |
| 1.1 | අධ්‍යයනයේ පසුබිම | 01 |
| 1.2 | අධ්‍යයන ගැටලුව හා එහි වැදගත්කම | 03 |
| 1.3 | අධ්‍යයනයේ අරමුණ | 04 |
| 1.4 | පර්යේෂණ ක්‍රමවේදය | 04 |
| 1.5 | දත්ත විශ්ලේෂණය | 07 |
| 1.6 | පර්යේෂණ වාර්තාවේ සැකැස්ම | 07 |
| දෙවන පරිච්ඡේදය | | 09 |
| කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහන | | 09 |
| 2.1 | හැඳින්වීම | 09 |
| 2.2 | කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහන | 09 |
| 2.2.1 | ආරම්භය හා විකාසනය | 09 |
| 2.2.2 | ගොවි කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහන් ඇගයීමේ ක්‍රියාවලිය | 10 |
| 2.3 | ගොවි කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහනෙ හි අරමුණු සහ කාර්යයන් | 12 |
| 2.3.1 | ආරම්භක අවධියේ අරමුණු සහ කාර්යයන් | 13 |
| 2.3.2 | උපාය මාර්ගික සැලැස්ම 2005 -2009 | 15 |
| 2.3.3 | වර්තමාන අවධිය 2010-2015 ප්‍රධාන අරමුණු, අපේක්ෂිත ප්‍රතිඵල, ප්‍රධාන කාර්යයන් සහ උප කාර්යයන් | 17 |

2.3.3.1 කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහනෙ හි ප්‍රධාන අරමුණ 17
2.3.3.2 අපේක්ෂිත ප්‍රතිඵල 17
2.3.3.3 ප්‍රධාන කාර්යයන් සහ උප කාර්යයන් 18
2.4 ගොවි කාන්තා සංවිධාන (සමිති) ස්ථාපිත කිරීම 20
2.4.1 ගොවි කාන්තා සමිති සාමාජිකත්වය හා බල ප්‍රදේශය 21
2.4.2 නිලධාරී මණ්ඩලය හා කාරක සභාව 21
2.4.3 සමිතියේ අරමුදල් 21
2.4.4 සමිතිය ලියාපදිංචි කිරීම 22
2.4.5 ක්‍රියාත්මක වැඩසටහන් 23
2.4.6 කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහන/ගොවිකාන්තා සමිති ස්ථාපිත කර ඇති ආකාරය 23

තෙ වැනි පරිච්ඡේදය 25
ප්‍රතිඵල හා සාකච්ඡා 25
අධ්‍යයන නියැදියේ සමාජ-ආර්ථික ලක්ෂණ
3.1 හැඳින්වීම 25
3.2 ගොවි කාන්තාවන්ගේ සමාජ-ආර්ථික තොරතුරු 25
3.2.1 ඉඩම් භුක්තිය හා නිවාසයන් හි තත්ත්වය 27

සිව්වැනි පරිච්ඡේදය 29
ගොවි කාන්තා සමිතිවල ක්‍රියාකාරීත්වය සහ එහි වර්තමාන තත්ත්වය 29

4.1 හැඳින්වීම 29
4.2 ගොවි කාන්තා සමිති ස්ථාපිත කිරීම
4.2.1 සාමාජිකාවන් තෝරා ගැනීමේ දී බලපාන නිර්ණායක 31
4.2.2 ගොවි කාන්තා සමිතිය පිහිටුවීමේ අරමුණු 33
4.2.3 වර්තමානයේ ගොවි කාන්තා සමිතිවල සිටින සාමාජික සංඛ්‍යාව 37
4.2.4 සමිතිය තුළ සාමාජිකාවන්ගේ රැඳී සිටීම 38
4.2.5 සමිතියේ ක්‍රියාකාරීත්වය 41

පස්වන පරිච්ඡේදය 43

ගොවි කාන්තා සමිති හරහා සාමාජිකාවන්ට ලැබෙන ප්‍රතිලාභ 43

**5.1** හැඳින්වීම **43**

**5.2** සමිති හරහා සාමාජිකාවන්ට ලැබෙන ප්‍රතිලාභ **43**

**5.3** සමිතිය හරහා කාන්තාවන් ලබා ඇති පුහුණුවීම් **45**

**5.4** පුහුණුවීම් පිළිබඳ ගොවි කාන්තාවන්ගේ අදහස **53**

**5.4.1** පුහුණුවීම් කාලීනව වෙනස් විය යුතු ආකාරය **54**

**5.5** පුහුණුවීම්වලට අමතරව ලැබෙන ප්‍රතිලාභ **56**

හයවැනි පරිච්ඡේදය **59**

ආදායම් උත්පාදන ක්‍රියාවන් සඳහා කාන්තාවන්ගේ සහභාගීත්වය සහ ගෘහස්ථ ජීවිතයට ඇති බලපෑම **59**

**6.1** හැඳින්වීම **59**

**6.2** ආදායම් උත්පාදන ක්‍රියාවන් හි කාන්තාවන්ගේ සහභාගීත්වය **59**

**6.3** ගොවි කාන්තාවන් නියැළී ඇති ආදායම් උත්පාදන කාර්යයන් හි ස්වභාවය **61**

**6.4** ආහාර නිෂ්පාදන කර්මාන්තයට කාන්තාවන් වැඩි නැඹුරුවක් දැක්වීමට හේතු **67**

**6.5** ආදායම් උත්පාදන මාර්ගයන් පවුලේ ප්‍රධාන ආදායමට දක්වා ඇති දායකත්වය සහ ගෘහ ජීවිතයට කර ඇති බලපෑම **68**

**6.5.1** ගෘහ ජීවිතයට ඇති බලපෑම (දියුණුව/පිරිහීම) **70**

**6.6** චක්‍රීය ණය අරමුදල් සහ ඉතිරි කිරීම් **72**

**6.7** සමාජීය බලගැන්වීම (සමාජ විද්‍යාත්මක දෘෂ්ටි කෝණයෙන්) **75**

හත්වන පරිච්ඡේදය **79**

කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී ගොවි කාන්තාවන් සහ නිලධාරීන් විසින් මුහුණ දෙන ගැටලු **79**

**7.1** හැඳින්වීම **79**

**7.2** ගොවි කාන්තා සමිති තුළ කාන්තාවන් මුහුණ දෙන ගැටලු **79**

**7.2.1** පෞද්ගලික ගැටලු **79**

**7.2.2** පොදු සමාජීය ගැටලු **80**

**7.2.3** ආර්ථිකමය ගැටලු **81**

**7.3** ගොවි කාන්තා සමිති ක්‍රියාත්මක කිරීමේ දී නිලධාරීන්ගේ කාර්යභාරය හා ඔවුන් මුහුණ දෙන ගැටලු **83**

**7.3.1** ප්‍රතිපාදන ලැබීම් සහ ඒ ආශ්‍රිත ගැටලු **84**

**7.3.2** පුහුණුවීම් ලබාදීම හා ඒ ආශ්‍රිත ගැටලු **86**

අටවැනි පරිච්ඡේදය **87**

සොයාගැනීම්, නිගමන හා නිර්දේශ **87**

**8.1** අධ්‍යයනයේ සොයාගැනීම් **87**

**8.2** නිගමන හා නිර්දේශ **92**

ආශ්‍රිත ග්‍රන්ථ **97**

ඇමුණුම් අංක **01** : පුහුණුවීම්වලට අමතරව ලැබූ ප්‍රතිලාභ **98**

ඇමුණුම් අංක **02** : "හෙළ බොජුන්හල්" සංකල්පය **99**

ඇමුණුම් අංක **03** : "හෙළ බොජුන්හල්" සංකල්පය -සිද්ධි අධ්‍යයනය අංක **01** **103**

ඇමුණුම් අංක **04** : "හෙළ බොජුන්හල්" සංකල්පය -සිද්ධි අධ්‍යයනය අංක **02** **106**

# වගු සටහන් ලැයිස්තුව

පිටු අංකය


| | | |
|---|---|---|
| වගු සටහන් අංක 1.1 | : දිස්ත්‍රික් මට්ටමින් නියැදියේ ව්‍යාප්තිය | 07 |
| වගු සටහන් අංක 2.1 | : දිස්ත්‍රික් මට්ටමින් ස්ථාපිත ගොවි කාන්තා සමිති | 24 |
| වගු සටහන් අංක 3.1 | : ගොවි කාන්තා සාමාජිකාවන්ගේ සමාජ-ආර්ථික ලක්ෂණ | 26 |
| වගු සටහන් අංක 4.1 | : ගොවි කාන්තා සමිති ආරම්භ කළ වර්ෂයන් හි ව්‍යාප්තිය | 30 |
| වගු සටහන් අංක 4.2 | : සමිති සඳහා තෝරාගැනීමට හේතු වූ නිර්ණායක | 32 |
| වගු සටහන් අංක 4.3 | : තමන් අයත් සමිතිය ආරම්භ කිරීමට හේතු වූ අරමුණු | 34 |
| වගු සටහන් අංක 4.4 | : සමිතිය ස්ථාපිත කළ අවස්ථාවේ සහ වර්තමානයේ සිටින සාමාජික සංඛ්‍යාවේ සාමාන්‍ය අගය | 37 |
| වගු සටහන් අංක 4.5 | : සමිතිවල අඛණ්ඩ සහභාගිත්වය වෙනස් වීමට බලපාන ලද හේතු | 39 |
| වගු සටහන් අංක 5.1 | : සහභාගී වී ඇති පුහුණු ක්ෂේත්‍රයන් | 46 |
| වගු සටහන් අංක 5.2 | : ලැබූ පුහුණුව සහ එහි ප්‍රයෝජනවත් භාවය | 50 |
| වගු සටහන් අංක 5.3 | : ගොවි කාන්තාවන් අපේක්ෂා කරන නව පුහුණු ක්ෂේත්‍රයන් | 54 |
| වගු සටහන් අංක 5.4 | : පුහුණුවීම්වලට අමතරව ලැබූ ප්‍රතිලාභ අනුව ගොවි කාන්තාවන්ගේ විසිරීම | 57 |
| වගු සටහන් අංක 6.1 | : ආදායම් උත්පාදන ක්‍රියාවන් හි නියුතු කාන්තාවන් පළාත් හා අන්තර් පළාත් අනුව විසිරීම | 59 |
| වගු සටහන් අංක 6.2 | : දිස්ත්‍රික් මට්ටමින් ආදායම් උත්පාදන ක්‍රියාවන් හි නියුක්ත වීම | 60 |
| වගු සටහන් අංක 6.3 | : ගොවි කාන්තාවන නියැලෙන ආදායම් උත්පාදන ක්‍රියාවන් (ස්වයං රැකියා) | 61 |
| වගු සටහන් අංක 6.4 | : ස්වයං රැකියාවන්ගෙන් ලබන මුළු මාසික ආදායම් සහ මුළු මාසික ආදායම්වල සාමාන්‍ය | 69 |
| වගු සටහන් අංක 6.5 | : ස්වයං රැකියාවෙන් ලබාගන්නා මුළු මාසික ආදායමෙ සාමාන්‍ය, පවුලේ මුළු ආදායමෙ ප්‍රතිශතයක් ලෙස | 70 |
| වගු සටහන් අංක 6.6 | : ජීවන තත්ත්වයේ පිරිහීම/දියුණුව පිළිබඳ අදහස් | 71 |
| වගු සටහන් අංක 7.1 | : නිලධාරීන් මුහුණ දෙන ගැටලු | 84 |

## ප්‍රස්තාර සටහන් ලැයිස්තුව


| | පිටු අංකය |
|---|---|
| ප්‍රස්තාර අංක **4.1 :** ගොවි කාන්තා සමිති ආරම්භ කළ වර්ෂයන් හි ව්‍යාප්තිය | **31** |
| ප්‍රස්තාර අංක **4.2 :** පළාත් සහ අන්තර් පළාත් මට්ටමේ දී ගොවි කාන්තා සමිති ස්ථාපිත කිරීමේ අරමුණු | **35** |
| ප්‍රස්තාර අංක **5.1 :** පුහුණුවීම් සහ වෙනත් ප්‍රතිලාභ ලැබූ කාන්තාවන් | **44** |

# සිද්ධි අධ්‍යයනය

**පිටු අංකය**


**සිද්ධි අධ්‍යයනය 01 : පැළ තවාන් පවත්වාගෙන යාම** **63**

**සිද්ධි අධ්‍යයනය 02 : ධාන්‍ය, කුළු බඩු හා බයිට් වර්ග නිෂ්පාදනය** **66**

පළමු පරිච්ඡේදය

# හැඳින්වීම

## 1.7 අධ්‍යයනයේ පසුබිම

සමාජයේ කුඩා ම ඒකකය වන පවුල සවිබල ගැන්වීම හරහා රටේ සමස්ත සමාජ-ආර්ථික හා මානව සංවර්ධනය අපේක්ෂා කිරීම වත්මන් ප්‍රතිපත්ති සැලසුම් කරන්නන් හා ක්‍රියාත්මක කරන්නන්ගේ මූලික අභිප්‍රායක් වී ඇත. විශේෂයෙන් සංවර්ධනය වෙමින් පවතින රටවල පවුල තුළ කැපී පෙනෙන ස්ථානයක් උසුලන, එසේ ම පවුල විනයගරුක හා නිරෝගීමත් සමාජයක් වෙත ගෙන යන කාන්තාව සංවර්ධනය කිරීම පිළිබඳ ගෙවී ගිය දශක කිහිපයක් මුළුල්ලේ ම සාකච්ඡාවට බඳුන් වී තිබේ. ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ද මෙම තත්ත්වයෙහි ලා වෙනසක් නොවේ.

අතීතයේ පටන් ම ශ්‍රී ලංකාවේ ගෘහස්ථ පරිපාලනය හා ආදායම් ඉපැයීමේ ආර්ථික කටයුතු සමබරව පවත්වාගැනීමේ දී ග්‍රාමීය කෘෂිකාර්මික කාන්තාව ප්‍රබල භූමිකාවක් රඟ දක්වයි. ආදායම් ඉපැයීමේ ආර්ථික කටයුතු සහ ගෘහස්ථ පරිපාලනය මිශ්‍රව ඉටුකිරීම හේතුවෙන් කාන්තාවන්ගේ ආර්ථික කටයුතු පිළිබඳ දේශීය ආර්ථිකය තුළ සංඛ්‍යාත්මකව හඳුනාගැනීමක් සිදු නොවුව ද පවුල තුළ මෙන්ම කෘෂි ආර්ථික අංශය තුළ ද කාන්තාවගේ දායකත්වය සුළුපටු නොවන බව බොහෝ අධ්‍යයන සාක්ෂ්‍ය දරයි.

සිංහල සමාජය තුළ ආර්ථික කටයුතුවල දී පුරුෂ පාර්ශවය හා සමානවම කාන්තා පාර්ශවය ද ක්‍රියාකාරී වන බව, වනසුන්දර, 2006 විසින් ගැටුම්කාරී වාතාවරණයක් පැවති ග්‍රාමීය ආර්ථිකය තුළ කාන්තාව සම්බන්ධයෙන් සිදු කළ අධ්‍යයනයක් මඟින් පෙන්වා දී ඇත. කාන්තාවන් විසින් තම ගොවිපළ තුළ මෙන්ම කෘෂිකාර්මික ශ්‍රමිකයින් ලෙස ද වගා කටයුතුවල නියුක්ත වන බවත්, ගෘහස්ථ කාර්යභාරයන්ට අමතරව, සත්ත්ව පාලනයේත් වෙරළබඩ තීරයන් හි ධීවර කර්මාන්තයේත් යෙදෙමින් කාන්තාවන් විසින් ආදායම් ඉපැයීම සිදු කරන බව එම අධ්‍යයනයෙන් පැහැදිලි කරයි.

එසේ ම සංවර්ධනය වෙමින් පවතින රටවල කාන්තාව, පුරුෂයින්ට වඩා වැඩ කිරීමේ කාලය 13%කට වඩා වැඩි බවත් සංවර්ධිත රටවල එය 6%ට වඩා වැඩි බවත් පෙන්වා දී ඇත. වැඩවල වගකීම දැරීමේ කාර්යයේදී ද සංවර්ධනය වෙමින් පවතින රටවල කාන්තාවන් පුරුෂයින්ටවඩා

ඉදිරියෙන් සිටින බවත් එය කාන්තාවන් සම්බන්ධයෙන් 53%ක් ද පුරුෂයින්ගේ 47%ක් ද වේ (ශ්‍රී කුමාර්, 2001).

ඒ අනුව කාන්තාව සමාජය තුළ තෙවැදෑරුම් කාර්යයභාරයක්[1] ඉටු කරන අතර, වර්තමානය වන විට නාගරික මෙන්ම ග්‍රාමීය කාන්තාවන්ගේ ද මෙම තෙවදෑරුම් කාර්යභාරය පුළුල් වෙනසකට ලක්ව ඇති අතර යටිතල පහසුකම් හා යාන්ත්‍රීකරණයේ වර්ධනය ඊට බලපා ඇත. 1950-70 දශකයන්ට සාපේක්ෂව වර්තමාන කාන්තාවන්ට තම කාර්යභාරයන් ඉටුකිරීමේ දී අවදානම් දැරීම, ගැටලු, දුෂ්කරතාවයන්ට මුහුණදීම වඩාත් අවම වී ඇත. (කුසුම්කුමාර හා වෙනත්, 2011).

ඒ අනුව වර්තමානයේ නාගරික මෙන් ම ග්‍රාමීය කෘෂිකාර්මික පවුල්වල කාන්තාවන්ට තම කාර්යභාරයන් ඉටු කිරීමේ දී විකල්ප අවස්ථාවන් රාශියක් පවතින අතර ඒවා බහුතරය නව තාක්ෂණය හා බැඳුණු අවස්ථාවන් වන බැවින් එම අවස්ථාවන්ගෙන් වඩාත් ගැළපෙන විකල්පය කරා යෑමේ වගකීම ද ඔවුන් සතුවේ. එබැවින් කාන්තාවන් වෙනුවෙන් දියත් කෙරෙන සංවර්ධන ව්‍යාපෘතීන් වඩාත් පුළුල් වූත් සැලසුම් සහගත වූත් මට්ටමකින් සකස් විය යුතු බවත් ක්‍රියාත්මක විය යුතු බවත් හඳුනාගත හැකිය.

ගොවි කාන්තා කෘෂිකර්ම ව්‍යාප්තිය

වර්ෂ 1948 දී යටත් විජිත රාජ්‍යයන්ගෙන් මිදී ගොඩනැඟුණු ශ්‍රී ලංකා පසුබිම තුළ සුලභව පවතින ග්‍රාමීය කාන්තා ශ්‍රමය ආර්ථික හා සමාජීය වශයෙන් බලගැන්වීමත් ඒ හරහා පවුල සංවර්ධනය කිරීමත් සඳහා විවිධ ව්‍යාපෘති හා වැඩසටහන් රාශියක් දියත් කෙරිණි.

විශේෂයෙන් 1970 දශකයේ දී කෘෂිකාර්මික අංශයේ ගොවි කාන්තාව සංවර්ධනය කිරීම සඳහා "ගොවි කාන්තා කෘෂිකර්ම ව්‍යාප්තිය" (Women'sAgricultural Extension- FWAE) නමින් විශේෂ වැඩසටහනක් කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ, ආහාර හා කෘෂිකර්ම සංවිධානය (FAO) මඟින් ආරම්භ කෙරිණි (රූපසිංහ,1996).

මෙම වැඩසටහනෙහි ප්‍රධාන ඉලක්කය වූයේ, ගොවි කාන්තාවන් දැනුමින් පෝෂණය කිරීමයි. වැඩසටහනෙහි මුල් ආරම්භයේදී ම ලැබුණු ප්‍රතිඵල අනුව රජය විසින් අවබෝධ කරගත් කරුණු වූයේ, ගොවි කාන්තාව පමණක් හුදකලාව රැගෙන දැනුවත් කිරීම ප්‍රමාණවත් නොවන බවත්, ගොවිපළ, ගෘහය, ගොවියා හා ගොවි කාන්තාව යන සමස්තයම සලකා ව්‍යාප්ති වැඩසටහන් සම්පාදනය කළ යුතු බවත් ය. ඒ අනුව, ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානයට අයත් ගෘහ

ආර්ථික විශේෂඥයින් යටතේ පුහුණුව ලත් දේශීය කාර්ය මණ්ඩලයක් සමඟ ගොවි කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහන ක්‍රියාත්මක කරනු ලැබීය (රූපසිංහ,1996).[1]

1976 දී ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධාන ව්‍යාපෘතිය අවසන් වන තුරු ස්වාධීනව ක්‍රියාත්මක වූ ගොවි කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහන, අනතුරුව කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති හා පුහුණු අංශයේ ගොවි කාන්තා ව්‍යාප්ති මූලස්ථානය ලෙස ස්ථාපිත විය. වර්තමානයේ ශ්‍රී ලංකාවේ පළාත් හා අන්තර් පළාත් යන කෘෂිකර්ම බල ප්‍රදේශ දෙකම ආවරණය වන සේ, දිස්ත්‍රික්ක මට්ටමින් විෂයභාර නිලධාරීන් ද, ග්‍රාමීය මට්ටමේ දී කෘෂිකර්ම උපදේශක නිලධාරීන් ද මඟින් කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහන ක්‍රියාත්මක වේ.

## 1.8 අධ්‍යයන ගැටලුව හා එහි වැදගත්කම

ග්‍රාමීය කෘෂිකාර්මික ගොවි පවුල්වල කාන්තාවන්ගේ ජීවන තත්ත්වය උසස් කිරීම හරහා සමස්ත ගොවි පවුලම සංවර්ධනය කරා යොමු කිරීමේ අභිලාෂයෙන් කාන්තාවන් වෙනුවෙන් විශේෂයෙන් ම සකස් කළ එකම කාන්තා ව්‍යාප්ති වැඩසටහන ලෙස කෘෂිකර්ම දෙපාර්තමේන්තුව තුළ කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහන වැදගත් වන අතර දශක ගණනාවක් තිස්සේ ක්‍රියාත්මක වන මෙම වැඩසටහන පිළිබඳවත් එහි ක්‍රියාකාරීත්වය හා ප්‍රතිඵල දායකත්වය පිළිබඳවත් මුල් කාලීනව ඇගයීම් සිදු කෙරී පැවතිය ද මෑත කාලීනව මෙම වැඩසටහනෙහි අරමුණු, ක්‍රියාකාරීත්වය හා ප්‍රතිඵල දායකත්වය පිළිබඳව විධිමත්ව හා විද්‍යාත්මක ක්‍රමවේදයන් අනුගමනය කරමින් අධ්‍යයනයක් සිදුකෙරී නොමැති බව මේ හා සම්බන්ධ ඉහළ නිලධාරීන්ගේ සාකච්ඡාවලින් අනාවරණය විය. එසේම ග්‍රාමීය අංශය තුළ ඒකරාශීව පවතින සක්‍රීය කාන්තා ශ්‍රමය ආර්ථිකමය හා සමාජීය වශයෙන් සවිබල ගැන්වීමේ කාර්යය සඳහා වර්තමාන රාජ්‍ය අංශයේ ද වැඩි නැඹුරුවක් පවතින බැවින් විශේෂයෙන් තරුණ කාන්තාවන් තිරසාර ව්‍යවසායකයින් ලෙසත් සමාජීය වශයෙනුත් බලගැන්වීම කෙසේ සිදු විය යුතු ද යන්න තීරණ ගැනීම සඳහාත් ග්‍රාමීය කෘෂිකාර්මික කාන්තාවන්ගේ ක්‍රියාකාරීත්වය පිළිබඳ පැහැදිලි ඇගයීමක් සිදු කිරීමේ අවශ්‍යතාවක් පවතී. ඒ අනුව කෘෂිකාර්මික අංශය තුළ කාන්තාවන් සවිබල ගැන්වීමේ කාර්යය සඳහා ප්‍රතිපත්ති සම්පාදකයින් හට ග්‍රාමීය කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ කාන්තාවන්ගේ කාර්යභාරයත් වෙනස්වීම්වලට ලක්වන නව අවස්ථාවන්ට කාන්තාවන් දක්වන ප්‍රතිචාරයත් හඳුනාගැනීම සඳහා ඔවුන් පිළිබඳ විශ්ලේෂණාත්මක තොරතුරු පද්ධතියක

[1]තෙවදෑරුම් කාර්යභාරය යනු ස්ත්‍රී පුරුෂ සමාජ භාවය හා සම්බන්ධ ප්‍රධාන සංකල්පයක් වන අතර නිෂ්පාදන සාධක (Productive), ප්‍රජනන සාධක(Reproductive) සහ සමාජීය සාධක(social) ලෙස මෙය ප්‍රධාන අංග 3කින් සමන්විත වේ.

අවශ්‍යතාව සපුරාලීමට මෙම වැඩසටහනෙහි වර්තමාන තත්ත්වය හා එහි අරමුණු සපුරාගැනීම පිළිබඳ ඇගයීමට ලක් කෙරිණි.

## 1.9 අධ්‍යයනයේ අරමුණ

මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වන්නේ, කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහනෙහි වර්තමාන ක්‍රියාකාරිත්වය, එහි බලපෑම් ඇගයීමට ලක් කිරීමත් එම වැඩසටහන් තවදුරටත් සාර්ථක කරගැනීම සඳහා එහි සාමාජිකාවන් මෙන්ම අදාළ නිලධාරීන් මුහුණ දෙන ගැටලු හා දුෂ්කරතාවන් හඳුනාගැනීමත් ය.

අධ්‍යයනයේ විශේෂිත අරමුණු,

1. කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහනට අයත් සාමාජිකාවන්ගේ සමාජ-ආර්ථික ලක්ෂණ අධ්‍යයනය කිරීම;
2. කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහන හරහා සාමාජිකාවන්ට ලැබෙන පුහුණුවීම් හා වෙනත් ප්‍රතිලාභ හඳුනාගැනීම;
3. සමිති සාමාජිකාවන් විසින් පවත්වාගෙන යනු ලබන ආදායම් උත්පාදන ක්‍රියාවන් හඳුනාගැනීම සහ ඒවා ගෘහස්ථ ජීවිතය කෙරෙහි බලපා ඇති ආකාරය අධ්‍යයනය කිරීම;
4. කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහනට අයත් කාන්තාවන් හා නිලධාරීන් විසින් මුහුණ දෙන ගැටලු හඳුනාගැනීම සහ ඔවුන්ගේ යෝජනා විමසා බැලීම.

## 1.10 පර්යේෂණ ක්‍රමවේදය

මෙම පර්යේෂණය ප්‍රාථමික හා ද්විතියික දත්ත මත පදනම්ව සිදු කෙරිණි. ප්‍රාථමික දත්ත සපයාගැනීම සඳහා කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහන මඟින් කෘෂිකර්ම උපදේශක බල ප්‍රදේශ මට්ටමින් ස්ථාපිත කර ඇති ගොවි කාන්තා සමිතිවල සාමාජිකාවන් සහ එම ගොවි කාන්තා සමිතිවලට අදාළ නිලධාරීන් එනම්, කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහනෙහි මූලස්ථානභාර නිලධාරීන්, දිස්ත්‍රික් මට්ටමේ ගොවි කාන්තා විෂයභාර නිලධාරීන් හා කෘෂි උපදේශක බල ප්‍රදේශවල කෘෂිකර්ම උපදේශක නිලධාරීන් මේ සඳහා සම්බන්ධ කර ගන්නා ලදී.

ද්විතීයික දත්ත රැස් කිරීමේ දී මීට අදාළ අධ්‍යයන වාර්තා එනම්, අධ්‍යයන සඟරා, ලිපි, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති මූලස්ථානයේ සිදු කළ අධ්‍යයන වාර්තා, එහි ප්‍රකාශිත විවිධ ලිපි ලේඛන සහ අදාළ වෙබ් අඩවි වාර්තා ද ප්‍රයෝජනයට ගනු ලැබිණි.

දත්ත රැස් කළ ක්‍රමය

අධ්‍යයනයේ අරමුණුවලට අදාළව දත්ත රැස් කිරීමේ ක්‍රම කිහිපයක් භාවිතා කෙරිණි. ඒ අනුව විධිමත් සාහිත්‍ය විමර්ශනයක් ද ඇතුළුව පුද්ගල සාකච්ඡා, කණ්ඩායම් සාකච්ඡා, සිද්ධි අධ්‍යයන සහ ප්‍රශ්නාවලී සමීක්ෂණ පවත්වන ලදී.

**(1)** සාහිත්‍ය විමර්ශනය

මූලිකවම කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහනෙහි ආරම්භය, ක්‍රමික විකාසනය සහ වර්තමාන තත්ත්වය පිළිබඳ පුළුල් විමර්ශනයක් සිදු කෙරිණ. එය මෙම වැඩසටහනෙහි විෂය පථය අවබෝධ කර ගනු පිණිස වඩාත් ප්‍රයෝජනවත් විය.

**(2)** පුද්ගල සම්මුඛ සාකච්ඡා

කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහන මඟින් ස්ථාපිත කර ඇති ගොවි කාන්තා සමිති පවත්වාගෙන යන කෘෂිකර්ම උපදේශක නිලධාරීන්, කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති සංවිධාන මූලස්ථානය භාර නිලධාරීන්, දිස්ත්‍රික් මට්ටමේ ගොවි කාන්තා විෂයභාර නිලධාරීන් (SMO) සහ විශේෂයෙන් කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසහටහනෙහි ආරම්භක අවධියේ ඊට පුරෝගාමීව කටයුතු කළ නිලධාරීන් සමඟ පවත්වනු ලැබූ දීර්ඝ සම්මුඛ සාකච්ඡා මඟින් අධ්‍යයනයට අදාළ සුවිශේෂී දත්ත සහ තොරතුරු සපයාගන්නා ලදී. එනම් කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහනෙහි මුල්කාලීන අරමුණු සහ එහි විකාසනය, වර්තමානයේ ක්‍රියාත්මක තත්ත්වය, නිලධාරීන් මුහුණ දෙන ගැටලු සහ ඔවුන්ගේ නව යෝජනාවලට අදාළ දත්ත සහ තොරතුරු මෙම සාකච්ඡා මඟින් සපයා ගනු ලැබිණි.

**(3)** කණ්ඩායම් සාකච්ඡා

සමීක්ෂණ නියැදියට අයත් නොවූ ගොවි කාන්තා සමිති සාමාජිකාවන් සහ වර්තමානයේ ප්‍රචලිතව සිදු කෙරෙන "හෙළ බොජුන්හල්" සඳහා සම්බන්ධ ගොවි කාන්තාවන් සමඟ සිදු කළ සමූහ සාකච්ඡා මඟින් කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහන තවදුරටත් වැඩි දියුණු කිරීමට උචිත යෝජනා පිළිබඳ පුළුල් නියෝජනයක් ලබාගන්නා ලදී.

**(4)** සිද්ධි අධ්‍යයන

කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහනට අදාළ ගොවි කාන්තා සමිතිවල සාර්ථක කාන්තා ව්‍යවසායකයින්ගේ අත්දැකීම් සම්බන්ධයෙන් කළ සිද්ධි අධ්‍යයන මඟින් ගොවි කාන්තා ව්‍යාප්ති වැඩසටහන් හි තිරසාරභාවය පවත්වාගෙන යාමට ඉවහල් වී ඇති කරුණු, ඔවුන් මුහුණු දෙන ගැටලු හා අවශ්‍යතා පිළිබඳ සමාලෝචනය කරන ලදී.

**(5)** ප්‍රශ්නාවලී සමීක්ෂණ

ගොවි කාන්තා සමිතිවල සාමාජිකාවන්ගෙන් තෝරාගත් නියැදියක් මඟින් ගොවි කාන්තාවන්ගේ සමාජ-ආර්ථික ලක්ෂණ, ඔවුන් විසින් සිදු කරනු ලබන ව්‍යවසායකත්ව කාර්යයන්, මුහුණ දෙන ගැටලු සහ ඔවුන්ගේ යෝජනා පිළිබඳ තොරතුරු සපයා ගන්නා ලදී.

අධ්‍යයන ප්‍රදේශය හා නියැදිය

කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහන පළාත් හා අන්තර් පළාත් බල ප්‍රදේශ දෙකම ආවරණය වන පරිදි ලංකාව පුරාම ක්‍රියාත්මක වේ. ඒ අනුව පළාත් බල ප්‍රදේශ තුළ වැඩිම හා අඩුම ගොවි කාන්තා සමිති සංඛ්‍යාවක් ස්ථාපිත කර ඇති දිස්ත්‍රික්ක දෙකක් ලෙස පිළිවෙළින් කුරුණෑගල හා මොණරාගල යන දිස්ත්‍රික්ක දෙකත් අන්තර් පළාත් බල ප්‍රදේශවල වැඩිම හා අඩුම කාන්තා සමිති සංඛ්‍යාවක් ස්ථාපිත කර ඇති දිස්ත්‍රික්ක දෙකක් ලෙස පිළිවෙළින් අනුරාධපුරය හා මහනුවර (හසලක) යන දිස්ත්‍රික්ක දෙකත් තෝරා ගන්නා ලදී. මෙම දිස්ත්‍රික්ක 4ට අයත් ග්‍රාම සේවක වසම්වල ස්ථාපිත කර ඇති ගොවි කාන්තා සමිතිවල සාමාජිකාවන් අධ්‍යයනයට අදාළ නියැදියට අයත් විය.

නියැදිය තෝරාගැනීම

නියැදිය තෝරාගැනීමේ දී බහු පියවර නියැදි ක්‍රමය (Multi-stage Random Sampling Technique) භාවිතා කළ අතර පළමුව පළාත් හා අන්තර් පළාත් නියෝජනය වීමත්, වැඩි ගොවි කාන්තා සමිති ප්‍රමාණයක් හා අඩුම ගොවි කාන්තා සමිති ප්‍රමාණයක් ස්ථාපිත වී තිබීමත් යන කරුණු පදනම් කරගනිමින් දිස්ත්‍රික්ක හතරක් තෝරා ගත් අතර දෙවනුව එම දිස්ත්‍රික්ක හතරෙහි ස්ථාපිත කර ඇති ගොවි කාන්තා සමිති සංඛ්‍යාවට සමානුපාතිකව 20%ක සමිති ප්‍රමාණයක් අහඹු ලෙස තෝරා ගනු ලැබිණි. තෙවනුව එම ගොවි කාන්තා සමිතිවල සාමාජික ලැයිස්තු භාවිතා කරමින් එක් එක් සමිතිවල සාමාජික සංඛ්‍යාවට සමානුපාතිකව සාමාජිකයින් 325 දෙනෙකු අධ්‍යයනය සඳහා තෝරා ගන්නා ලදී.

වගු අංක 1.1: දිස්ත්‍රික් මට්ටමින් නියැදියේ ව්‍යාප්තිය

| කෘෂිකාර්මික බල ප්‍රදේශ | තෝරාගනු ලැබූ දිස්ත්‍රික්ක | එක් එක් දිස්ත්‍රික්ක තුළ ස්ථාපිත මුළු සමිති සංඛ්‍යාව | අධ්‍යයනය සඳහා තෝරාගනු ලැබූ සමිති සංඛ්‍යාව | අධ්‍යයනය සඳහා තෝරාගනු ලැබූ ගොවි කාන්තාවන් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| පළාත් මට්ටමින් | 1.කුරුණෑගල | 124 | 24 | 163 |
| | 2.මොණරාගල | 36 | 06 | 39 |
| අන්තර් පළාත් මට්ටමින් | 3.අනුරාධපුරය | 63 | 14 | 91 |
| | 4.මහනුවර | 26 | 06 | 32 |
| එකතුව | | 249 | 50 | 325 |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2014

## 1.5 දත්ත විශ්ලේෂණය

ප්‍රමාණාත්මක දත්ත (Quantitative data) විශ්ලේෂණය සඳහා SPSS සංඛ්‍යානමය ක්‍රමවේදයට අයත් සරල සංඛ්‍යානමය ක්‍රමයන් (ප්‍රස්තාර සහ වගු සටහන්) භාවිතා කළ අතර ගුණාත්මක දත්ත (Qualitative data) විස්තරාත්මක ක්‍රමවේදයන් මඟින් විශ්ලේෂණය කර ඉදිරිපත් කරන ලදී.

### 1.6 පර්යේෂණ වාර්තාවේ සැකැස්ම

මෙම වාර්තාවේ පළමු පරිච්ඡේදය, අධ්‍යයනයට ප්‍රවේශයක් සපයමින් එහි පසුබිම; අරමුණු හා ක්‍රමවේදය පැහැදිලි කරයි. දෙවන පරිච්ඡේදය කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහන පිළිබඳ පවතින සාහිත්‍ය විමර්ශනය කරමින් එම වැඩසටහනෙහි ආරම්භය හා විකාසනය පිළිබඳවත් එහි ප්‍රධාන අරමුණු; ක්‍රියාකාරකම් හා අපේක්ෂිත ප්‍රතිඵල පිළිබඳ විග්‍රහයක යෙදේ. තෙවන පරිච්ඡේදයේ දී අධ්‍යයනයට බඳුන් වූ කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහන පිළිබඳ ක්ෂේත්‍ර සමීක්ෂණයෙන් රැස් කර ගත් තොරතුරු පදනම් කරගනිමින් ඒ පිළිබඳ විග්‍රහයක යෙදේ. සිව්වන පරිච්ඡේදයේ දී ගොවි කාන්තා සමිතිවල ක්‍රියාකාරීත්වය හා එහි වර්තමාන තත්ත්වය පිළිබඳවත්, පස්වන හා හයවන පරිච්ඡේදයේ දී ගොවි කාන්තා සමිති හරහා සාමාජිකාවන්ට ලැබෙන ප්‍රතිලාභ සහ ඔවුන් විසින් ආරම්භ කර ඇති ස්වයං රැකියා පිළිබඳ විමර්ශනයක යෙදේ. හත්වන පරිච්ඡේදයේ දී ගොවි කාන්තා සමිති හා නිලධාරීන් මුහුණ දෙන ගැටලු පිළිබඳව සවිස්තරාත්මකව සාකච්ඡා කෙරෙන අතර අවසන් පරිච්ඡේදය නිගමන හා නිර්දේශ සඳහා වෙන් කර ඇත.

දෙවන පරිච්ඡේදය

# කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහන

## 2.1 හැඳින්වීම

කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහන පිළිබඳ පවතින සාහිත්‍ය විමර්ශනය කරමින් එම වැඩසටහනෙ හි ආරම්භය හා විකාසනය පිළිබඳ විග්‍රහයක් මෙම පරිච්ඡේදයේ දී සිදු කෙරෙන අතර එම වැඩසටහනට අදාළ ප්‍රධාන අරමුණු, ක්‍රියාකාරකම් හා අපේක්ෂිත ප්‍රතිඵල පිළිබඳව ද කරුණු විමර්ශනය කෙරේ.

## 2.2 කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහන

### 2.2.1 ආරම්භය හා විකාසනය

එක්දහස් නවසිය 70 දශකයේ දී කෘෂිකර්ම අමාත්‍යාංශයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ (FAO) පූර්ණ අනුග්‍රහය ඇතිව ගොවි කාන්තාවන්ට විශේෂ වූ වැඩසටහනක් ලෙසින් ගොවි කාන්තා කෘෂිකර්ම ව්‍යාප්තිය (Farm Women Agricultural Extension- FWAE) ආරම්භ කෙරිණි. මෙම වැඩසටහනෙ හි ප්‍රධාන ඉලක්කය වූයේ ගොවි කාන්තාවන් දැනුවත්භාවයෙන් යුත් කණ්ඩායමක් බවට පත් කිරීමයි. ගොවිපළ සහ ගෘහය, ගොවියා සහ ගොවි කාන්තාව හුදකලා කොට ආහාර බෝග අංශයේ ප්‍රවර්ධනයක් ඇති කළ නොහැකි බව මෙම වැඩසටහන ආරම්භයේ දී ම රජය විසින් අවබෝධ කොට ගනු ලැබිණි (රූපසිංහ, 1996). මේ තත්ත්වය මත ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ ගෘහ ආර්ථික විද්‍යාඥයින් ද සමඟ විශේෂ පුහුණුවක් ලබා ගත් දේශීය කාර්ය මණ්ඩලය ද එක්ව ගොවි කාන්තා ව්‍යාප්ති පුහුණු වැඩසටහන වඩාත් උසස් තලයකට රැගෙන යාමට කටයුතු කළ හ. මෙම කාර්ය මණ්ඩලය විසින් ලංකාවේ මහා වාරි ප්‍රදේශයන්ට අයත් දිස්ත්‍රික්ක කිහිපයක වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ආරම්භකළ අතර, මෙම කාලවකවානුව තුළ රට පුරා ඇති වූ ආහාර අර්බුදයට විසඳුම් සෙවීමේ දී ගොවි කාන්තා ව්‍යාප්ති පුහුණු වැඩසටහන් මෙන්ම එහි නිලධාරීන් ඇතුළු ප්‍රවීණයන් ද එම කටයුත්තට වඩාත් දායක වූ කණ්ඩායමක් ලෙස හැඳින්විය හැකිය (රූපසිංහ, 1996).

ගොවි කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති සංවිධානය ආරම්භයේ සිට 1976 වර්ෂය දක්වා ම ජාත්‍යන්තර අරමුදල ආශ්‍රිත ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක වුව ද එම ව්‍යාපෘතිය අවසන් වීමත් සමඟ කෘෂිකර්ම

දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති අංශයේ කොටසක් ලෙස පූර්ණ වශයෙන් අනුයුක්ත කෙරිණි. එම තත්ත්වය මත ගොවි කාන්තාවන් සඳහා විශේෂයෙන් සකස් කළ වැඩසටහනක් ලෙසින් ක්‍රියාත්මක වූ ගොවි කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහන, සාමාන්‍ය කෘෂිකර්ම ව්‍යාප්ති සේවයේ කොටසක් බවට පත් විය (රූපසිංහ, 1996).

ශ්‍රී ලංකාවේ කෘෂිකර්ම ව්‍යාප්ති සේවය සඳහා ලෝක බැංකුව විසින් හඳුන්වා දෙන ලද ව්‍යාප්ති ප්‍රවේශයක් වන පුහුණුව හා හමුවීමේ ක්‍රමය (Training and Visit System – T&V System) 1970 අගභාගය වන විට ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වූ අතර මෙම ප්‍රවේශය තුළට ගොවි කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහන ඇතුළත් වී නොමැත. එහි ප්‍රතිඵලයක් ලෙසට සිදු වී ඇත්තේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව තුළ සම්පත් බෙදීයාමේ දී හා කාර්යයන් වෙන්කිරීමේ දී ගොවි කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහන සඳහා අඩු වැදගත්කමක් ලැබීමයි.

එසේ වුවත් අසූව දශකය මුල් භාගයේ දී පුහුණුව හා හමුවීමේ ව්‍යාප්ති ප්‍රවේශය හරහා ක්‍රියාත්මක වූ විෂය ක්ෂේත්‍ර වැඩසටහන් සඳහා ගොවි කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහන ඇතුළත් කරන ලදී. එහි ප්‍රතිඵලයක් වූයේ, ගොවි කාන්තාවන් සම්බන්ධයෙන් විවාදාත්මක ප්‍රවේශයකට මඟ පෑදීම මෙන් ම ගොවි කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති කාර්යය මණ්ඩලය ද පුහුණුව හා හමුවීමේ ව්‍යාප්ති ක්‍රමවේදයේම එක් කොටසක් ලෙසින් ක්‍රියාත්මක වීමයි (රූපසිංහ, 1996).

### 2.2.2 ගොවි කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහන් ඇගයීමේ ක්‍රියාවලිය

යට කී පරිදි සාමාන්‍ය කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහන් ලෙසින් ක්‍රියාත්මකවීම ආරම්භයත් සමඟ ගොවි කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහන් ඇගයීම පිණිස කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ගොවි කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති මූලස්ථානය විසින් ඇගයීමේ ක්‍රියාවලියක් ආරම්භ කරන ලදී.

වසර දෙකකට වරක් ඇගයීමේ කාර්යය සිදු කෙරී ඇති අතර මූලස්ථානයේ නිලධාරීන් දිස්ත්‍රික්ක මට්ටමේ කාර්ය මණ්ඩලය සහ බිම් මට්ටමේ නිලධාරීන් මෙම කාර්යය සිදු කර ඇත. එක් එක් මට්ටමේ නිලධාරීන් සියලු දෙනාම, මූලස්ථානය සමඟ දැඩි සහයෝගයකින් රාජකාරී සම්බන්ධතාවය පවත්වාගෙන ගොස් ඇති අතර, පහළ මට්ටමේ නිලධාරීන්ට, ගොවි කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති මූලස්ථානයේ නිලධාරීන් විසින් තාක්ෂණික සහය ලබා දී ඇත. ගොවි කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහන් හි බිම් මට්ටමේ නිලධාරීන් මාසික ප්‍රගතිය (වැඩසටහන්වල අසාර්ථකභාවය මෙන්ම සාර්ථකභාවය පිළිබඳ දත්ත) ඔවුන්ගේ ඉහළ මට්ටමට ලබාදීමේ ක්‍රමවේදයක් පැවතිණි. පෙර සූදානමක් සහිතව මූලස්ථානයේ නිලධාරීන් විටින් විට ගොවි

කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහන් ක්‍රියාත්මක වන ප්‍රදේශ අධීක්ෂණය සඳහා යන අතර මාසිකව ඔවුන්ට ලැබෙන තොරතුරු සත්‍ය දැයි නිරීක්ෂණය කරනු ලබයි. ඊට අමතරව අවශ්‍ය තන්හි දී ඔවුන්ගේ උපදේශක සේවය ද බිම් මට්ටමේ නිලධාරීන්ට මෙන්ම ගොවි කාන්තාවන්ට ද සැපයීම සිදු කෙරී ඇත (රූපසිංහ, 1996).

වර්ෂ 1986 වන විට ගොවි කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති මූලස්ථානය විසින් ස්ත්‍රී-පුරුෂ සමාජභාවය අනුව මාසිකව ඇගයීමේ වාර්තා ලබාගැනීමේ ක්‍රමයක් සකස් කෙරිණි. පෙර දී වැඩසටහන් හි සාර්ථක/අසාර්ථකභාවය පිළිබඳ පමණක් මාසික වාර්තා ලබාගත් අතර පසුව පුද්ගලයින් සම්බන්ධව ද ඇගයීමක් සිදු කෙරී ඇති බව මෙයින් ගම්‍ය වේ. මේ අනුව ගොවි කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහන්වලට සම්බන්ධව ගෘහණියගේ කාර්යභාරය වැඩි දියුණු කිරීමේ අරමුණු වැඩි වශයෙන් වැඩසටහන් සඳහා ඇතුළත්ව පැවති බව පෙනී යයි.

වර්ෂ 1980 දශකයේ දී ගෘහස්ථය තුළ ගෘහණියගේ කාර්යභාරය ශක්තිමත් කිරීම පමණක් අරමුණු කොටගෙන තිබූ ගොවි කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහනෙහි අරමුණු පුළුල් වෙමින් ගොවි කාන්තාවන් ගෘහස්ථ මට්ටමින් ආදායම් ඉපැයීමේ ක්‍රියාවන්ට යොමු කිරීම වෙනුවෙන් ද වැඩසටහන් ක්‍රියාත්මක කෙරිණි. ආදායම් ඉපැයීමේ කාර්යයන් තුළ "පෝෂණීය ගෙවත්ත" සංකල්පය වඩාත් මතු කර දක්වා ඇත. අසූව දශකයේ අගභාගය වන විට ගොවි කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති සංවිධාන මූලස්ථානය විසින් ඉදිරිපත් කළ ව්‍යාපෘති යෝජනා සඳහා යුනිසෙෆ් (UNISEF) ආයතනය මඟින් මූල්‍ය ප්‍රතිපාදන ලබාදුන් අතර පුහුණුව හා හමුවීමේ ප්‍රවේශය මඟින් එම ව්‍යාපෘති වැඩසටහන් ක්‍රියාත්මක කෙරිණි. මෙම ව්‍යාපෘති යටතේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී ව්‍යාප්ති සේවකයින්ට සහ එම ව්‍යාපෘතියට සම්බන්ධ වූ ගොවි පවුල්වලට පමණක් යම් දීමනාවක් ලැබීම විශේෂත්වයකි. ගොවි කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති මූලස්ථානයේ භාරකාරත්වය යටතේ දිස්ත්‍රික්ක මට්ටමේ ගොවි කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරීන් විසින් මෙම වැඩසටහන් සම්බන්ධීකරණය කරන ලදී. කාන්තා ව්‍යාප්ති නිලධාරීන් පමණක් නොව මෙම වැඩසටහන් හරහා පුරුෂ පාර්ශවයේ ව්‍යාප්ති නිලධාරීන් ද ගොවි කාන්තා වැඩසටහන් සඳහා දායකත්වය සැපයීම මෙහි දී ආරම්භ කෙරී ඇත. මෙම කාලය තුළ දී ගොවි කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහන දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක කිරීමට වගකීම පැවරුණු නිලධාරීන්ගේ සංඛ්‍යාව ද වර්ධනය විය. අයත් නිලධාරීන් ද සංඛ්‍යාත්මකව වර්ධනය වී ඇත. (1981 දී නිලධාරීන් 18 සිටි අතර 1987 වන විට එම සංඛ්‍යාව 33ක් දක්වා වැඩි වී ඇත).

අසූව දශකය අවසන්වීමත් සමඟ ගොවි කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහන් ක්‍රියාත්මක කෙරෙන ප්‍රදේශයන් හි කාර්යයන් පිළිබඳ වූ අවධානය මදක් අඩු වූ බව සඳහන් කෙරෙන අතර, මෙහි ප්‍රතිඵලයක් ලෙස ගොවි කාන්තාවන්ට දැනුම හා පුහුණුව ලබා දෙන නිලධාරීන්ට ලැබුණු පුහුණුවීම් ද අවම වී ඇත (රූපසිංහ, 1996). මෙම කාලවකවානුව තුළ රජයේ පරිපාලන ව්‍යුහය තුළ සිදු වූ විශේෂ සිදුවීමක් ලෙස පළාත් සභා ක්‍රමය හඳුන්වාදීමත් සමඟ එතෙක් පැවති සාමාන්‍ය ව්‍යාප්ති ප්‍රවේශය සහ අනෙකුත් කටයුතුවල කැපී පෙනෙන වෙනස්කම් සිදු වූ අතර, ගොවි කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහන් ද එහි ප්‍රතිඵලයන්ට ගොදුරුවන ලදී. කෘෂිකර්ම ව්‍යාප්ති කටයුතු විමධ්‍යගත කළ මුත් පළාත් හා මූලස්ථාන අතර පැවති නිලධාරී මට්ටමේ සම්බන්ධතාවය පිළිබඳ තත්ත්වය ස්ථාපිත කිරීම පිළිබඳ කිසිවකු හඳුනා නොගැනීම මෙහි දී සිදු වූ ප්‍රබල දුර්වලතාවයක් විය.

පළාත් මට්ටමේ කෘෂිකර්ම ව්‍යාප්ති සේවයට අදාළ පරිපාලන ව්‍යුහය සහ රැකියා තත්ත්වයන් පිළිබඳ දිස්ත්‍රික්ක මට්ටමේ ගොවි කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහනට අයත් බොහොමයක් නිලධාරීන් අපැහැදිලි තත්ත්වයකට පත් වීම මෙහි දී දැකිය හැකි විය.

අනූව දශකය ආරම්භයත් සමඟ ලංකාව පුරා ක්‍රියාත්මක කෙරුණු දරිද්‍රතාවය දුරලීමේ වැඩසටහනක් වූ "ජන සවිය" වැඩසටහන ක්‍රියාත්මක වූ අතර ග්‍රාමීය රැකියාවන් හි නියුතු දිළිඳු ජනතාව එහි ඉලක්කගත කණ්ඩායම විය. එහි ප්‍රධාන නිර්ණායක වූයේ, ගෘහස්ථ පදනම් කරගත් හෝ ප්‍රජා මට්ටමේ ක්‍රියාකාරකම් මඟින් ආදායම් උත්පාදන ක්‍රම හඳුන්වාදීමයි. මෙහි දී ගොවි කාන්තාවන් නිරායාසයෙන් ම මෙම ඉලක්කගත කණ්ඩායමට ඇතුළත් විය. මෙම ජාතික අවශ්‍යතාව සපුරාලනු වස් ගොවි කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහන කෘෂිපාදක ව්‍යවසායකත්ව ක්‍රියාකාරකම් සඳහා ප්‍රමුඛත්වය දෙන ලදී. ගොවි කාන්තාවන් වෙනුවෙන් විශේෂිතව ආරම්භ කෙරුණු ගොවි කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහන ජාතික වැඩසටහන් (උදා: ජනසවිය) ක්‍රියාත්මක කිරීමේ ඉලක්කගත අරමුණු ඉටු කරගැනීමට නිරායාසයෙන් ම යොමු වූ වැඩසටහන් බවට පත් වී ඇති බව තොරතුරු විමර්ශනයේ දී පැහැදිලි විය.

## 2.3 ගොවි කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහනෙ හි අරමුණු සහ කාර්යයන්

ගොවි කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහන පිළිබඳ පවතින තොරතුරුවලට අනුව මෙම වැඩසටහන ආරම්භයේ දී ප්‍රාදේශිය මට්ටමේ සේවය කළ නිලධාරීන් 28 දෙනෙකු හරහා කෘෂිකාර්මික පරිපාලන දිස්ත්‍රික්ක 21ක් තුළ ක්‍රියාත්මක වී ඇත. ගොවි කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති මූලස්ථානය විසින් මෙම දිස්ත්‍රික්කයන් හි පැවති බිම් මට්ටමේ තොරතුරු මත පදනම් වී

කාන්තාවන් සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අදාළව අරමුණු සහ කාර්යයන් සම්පාදනය කර ඇත. පවතින දත්ත හා තොරතුරුවලට අනුව ගොවි කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහන්වල අරමුණු සහ ක්‍රියාකාරකම් කාලීනව යම් යම් වෙනස් කිරීම් සහ ඇතුළත් කිරීම් සහිතව කොටස් 03ක් යටතේ හඳුනාගත හැකිය. ඒ අනුව,

1. ආරම්භක අවධිය
2. උපාය මාර්ගික සැලැස්ම 2005
3. වර්තමාන අවධිය 2010-2015

### 2.3.1 ආරම්භක අවධියේ අරමුණු සහ කාර්යයන්

ගොවි කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහන් හි ආරම්භක අවධියේ දී මූලික අවධානය යොමු වී ඇත්තේ, ගොවි කාන්තාව උසස් මට්ටමේ ගෘහණියක් බවට පත් කිරීමත්, ඒ හරහා පවුල් පරිසරය යහපත් කිරීමත්, ගෘහස්ථ පරිසරය තුළ යම් යම් ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් සිදු කිරීමට දැනුවත් කිරීමත් සඳහා ය. මෙම ප්‍රධාන අරමුණ සපුරාගැනීම සඳහා පහත දැක්වෙන ප්‍රධාන කාර්යයන් හා උප කාර්යයන් සිදු කර ඇත.

1. ගොවි කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති පුහුණු වැඩසටහනට අදාළ කාර්යයන් පිළිබඳ නිලධාරීන් පුහුණු කිරීම

    (අ) කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, වෙනත් රජයේ ගොවි කාන්තා නොවන සංවිධානවලට අයත් නිලධාරීන් ගොවි කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති කාර්යයන් සඳහා පුහුණු කිරීම

2. ගොවි කාන්තාවන් සඳහා ආර්ථික ක්‍රියාකාරකම් හඳුන්වාදීම

    (අ) වෙළඳපොළ හඳුනාගැනීම සඳහා කාන්තාවන් දැනුවත් කිරීම

    (ආ) වෙළඳපොළ ඉල්ලුම සහිත භාණ්ඩ ස්ව සම්පත් යොදා සකසා ගැනීමට අවශ්‍ය දැනුම හා නිපුණත්වය ලබාදීම

    (ඇ) වෙළඳපොළට ඉදිරිපත් කරනු ලබන භාණ්ඩවල ගුණාත්මය, නිමවීම, ඇසිරීම හා ප්‍රවාහනය පිළිබඳ පුහුණුව

3.ගෘහස්ථ ක්‍රියාකාරකම් පිළිබඳ කාන්තාවන්ගේ කළමනාකරණ හා සංවිධානාත්මක හැකියාව දියුණු කිරීම

(අ) කාලය, ශ්‍රමය සහ මුදල් ඉතිරි කරගනිමින් ගෘහස්ථ ක්‍රියාකාරකම් වෙහෙසකරභාවයෙන් තොරව ඉටුකර ගැනීම සඳහා ක්‍රම සහ විධි හඳුන්වාදීම

(ආ) පරිසර දූෂණයෙන් වැළකෙන හා පරිසරය සංරක්ෂණය වන පරිදි ගෘහස්ථ කාර්යයන් හි යෙදෙන ආකාරය ප්‍රගුණ කිරීම

4. ආහාර පරිභෝජනය හා සංරක්ෂණය පිළිබඳ තාක්ෂණයන් ප්‍රවර්ධනය කිරීම

(අ) ආහාර සංරක්ෂණය සහ පරිභෝජනය පිළිබඳ වැඩි දියුණු කළ තාක්ෂණයන් හඳුන්වාදීම

(ආ) වැඩියෙන් පවතින ආහාර නිෂ්පාදන ආහාර අඩු කාලයන් හි ප්‍රයෝජනයට ගැනීමට සංරක්ෂණය කිරීම සඳහා කාන්තාවන් දිරිගැන්වීම

(ඇ) වැඩියෙන් පවතින ආහාර නිෂ්පාදන වෙළඳපොළ වෙත යොමු කිරීමට කාන්තාවන් දිරිගැන්වීම

5. පවුලේ ආහාර රටාව ප්‍රවර්ධනය කිරීම

(අ) පෝෂණීය ආහාර පරිභෝජනයේ වැදගත්කම අවබෝධ කිරීම

(ආ) පවුලේ ආහාර පරිභෝජනය සඳහා පෝෂණීය බෝග වගාකිරීමට දිරිගැන්වීම (පෝෂණීය ගෙවත්ත)

(ඇ) වෙළඳපොළ තුළ පවතින ආහාර වර්ගවල පෝෂණීය අගය පිළිබඳ දැනුවත් කිරීම

(ඉ) විවිධ වයස් කාණ්ඩ සඳහා ලාභදායී හා පෝෂණීය ආහාර වේල් සැලසුම් කිරීම හා පෝෂ්‍ය පදාර්ථ සුරැකෙන සේ පිළියෙල කිරීම පිළිබඳ නිපුණතාවයක් ලබාදීම

(ඊ) පෝෂ්‍ය පදාර්ථ සුරැකෙන ලෙස ආහාර පිළියෙල කිරීමේ තාක්ෂණයන් පිළිබඳ නිපුණතාවයක් ලබාදීම

(උ) ආහාර හා පෝෂණය පිළිබඳ මිත්‍යා මත දුරු කිරීම

6. ගොවි කාන්තාවන්ගේ දැනුම හා කුසලතාවය සඳහා පුහුණුවීම් සිදු කිරීම

    (අ) ගොවි කාන්තාවන් විසින් හඳුනාගත් අවශ්‍යතා අනුව දැනුම හා කුසලතා වර්ධනයට පුහුණුවීම් ලබාදීම

7. යෝග්‍ය තාක්ෂණයන් වර්ධනය, ලේඛනගත කිරීම හා ජාතික වශයෙන් එම තාක්ෂණයන් ව්‍යාප්ත කිරීම

8. ප්‍රචාරක වැඩසටහන් සංවිධානය කිරීම

    (අ) ජනමාධ්‍ය වැඩසටහන්
    (ආ) ක්ෂේත්‍ර දින
    (ඇ) ප්‍රදර්ශන

9. ගොවි කාන්තාවන්ගේ සංවර්ධනයට අදාළ කාර්යයන් පිළිබඳ දත්ත හා තොරතුරු ජාතික මට්ටමින් රැස් කිරීම හා ව්‍යාප්තියට දායකවීම

    (අ) ප්‍රගතිය පිළිබඳ වාර්තා මඟින්

### 2.3.2 උපාය මාර්ගික සැලැස්ම 2005 -2009

සමාජ, ආර්ථික හා දේශපාලනමය වශයෙන් සිදුවන වෙනස්වීම්වලට සමගාමීව කාන්තාවන්ගේ අවශ්‍යතා මෙන්ම පවුල් පසුබිම ද එසේම රජයේ යම් පරිපාලනමය වෙනස්වීම් හේතුවෙන් ද ගොවි කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහන් හි අරමුණු හා ක්‍රියාකාරකම් ද යම් සංශෝධනයකට ලක් වී ඇති බව පෙනී යයි. ඒ අනුව ආරම්භක අවධියේ පැවති අරමුණු සහ කාර්යයන් හි යම් යම් වෙනස්වීම් සිදු වී ඇති බව 2005-2009 අතර කාලයේ අරමුණු හා කාර්යයන් විමසීමේ දී පෙනී යයි.

ඒ අනුව 2005-2009 කාලය තුළ සම්පාදිත සැලැස්ම උපාය මාර්ගික සැලැස්ම ලෙස නම් කර ඇති අතර එහි "ගොවි කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහන" යන නාමය "ගොවි" යන්න ඉවත් කර "කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහන" ලෙස වෙනස් වී ඇත. එහි දී ගොවි පවුල්වල කාන්තාවන් පමණක් නොව කෘෂිකාර්මික කටයුතු සඳහා කැමැත්තක් ඇති සියලුම කාන්තාවන් මෙම වැඩසටහන් සඳහා දායක විය හැකි බව ගම්‍ය කරයි. එසේ ම මෙම සැලැස්ම තුළ ප්‍රධාන මෙහෙවර ලෙසින් සඳහන් කර ඇත්තේ, කෘෂිකාර්මික සංවර්ධනය සඳහා කාන්තාවන්ගේ දායකත්වය තීව්‍ර කිරීමෙන් පවුල් ඒකකයන් හි පෝෂණීය තත්ත්වය සහ ජීවන තත්ත්වය දියුණු කිරීම යන්නයි. එසේ ම ප්‍රධාන අරමුණ ලෙසින් දක්වා ඇත්තේ, පවුල් ඒකක සඳහා විශේෂයෙන්

කාන්තාව කේන්ද්‍ර කර පවුල් පරිසර ප්‍රවර්ධනය කිරීම සහ තිරසාර ආදායම් මාර්ගයන් උත්පාදනය කිරීම යන්නයි. ඒ අනුව ආරම්භක අවධියේ පැවති අරමුණට වඩා යම් ස්ථිරසාර තත්ත්වයක් කාන්තාවන්ගේ ආර්ථික කටයුතු සම්බන්ධයෙන් සිදු කිරීමට මෙම වැඩසටහන උත්සහ දරා ඇති බවපෙනී යයි.

2005-2009 උපාය මාර්ග සැලැස්ම තුළ අන්තර්ගත කාර්යයන් සහ උප කාර්යයන් පිළිබඳ විමසීමේ දී පෙනී යන්නේ, ආරම්භක අවධියේ කාර්යයන් සංඛ්‍යාව අඩු කර යම් වෙනසක් සිදුකොට ඇති බවයි. ඒ අනුව, ප්‍රධාන කාර්යයන් අතරට නවතාවයෙන් එක් කර ඇත්තේ,

1. කාන්තා සංවිධාන(සමිති) ගම් මට්ටමින් ස්ථාපිත කිරීම
   මෙහි දී සංවිධානාත්මක ශක්තිය පිළිබඳවත්, සංවිධානයක් ලෙස ලබාගත හැකි සේවාවත්, ප්‍රතිලාභ පිළිබඳව කාන්තාවන් දැනුවත් කිරීම සහ ඒවා ලබාගැනීමට යොමු කරවීම අරමුණු කර ඇත.

2. කෘෂි ව්‍යවසායකත්වය පිළිබඳ පුහුණුවීම්
   ආරම්භක අවධියේ දී මෙය ආර්ථික ක්‍රියාකාරකම් ලෙස දක්වා ඇත. කෘෂිකාර්මික ව්‍යවසායකත්වය ලෙස පසුව වෙනස් කර උප කාර්යයන් අතරට වෙළඳපළට අවතීර්ණ වීමට ආධාර කරගත හැකි සම්පත් හා උපාය මාර්ග වෙත යොමු කිරීම යන ශීර්ෂය ද එක් කර ඇත. ගොවි කාන්තාවන් කෘෂි ව්‍යාවසායකයින් ලෙස පුහුණු කරවීමත් වෙළඳපොළ හා අලෙවිය පිළිබඳ ප්‍රවේශයන් සකස් කිරීමටත් සුදුසු ලෙස මෙම අවධියේ අරමුණු හා කාර්යයන් සකස් කර ඇති බවට විද්‍යාමාන වේ.

3. සම්පත් කළමනාකරණය පිළිබඳ හැකියා දියුණු කිරීම
   ආරම්භක අවධියේ පැවති අරමුණු හා ප්‍රධාන කාර්යයන් තුළ මේ පිළිබඳව සඳහන් වන්නේ ගෘහස්ථ ක්‍රියාකාරකම් සංවිධානාත්මක හා කළමනාකරණයක් සහිතව සිදු කිරීමේ හැකියාව ප්‍රවර්ධනය කිරීම යනුවෙනි. ඊට අමතරව මෙම ප්‍රධාන අරමුණට 2005-2009 උපාය මාර්ගික සැලැස්ම තුළ උප කාර්යයක් එකතු කර ඇත. එනම් ගෘහයේ හා ගොවිපළේ කාර්යයන් පහසු කිරීමේ උපකරණ හා උපක්‍රම හඳුන්වා දීම යනුවෙනි.

**4.** **පවුලේ ආහාර පද්ධතිය සහ පෝෂණය දියුණු කිරීම**

**මුල් අවධියේ පැවති අරමුණු හා ප්‍රධාන කාර්යයන් අතර ආහාර පරිභෝජනය හා සුරක්ෂිතතාවය පිළිබඳ තාක්ෂණය ප්‍රවර්ධනය කිරීම සහ පවුලේ ආහාර රටාව ප්‍රවර්ධනය කිරීම යන උපාය මාර්ගයන් දෙකම වෙනුවට 2005-2009 උපාය මාර්ගික සැලැස්ම තුළ සඳහන් කරන්නේ ඉහත සඳහන් වන උප කාර්යය පමණි. මුල් අවධියේ පැවති එම ප්‍රධාන කාර්යය තුළින් ආහාර සංරක්ෂණය හා අතිරික්තය වෙළඳපොළට යොමු කර ඇති බව පෙනී යන අතර, 2005-2009 උපාය මාර්ගික සැලැස්මට ඇතුළත් මෙම ප්‍රධාන කාර්යය තුළින් පවුලේ ආහාර පද්ධතියේ පෝෂණීය තත්ත්වය ගැන වැඩි අවධානයක් යොමු කර ඇත. එසේම නව උප කාර්යයක් ලෙසින් පාරිභෝගික අයිතිවාසිකම්, ආහාර සුරක්ෂිත භාවය ආදිය පිළිබඳ කාන්තාවට දැනුම ලබාදීම ද ඇතුළත් කර ඇත.**

**ගොවි කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහනට අදාළව ආරම්භක අවධිය සහ 2005-2009 උපාය මාර්ගික සැලැස්මට අදාළ අරමුණු සහ එම අරමුණු සාක්ෂාත් කිරීමට සිදු කළ ප්‍රධාන කාර්යයන් මෙන්ම උප කාර්යයන් ද වෙනස් වූ ආකාරය ඉහත විග්‍රහ වන අතර මුල් අවධියේ පැවති කාර්යයන් 9 පසුව කාර්යයන් 7කට සංක්ෂිප්ත කර ඇත. එය ඇමුණුම් අංක 01න් පැහැදිලි කෙරේ.**

### 2.3.3 වර්තමාන අවධිය 2010-2015

**ආරම්භක අවධිය සහ 2005-2009 අතර පැවති උපාය මාර්ගික සැලැස්ම තුළ ප්‍රතිඵල, එම ප්‍රතිඵල සාධනය සඳහා ක්‍රියාත්මක කළ ප්‍රධාන කාර්යයන් හා උප කාර්යයන් යට පරිච්ඡේදයෙන් විස්තර කෙරුණි. එම අරමුණු, අපේක්ෂිත ප්‍රතිඵල හා ප්‍රධාන කාර්යයන් කාලානුරූපව නැවත ප්‍රතිසංශෝධනයකට ලක් කිරීමෙහි ප්‍රතිඵලයක් ලෙස 2010 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා වූ කාලයක් සඳහා නැවත අරමුණු සහ කාර්යයන් හඳුන්වා දී ඇත. මුල් කාලීනව "ගොවි කාන්තා" යන වචනය භාවිතා කළ ද වර්තමානය වන විට එය වඩාත් පුළුල් පරාසයක් කරා මෙහි වැඩසටහන් ඉලක්ක කිරීමේ අරමුණු මත වර්තමානයේ භාවිතා කරනු ලබන්නේ, "කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහන" යනුවෙනි.**

**2.3.3.1කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහනෙ හි ප්‍රධාන අරමුණ**

**කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහනෙ හි ප්‍රධාන අරමුණ වන්නේ, කාන්තාව කේන්ද්‍ර කරගනිමින් පවුල් ඒකකයන් තුළ පවුල් පරිසරය ප්‍රවර්ධනය කිරීම, තිරසාර ආදායම් මාර්ගයන් උත්පාදනය කිරීම සහ සවිබල ගැන්වීමයි.**

**2.4.3.2අපේක්ෂිත ප්‍රතිඵල**

1. **සක්‍රීය කාන්තා ගොවි සංවිධාන ස්ථාපිත වීම සහ එම සංවිධාන කෘෂිකාර්මික නිෂ්පාදනය වැඩි කිරීමට දායක වීම.**
2. **කාන්තා කෘෂිකර්ම ව්‍යවසායකත්වය ප්‍රවර්ධනය වීම සහ නිෂ්පාදන සඳහා තිරසාර වෙළඳපොළක් ඇති වීම.**
3. **පවුලේ ආහාර පද්ධතිය හා පෝෂණය වැඩි දියුණු වීම.**
4. **ස්ව සම්පත් ප්‍රශස්ත අන්දමින් කළමනාකරණය කිරීමට හැකි වීම**
5. **කාන්තාවන්ගේ කාර්යභාරය සහ අයිතිවාසිකම්, කාන්තා සංවිධාන සාමූහිකව ක්‍රියාකිරිමෙන් අත්වන වාසි සහ සංවර්ධන ක්‍රියාදාමයන් සඳහා වූ සම්පත් පිළිබඳව අවබෝධයක් ලබාගැනීම සහ කාන්තාවන්/සංවිධාන සවිබල ගැන්වීම**
6. **කාන්තාව/සංවිධානවල සුරැකුම් සහ ආයෝජන වැඩි වීම**
7. **කාන්තා සංවිධාන අතර තිරසාර සම්බන්ධතා වර්ධනය වීම**

**2.3.3.3 ප්‍රධාන කාර්යයන් සහ උප කාර්යයන්**

**ඉහත සඳහන් අපේක්ෂිත ප්‍රතිඵල සාධනය කරගැනීම සඳහා, කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහන විසින් ඉටු කරනු ලබන ප්‍රධාන කාර්යයන් සහ උප කාර්යයන් පහත දැක්වේ.**

| | ප්‍රධාන කාර්යයන් | උප කාර්යයන් |
|---|---|---|
| **1** | තෝරාගනු ලබන ව්‍යාප්තිකාරකයන්ගේ දැනුම හා කුසලතා ප්‍රවර්ධනය | **1.1** කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනයන් හි පුහුණු කරන්නන් කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති කර්යයන් පිළිබඳව දැනුම හා කුසලතා වර්ධනය<br>- සේවාස්ථ පුහුණු<br>- විශේෂ පුහුණු<br>උදා: ගොවි සතිය, ලෝක ආහාර දිනය, ග්‍රාමීය කාන්තා දිනය ආදිය |

| | | |
|---|---|---|
| **2** | කාන්තා සංවිධාන ස්ථාපිත කිරීම | **2.1**සංවිධානාත්මක ව්‍යුහයක ශක්තිය පිළිබඳ සේවාදායකයන්හට වටහා දීම<br>**2.2** සංවිධානයක් ලෙස ලබා ගත හැකි සේවාවන්, ප්‍රතිලාභ පිළිබඳව සේවාදායකයන් දැනුවත් කිරීම සහ ඒවා ලබාගැනීමට යොමු කිරීම<br>**2.3** කාන්තාවන් සවිබල ගැන්වීම |
| **3** | කෘෂි ව්‍යවසායකත්වය පිළිබඳ පුහුණුවීම් | **3.1** වෙළඳපොළට ප්‍රවිෂ්ටවීමට සේවාදායකයින් දැනුවත් කිරීම<br>**3.2** වෙළඳපොළ ඉල්ලුම සහිත කෘෂිකාර්මික භාණ්ඩ ස්ව සම්පත් යොදා සකසා ගැනීමට අවශ්‍ය කුසලතා වර්ධනය<br>**3.3** වෙළඳපොළට ඉදිරිපත් කරනු ලබන භාණ්ඩවල මිල, ගුණාත්මය, නිමවීම, ඇසිරීම හා ප්‍රවාහනය පිළිබඳ පුහුණුව<br>**3.4** වෙළඳපොළට අවතීර්ණ වීම සඳහා ආධාර කර ගත හැකි විවිධ සම්පත් හා උපාය මාර්ග වෙත යොමු කිරීම |
| | ප්‍රධාන කාර්යයන් | උප කාර්යයන් |
| **4** | සම්පත් කළමනාකරණය පිළිබඳ කාන්තා හැකියා දියුණු කිරීම | **4.1** කාලය, ශ්‍රමය, බලශක්තිය, මූල්‍යමය හා ස්වාභාවික සම්පත් ප්‍රශස්ත ආකාරයට යොදා නිවසේ සහ ගොවිපළේ කාර්යයන් සංවිධානය කිරීම පිළිබඳ දැනුවත් කිරීම<br>**4.2** පරිසර දූෂණයන් වැළකෙන හා පරිසර සංරක්ෂණය වන පරිදි ගෘහ කාර්යයවල යෙදෙන ආකාරය ප්‍රගුණ කිරීම<br>**4.3** ගෘහයේ හා ගොවිපළේ කාර්යයන් පහසු කිරීමේ උපකරණ හා උපක්‍රම හඳුන්වාදීම |
| **5** | පවුලේ ආහාර පද්ධතිය හා පෝෂණය දියුණු කිරීම | **5.1** පෝෂණීය ආහාර පරිභෝජනයේ වැදගත්කම අවබෝධ කිරීම<br>**5.2** පෝෂණය සහ ආර්ථික වටිනාකමක් ඇති බෝග පිළිබඳ දැනුවත් කිරීම<br>**5.3** පෝෂණීය සහ ආර්ථික වටිනාකමෙන් යුත් බෝග වගා කරගැනීමට අවශ්‍ය නව තාක්ෂණික දැනුම ප්‍රායෝගික දැනුම සහ නිපුණත්වය ලබාදීම<br>**5.4** විවිධ වයස් කාණ්ඩ සඳහා ලාභදායී හා පෝෂ්‍යදායී ආහාර වේල් සැලසුම් කිරීම හා පෝෂ්‍ය පදාර්ථ සුරැකෙන සේ පිළියෙල කිරීම පිළිබඳ නිපුණත්වයක් ලබා දීම |

| | | |
|---|---|---|
| | | **5.5** ආහාර සහ පෝෂණය පිළිබඳ මිත්‍යා මත දුරු කිරීම<br>**5.6** පාරිභෝගික අයිතිවාසිකම්, ආහාර සුරක්ෂිතභාවය ආදිය පිළිබඳ දැනුම ලබාදීම |
| **6** | ගොවි කාන්තා කණ්ඩායම් හරහා විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම | ව්‍යාපෘතීන්ට අදාළ ක්‍රියාකාරකම් |
| **7** | ප්‍රචාරක වැඩසටහන් සංවිධානය කිරීම | **7.1** අත්පත්‍රිකා/ පත්‍රිකා/පොත්පිංච සැකසීම<br>**7.2** රූපවාහිනී/ගුවන්විදුලි/ සඟරා/පුවත්පත්- දායකත්වය<br>**7.3** ක්ෂේත්‍ර දින සංවිධානය හා පැවැත්වීම<br>**7.4** ප්‍රදර්ශන සංවිධානය හා පැවැත්වීම<br>**7.5** කඳවුරු(camps)/සංග්‍රාම(Campaigns) සංවිධානය හා පැවැත්වීම |
| **8** | කෘෂිකර්මයේ නිරත කාන්තාවන්ගේ සංවර්ධනයට අදාළ දත්ත, තොරතුරු, නව තාක්ෂණයන් ජාතික මට්ටමින් රැස්කිරීම හා ව්‍යාපෘතියට දායකවීම | **8.1** ප්‍රගතිය විධිමත්ව අඛණ්ඩව, නියමිත දිනයට වාර්තා කිරීම |

කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහනට අදාළ වර්තමාන අරමුණු සහ කාර්යයන් පිළිබඳව සලකා බැලීමේ දී මුල් කාලීන අරමුණු හා කාර්යයන්ට බොහෝ සෙයින් සමාන වන නමුත් වර්තමානයට ගැළපෙන ලෙස යම් යම් සංශෝධන සිදු කර ඇති බව විද්‍යාමාන වේ. කාන්තාවන් සඳහා ආදායම් උත්පාදනය පමණක් නොව ඔවුන් සමාජීය, ආර්ථික හා දේශපාලනමය වශයෙන් සවිබල ගැන්වීම සඳහා අවශ්‍ය කාර්යයන් ඉටු කිරීමට ද අරමුණු කර ඇති බව පෙනී යයි.

එසේම, ප්‍රධාන කාර්යයන් අතරට ගොවි කාන්තා කණ්ඩායම් හරහා විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කරවීම ද නව කාර්යයක් ලෙසින් ඇතුළත් කර ඇත. මෙහි දී කාලීනව රජය විසින් ක්‍රියාත්මක කෙරෙන විශේෂ ව්‍යාපෘතීන්ට අදාළ කාර්යයන් ද ගොවි කාන්තා කණ්ඩායම් හරහා සිදුවන බව පැහැදිලි වේ.

## 2.5 ගොවි කාන්තා සංවිධාන (සමිති) ස්ථාපිත කිරීම

කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ දී එහි ප්‍රධානත ම කාර්යයන් වන්නේ, ග්‍රාමීය මට්ටමින් (ග්‍රාම සේවා වසම්) ගොවි කාන්තා සංවිධාන (සමිති) ස්ථාපිත කිරීමයි. ගොවි කාන්තා සංවිධාන ස්ථාපිත කිරීම මඟින් අරමුණු 06ක් ඉටුකරගැනීම අපේක්ෂා කෙරේ. එනම්,

**සාමාජිකයින් තුළ කෘෂිකාර්මික දැනුම හා කුසලතාව වර්ධනය කිරීම, කාන්තාව සවිබල ගැන්වීම, කෘෂිකර්මයට සම්බන්ධ විවිධ ස්වයං රැකියා ක්‍රියාකාරකම් මඟින් ව්‍යවසායකත්ව හැකියා වර්ධනය කිරීම, සංවිධානය හා සාමාජිකයින් තුළ ඉතිරි කිරීම් සහ ආයෝජන වැඩි කිරීම, නායකත්ව හැකියා වර්ධනය කිරීම සහ ඉහත කරුණු ව්‍යාප්ති සේවය මෙවලම් ලෙස ප්‍රයෝජනයට ගැනීම සහ අරමුණු ඉටු කර ගැනීමයි.**

**කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහන ප්‍රධාන වශයෙන් ම ක්‍රියාත්මක වන්නේ, ග්‍රාමීය මට්ටමින් ස්ථාපිත කෙරෙන මෙම ගොවි කාන්තා සමිති හරහා ය. ගොවි කාන්තා සංවිධාන තුළ අන්තර්ගත අරමුණු ඉටු කරගැනීම මඟින් කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහනෙහි පුළුල් අරමුණු සාක්ෂාත් කරගැනීමට මෙම වැඩසටහනෙ හි අපේක්ෂාව වේ.**

### 2.4.1 ගොවි කාන්තා සමිති සාමාජිකත්වය හා බල ප්‍රදේශය

**කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති ව්‍යවස්ථාව යනුවෙන් මේ සඳහා සකස් කෙරුණු ව්‍යවස්ථා මාලාවට අනුව ගොවි කාන්තා සමිති ස්ථාපිත කෙරෙන බල ප්‍රදේශය වන්නේ, ගම් මට්ටම හෝ ග්‍රාම සේවා මට්ටමයි. මෙම ග්‍රාමීය මට්ටමේ හෝ ග්‍රාම සේවා මට්ටමට අයත් බල ප්‍රදේශය තුළ එක් කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති සංවිධානයක් (සමිතියක්) පමණක් පිහිටුවිය හැකි බව ව්‍යවස්ථාවේ සඳහන් වේ. සාමාජිකත්වය පිළිබඳ සැලකීමේ දී සෑම කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති සංවිධානයක ම 15 දෙනෙකුට නොඅඩු සාමාජික සංඛ්‍යාවක් සිටිය යුතු වේ. වයස අවුරුදු 15ට වැඩි, බල ප්‍රදේශයේ පදිංචි කාන්තාවන්ට මෙම සමිතියට අයදුම් කළ හැකි අතර, සමිතියේ ලේකම්වරිය වෙත සාමාජික ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කළ හැකිය.**

**සාමාජික මුදලක් ලෙස මහා සභා රැස්වීමක දී 2/3කට වඩා වැඩි ඡන්දයෙන් නියම කෙරෙන මුදලක් එක් එක් සාමාජිකයා විසින් ගෙවිය යුතු ය. මාසික ගාස්තුවට අමතරව ඇතුළත් වීමේ ගාස්තුවක් ද අය කරගැනීමේ හැකියාව ඇත (කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති ව්‍යවස්ථාව).**

### 2.4.2 නිලධාරී මණ්ඩලය හා කාරක සභාව

සංවිධානයේ අනුශාසක ලෙස නිල බලයෙන් එම ප්‍රදේශයේ කෘෂිකර්ම උපදේශක/උපදේශිකා පත් වේ. වාර්ෂික මහා සභා රැස්වීමක දී වැඩි ඡන්දයෙන් තෝරා ගන්නා ලද සාමාජිකාවන් 09 දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවක්, කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති සමිතියේ කාරකසභාව ලෙස තේරී පත් වේ. පිරිමි සාමාජිකයින්ට කාරකසභාවට තේරී පත්වීමට හිමිකමක් නැත.

### 2.4.3 සමිතියේ අරමුදල්

කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති සංවිධානයේ අරමුදල්, කොටස් කිහිපයකින් සමන්විත වේ. එනම්, සාමාජික මුදල් මහජනයාගේ හා පුද්ගලික සංවිධානවලින් ලැබෙන පරිත්‍යාග මුදල්, රාජ්‍ය, රාජ්‍ය සංස්ථා, රාජ්‍ය නොවන සංවිධානවලින් ලැබෙන ආධාර මුදල් සහ සංවිධානයේ අනෙකුත් කටයුතුවලින් උපයාගන්නා මුදල් වශයෙනි.

මෙම අරමුදල් පරිහරණය, තැන්පත් කිරීම සම්බන්ධයෙන් පවතින ක්‍රමය වන්නේ, කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති සමිතිය සතු අරමුදල් තැපැල් කාර්යාලයෙන් හෝ බැංකු ගිණුමක තැන්පත් කර එදිනෙදා කටයුතු සඳහා වැය කිරීමට රු. 100/=ට නොවැඩි මුදලක් භාණ්ඩාගාරික වෙත ගැනීමයි. කාරකසභාව හෝ මහා සභාව විසින් තීරණය කරන කටයුතු සඳහා වැය කිරීමට මුදල් ආපසු ලබාගැනීමේ දී සභාපති, ලේකම් හා භාණ්ඩාගාරික යන අයගෙන් දෙදෙනෙකුගේ අත්සන් අවශ්‍ය වේ. මුදල් ගැනීමේ දී ඒ පිළිබඳ අදාළ කෘෂිකර්ම උපදේශක දැනුවත් වීම අනිවාර්ය වේ (කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති ව්‍යවස්ථාව).

### 2.4.4 සමිතිය ලියාපදිංචි කිරීම

සියලු ම කාන්තා සංවිධාන ලියාපදිංචි කිරීම සඳහා දිස්ත්‍රික්කයේ විෂයභාර නිලධාරී (කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති) වෙත අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ය. මේ සඳහා සෑම කාන්තා සමිතියක් ම, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ උපදේශක මහතුන්ගේ/මහත්මීන්ගේ මඟපෙන්වීම යටතේ යටත් පිරිසෙයින් මාස 06ක් වත් අඛණ්ඩව පවත්වා ඇති බවට ප්‍රමාණවත් සාක්ෂි තිබිය යුතු අතර සියලු ම සාමාජිකාවන් ව්‍යාපෘතිවලට සම්බන්ධ වී තිබීමත්, වැඩසටහන් ක්‍රියාත්මක කර තිබෙන බවට

වාර්තා ඉදිරිපත් කළ හැකිවීමත් සහ මාස 06ක් තුළ අයවැය ලේඛන ගණන් පරීක්ෂක මහතුන් විසින් අනුමත කර තිබීමත් අවශ්‍ය වේ.

එම අවශ්‍යතා සම්පූර්ණ කර ඇති අයදුම්පත් කාන්තා ව්‍යාප්ති නිලධාරියා විසින් නිර්දේශ කර කලාපීය සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ මඟින් ලියාපදිංචිය සඳහා දිස්ත්‍රික් නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (ව්‍යාප්ති) වෙත ඉදිරිපත් කරනු ලබයි. දිස්ත්‍රික් නියෝජ්‍ය අධ්‍යක්ෂකගේ අනුමැතිය ලැබීමෙන් අනතුරුව එක් අයදුම්පත්‍රයක් ගොවි කාන්තා සංවිධානයේ ලේකම් වෙත යැවෙන අතර, අනෙක් අයදුම්පත සෘජුව ම පේරාදෙණිය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති හා පුහුණු අංශයේ සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ, කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති මූලස්ථානය වෙත යොමු කරනු ලබයි. කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති මූලස්ථානය මඟින් එම සංවිධානය ලියාපදිංචි කර ඒ සඳහා අංකයක් ලබා දී එය ලිඛිතව කාන්තා සංවිධානය හා අදාළ නිලධාරීන් වෙත දන්වනු ලබයි. කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති සංවිධානවල අරමුණුවලට පරිබාහිරව සහ ඊට අනුකූලව ක්‍රියාත්මක නොවන්නේ නම් අදාළ ගොවි කාන්තා සංවිධානයේ ලියාපදිංචිය අවලංගු කිරීමට දිස්ත්‍රික් නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (ව්‍යාප්ති) ට බලය ඇත (කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති සංවිධාන ව්‍යවස්ථාව).

### 2.4.5 ක්‍රියාත්මක වැඩසටහන්

එක් එක් ගොවි කාන්තා සමිති විසින් තම අරමුණුවලට අනුකූලව සහ කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහනෙ හි අරමුණුවලට ද අදාළ වන පරිදි වාර්ෂික වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතුය. වෙනත් කටයුතු අතර මෙම වැඩසටහන් කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරීන්ගේ මඟපෙන්වීම යටතේ ක්‍රියාත්මක කළ යුතු ය. ඒ අනුව, අධ්‍යාපනික වැඩසටහන් (දේශන, ප්‍රායෝගික පුහුණු, වැඩමුළු යනාදිය), තිරසාර ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම (සාර්ථක ව්‍යාපෘති තේරීමේ තරඟ යනාදිය), ප්‍රජා සංවර්ධන කටයුතු (ශ්‍රමදාන, පවුල් පෝෂණය, ගෘහාශ්‍රිත ස්වයං රැකියා පිළිබඳ දැනුවත් කිරීමේ සංග්‍රාම, පරිසර සංරක්ෂණ කටයුතු යනාදිය), සංස්කෘතික වැඩසටහන් (අවුරුදු උත්සව, ආගමික උත්සව, ක්‍රීඩා උත්සව) ප්‍රදර්ශන, රැලි හා සංග්‍රාම (ජාත්‍යන්තර කාන්තා දිනය, ලෝක කාන්තා දිනය, ග්‍රාමීය කාන්තා දිනය, ජගත් ළමා දිනය යනාදිය) සහ සාමාජිකයින්ගේ නිපුණතා හා කුසලතා අගය කිරීමේ දින යනාදි යයි (කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති සංවිධාන ව්‍යවස්ථාව).

### 2.4.6 කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහන/ගොවිකාන්තා සමිති ස්ථාපිත කර ඇති ආකාරය

කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහන, පළාත් සහ අන්තර් පළාත් යන කෘෂිකර්ම බල ප්‍රදේශයන් දෙකටම අයත් දිස්ත්‍රික්ක තුළ ක්‍රියාත්මක වේ. එනම් පළාත් සභා දිස්ත්‍රික්ක 20ක සහ අන්තර් පළාත් දිස්ත්‍රික්ක 06ක (අම්පාර, අනුරාධපුරය, පොළොන්නරුව, හම්බන්තොට, මොණරාගල, මහනුවර-හසලක) වශයෙනි. වගු සටහන් අංක 2.1 මඟින් දැක්වෙන්නේ දැනට ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික් මට්ටමින් ස්ථාපිත වී ඇති ගොවි කාන්තා සමිති සංඛ්‍යාව වේ (සැ.යු. පළාත් සහ අන්තර් පළාත් යන බල ප්‍රදේශයන් දෙකටම අයත් ගොවි කාන්තා සංවිධාන මෙම සංඛ්‍යාවලින් පිළිබිඹු වේ).

වගු සටහන් අංක 2.1: දිස්ත්‍රික් මට්ටමින් ස්ථාපිත ගොවි කාන්තා සමිති

| දිස්ත්‍රික්කය | සමිති සංඛ්‍යාව |
|---|---|
| ගම්පහ | 14 |
| මඩකලපුව | 19 |
| මොණරාගල (පළාත්/අන්තර් පළාත්) | 36 |
| ගාල්ල | 79 |
| මහනුවර | 13 |
| පුත්තලම | 42 |
| කුරුණෑගල | 124 |
| අනුරාධපුරය (පළාත්/අන්තර් පළාත්) | 63 |
| අම්පාර | 03 |
| මාතර | 06 |
| කොළඹ | 08 |
| හම්බන්තොට | 20 |
| මහනුවර (අන්තර් පළාත්) හසලක | 11 |
| මන්නාරම | 10 |
| පොළොන්නරුව | 07 |
| නුවරඑළිය | 04 |

මූලාශ්‍රය: කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති මූලස්ථාන වාර්තා, 2014

සැ.යු. ක්ෂේත්‍ර සමීක්ෂණය සිදු කරන අවස්ථාවේ කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති මූලස්ථානයේ පැවති ලේඛනයන් අනුව මෙය සකස් කෙරිණි. නව ලියාපදිංචි කිරීම් හා වෙනස්වීම් සොයා බලා මෙම සංඛ්‍යාවන් යාවත්කාලීන කිරීම සිදු කෙරෙමින් පවතින බැවින් ඉදිරියේ දී මෙම සංඛ්‍යාවන් වෙනස් විය හැකිය.

## තුන්වැනි පරිච්ඡේදය

## ප්‍රතිඵල හා සාකච්ඡා

## අධ්‍යයන නියැදියේ සමාජ-ආර්ථික ලක්ෂණ

### 3.1 හැඳින්වීම

අධ්‍යයනයේ ක්ෂේත්‍ර සමීක්ෂණයට සහභාගී වූ ගොවි කාන්තා සාමාජිකාවන්ගේ වයස් මට්ටම්, තත්ත්වය, රැකියාව, ආදායම් මට්ටම්, ඉඩම් භුක්තිය හා නිවාසයන්හි තත්ත්වය වැනි සමාජ-ආර්ථික ලක්ෂණ පිළිබඳව මෙම පරිච්ඡේදය මඟින් සංක්ෂිප්ත විමර්ශනයකට ලක් කෙරේ.

### 3.2 ගොවි කාන්තාවන්ගේ සමාජ-ආර්ථික තොරතුරු

අධ්‍යයනයට සහභාගී වූ සමිති සාමාජිකාවන්ගේ පවුල් පසුබිම පිළිබඳ විමර්ශනය කිරීමේ දී සමස්ත නියැදියෙන් (325), අඩු ආදායම්ලාභී පවුල් සඳහා රජයෙන් ලබාදෙන සමෘද්ධි ප්‍රතිලාභයට හිමිකම් කියූ පවුල්වලට අයත් වූවන් හමුවූයේ 24%කි. එසේම නියැදියට අයත් කාන්තාවන්ගෙන් 90%ක් විවාහ වී සිටි අතර ඉතිරි 10% වැන්දඹු/අවිවාහක/විවාහක පුරුෂයාගෙන් වෙන්ව තනිව ජීවත් වන්නෝ වෙති.

වයස් කාණ්ඩ සැලකීමේ දී බහුතර පිරිස (83%) මැදි වයස/ මැදි වයසට ළඟාවූවන් වන අතර තරුණ කාන්තාවන්ගේ සහභාගීත්වය සාපේක්ෂව අඩුය (7%). එසේම වැඩි දෙනෙකු (45%) සාමාන්‍ය පෙළ සමතුන් වන අතර උසස් පෙළ සමත් වූවන් ද නියැදිය තුළ 28%ක් සිටින අතර ස්වයං රැකියාවක නියුක්ත වීමට සුදුසු අධ්‍යාපන මට්ටමක් හා පවුලේ ශ්‍රමය ලබාගත හැකි පවුල් පසුබිමක් ද සහිත වූවෝ වෙති.

රැකියා නියුක්තිය සැලකීමේ දී සාමාජිකාවන්ගෙන් 72%ක් (233) ගෘහයේ කාර්යයන් ද සමඟින් කුමන හෝ ආදායම් උත්පාදන ක්‍රියාවක නියුක්ත වී සිටියහ. එම සංඛ්‍යාව පළාත් සහ අන්තර් පළාත් දිස්ත්‍රික්කයන්ට බෙදී පැවතියේ පිළිවෙළින් 63% (147දෙනෙකු) සහ 37% (86 දෙනෙකු) වශයෙනි. නියැදියෙන් 70%කගේ ම(38%+14%+18%) මුළු මාසික ආදායම රු. 10,000 හෝ ඊට අඩු වුවත් තම පවුලේ ප්‍රධාන ආදායමට දායකත්වයක් ලබාදීමේ හැකියාව ඔවුන් සතුවීම ඔවුන්ගේ පවුල්වල සමාජීය ප්‍රවර්ධනයට ප්‍රබල හේතුවක් වී ඇත. සමස්තයක් ලෙස සැලකීමේ දී නියැදියට අයත් සාමාජිකාවන් බහුතරයක් මධ්‍යස්ථ වූ සමාජීය හා ආර්ථික මට්ටමක් සහිත ජීවන රටාවකට හිමිකම් කියන්නන් බව පැහැදිලි වේ (වගු සටහන් අංක 3.1).

වගු සටහන් අංක 3.1: ගොවි කාන්තා සාමාජිකාවන්ගේ සමාජ-ආර්ථික ලක්ෂණ

| සමාජ-ආර්ථික ලක්ෂණ | ගොවි කාන්තා සාමාජිකාවන්ගේ ප්‍රතිශතය % | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | පළාත් දිස්ත්‍රික්ක | | | අන්තර් පළාත් දිස්ත්‍රික්ක | | | සමස්ත නියැදිය දිස්ත්‍රික්ක N=325 |
| | කුරුණෑගල දිස්ත්‍රික්ක N=163 | මොණරාගල දිස්ත්‍රික්ක N=39 | එකතුව N=202 | අනුරාධපුර දිස්ත්‍රික්ක N=91 | මහනුවර N=32 | එකතුව N=12 3 | |
| වයස් කාණ්ඩය (අවුරුදු) | | | | | | | |
| 30ට අඩු | 04 | 10 | 05 | 08 | 13 | 09 | 07 |
| 30-40 අතර | 20 | 21 | 20 | 33 | 34 | 33 | 25 |
| 40-50 අතර | 30 | 36 | 31 | 25 | 31 | 27 | 29 |
| 50-60 අතර | 33 | 30 | 33 | 26 | 09 | 22 | 29 |
| 60ට වැඩි | 13 | 03 | 11 | 08 | 13 | 09 | 10 |
| විවාහක/අවිවාහක බව | | | | | | | |
| විවාහක | 90 | 95 | 91 | 89 | 94 | 90 | 90 |
| වැන්දඹු | 08 | 0.0 | 06 | 08 | 0.0 | 06 | 06 |
| තනිව/වෙන්ව ජීවත් වන | 02 | 05 | 03 | 03 | 06 | 04 | 04 |
| අධ්‍යාපන මට්ටම | | | | | | | |
| පාසැල් නොගිය | 0.0 | 0.0 | 0.0 | 3 | 0.0 | 02 | 01 |
| ප්‍රාථමික අධ්‍යාපනය ලද (1-5) | 06 | 05 | 06 | 10 | 03 | 08 | 07 |
| ද්විතියික අධ්‍යාපනය ලද (6-10) | 10 | 26 | 13 | 25 | 19 | 24 | 17 |
| අ.පො.ස. (සා.පෙළ)සමත් | 40 | 46 | 41 | 50 | 59 | 52 | 45 |
| අ.පො.ස. (උ.පෙළ)සමත් | 42 | 18 | 37 | 12 | 19 | 14 | 28 |
| උපාධි/ඩිප්ලෝමා | 02 | 05 | 03 | 0.0 | 0.0 | 0.0 | 02 |
| ප්‍රධාන රැකියාව | | | | | | | |
| ස්වයං රැකියා | 53 | 55 | 53 | 43 | 20 | 40 | 48 |
| ගොවිතැන හා සත්ව පාලනය | 30 | 40 | 33 | 46 | 67 | 49 | 38 |
| රාජ්‍ය හා පෞද්ගලික අංශයේ රැකියා | 14 | 0.0 | 11 | 10 | 0.0 | 08 | 10 |
| කම්කරු (කෘෂි/කෘෂිකාර්මික නොවන) | 03 | 05 | 03 | 01 | 13 | 03 | 04 |
| සාමාජිකාවන්ගේ මාසික ආදායම (රු.) | | | | | | | |
| 2,500ට අඩු | 39 | 31 | 37 | 29 | 72 | 40 | 38 |
| 2,500 -5,000 | 13 | 21 | 15 | 15 | 03 | 12 | 14 |
| 5,000-10,000 | 14 | 41 | 19 | 14 | 19 | 15 | 18 |
| 10,000-15,000 | 15 | 05 | 13 | 19 | 0.0 | 14 | 13 |
| 15,000ට වැඩි | 19 | 02 | 16 | 23 | 06 | 19 | 17 |
| සමිති සාමාජිකයෙකුව සිටි කාලය (වසර) | | | | | | | |
| 1ට අඩු | 20 | 15 | 19 | 10 | 50 | 20 | 20 |
| 1-3 | 42 | 15 | 37 | 24 | 19 | 23 | 31 |
| 3-5 | 15 | 08 | 13 | 22 | 03 | 17 | 15 |
| 5-7 | 12 | 49 | 19 | 23 | 09 | 20 | 19 |
| වසර 7ට වැඩි | 11 | 13 | 12 | 21 | 19 | 20 | 15 |

මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත, 2014

### 3.2.1 ඉඩම් භුක්තිය හා නිවාසයන් හි තත්ත්වය

ගොවි කාන්තා සමිති සාමාජිකාවන්ගේ ඉඩම් භුක්තිය සහ නිවාසයන් හි තත්ත්වය ඔවුන්ගේ සමාජ-ආර්ථික පසුබිම පිළිබිඹු කෙරෙන විශේෂ නිර්ණායකයකි. ඒ අනුව අධ්‍යයනයට ලක් වූ සමස්ත ගොවි කාන්තාවන්ගෙන් 95% (සාමාජිකාවන් 308)ට තම පවුලට අයත් ගොඩ ඉඩමක් පැවති අතර 55% (සාමාජිකාවන් 179)ට මඩ ඉඩම් පැවතුණි.එම පිරිසෙන් 82% ට තම පවුලට අයත්මඩ ඉඩම් පිළිබඳ නිරවුල් අයිතිය පැවති අතර, 13%ක් බදු ක්‍රමයටත් 6%ක් හවුල් ක්‍රමයටත් මඩ ඉඩම් වගා කරන බව අධ්‍යයනයෙන් අනාවරණය විය.

සමිති සාමාජිකාවන්ගේ පවුල්වලට අයත් ගොඩ සහ මඩ ඉඩම් ප්‍රමාණයන් පිළිබඳ විග්‍රහ කිරීමේ දී, බහුතරයක්(68%) අයත් වන්නේ, අක්කර 0.5 සිට අක්කර 2 අතර ප්‍රමාණයක් අයිති පවුල්වලට වන අතර මඩ ඉඩම් හිමි පවුල්වලට අයත් ගොවි කාන්තාවන් 66%ක් අයත් වන්නේ, මඩ ඉඩම් අක්කර 0.5 සිට අක්කර 2 අතර ප්‍රමාණයක් අයත් වන පවුල්වලට ය.

සමීක්ෂණ දත්තවලට අනුව අධ්‍යයනයට සහභාගී වූ කාන්තාවන්ගෙන් 95%ක්ම ඔවුන්ගේ පවුලට අයත් නිවාස පැවති අතර ඒවා උළු/ඇස්බැස්ටෝස් වහලය සහ ගඩොලින් නිම කළ ස්ථිර නිවාස විය. රූපවාහිනී, කැසට් රෙකෝඩර්, ශීතකරණ වැනි සුඛෝපභෝගී භාණ්ඩ සහ දුරකතන (ජංගම හා රැහැන් සහිත දුරකතන) පහසුකම් සහිත පවුල්වලට අයත් කාන්තාවන් ප්‍රමාණය 88%ක් වූ අතර සමස්ත නියැදියෙන් 71%ක් ප්‍රතිචාර දැක්වූයේ තම නිවසේ යතුරු පැදියක් පවතින බවයි. නිවසේ ත්‍රී වීලයක් පවතින බවට 14%ක් ප්‍රතිචාර දැක්වූහ.

## සිව්වැනි පරිච්ඡේදය

# ගොවි කාන්තා සමිතිවල ක්‍රියාකාරීත්වය සහ එහි වර්තමාන තත්ත්වය

## 4.1 හැඳින්වීම

කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහනෙ හි මූලික කාර්යයක් වන්නේ, ග්‍රාම සේවා වසම් මට්ටමින් ගොවි කාන්තා සමිති ස්ථාපිත කර ක්‍රියාත්මක කිරීමයි. මේ හරහා කාන්තාවන් ඒකරාශී කරගැනීම, ඔවුන්ට පුහුණුවීම් ලබාදීම, පුහුණුවීම් හරහා ව්‍යවසායකත්ව වැඩසටහන් ක්‍රියාත්මක කරවීම, ආහාර හා පෝෂණය, පෝෂණීය ගෙවත්ත වැනි කාර්යයන් ද එසේ ම අවසානයේ කාන්තාවන්ගේ ජීවන තත්ත්වය උසස් තලයක් කරා මෙහෙයවීමත් ඔවුන් සමාජීය, ආර්ථික වශයෙන් සවිබල ගැන්වීමත් යන අරමුණු ඉටු කරගැනීම ගොවි කාන්තා සමිති හරහා සිදු කෙරේ. ඒ අනුව, ගොවි කාන්තා සමිති පිළිබඳ වර්තමාන තත්ත්වය, එහි ක්‍රියාකාරීත්වය සහ කාන්තාවන් එයට සම්බන්ධ වී ඇත්තේ කුමන අරමුණකින් ද හා ඔවුන් ඒ සඳහා යොමු වීමට බලපෑ හේතු කවරේ ද යන්න පිළිබඳව මෙම පරිච්ඡේදයෙන් විග්‍රහ කෙරේ.

## 4.2 ගොවි කාන්තා සමිති ස්ථාපිත කිරීම


අධ්‍යයනය සඳහා තොරතුරු ලබාගැනීමට උපයෝගී කරගත් ගොවි කාන්තා සමිතිවලට අයත් තෝරා ගනු ලැබූ ගොවි කාන්තා සාමාජිකාවන් සඳහන් කළ පරිදි ඔවුන් සම්බන්ධ වී සිටින ගොවි කාන්තා සමිති ආරම්භ කළ වර්ෂයන් වගු සටහන් අංක 4.1න් දැක්වේ.

වගු සටහන් අංක **4.1:** ගොවි කාන්තා සමිති ආරම්භ කළ වර්ෂයන් හි ව්‍යාප්තිය

| වර්ෂය | පළාත් දිස්ත්‍රික්ක | | | | එකතුව | | අන්තර් පළාත් දිස්ත්‍රික්ක | | | | එකතුව | | සමස්ත එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | කුරුණෑගල | | මොණරාගල | | | | අනුරාධපුරය | | මහනුවර | | | | | |
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| **1990-1995** | **03** | **2** | **0** | **0.0** | **03** | **1** | **0** | **0.0** | **0** | **0.0** | **0** | **0.0** | **03** | **1** |
| **1996-2001** | **02** | **1** | **05** | **13** | **07** | **4** | **01** | **01** | **0** | **0.0** | **01** | **1** | **08** | **2** |
| **2002-2007** | **24** | **15** | **01** | **2** | **25** | **12** | **39** | **43** | **09** | **28** | **48** | **39** | **73** | **23** |
| **2008-2013** | **129** | **79** | **33** | **85** | **162** | **81** | **51** | **56** | **12** | **38** | **63** | **51** | **225** | **69** |
| **2014** | **05** | **3** | **0** | **0.0** | **05** | **2** | **0** | **0.0** | **11** | **34** | **11** | **9** | **16** | **5** |
| එකතුව | **163** | **100.0** | **39** | **100.0** | **202** | **100** | **91** | **100.0** | **32** | **100** | **123** | **100.0** | **325** | **100.0** |

**මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2014**

වසර 15ක් වැනි කාලයක් ආපස්සට සලකා බැලීමේ දී ගොවි කාන්තා සමිති වැඩි ප්‍රමාණයක් ස්ථාපිත වී ඇත්තේ, 2008-2013 අතර වර්ෂයන්හි වේ. සමස්ත නියැදියෙන් 69%ක් ඒ බව සඳහන් කර ඇත. ප්‍රස්තාර අංක 4.1 න් දැක්වෙන්නේ පළාත් සහ අන්තර් පළාත් වශයෙන් සමිති ආරම්භ කළ වර්ෂයන් හි ව්‍යාප්තිය වේ. ඒ අනුව ද සමිති වැඩි ප්‍රමාණයක් ආරම්භ කර ඇත්තේ 2008-2013 අතර වර්ෂයන් හි වේ.




**ප්‍රස්තාර අංක 4.1:ගොවි කාන්තා සමිති ආරම්භ කළ වර්ෂයන් හි ව්‍යාප්තිය**

**මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2014**

**මෙම තත්ත්වයට හේතු විමසීමේ දී අනාවරණය වූ පරිදි සාමාන්‍යයෙන් ගොවි කාන්තා සමිති ස්ථාපිත වීමටත්, එම සමිති සක්‍රීය මට්ටමින් පවත්වා ගැනීමටත් කාලීනව රජයන් විසින් දියත් කරන විශේෂ ව්‍යාපෘති හේතුපාදක වන බව ගොවි කාන්තා සමිතිවලට අදාළ නිලධාරීන් හා කෙරුණු සාකච්ඡා තුළදී ගම්‍ය විය. ඒ අනුව 2007-2008 වැනි කාල පරිච්ඡේදයන් හි සහ ඊට පසුකාලීනව ගොවි කාන්තා සමිති වැඩි වශයෙන් ස්ථාපිත වීමට ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වූ දිවි ව්‍යාප්ත ආහාර ප්‍රවර්ධන වැඩසටහන හේතු පාදක වී ඇත.**

### 4.2.1 සාමාජිකාවන් තෝරා ගැනීමේ දී බලපාන නිර්ණායක

**සමිති පවත්වාගෙන යනු ලබන කෘෂිකර්ම උපදේශක මහතුන්ගේ සාකච්ඡාවල දී පැහැදිලි වූ පරිදි, ගොවි කාන්තා සමිතිවල අරමුණුවලට අදාළව පහත සඳහන් නිර්ණායක පිළිබඳ අවධානය යොමු කරමින් කාන්තාවන් ගොවි සමිති සඳහා තෝරාගෙන ඇත.**

1. **කෘෂිකාර්මික පවුලකට අයත්වීම(පසුව අරමුණු පුළුල් වීමත් සමඟ සමිති සඳහා සම්බන්ධ වීමට කැමැත්තක් ඇති සියලු කාන්තාවන්ට මේ සඳහා සහභාගීවීමට හැකියාව ලැබී ඇත)**
2. **ක්‍රියාකාරීව කටයුතු කිරීමට අමතර කාලයක් පැවතීම**
3. **කැමැත්ත සහ උනන්දුව පැවතීම**
4. **ව්‍යවසායකත්ව කටයුතු කිරීමට පසුබිමක් හා හැකියාවක් පැවතීම**

නමුත් අධ්‍යයනය අනුව වර්තමානයේ ගොවි කාන්තා සමිති සඳහා කාන්තාවන් යොමුවීමට බලපෑ නිර්ණායක ගොවි කාන්තාවන් විසින් සඳහන් කළ පරිදි පහත වගුවෙන් පැහැදිලි කෙරේ.

වගු සටහන් අංක 4.2: සමිති සඳහා තෝරාගැනීමට හේතු වූ නිර්ණායක

| | කරුණු | සාමාජික සංඛ්‍යාව | ප්‍රතිශතය % |
|---|---|---|---|
| 01 | බාහිර කාර්යයන්ට යොමුවීමට අවශ්‍ය කාලය ප්‍රමාණවත්ව පැවතීම | 117 | 36.0 |
| 02 | කෘෂිකාර්මික පවුලකට අයත්වීම | 100 | 30.0 |
| 03 | නිලධාරීන්ගේ දැනුවත් කිරීම | 07 | 22.0 |
| 04 | ස්වයං රැකියා සිදු කිරීමට කැමැත්තක් පැවතීම | 31 | 10.0 |
| 05 | කණ්ඩායම් සාමාජික සංඛ්‍යාව සම්පූර්ණ කරගැනීමේ අවශ්‍යතාවය | 06 | 2.0 |
| | එකතුව | 325 | 100.0 |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2014

වගුසටහන් අංක 4.2ට අනුව ගොවි කාන්තා සමිති සඳහා සහභාගීවීමට බලපෑ නිර්ණායකයක් වූ කෘෂිකාර්මික පවුලකට අයත්වීමට, වඩා නිවසේ කාර්යයන්ට පරිබාහිරව යම් කටයුත්තක නියැළීමට අමතර කාලය පවතින කාන්තාවන්ට මේ සඳහා සම්බන්ධ වීමේ හැකියාව වැඩි වී ඇති බව පෙනී යන්නේ, බාහිර කාර්යයන්ට යොමුවීමට කාලය පැවතීම යන නිර්ණායකය සමස්ත නියැදියට අයත් කාන්තාවන්ගෙන් 36% සඳහන් කිරීමෙනි. කෘෂිකාර්මික පවුලකට අයත්වීම දෙවැනි කාරණය බවට පත් වී ඇත. මෙයට බලපෑ තවත් හේතුවක් ලෙස නිලධාරීන් සඳහන් කළේ, මුල් කාලීන අරමුණුවලට වඩා වර්තමානයේ අරමුණු පුළුල්වීම මත මෙයට සම්බන්ධ වීමට කෘෂිකාර්මික පවුලකට ම අයත්වීම අත්‍යවශ්‍ය නොවීමයි. ඒ අනුව බල ප්‍රදේශය තුළ හැකියාව, කැමැත්ත ඇති සියලු කාන්තාවන්ට ගොවි කාන්තා සමිති සඳහා සහභාගීවීමට වීමට අවස්ථාව ලැබී ඇත.

කිසිදු අරමුණක් හෝ ලැබෙන ප්‍රතිලාභයක් පිළිබඳව හෝ නොදැන සමිතියේ සාමාජික සංඛ්‍යාව සම්පූර්ණ කරගැනීමට පමණක් සම්බන්ධ වූ සුළු පිරිසක් (2%) ද අධ්‍යයනයේ දී හමු විය. ඔවුන් ගොවි කාන්තා සමිතියට සම්බන්ධ වීමේ දී තත්ත්වය එසේ වුවද පසුකාලීනව ගොවි කාන්තා සමිතිවලින් විවිධ ප්‍රතිලාභ ලබාගත් බව ද ඔවුන් විසින්ම සඳහන් කරන ලදී.

### 4.2.2 ගොවි කාන්තා සමිතිය පිහිටුවීමේ අරමුණු

කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහන මඟින් ග්‍රාමීය මට්ටමින් ගොවි කාන්තා සමිති ස්ථාපිත කිරීමේ ප්‍රධාන අරමුණු 4කි.

1. සමිතිවල සාමාජිකාවන් ව්‍යවසායකයින් ලෙස පුහුණු කිරීම
2. ඒ මඟින් යම් ආදායම් උත්පාදන කාර්යයක නිරත කරවීම
3. එසේම ඔවුන්ගේ පවුලේ ජීවන තත්ත්වය නඟා සිටුවීම
4. අවසන කාන්තාව ආර්ථික හා සමාජීය වශයෙන් බලගැන්වීම වශයෙනි.


කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහනෙ හි පුළුල් අරමුණු එසේ වන අතර අධ්‍යයනයට සහභාගී වූ කාන්තාවන් ද මෙම වැඩසටහනෙහි ප්‍රධාන අරමුණු ඔවුන් අවබෝධ කරගත් ආකාරයට සහ නිලධාරීන්ගේ දැනුවත් කිරීම මත මෙන්ම ස්වකීය කැමැත්ත මත විවිධ වූ අරමුණු ඉටු කරගැනීමේ අභිලාශයෙන් ගොවි කාන්තා සමිති ස්ථාපිත කරගෙන ඇත.

තමන් වෙසෙන ග්‍රාමය තුළ ගොවි කාන්තා සමිතියක් පිහිටුවාගනිමින් එයින් ඉටු කරගැනීමට අපේක්ෂා කළ අරමුණු පිළිබඳ ඔවුන් දැක් වූ අදහස් **4.3** වගු සටහනින් ඉදිරිපත් කර ඇත.

වගු සටහන් අංක **4.3 :** තමන් අයත් සමිතිය ආරම්භ කිරීමට හේතු වූ අරමුණු

| | අරමුණු | පළාත් දිස්ත්‍රික්ක | | | | එකතුව | | අන්තර් පළාත් දිස්ත්‍රික්ක | | | | එකතුව | | සමස්ත එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | කුරුණෑගල | | මොණරාගල | | | | අ' පුරය | | මහනුවර | | | | | |
| | | සංඛ්‍යව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| **01** | ගෙවතු වගා වැඩසටහන | **60** | **37** | **29** | **74** | **89** | **44** | **52** | **57** | **29** | **91** | **81** | **66** | **170** | **52** |
| **02** | කෘෂි ව්‍යවසායකත්ව සංවර්ධනය | **87** | **53** | **05** | **13** | **92** | **46** | **18** | **20** | **03** | **9** | **21** | **17** | **113** | **35** |
| **03** | පවුලේ ආහාර පද්ධතිය හා පෝෂණය දියුණු කිරීම | **11** | **6** | **04** | **10** | **15** | **8** | **10** | **11** | **0** | **0.0** | **10** | **8** | **25** | **8** |
| **04** | චක්‍රීය අරමුදලක් ඇති කරගැනීම | **04** | **3** | **0** | **0.0** | **04** | **1** | **09** | **10** | **0** | **0.0** | **09** | **7** | **13** | **4** |
| **05** | සහන ක්‍රමයට කෘෂි බීජ ලබාගැනීම සඳහා | **01** | **1** | **01** | **3** | **02** | **1** | **02** | **02** | **0** | **0.0** | **02** | **2** | **04** | **1** |
| | එකතුව | **163** | **100.0** | **39** | **100.0** | **202** | **100** | **91** | **100.0** | **32** | **100** | **123** | **100.0** | **325** | **100.0** |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2014




**ප්‍රස්තාර අංක 4.2: පළාත් සහ අන්තර් පළාත් මට්ටමේ දී ගොවි කාන්තා සමිති ස්ථාපිත කිරීමේ අරමුණු**

**මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2014**

**අධ්‍යයනයට සහභාගී වූ ගොවි කාන්තාවන්ගෙන් 52%ක් ගෙවතු වගා වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා තම සමිතිය ආරම්භ කළ බව සඳහන් කර ඇත. එසේම 35%ක් සඳහන් කළේ, සාමාජිකාවන්ට කෘෂිකාර්මික ව්‍යවසායක කටයුත්තක් ආරම්භ කිරීමේ පදනම සකසා ගැනීම සඳහා තම සමිතිය ස්ථාපිත කළ බවයි. පළාත් සහ අන්තර් පළාත් මට්ටමින් සැලකීමේ දි ද මෙම අරමුණුවල කැපීපෙනෙන වෙනස්කමක් නොපෙන්වයි (ප්‍රස්තාර අංක 4.2).**

**සමිතිවලින් බහුතරයක් වර්ෂ 2008-2013 අතර ආරම්භ වී ඇති අතර, මෙම කාලය තුළ රට තුළ දියත් කෙරුණු රජයේ ආහාර ප්‍රවර්ධන වැඩසටහන (අපි වවමු-රට නගමු) හා සමගාමීව ගෙවතු වගා සංවර්ධන වැඩසටහන මූලික වූ බැවින් ඒ සඳහා ගොවි කාන්තාවන්ගේ ඒකරාශී වීම මඟින් ගොවි කාන්තා සමිති ස්ථාපිත වී ඇත. මෙහි දී කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහන ස්ථාපිත කිරීමේ ප්‍රධාන අරමුණු ගෙවතු වගා සංවර්ධනය හරහා ඉටු වී ඇති බව පැහැදිලි වේ. එසේම ගොවි කාන්තාවන් සඳහන් කළ පරිදි ව්‍යවසායකත්ව කාර්යයන් ආරම්භ කිරීම ද මේ හරහා සිදු වී ඇත. ගෙවතු වගා සංවර්ධනය යන පුළුල් මාතෘකාව යටතේ, ව්‍යවසායකත්ව හැකියාව දියුණු කිරීමත්,**

වස විසෙන් තොර අලුත් එළවළු පලතුරු පරිභෝජනය කිරීමේ හැකියාව ලැබීමෙන් පවුලේ ආහාර පද්ධතිය හා පෝෂණය දියුණු කිරීමත්, එසේම ආදායම් උත්පාදනයක් ඇතිවීමත්, මෙම කාර්යයන් කිරීම සඳහා චක්‍රීය අරමුදලක් ඇති කරගැනීම හරහා එම ව්‍යවසායන් හි තිරසාරත්වයට ද යම් බලපෑමක් කිරීමට උත්සාහ දරා තිබීමත් මඟින් කාන්තාවන්ගේ පවුලේ ජීවන තත්ත්වය නඟා සිටුවීමේ අරමුණත් ගෙවතුවගා වැඩසටහන මඟින් යම් ආදායමක් උපයන්නේ නම් එය ඔවුන්ගේ පවුලේ මුළු ආදායමට දායකත්වයක් සැපයීමත් සිදු වන බව පැහැදිලි වේ.

බොහෝ කාන්තාවන් ගෙවතු වගා වැඩසටහනට සමගාමීව මල් හා විසිතුරු පත්‍ර වගාව සිදු කරන බව ද අධ්‍යයනයේ දී නිරීක්ෂණය කළ හැකි විය. මේ අනුව ගෙවතු වගාව හා මල් වගාව ආශ්‍රිතව ව්‍යවසායකත්ව හැකියාව සංවර්ධනය කරගැනීම යන අරමුණ ද ඉටුකර ගැනීමට මෙම කාන්තාවන්ට හැකි වී ඇති බව පැහැදිලි වේ.

රජයෙන් ලබාදෙන 50% හෝ 30% පදනම යටතේ සහන මිලට බීජ ලබාගැනීමට තම සමිතිය ස්ථාපිත කළ බව 1%ක් සාමාජිකාවෝ සඳහන් කළහ. සහන මිලට රජයෙන් ලබාදෙන ද්‍රව්‍ය (බීජ/උපකරණ) ලබාගැනීමේ දී තනි තනිව ඉදිරිපත් වීම අවාසි සහගත බවත් කණ්ඩායමක් ලෙස ඉදිරිපත් වීම තුළ එම ප්‍රතිලාභය ලබාගැනීමේ පහසුවක් පවතින බවත්, ගොවි කාන්තා සමිතිවලට අදාළ කෘෂිකර්ම උපදේශක මහතුන් විසින් සඳහන් කරන ලදි. ඒ අනුව යම් යම් අවස්ථාවල දී කෘෂිකර්ම උපදේශකවරයා විසින් එවැනි අරමුණු අනුව ද ගොවි කාන්තා සමිති ස්ථාපිත කිරීමට සුදුසු පසුබිමක් සපයාගනු ලබයි. එනම් ගොවි කාන්තා සමිතියක් ස්ථාපිත කර එයට සම්බන්ධ වුවහොත් යම් යම් ද්‍රව්‍ය නොමිලේ/සහන මිලට ලබාගැනීමේ හැකියාව පවතින බව කෘෂිකර්ම උපදේශකවරයා උපදෙස් දෙන විට සමිතිවලට සම්බන්ධවීමට වැඩි උද්‍යොගයක් කාන්තාවන් තුළ ඇති කිරීමට එය සමත් වේ. සමහර අවස්ථාවල දී ප්‍රතිලාභය ගැන පමණක් සිතන සාමාජිකත්වය සහිතව ස්ථාපිත කෙරෙන ගොවි කාන්තා සමිති කාලයත් සමඟ අක්‍රීය වීමේ ප්‍රවණතාවයක් ද පෙන්නුම් කෙරෙන අතර සමිතියේ වටිනාකම තේරුම්ගෙන එය වැඩි දියුණු කරගෙන ප්‍රශස්ත ලෙස ප්‍රතිලාභ ලබාගැනීමට යොමුවන කාන්තාවන් සහිත සමිති ද පවතී, ඒවා වඩාත් සක්‍රීය මට්ටමකට පත් වී ගොවි කාන්තාවන්ගේ අරමුණු මෙන්ම වැඩසටහනේ අරමුණු ද වර්ධනය වන බව නිලධාරීහු සඳහන් කළහ.

ඉහත ප්‍රධාන අරමුණුවලට අමතරව, කණ්ඩායමක් ලෙස සමාජයීය සත්කාරයන් හි යෙදීම සඳහාත් (සමිතියට අයත් සාමාජිකයින්ට ඇති වන හදිසි රෝග හා ස්වාභාවික අනතුරු, දන්සැල්, දානමය පිංකම්, ශ්‍රමදාන කටයුතු වැනි...) සමිතිය තුළ අන්‍යොන්‍ය වශයෙන් මූල්‍යමය ගනුදෙනු

සිදුකර ගනිමින් ඉතාමත් පුළුල් අරමුණු කරා මෙහෙයැවීම පෙරදැරි කරගත් ගොවි කාන්තා සමිති ද ක්ෂේත්‍ර සමීක්ෂණයේ දී හඳුනාගත හැකි විය.

ඉහත විග්‍රහයට අනුව පෙනී යන්නේ කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහන මඟින් ග්‍රාමීය මට්ටමින් ගොවි කාන්තා සමිති ස්ථාපිත කිරීමේ ප්‍රධාන අරමුණු, රජය මගින් දියත් කළ ආහාර ප්‍රවර්ධන වැඩසටහන හා සමගාමීව ක්‍රියාත්මක වූ ගෙවතු වගා සංවර්ධනය යන ක්ෂේත්‍රය යටතේ වක්‍රාකාරයෙන් ක්‍රියාත්මක වන බව යි.

### 4.2.3 වර්තමානයේ ගොවි කාන්තා සමිතිවල සිටින සාමාජික සංඛ්‍යාව

අධ්‍යයනය සඳහා තෝරාගනු ලැබූ ගොවි කාන්තා සමිති බොහොමයක් ස්ථාපිත වී ඇත්තේ වර්ෂ 2008-2013 අතර කාලපරාසය තුළ බව පෙර පරිච්ඡේදයන් හි සාකච්ඡා කෙරිණි. සමිතිය ස්ථාපිත කළ අවස්ථාවේ සාමාජිකත්වය ලැබූ කාන්තාවන් සංඛ්‍යාවත් වර්තමානයේ සිටින සාමාජිකාවන් සංඛ්‍යාවත් අතර වෙනසක් පවතින්නේ ද යන්න අධ්‍යයනයේ දී සොයා බැලිණි.

වගු සටහන් අංක 4.4 : සමිතිය ස්ථාපිත කළ අවස්ථාවේ සහ වර්තමානයේ සිටින සාමාජික සංඛ්‍යාවේ සාමාන්‍ය අගය

| කාලය | පළාත් දිස්ත්‍රික්ක | | අන්තර් පළාත් දිස්ත්‍රික්ක | | එකතුවේ සාමාන්‍ය අගය |
|---|---|---|---|---|---|
| | කුරුණෑගල | මොණරාගල | අනුරාධපුරය | මහනුවර | |
| ආරම්භක අවස්ථාව | 15 | 15 | 30 | 20 | 15 |
| වර්තමාන අවධිය | 25 | 20 | 20 | 10 | 20 |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2014

කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහනට අදාළ ව්‍යවස්ථාවේ සඳහන් වන පරිදි ගොවි කාන්තා සමිතියක් ස්ථාපිත කිරීමේ දී සාමාජිකාවන් 15ට නොවැඩි පිරිසක් සිටිය යුතු වේ. අධ්‍යයනයට අනුව සමස්තයක් ලෙස ගත් විට පළාත් හා අන්තර් පළාත් දිස්ත්‍රික්ක 4හිම ආරම්භක අවධියේ

සිටින ලද සාමාජිකාවන්ගේ සාමාන්‍ය අගය වූ 15 වර්තමානයේ 20 දක්වා වැඩි වී ඇති බව පැහැදිලි වේ.

දිස්ත්‍රික් මට්ටමේ දත්ත විශ්ලේෂණයේ දී පෙනී යන්නේ, අන්තර් පළාත් බල ප්‍රදේශයට අයත් අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගොවි කාන්තා සමිති ස්ථාපිත කරන අවස්ථාවේ ඒ සඳහා සහභාගී වී ඇති සාමාජිකාවන් සංඛ්‍යාවේ සාමාන්‍ය අගය 30 දෙනෙකු වුව ද වර්තමානය වන විට එම සමිතිවල සාමාජිකත්වයේ සාමාන්‍ය අගය 20 දක්වා අඩු වී ඇති බවකි. මහනුවර දිස්ත්‍රික්කයේ තත්ත්වය ද එයට සමාන ය. නමුත් පළාත් බල ප්‍රදේශයට අයත් කුරුණෑගල සහ මොණරාගල යන දිස්ත්‍රික්කවල සමිති ස්ථාපිත කරන අවස්ථාවේ සාමාජික සංඛ්‍යාවේ සාමාන්‍ය අගය අඩු මට්ටමක පැවතිය ද (සාමාජිකාවන් 15 දෙනෙකු) වර්තමානය වන විට එම අගය වැඩි වී ඇති බවත් පෙන්නුම් කරයි. මේ අනුව පළාත් බල ප්‍රදේශයන් හි සහ අන්තර් පළාත් බල ප්‍රදේශයන් හි අරම්භ අවධියේ සාමාජික සංඛ්‍යාවෙහි සාමාන්‍ය අගයේ සහ වර්තමානයේ සිටින සාමාජික සංඛ්‍යාවේ සාමාන්‍ය අගය අතර ඇති ප්‍රතිලෝම සම්බන්ධතාවයට හේතු විමර්ශනය කිරීමේ දී පැහැදිලි වූයේ, කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහන මුලින් ක්‍රියාත්මක කිරීම ආරම්භ කරන ලද්දේ අන්තර් පළාත් කෘෂිකර්ම බල ප්‍රදේශයන් හි වන අතර මුල්කාලීනව කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය හා අවධානය ඉතාමත් තීව්‍ර ලෙස මෙම වැඩසටහන් හා බද්ධව පැවතුණි. නමුත් විශේෂ අවධානයක් යටතේ ක්‍රියාත්මක වූ කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහන් වෙත පැවති අධීක්ෂණය, අවධානය යම්තාක් මට්ටමින් ගිලිහීයාමටත්, ප්‍රතිපාදන බෙදා හැරීමේ කාර්යය දුර්වලවීමටත් කාලීනව සිදුවන දේශපාලනමය හා පරිපාලනමය වෙනස්වීම් බලපා ඇත. එම තත්ත්වය අන්තර් පළාත් හි ගොවි කාන්තා සමිතිවල ක්‍රියාකාරීත්වයට හානිකර ලෙස බලපාන්නට ඇතැයි නිගමනය කළ හැකිය. ඒ අනුව පෙර පැවති තත්ත්වය යම් වෙනසකට ලක් වී ඇති බව නිලධාරීන් හා කෙරුණු සාකච්ඡාවල දී ද තහවුරු විය.

එසේ වුවත්, පළාත් බල ප්‍රදේශයන් හි ක්‍රියාකාරීත්වය විමසීමේ දී, එහි පවතින ගොවි කාන්තා සමිතිවල මෙම තත්ත්වයෙහි වෙනසක් දැකිය හැකි විය. පළාත් නිශ්චිත ප්‍රතිපාදන, දේශපාලන ප්‍රතිපාදන, වෙනත් රාජ්‍ය නොවන සංවිධානවලට අයත් ප්‍රතිපාදන යටතේ ගොවි කාන්තා සමිති සාමාජිකාවන්ට අවස්ථා හා ප්‍රතිපාදන ලැබීමේ හැකියාව අධ්‍යයනයට ලක් වූ ප්‍රදේශයන් හි ඉහළ මට්ටමක පවතින බව අනාවරණය විය. එබැවින් ගොවි කාන්තා සමිති ස්ථාපිත කරන අවස්ථාවේ සිටි සාමාජික සංඛ්‍යාවේ සාමාන්‍ය අගයට වඩා වර්තමානයේ සිටින සාමාජික සංඛ්‍යාවේ සාමාන්‍ය අගය මෙම දිස්ත්‍රික්කවල (පළාත් සභාවට අයත් දිස්ත්‍රික්ක) වැඩිවීමට හේතුපාදක වී ඇති බව නිගමනය කළ හැකි වේ.

### 4.2.4 සමිතිය තුළ සාමාජිකාවන්ගේ රැඳී සිටීම

**ආරම්භක අවධියේ සහ වර්තමානයේ සමිති තුළ සිටින කාන්තාවන්ගේ සාමාන්‍ය අගය සංඛ්‍යාත්මකව වැඩි වීමක් පෙන්නුම් කළ ද සමිති තුළ කාන්තාවන් අඛණ්ඩව රැඳී නොසිට ඉන් ඉවත්වන අවස්ථා ද පවතී.**

**ඊට බලපෑ හැකි හේතු විමසීමේ දී එම හේතු පවුල තුළ හා සමාජය තුළ කාන්තාවන්ගේ තෙවැදෑරුම් කාර්යභාරය[2], එනම් නිෂ්පාදන සාධක, ප්‍රජනන සාධක සහ සමාජීය සාධක සමග සෘජුවම සම්බන්ධ වන බැව් පෙනී ගියේය. 4.5 වගු සටහනින් පෙන්වා ඇත්තේ අධ්‍යනයේ දී කාන්තාවන් දැක්වූ අදහස් කාන්තාවගේ කාර්යභාරය විශ්ලේෂණය කිරීමේ සාධක සමග සම්බන්ධ වන ආකාරයයි.**

වගු සටහන් අංක **4.5:** සමිතිවල අඛණ්ඩ සහභාගීත්වය වෙනස් වීමට බලපාන ලද හේතු

| අරමුණු | පළාත් දිස්ත්‍රික්ක | | | | එකතුව | | අන්තර් පළාත් දිස්ත්‍රික්ක | | | | එකතුව | | සමස්ත එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | කුරුණෑගල | | මොණරාගල | | | | අ' පුරය | | මහනුවර | | | | | |
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| නිෂ්පාදන සාධක | **31** | **58** | **01** | **11** | **32** | **52** | **14** | **52** | **03** | **14** | **17** | **35** | **49** | **45** |
| ප්‍රජනන සාධක | **11** | **21** | **08** | **89** | **19** | **31** | **08** | **30** | **16** | **76** | **24** | **50** | **43** | **39** |
| සමාජීය සාධක | **11** | **21** | **0** | **0.0** | **11** | **17** | **05** | **18** | **02** | **10** | **07** | **15** | **18** | **16** |
| එකතුව | **53** | **100.0** | **09** | **100.0** | **62** | **100** | **27** | **100.0** | **21** | **100** | **48** | **100.0** | **110** | **100.0** |

**මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2014**

**4.5 වගු සටහනට අනුව පළාත් හා අන්තර් පළාත්වලට අයත් දිස්ත්‍රික්ක 4හිම 45%ක් සඳහන් කරන්නේ, සමිතිය තුළ අඛණ්ඩව රැඳී නොසිටීමට නිෂ්පාදන සාධක බලපාන බවයි.**

---

[2]**තෙවැදෑරුම් කාර්යභාරය (Triple Concept) යනු ස්ත්‍රී පුරුෂ භාවය හා සම්බන්ධ සංකල්පයකි. එම සංකල්පයෙන් සමාජය තුළ ස්ත්‍රියකගේ කාර්යභාරය තෙවැදෑරුම් බව විශ්ලේෂණය වේ. එනම් නිෂ්පාදන සාධක යනු ජාතික නිෂ්පාදනයට කාන්තාවගේ දායකත්වය සහ නිෂ්පාදන කාර්යයන් වේ. ප්‍රජනන සාධක යනු ප්‍රති නිෂ්පාදනයයි. එනම් දරුවන් හැදීම, රැකබලා ගැනීම හා පෝෂණයයි. සමාජීය සාධක යනු කාන්තාව සමාජීය වශයෙන් සිදු කරන හා පවුලේ සාමාජිකයින් සමාජීය කාර්යයන්ට යොමු කිරීමට ඇය දක්වන සහයෝගයයි.**

කාන්තාවන්ගේ අවබෝධය අනුව ඔවුන් නිෂ්පාදන සාධක ලෙස සඳහන් කළේ, සමිතිය හරහා ඔවුන්ට ලැබෙන ප්‍රතිලාභ වේ. එම ප්‍රතිලාභ අඩු වන විට සමිතියට පැමිණෙන සාමාජිකාවන්ගේ සක්‍රීය දායකත්වය අඩු වී යන බව ඔවුන්ගේ විශ්වාසයයි. කාන්තා සමිතියක් තම බල ප්‍රදේශය තුළ ස්ථාපිත කිරීමේ දී ව්‍යවසායකත්ව කාර්යයන් ආරම්භ කිරීමට සමිතිය හරහා මූල්‍යමය හෝ ද්‍රව්‍යමය ප්‍රතිලාභ ලබාගැනීමේ අපේක්ෂාවෙන් පැමිණෙන කාන්තාවන්ට ඔවුන් අපේක්ෂා කරන මට්ටමින් හෝ අපේක්ෂා කරන කාලයට එවැනි දෑ නොලැබෙන විට සමිතියට පැමිණීම අතපසු කරන බව සමිතිවල සභාපති, ලේකම් වැනි තනතුරු දරන්නෝ සඳහන් කළහ. එසේම කාන්තාවන් සඳහන් කළ නිෂ්පාදන සාධකයක් ලෙස විශ්ලේෂණය කළ හැකි අනෙක් සාධකය වන්නේ, ප්‍රදේශය තුළ නව රැකියා බිහිවීම හා ඊට කාන්තාවන්ගේ යොමුවීමයි. පෞද්ගලික අංශයේ ඇගලුම් කර්මාන්ත හා වෙනත් සුළු පරිමාණ ව්‍යාපාර (ගමන් මළු මැසීමේ ව්‍යාපාර, රූපලාවන්‍ය සහායිකාවන් වැනි) සඳහා යොමු වීමෙන් ලැබෙන ආදායම ගොවි කාන්තා සමිතිය හරහා ලැබෙන ප්‍රතිලාභයන් ඉක්මවා යෑමෙන් මෙම තත්වය ඇති වේ. පවුල තුළ කාන්තා කාර්යභාරයේ ඉතා සුවිශේෂී කාර්යභාරය වන්නේ ප්‍රජනන කාර්යය යි. දරුවන් හදාවඩා ගැනීම රැකබලාගැනීම හා පෝෂණයයි. ගොවි කාන්තාවන් අදහස් දැක් වූ පරිදි මෙම කාර්යය නිසා ගොවි කාන්තා සමිති සඳහා අඛණ්ඩව සහභාගීත්වය අඩු වන බව සඳහන් කළ පිරිස නියැදියෙන් 39% (43) කි. ගොවි කාන්තා සමිති ස්ථාපිත කරන අවස්ථාවේ දී ඒ සඳහා යොමු වීමට පැවති අමතර කාලය පසුකාලීනව කාන්තාවන්ට අහිමි වන්නේ, කාලයක් සමඟ දරුවන් වර්ධනය වී රැකියා සඳහා යෑම, රැකියා කරන දරුවන්ගේ ළමුන් රැකබලා ගැනීම සහ ඔවුන් පෝෂණය කිරීම, එසේම දරුවන්ගේ නිවෙස්වලත් තම නිවසේත් ගෘහස්ථ පරිපාලනය සිදු කිරීම වැනි කාර්යයන් රාශියක් අලුතින් පැන නැගීම නිසා බොහෝ කාන්තාවන් තමන් සම්බන්ධ වී සිටින බාහිර සමාජයෙන් මිදෙන තත්ත්වයක් ඇතිවීම තුළ සමිතියට ද එය  බලපානු ලබයි.

නියැදියෙන් 16%ක් සඳහන් කළේ, සමිති සඳහා අඛණ්ඩ සහභාගීත්වය වෙනස්වීමට, ඔවුන්ගේ පදිංචිය වෙනස්වීම, එසේම ප්‍රදේශය තුළ ස්ථාපිත කෙරෙන වෙනත් කාන්තා සමිති (කාන්තා කාර්යාංශය මඟින් රාජ්‍ය නොවන සංවිධාන මඟින් හා දේශපාලනමය වශයෙන්) සඳහා ඇදී යාම බලපාන බවයි. කාන්තාවන්ගේ කාර්යභාරය තුළ ඔවුන් මඟින් ඉටුවන සමාජීය කාර්යභාරය තුළ යට කී කාරණා විශ්ලේෂණය කිරීමේ දී, පෙනී යන්නේ, කාන්තාවන්ට සමාජීය වශයෙන් නායකත්වය ලැබෙන, එසේම ප්‍රතිලාභ වැඩියෙන් ලැබෙන, එසේම පිළිගැනීමක් ලැබෙන අවස්ථාවන්ට ඔවුන්ගේ ආකර්ෂණය යොමු වන බවයි. එසේම සමාජය තුළ දේශපාලනික

වශයෙන් පුරුෂ පාර්ශවයට කාන්තාවන් විසින් ලබාදෙන සහයෝගය, වර්ධනය කිරීමට යම් හැකියාවක් ලැබෙන අවස්ථා ද පවතින බැවින් දේශපාලනික වශයෙන් බලගැන්වෙන කාන්තා සමිති කරා යොමුවීම ද දැකිය හැකිය. එසේම දරුවන්ට රැකියා අවස්ථා ලබාගැනීම හෝ තමන්ට වෙනත් මූල්‍යමය ප්‍රතිලාභයක් අපේක්ෂාවෙන් කාන්තාවන් වෙනත් පාර්ශවයන් වෙත යොමු වීමේ ප්‍රවණතාවය ද වැඩි වී ඇත.

මේ අනුව කාන්තාව විසින් තම පවුළ තුළ සමාජය තුළ ඉටු කරනු ලබන තෙවැදෑරුම් කාර්යභාරය ගොවි කාන්තා සමිති තුළ අඛණ්ඩව රැදීසිටීම වෙනස් වීමට බලපාන තීරණාත්මක සාධකයක් වී ඇත.

### 4.2.5 සමිතියේ ක්‍රියාකාරීත්වය

ගොවි කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහනට අදාළ ව්‍යවස්ථාව අනුව සාමාජිකාවන් 15 දෙනෙකුට නොවැඩි පිරිසක් රැස් වී අදාළ බල ප්‍රදේශයේ කෘෂිකර්ම උපදේශකගේ අනුමැතිය හා අනුශාසකත්වය ඇතිව සභාපති, උපසභාපති, ලේකම් හා භාණ්ඩාගාරික, උප භාණ්ඩාගාරික යන ප්‍රධාන නිලතල සහිතව ගොවි කාන්තා සමිති ක්‍රියාත්මක වන බව අධ්‍යයනයේ දී පැහැදිලි විය. මෙම සමිති රැස්වන ආකාරය, රැස් වන ස්ථානය, රැස් වී ක්‍රියා කරන ආකාරය, රැස්වීම්වලට ඇති සහභාගීත්වය ආදී කරුණු විමර්ශනය කිරීමේ දී, අධ්‍යයනයට සහභාගී වූ සමස්ත ගොවි කාන්තා සමිති සාමාජිකාවන්ගෙන් 91%ක් සඳහන් කළ පරිදි ගොවි කාන්තා සමිති මාසයකට වරක් සමිති සාමාජිකයෙකුගේ නිවසේ හෝ ප්‍රජා ශාලාවේ හෝ පන්සලට අයත් ශාලාවක රැස් වේ. නියැදියෙන් 6%ක් සඳහන් කළේ ඔවුන් අයත් සමිතිය මාස දෙකකට වරක් රැස්වන බවයි. ඉතිරි 3%ක් සඳහන් කළේ අවශ්‍යතාවය මත සමිතිය රැස්වන දිනය ඔවුන් තීරණය කර ගනු ලබන බවයි. ඒ අනුව ගොවි කාන්තා සමිති මාසයකට වරක් හා අවශ්‍යතාවය අනුව රැස්වන බව පැහැදිලි විය. මෙසේ රැස් වී වැඩිපුරම සාකච්ඡාවට ලක් කරනු ලබන්නේ, කෘෂිකාර්මික ගැටලු බව සමස්ත නියැදියෙන් 68%ක් සඳහන් කළහ. එසේම ව්‍යවසායකත්ව ගැටලු, ප්‍රතිලාභ බෙදාගැනීම, සාමාජිකාවන් දිරිගැන්වීම පිළිබදව, සමාජ සේවා කටයුතු සංවිධානය කිරීම, හා ණය නිකුත් කිරීම් පිළිබදව ද සාකච්ඡාවට ලක් කෙරෙන බව සඳහන් විය. සමිතිය තුළ හඳුනාගැනෙන ගැටලු සාමාජිකාවන්ට විසඳා ගැනීමට අපහසු වන අවස්ථාවල දී ඒවා කෘෂිකර්ම උපදේශක වෙත යොමු කරන බවත් ඔහු විසින් කාන්තා විෂය භාර නිලධාරීන්ගේ ද සහය ඇතිව එම ගැටලු සඳහා විසඳුම් සැපයීමට කටයුතු කරන බවත් සඳහන් විය.

**කෘෂිකර්ම උපදේශක සඳහන් කළ ආකාරයටත් අධ්‍යයනයේ දී පැහැදිලි වූ ආකාරයටත් කෘෂිකර්ම ව්‍යාප්ති සේවය සැපයීමේ කාර්යයයේ දී ප්‍රජාවට සමීප වීමට විශේෂ ප්‍රවේශයක් ලෙසින් ගොවි කාන්තා සමිති වැදගත් වන බව හඳුන්වා දිය හැකිය.**

පස්වන පරිච්ඡේදය

# ගොවි කාන්තා සමිති හරහා සාමාජිකාවන්ට ලැබෙන ප්‍රතිලාභ

## 5.1 හැඳින්වීම

කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහන යටතේ ක්‍රියාත්මක වන ගොවි කාන්තා සමිති මඟින් එහි සාමාජිකාවන්ට ලබාදෙන පුහුණුවීම්, ලැබූ පුහුණුවීම්වල ප්‍රයෝජනවත්භාවය සහ කාන්තාවන් අපේක්ෂා කරන නව පුහුණු ක්ෂේත්‍රයන් පිළිබඳවත්, පුහුණුවීම්වලට අමතරව ලැබෙන වෙනත් ප්‍රතිලාභ පිළිබඳවත් මෙම පරිච්ඡේදයේ දී සාකච්ඡා කෙරේ.

## 5.2 සමිති හරහා සාමාජිකාවන්ට ලැබෙන ප්‍රතිලාභ

ගොවි කාන්තා සමිති මඟින් එහි සාමාජිකාවන්ට ප්‍රතිලාභ ලැබෙන ප්‍රධාන ආකාර දෙකක් ඇත. එනම්,


01. විවිධ විෂයන් යටතේ පුහුණුවීම් ලබාදීම හා ආදායම් උත්පාදන කාර්යයන්ට යොමු කිරීම
02. ද්‍රව්‍යාත්මක හා මූල්‍යමය ප්‍රතිලාභ

කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති සංවිධාන ක්‍රියාත්මක කිරීමේ දී එහි ප්‍රධාන අරමුණු හා කාර්යභාරයන්ට අනුකූලව කෘෂිකර්ම උපදේශක, කලාප මට්ටමේ කාන්තා විෂයභාර නිලධාරී, දිස්ත්‍රික් මට්ටමේ කාන්තා විෂයභාර නිලධාරී යන කණ්ඩායම විසින් ගොවි කාන්තා සමිති සාමාජිකාවන් සඳහා කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහන ආරම්භ කිරීමේ මූලික අරමුණු හා ගොවි කාන්තා සමිති පිහිටුවීමේ අරමුණු පදනම් කරගනිමින් පුහුණු වැඩසටහන් හා දැනුම ලබා දීමේ වැඩසටහන් සංවිධානය කර ඇති බව අධ්‍යයනයේ දී පැහැදිලි විය.

විශේෂයෙන් තම බල ප්‍රදේශය තුළ කාන්තාවන් ඒකරාශී කර ගොවි කාන්තා සමිතියක් ස්ථාපිත කිරීමේ මූලික අදියරේ පටන් ම දැනුම ලබාදීමේ පුහුණු සැසිවාර පවත්වන බව එහිදී සඳහන් විය. ගොවි කාන්තා සමිතියකට යොමු වීමේ අවශ්‍යතාවය, එයින් කාන්තාවන්ට ලැබිය හැකි ප්‍රතිලාභ පිළිබඳ කෘෂිකර්ම උපදේශක විසින් දැනුම ලබාදෙන අතර පසුව කාන්තා සමිතිය තුළ සාමාජිකාවන් විවිධ ස්වයං රැකියා සඳහා යොමු කිරීම සඳහා ව්‍යවසායකයින් ලෙස පුහුණු කිරීමේ වැඩසටහන්, එසේ ම පවුලේ ජීවන තත්ත්වය නඟා සිටුවීමට අදාළ ආදායම් උත්පාදන

වැඩසටහන්, සම්පත් කළමනාකරණය පිළිබද වැඩසටහන්, ආහාර හා පෝෂණය පිළිබඳ පුහුණු වැඩසටහන් හා කාන්තාවන් සවිබල ගැන්වීමට අදාළ පුහුණු වැඩසටහන් ද සංවිධානය කර ඇත. මෙම පුහුණු වැඩසටහන් සංවිධානය කිරීමේ දී කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති මූලස්ථානයේ සම්බන්ධීකරණයෙන් මෙන්ම පසු අස්වනු තාක්ෂණ ආයතනය, විද්‍යා සම්පත් මධ්‍යස්ථානය, විවිධ පර්යේෂණ ආයතන හරහා ගොවි කාන්තාවන්ට පුහුණුවීම් ලබා දීමට කටයුතු කර ඇත.

අධ්‍යයන දත්තවලට අනුව සමීක්ෂණයට සහභාගී වූ ගොවි කාන්තා සාමාජිකාවන්ගෙන් 92%ක් (300 දෙනෙකු) ගොවි කාන්තා සමිති හරහා ලබා දුන් පුහුණුවීම් සහ ඊට අමතරව වෙනත් ප්‍රතිලාභ ගෙන ඇති බව අනාවරණය විය. 8%ක් (25 දෙනෙකු) පුහුණුවීම් හෝ වෙනත් ප්‍රතිලාභ ලබාගෙන නොමැති බව පැහැදිලි විය (ප්‍රස්තාර අංක 5.1).




ප්‍රස්තාර අංක 5.1: පුහුණුවීම් සහ වෙනත් ප්‍රතිලාභ ලැබූ කාන්තාවන්

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2014

කිසිදු ප්‍රතිලාභයක් (පුහුණුව/වෙනත් ප්‍රතිලාභ) නොලැබූ පිරිස 8% (25 දෙනෙකු) වැනි සුළු පිරිසක් වුව ද ඔවුන් ගොවි කාන්තා සමිතිවල තවදුරටත් සාමාජිකත්වය දරන කාන්තාවන් බැවින් එසේ ප්‍රතිලාභ නොලැබීමට හේතු විමසන ලදුව ඔවුන් ඊට දැක්වූ ප්‍රතිචාරයන් සම්පිණ්ඩනය කිරීමේ දී ගම්‍ය වූයේ, සමිතිය තුළ ප්‍රතිලාභ බෙදීයාම පිළිබඳව සාමාජිකාවන් සුළු පිරිසක් තුළ සතුටුදායක හැඟීමක් නොපවතින බවයි. ඔවුන් සඳහන් කරන්නේ ප්‍රතිලාභ බෙදීයාමේ විෂමතා

පවතින බවයි. එසේම, පෞද්ගලික හිතවත්කම මත ප්‍රතිලාභ ලබාදීම, ප්‍රතිලාභ ලබාගැනීමේ දී සමිතියේ නිලධාරීන් ප්‍රමුඛත්වය ගැනීම වැනි හේතු ද ඔවුහු සඳහන් කළහ.

මේ සම්බන්ධයෙන් සමිතියේ නිලධාරීන් හා කෘෂිකර්ම උපදේශක මහතා දැක් වූ අදහස් වූයේ, බොහෝ විට ද්‍රව්‍යාත්මක හා මූල්‍ය ප්‍රතිලාභ කලාප මට්ටමින් ලැබෙන බැවින් ප්‍රදේශය තුළ තිබෙන සියලු සමිතිවලට එකවර ප්‍රතිලාභ ලබා දීමේ අපහසුවක් පවතින බවයි. ලැබෙන ප්‍රතිලාභය වඩාත් සුදුසු සමිතියට හා එහි සිටින ප්‍රතිලාභයට සුදුසුකම් සපුරන කාන්තාවන්ට ඒවා සපයන බවත් හේ සඳහන් කළේය. බොහෝ විට යම් ස්වයං රැකියාවකට යම් ප්‍රතිලාභයක් ලබාදෙන විට, අදාළ කාන්තාවන්ට ඒ පිළිබඳ පවතින සුදුසුකම් හැකියාව හා කැමැත්ත වැනි දෑ සලකන අතර සමිතියේ නිලධාරීන් මෙන්ම කෘෂිකර්ම උපදේශක මහතා එක්ව සාකච්ඡා කර මෙවැනි තීරණ ගන්නා බව ඔවුහු සඳහන් කළහ. කෙසේ වුව ද ප්‍රතිලාභ ලබාගැනීමේ අරමුණින් පමණක් සමිතියට පැමිණෙන සාමාජිකාවන් මෙන්ම අවම වශයෙන් සමිතිවාර සඳහා අඛණ්ඩව නොපැමිණෙන සාමාජිකාවන්ට පුහුණුවීම් හෝ ප්‍රතිලාභ නොලැබී යාමේ අවස්ථාව වැඩි බව නිලධාරීන් විසින් සඳහන් කරන ලදී.

## 5.3 සමිතිය හරහා කාන්තාවන් ලබා ඇති පුහුණුවීම්

ගොවි කාන්තාවන් ආර්ථික හා සමාජීය වශයෙන් සවිබල ගැන්වීම හරහා පවුලේ ජීවන තත්ත්වය ඉහළ දැමීමත් කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහනෙහි ප්‍රධාන අරමුණු වන අතර, ඒ මඟින් ග්‍රාමීය කාන්තාවන් රටේ සංවර්ධන කාර්යයට දායක කරගැනීම ද අපේක්ෂා කෙරෙන බැවින්, ගොවි කාන්තා සමිති හරහා ලබා දී ඇති පුහුණුවීම් ප්‍රධාන අංශ 04ක් යටතේ සංවිධානය කර කාන්තාවන්ට ලබා දීමට කෘෂිකර්ම උපදේශක ඇතුළු කාන්තා විෂයභාර නිලධාරීන් ක්‍රියාකර ඇති බව අධ්‍යයනයේ දී අනාවරණය විය. ඒ අනුව,

1. ව්‍යාවසායකත්ව සංවර්ධනය
2. ගොවි කාන්තා පෝෂණය හා ආහාර තාක්ෂණය
3. ගෙවත්ත සංවර්ධනය
4. සම්පත් කළමනාකරණය හා මූළුතැන්ගේ කළමනාකරණය

යන ප්‍රධාන කාර්යයන් යටතේ පවත්වනු ලැබූ පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වී ඇති බව ගොවි කාන්තාවෝ සඳහන් කළහ.

ගොවි කාන්තා සමිති ස්ථාපිත කිරීමේ අරමුණු (4.2.2 බලන්න) හා මෙම පුහුණු ක්ෂේත්‍රයන් අතර ඇති සම්බන්ධතාවය විමසා බැලීමේ දී කෘෂිකර්ම උපදේශකවරුන් සමිති ස්ථාපිත කිරීමේ අරමුණු ද සැලකිල්ලට ගනිමින් පුහුණු ක්ෂේත්‍රයන් සඳහා කාන්තාවන් යොමු කර ඇති බව පෙනී යයි. ඒ අනුව පහත දැක්වෙන්නේ පළාත් සහ අන්තර් පළාත් ගොවි කාන්තාවන් පුහුණුව ලැබූ ක්ෂේත්‍ර පිළිබඳව තොරතුරු වේ.

**වගු සටහන් අංක 5.1 : සහභාගී වී ඇති පුහුණු ක්ෂේත්‍රයන්**

| පුහුණුවේ ස්වභාවය | පළාත් බල ප්‍රදේශ N=190 | | | | අන්තර් පළාත් බල ප්‍රදේශ N=110 | | | | පුහුණුව ලැබූ පිරිස N=300 | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | කුරුණෑගල N=153 | | මොණරාගල N=37 | | අනුරාධපුරය N=82 | | මහනුවර N=28 | | සංඛ්‍යාව | % |
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | | |
| ව්‍යවසායකත්ව සංවර්ධනය<br>1. ආහාර නිෂ්පාදනය | 106 | 69.0 | 35 | 95.0 | 64 | 78.0 | 15 | 54.0 | 220 | 73.0 |
| 2. ගුණාත්මක සහල් සකස් කිරීමේ පුහුණුව | 44 | 29.0 | 0 | 0.0 | 37 | 45.0 | 01 | 4.0 | 82 | 27.0 |
| 3. මල් වගාව හා විසිතුරු පැළ වගාව | 40 | 26.0 | 04 | 11.0 | 07 | 9.0 | 01 | 4.0 | 52 | 17.0 |
| 4. හතු නිෂ්පාදනය පිළිබඳ පුහුණුව | 21 | 14.0 | 03 | 8.0 | 06 | 7.0 | 02 | 7.0 | 32 | 11.0 |
| 5. මී මැසි පාලනය | 16 | 11.0 | 0 | 0.0 | 14 | 17.0 | 0 | 0.0 | 32 | 10.0 |
| 6. ක්ෂේත්‍ර චාරිකා මඟින් පුහුණුව | 16 | 11.0 | 02 | 5.0 | 02 | 2.0 | 02 | 7.0 | 24 | 8.0 |
| 7. ව්‍යවසායක හැකියාවන් වැඩි දියුණු කිරීමේ පුහුණුවීම් | 13 | 9.0 | 0 | 0.0 | 05 | 6.0 | 0 | 0.0 | 18 | 6.0 |
| 8. ඇඳුම් මැසීම හා නිමි ඇඳුම් නිෂ්පාදනය | 07 | 5.0 | 0 | 0.0 | 02 | 2.0 | 0 | 0.0 | 09 | 3.0 |
| 9. ඉදල්/කොසු/පාපිසි නිෂ්පාදනය පිළිබඳ පුහුණුව | 03 | 2.0 | 0 | 0.0 | 04 | 5.0 | 0 | 0.0 | 07 | 2.0 |
| 10. බීජ නිෂ්පාදනය පිළිබඳ පුහුණුව | 01 | 1.0 | 02 | 5.0 | 04 | 5.0 | 0 | 0.0 | 07 | 2.0 |
| 11. කොම්පෝස්ට් නිෂ්පාදනය | 97 | 63.0 | 24 | 65.0 | 43 | 52.0 | 21 | 75.0 | 185 | 62.0 |
| ගෙවත්ත සංවර්ධනය<br>12. ගෙවත්ත කළමනාකරණය | 100 | 65.0 | 13 | 35.0 | 14 | 17.0 | 17 | 61.0 | 144 | 48.0 |
| ගොවි කාන්තා පෝෂණය හා ආහාර නිෂ්පාදනය<br>13. පවුලේ පෝෂණය හා ගුණාත්මක ආහාර පරිභෝජනය | 09 | 6.0 | 01 | 3.0 | 07 | 9.0 | 03 | 11.0 | 20 | 7.0 |
| සම්පත් කළමනාකරණය මුළුතැන්ගේ සංවර්ධනය<br>14. ස්ව සම්පත් කළමනාකරණය පිළිබඳ පුහුණුව | 05 | 3.0 | 0 | 0.0 | 03 | 4.0 | 0 | 0.0 | 08 | 3.0 |
| 15. ඉතිරි කිරීම හා සකසුරුවම පිළිබඳ පුහුණුව | 0 | 0.0 | 1 | 3.0 | 02 | 2.0 | 0 | 0.0 | 03 | 1.0 |
| 16. බැංකු හා ණය පහසුකම් වෙත යොමුවීම පිළිබඳ පුහුණුව | 0 | 0.0 | 0 | 0.0 | 03 | 4.0 | 0 | 0.0 | 03 | 1.0 |

සටහන: එකම ප්‍රතිචාරියා විසින් එක පුහුණුවකට වඩා හදාරා ඇති බැවින් බහුවිධ ප්‍රතිචාර ගණනය කොට ඇත.

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2014

අධ්‍යයනයයට සහභාගී වූ කාන්තාවන්ගෙන් පුහුණුවීම් සහ වෙනත් ප්‍රතිලාභ ලැබූ පිරිස 92% (300) කි. එම කණ්ඩායමෙන් පළාත් දිස්ත්‍රික්කවලට අයත් වූ පිරිස 51% (153)ක් වන අතර අන්තර් පළාත් දිස්ත්‍රික්කවලට අයත් වූ පිරිස 37% (110) කි. ඒ අනුව පළාත් හා අන්තර් පළාත් බල ප්‍රදේශයන් දෙකටම අයත් පිරිස පිළිබඳ සැලකිලිමත් වීමේ දී ඔවුන් අතරින් 73% (220)කගේ ම ජනප්‍රිය පුහුණු ක්ෂේත්‍රය වී ඇත්තේ ආහාර නිෂ්පාදනය පිළිබඳ ලබා දී ඇති පුහුණුවයි. කොම්පෝස්ට් නිෂ්පාදනයත්(62%), ගෙවත්ත කළමනාකරණයත්(48%), ගුණාත්මක සහල් සකස් කිරීමේ පුහුණුවත් (27%), මල් වගාව හා විසිතුරුපැළ වගාව(17%) පිළිබඳ පුහුණුවත් කාන්තාවන්ගේ වැඩි අවධානයට ලක් වී ඇත.

කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහන තුළ ගොවි කාන්තා සමිති සාමාජිකාවන් හරහා සිදු කිරීමට යෙදුණු පෝෂණීය ගෙවත්ත යන සංකල්පය මුල්කාලීන අරමුණු අතර ප්‍රධාන අරමුණක් වූ අතර රජය විසින් දියත් කිරීමට යෙදුණු ආහාර ප්‍රවර්ධන වැඩසටහනට සමගාමීව ආරම්භ කෙරුණු ගෙවතු වගා සංවර්ධන වැඩසටහන හරහා මෙම අරමුණු තවදුරටත් වර්ධනය කෙරිණි. ඒ අනුව කාන්තා සාමාජිකාවන්ට ලබාදෙන පුහුණු වැඩසටහන් අතර ගෙවතු වගා සංවර්ධනයට අදාළ පුහුණුවීම් සඳහා ද කාන්තාවන්ගේ වැඩි නැඹුරුවක් පවතින බැව් පෙනී යයි. කාන්තාවන්ගෙන් 62% (185)ක් කොම්පෝස්ට් නිෂ්පාදනය සම්බන්ධ පුහුණුවට සහභාගී වූ බවට ප්‍රතිචාර දක්වා ඇත. එසේම ගෙවත්ත කළමනාකරණය එනම්, පාත්ති සකස් කිරීම, නිර්දේශිත පොහොර භාවිතය, ප්‍රදේශයට උචිත හා පසට සුදුසු බෝග තෝරාගැනීම හා විකල්ප වගා ක්‍රම හඳුනාගැනීම ඇතුළත් පුහුණුව සඳහා 48% (144)ක් ප්‍රතිචාර දක්වා ඇත.

කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහනෙහි ප්‍රධාන අරමුණක් වන්නේ, කාන්තාවන්ට තිරසාර ආදායම් මාර්ගයන් උත්පාදනය කිරීම සහ ඔවුන් ආර්ථික හා සමාජීය වශයෙන් බල ගැන්වීමයි. එසේම එම අරමුණු ඉටු කරගැනීම මඟින් කාන්තාවන්ගේ කෘෂිකාර්මික ව්‍යවසායකත්වය ප්‍රවර්ධනය වීම සහ කාන්තා නිෂ්පාදන සඳහා තිරසාර වෙළඳපොළක් ඇතිවීම අපේක්ෂා කරනු ලබයි. මෙම අරමුණු සහ අපේක්ෂාවන් ළඟා කර ගැනීමට ව්‍යවසායකත්ව සංවර්ධනය පිළිබඳ පුහුණුවීම් රාශියක් ගොවි කාන්තා සමිති සාමාජිකාවන්ට ලබා දී ඇති බව ඉහත වගු අංක 5.1 අනුව පැහැදිලි වේ.

ව්‍යවසායකත්ව පුහුණු වැඩසටහන් පිළිබඳ ගොවි කාන්තාවන්ගෙන් ලද තොරතුරු අනුව අනාවරණය කර ගත හැකි වූ ප්‍රධාන කරුණක් වූයේ, ගොවි කාන්තාවන් ලබාගෙන ඇති බොහොමයක් පුහුණුවීම්, ගොවි කාන්තා සමිතිය වෙනුවෙන්ම විශේෂයෙන් සකස් කළ පුහුණුවීම්

නොව, විවිධ ආයතන මඟින් හා රජයේ ව්‍යාපෘති මඟින් ග්‍රාමීය අංශය තුළ දියත් කෙරෙන විවිධ වැඩසටහන් පාදක කර ගත් පුහුණුවීම් ගොවි කාන්තා සමිතියට ප්‍රමුඛත්වයක් දී ඔවුන් වෙත ලබා දී ඇති බවයි. උදාහරණයක් ලෙස 5.1 වගු සටහනට අනුව, ගොවි කාන්තා සමිතිය හරහා ගුණාත්මක සහල් සැකසීම පිළිබඳව පුහුණුවීම් ලැබූ බව අධ්‍යයන නියැදියෙන් 27% (82 දෙනෙකු) ප්‍රතිචාර දක්වා ඇත. මෙවැනි පුහුණුවීමක් ලැබීමට සැබවින්ම පාදක වී ඇත්තේ, 2005 වර්ෂයේ පසු අස්වනු තාක්ෂණ ආයතනය විසින් අනුරාධපුරය, පොළොන්නරුව, හම්බන්තොට, කුරුණෑගල, මහනුවර (මිනිපේ) අම්පාර, බදුල්ල (මහියංගනය), පුත්තලම වැනි දිස්ත්‍රික්කවල දියත් කරනු ලැබූ ගුණාත්මක සහල් සැකසුම් ගම්මාන ව්‍යාපෘතියයි. මෙම ව්‍යාපෘතිය පිළිබඳ ඇගයීමේ අධ්‍යයනයක් සිදු කරමින් ඇපාසිංහ, එස්. සහ වෙනත් අය (2013) විසින් සඳහන් කරන්නේ සහල් සැකසුම් ගම්මාන ව්‍යාපෘතියට සම්බන්ධ වූවන්ගෙන් 82%ක් ම කාන්තාවන් බවත් ඔවුන් තමන්ට සුදුසු ස්වයං රැකියාවක් ලෙස ගුණාත්මක සහල් සැකසුම තෝරා ගෙන ඇති බවත් ය. මේ අනුව පෙනී යන්නේ, මෙවැනි ව්‍යාපෘති ග්‍රාමීය මට්ටමේ දී ක්‍රියාත්මක වන විට කෘෂිකර්ම උපදේශක මහතුන් සෘජුවම ගොවි කාන්තා සමිතිවලට ප්‍රමුඛතාවය ලබා දී එම ප්‍රතිලාභයට ඔවුන්ව යොමු කර ඇති බවයි.

ගුණාත්මක සහල් නිෂ්පාදන පුහුණුවීම ලැබූවන් අනුරාධපුරයෙන් සහ කුරුණෑගලින් ඉහළ ප්‍රතිශතයක් හමු වුවත් මහනුවර දිස්ත්‍රික්කයෙන් එම පුහුණුව ලැබූවන් හමුවූයේ එක් අයෙක් පමණි. මොණරාගල දිස්ත්‍රික්කයේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වී නොමැත. කාන්තාවන් අතර පුහුණුවීම් ලෙස ගෙවතු සංවර්ධනය පිළිබඳ පුහුණුවීම්, කොම්පෝස්ට් නිෂ්පාදනය, බීජ නිෂ්පාදනය වැනි පුහුණුවීම් ද "අපි වවමු- රට නගමු" ව්‍යාපෘතිය හා සම්බන්ධ බව පෙනී යයි. එසේම දිවි නැඟුම ව්‍යාපෘතිය හා සම්බන්ධ වෙමින් ඒ හරහා ලබාදෙන පුහුණුවීම් ද කෘෂිකර්ම උපදේශකවරයා විසින් ගොවි කාන්තාවන් වෙත යොමු කරන බව කෘෂිකර්ම උපදේශකවරයා සඳහන් කළේය.

ස්ව සම්පත් ප්‍රශස්ත අන්දමින් කළමනාකරණය කිරීමට හැකියාව ලබාදීම සඳහා සම්පත් කළමනාරණය සහ මුළුතැන්ගේ සංවර්ධනයට අදාළ පුහුණුවීම් සඳහා සහභාගී වූ බව කාන්තාවන්ගෙන් 3%ක් ද ඉතිරි කිරීම හා සකසුරුවම පිළිබඳ පුහුණුවීම් සඳහා 1%ක් ද මූල්‍ය පහසුකම් (අඩු පොළී බැංකු ණය ආධාර වැනි) වෙත ප්‍රවේශවීම සම්බන්ධව දැනුවත් කිරීම් පිළිබඳ පුහුණුවීම් ලබාගත් බව 1%ක් ප්‍රතිචාර දක්වා ඇත. කාන්තාව සවිබල ගැන්වීම සම්බන්ධයෙන් වූ මෙවැනි පුහුණුවීම් කෘෂිකර්ම උපදේශක විසින් කාන්තා විෂයභාර නිලධාරීන්, ගොවි කාන්තා මූලස්ථාන නිලධාරීන් මෙන්ම වෙනත් ආයතනවලට අදාළ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන්

පවත්වනු ලබන බව සඳහන් විය. එසේ වුවත් මෙම පුහුණු ක්ෂේත්‍රයන් සඳහා කාන්තාව ප්‍රතිචාර දක්වා ඇත්තේ ඉතාමත් සුළු ප්‍රතිශතයකි. එයට හේතු වී ඇත්තේ, කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති මූලස්ථානය මඟින් මෙවැනි පුහුණුවීම් පැවැත්වීම ක්‍රමයෙන් අඩු වීමයි.

එයට හේතු සෙවීමේ දී කාන්තා විෂයභාර නිලධාරින් (SMO) සහ කෘෂිකර්ම උපදේශකවරුන් සඳහන් කළේ, මුල් කාලීනව ගොවි කාන්තා විෂය විශේෂාකාරයෙන් ක්‍රියාත්මක වූ බවත් එවිට කාන්තාවන්ට විශේෂ පුහුණුවීම් ලබාදීමට මෙන්ම විවිධ ප්‍රතිපාදන ලබාදීමටත් කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති මූලස්ථානය ක්‍රියා කළ බවයි. නමුත් වර්තමානයේ එවැනි විශේෂ පුහුණුවීම් ලබාදීමක් හෝ ප්‍රතිපාදන සැපයීමක් හෝ සිදු නොවන බව සඳහන් විය. මුල් කාලීනව ගොවි කාන්තා සමිති පවත්වාගෙන යන කෘෂිකර්ම උපදේශකවරුන්ට, කලාප හා දිස්ත්‍රික්ක මට්ටමේ කාන්තා විෂයභාර නිලධාරීන්ට ඔවුන්ගේ අවශ්‍යතා මෙන්ම ඔවුන් හරහා ගොවි කාන්තාවන්ගේ අවශ්‍යතා ද සැලකිල්ලට ගනිමින් ගන්නෝරුව සේවාස්ථ පුහුණුවීම් ලබාදීම සිදු කර ඇති නමුත් වර්ෂ කිහිපයක සිට එවැනි පුහුණුවීම් ලබාදීමේ අඩුවක් පවතින බව සඳහන් විය.

කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති මූලස්ථානයේ මේ සම්බන්ධයෙන් කටයුතු කළ පැරණි නිලධාරීන් මෙන්ම නව නිලධාරීන් ද සඳහන් කළ අන්දමට ගොවි කාන්තා විෂය වෙනුවෙන් විශේෂිතව රජයෙන් වෙන් වන මූල්‍ය ප්‍රතිපාදනයන් හි අඩුවක් පවතින බවත්, දිස්ත්‍රික්ක මට්ටමේ හා කලාප මට්ටමේ ගොවි කාන්තා අවශ්‍යතා හඳුනාගෙන ඊට අදාළ ව ව්‍යාපෘති සකස් කොට ඇස්තමේන්තු ගත කර දේශීය හා විදේශීය වූ විවිධ මූල්‍ය ප්‍රභවයන් (Funding Sources) වෙත ඉදිරිපත් කිරීමෙන් මූල්‍ය මෙන්ම ද්‍රව්‍යමය ප්‍රතිපාදනයන් ලබාගන්නා බවයි. මෙහි දී ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානය (FAO)මෙන්ම වෙනත් මූලාශ්‍ර හරහා ද ගොවි කාන්තා විෂය වෙනුවෙන් ප්‍රතිපාදනයන් ජනනය කරගෙන ඇත.

නමුත් වර්තමානයේ මෙවැනි මූල්‍ය ප්‍රභවයන් මඟින් මෙන්ම වෙනත් මූලාශ්‍රයන්ගෙන් ප්‍රතිපාදන ලැබීම් අවම මට්ටමක පැවතීම හේතුවෙන් මුල්කාලීනව පැවති තත්ත්වයේ වෙනසක් සිදු වී ඇත. කාන්තා විෂයභාර නිලධාරීන්ට අඛණ්ඩව පුහුණුවීම් ලබාදීමේ ක්‍රමවේදයට මෙන්ම මුල්කාලීනව ගොවි කාන්තා සමිති වෙත ලබාදුන් ද්‍රව්‍යාත්මක ප්‍රතිලාභ සීමාවීමට ද මෙම තත්ත්වය හේතු වූ බවත් සඳහන් විය. විශේෂයෙන් පුහුණු කිරීම සඳහා අවශ්‍ය සම්පත් දායකයින් සපයා ගැනීමේ දුෂ්කරතාව මෙහිදී මූලික වන බව කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති මූලස්ථානභාර නිලධාරීහු සඳහන් කළහ. මේ අනුව වර්තමානයේ ගොවි කාන්තාවන්ට ව්‍යවසායකත්ව සංවර්ධනය සඳහා පුහුණුවීම් ලබා දීම වැඩි වශයෙන් ම සිදුවන්නේ, ග්‍රාමීය මට්ටමින් සිදු කෙරෙන වෙනත් විවිධ සංවර්ධන ව්‍යාපෘති මගින් ලබා දෙන පුහුණුවීම් සහ කාන්තා කාර්යාංශය හරහා ගමට ලැබෙන පුහුණුවීම් ගොවි කාන්තා සමිති සාමාජිකාවන් වෙත යොමු කරවීම මඟිනි.

වගු සටහන් අංක **5.2 :** ලැබූ පුහුණුව සහ එහි ප්‍රයෝජනවත් භාවය

| | පුහුණුවේ ස්වභාවය | පළාත් හා අන්තර් පළාත් දිස්ත්‍රික්කවල ප්‍රතිචාර ප්‍රතිශතය (%) | |
|---|---|---|---|
| | | ප්‍රයෝජනවත් බව කියූ සංඛ්‍යාව **N=300** | ප්‍රයෝජනවත්බව කියූ සංඛ්‍යාව පුහුණුව ලැබූවන්ගේ ප්‍රතිශතයක් ලෙස (%) |
| **1** | කොම්පෝස්ට් නිෂ්පාදනය (සංඛ්‍යාව **185)** | **79** | **43.0** |
| **2** | ගෙවත්ත කළමනාකරණය (සංඛ්‍යාව **144)** | **74** | **51.0** |
| **3** | ආහාර නිෂ්පාදනය පිළිබඳ පුහුණුව (සංඛ්‍යාව **220)** | **60** | **27.0** |
| **4** | ගුණාත්මක සහල් නිෂ්පාදනය (සංඛ්‍යාව **82)** | **30** | **37.0** |
| **5** | මල් වගා හා විසිතුරු පැළ වගාව (සංඛ්‍යාව **52)** | **20** | **38.0** |
| **6** | හතු නිෂ්පාදනය ( සංඛ්‍යාව **32)** | **04** | **13.0** |
| **7** | මී මැසි පාලනය (සංඛ්‍යාව **30)** | **04** | **13.0** |
| **8** | ව්‍යවසායක හැකියාවන් දියුණු කිරීමේ පුහුණුව ( සංඛ්‍යාව **20)** | **05** | **28.0** |
| **9** | පවුලේ පෝෂණීය ආහාර පරිභෝජනය පිළිබඳ පුහුණුව(සංඛ්‍යාව **08)** | **10** | **50.0** |
| **10** | ස්ව සම්පත් කළමනාකරණය පිළිබඳ පුහුණුව (සංඛ්‍යාව **08)** | **04** | **25.0** |
| **11** | බීජ නිෂ්පාදනය පිළිබඳ පුහුණුව (සංඛ්‍යාව **07)** | **02** | **29.0** |
| **12** | ඉදල්/කොසු/පාපිසි/ සබන් නිෂ්පාදනය (සංඛ්‍යාව **07)** | **02** | **29.0** |
| **13** | ඉතිරි කිරීම් හා සකසුරුවම (සංඛ්‍යාව **03)** | **03** | **100.0** |
| **14** | බැංකු කටයුතු, ණය පහසුකම් වෙත යොමුවීම හා ආයෝජන හැකියාව වර්ධනය (සංඛ්‍යාව **03)** | **03** | **100.0** |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, **2014**

කාන්තාවන් විසින් සහභාගී වූ පුහුණු වැඩසටහන්වල ප්‍රයෝජනවත්භාවය පිළිබඳ විමසීමේ දී ස්වයං රැකියාවක් ආරම්භ කිරීමට හෝ පවුල් තුළ සහජීවනය වර්ධනය කිරීමට හෝ ඔවුන්ගේ ජීවන තත්ත්වයේ කිසියම් වූ වෙනසකට, ලැබූ පුහුණුව හා දැනුම විවිධ මට්ටමින් ප්‍රයෝජනවත් වී ඇති බව වගු සටහන් අංක 5.2අනුව පැහැදිලි වේ.

කාන්තාවන්ගෙන් වැඩි දෙනෙක් (220) සහභාගී වී ඇත්තේ ආහාර නිෂ්පාදනය පිළිබඳ පුහුණුවීම් සඳහා වුවත්, ලැබූ පුහුණුවීම් අතරින් ප්‍රයෝජනවත් බවින් වැඩි යැයි සඳහන් කර ඇත්තේ, ගෙවතු වගාව ඇතුළු කොම්පෝස්ට් නිෂ්පාදනය, මල් හා විසිතුරු පැළ නිෂ්පාදනය වැනි පුහුණු වීම් වේ. අධ්‍යයනයට සහභාගී වූ ගොවි කාන්තා සමිති සාමාජිකාවන්ගෙන් බහුතරයක් තම ගෙවත්ත වඩාත් කළමනාකාරීත්වයක් ඇතිව සකස් කරගෙන ඇති බව නිරීක්ෂණ දත්ත ද සාක්ෂ්‍ය දරයි. අනෙකුත් දිස්ත්‍රික්කයන්ට සාපේක්ෂව තමන් ලබාගත් දැනුම තුළින් ගෙවතු වගාව සාර්ථක ලෙස සිදු කරනු ලබන කාන්තාවන් කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඉබ්බාගමුව ගොවිජන සේවා මධ්‍යස්ථානයෙන් ද ("දිරිය පැරකුම්" ගොවි කාන්තා සමිතිය), නාගොල්ලාගම ගොවිජන සේවා මධ්‍යස්ථානයෙන් ද ("විශාඛා" ගොවි කාන්තා සමිතිය) හමු වූ අතර ඔවුහු තම ගෙවත්ත තුළ වගා කටයුතු කරන අතර අවශ්‍ය කොම්පෝස්ට් පොහොර ද නිෂ්පාදනය කරගනු ලබයි. කුරුණෑගල දිස්ත්‍රික්ක නියැදියෙන් 36%ක් මෙසේ සාර්ථකව ගෙවතු වගාවේ නිරත වෙති. එහි දී මෙම කාන්තාවන්ගේ ස්වාමි පුරුෂයින් ද කොම්පෝස්ට් නිෂ්පාදනයට අවශ්‍ය ද්‍රව්‍ය ප්‍රවාහනය කර දීම වැනි කාර්යයන්හි දී උපරිම සහයෝගය දක්වන බව ඔවුහු සඳහන් කළහ. ජාතික මට්ටමේ ගෙවතු වගා තරඟ සඳහා ද සහභාගී වී ජයග්‍රහණ ලබා ගත් බව ඉබ්බාගමුව ගොවිජන සේවා මධ්‍යස්ථානයට අයත් දිරිය පැරකුම් ගොවි කාන්තා සමිති සාමාජිකාවෝ සඳහන් කළහ. එසේම කුරුණෑගල දිස්ත්‍රික්කයේ උඩුබද්දාව ගොවිජන සේවා මධ්‍යස්ථානයට අයත් "පබෝදා" ගොවි කාන්තා සමිතිය ද පිළිබඳව ද හොඳම ගෙවත්තට හිමි ජනාධිපති සම්මාන දිනා ඇති බව සඳහන් කෙරුණි. අනෙකුත් දිස්ත්‍රික්කයන් පිළිබඳ සැලකීමේ දී මහනුවර, මොණරාගල යන දිස්ත්‍රික්කයන්හි ද ගෙවතු වගාව සම්බන්ධ පුහුණුවීම් ලබා දී තිබුණ ද එයින් ප්‍රතිලාභ ලැබීම සාපේක්ෂව අඩු මට්ටමක පවතින බව පැහැදිලි විය. මහනුවර දිස්ත්‍රික්කයේ මොරයාය, උල්පතගම වැනි ගොවිජන සේවා මධ්‍යස්ථානවලට අදාළ කාන්තා සමිති ("මිණිමුතු" කාන්තා සමිතිය, "කුමුදු" කාන්තා සමිතිය) ස්ථාපිත කිරීමට ද ප්‍රධාන හේතුව වී ඇත්තේ ගෙවතු වගා සංවර්ධනය කිරීම වුවත් වර්තමානයේ එය යම් කිසි පසුබෑමකට ලක් වී ඇති බව පෙනුණි. එයට හේතු වී ඇත්තේ, ගෙවතු වගා සංවර්ධනය සඳහා අවශ්‍ය පුහුණුවීම් රාශියක් ලබා දුන්නද පුහුණුවෙන් පසුව ඒ සම්බන්ධයෙන් විශේෂ ක්‍රියාදාමයක් සිදු නොවීමයි. එනම්, ගෙවතු වගාව

සඳහා ද්‍රව්‍යාත්මක ආධාර ලබාදීමේ අඩුවක් පවතී. මොණරාගල දිස්ත්‍රික්කය තුළ ද මෙම තත්ත්වයෙහි වෙනසක් විද්‍යමාන නොවිණි. සමස්තයක් ලෙස දිස්ත්‍රික්ක හතරෙහිම කොම්පෝස්ට් නිෂ්පාදනය ගෙවතු වගා කළමනාකරණය පිළිබඳ පුහුණුව ගොවි කාන්තා සමිතිවල සාමාජිකාවන්ට ප්‍රයෝජනවත් වී ඇති බව පැහැදිලි විය.

ආහාර නිෂ්පාදනය පිළිබඳ පුහුණුව ද ගොවි කාන්තාවන් වැඩිම දෙනෙකුගේ ප්‍රසාදයට හේතු වී ඇත. පුහුණුවට ලැබූ කාන්තාවන්ගෙන් 27% (60) ක් සඳහන් කළේ, රසකැවිලි, බයිට් වර්ග අලුතින් පර්යේෂණ කර සොයා ගනු ලැබූ නව කෑම (රයිස් ක්‍රීම් වැනි) වර්ග සෑදීම පිළිබඳ පුහුණුව ඔවුන්ට ස්වයං රැකියා මට්ටමට ප්‍රවේශවීමේ අවස්ථාව ද උදා කළ බවයි. අධ්‍යයනයට ලක් වූ දිස්ත්‍රික්ක හතරටම අයත් කාන්තා නියැදි පිළිබඳ ව සැලකීමේ දී අනුරාධපුර දිස්ත්‍රික්කය 24% (20)ක් ද, කුරුණෑගල 18% (27)ක් ද, මොණරාගල 38% (14) සහ මහනුවර 14% (04) ක් ද වශයෙන් එය ප්‍රයෝජනවත් වූ බව සඳහන් කර ඇත.

වගුවට අනුව ගොවි කාන්තාවන් ලැබූ පුහුණු ක්ෂේත්‍රයන් අතරින් ගුණාත්මක සහල් නිෂ්පාදනය පිළිබඳ පුහුණුව ද වඩාත් ප්‍රයෝජනවත් වූ බව පුහුණුවීම් ලැබූ කාන්තාවන්ගෙන් 37% (30)ක් සඳහන් කරන ලදී. පසු අස්වනු තාක්ෂණ ආයතනය විසින් දිස්ත්‍රික්ක ගණනාවක මෙම පුහුණුවීම් ලබා දී ඇති අතර, විශේෂයෙන් කාන්තා සමිති මේ සඳහා සෘජුවම සම්බන්ධ වී ඇති බව අධ්‍යයනයේ දී තහවුරු විය. අනෙකුත් දිස්ත්‍රික්කයන්ට සාපේක්ෂව අනුරාධපුර දිස්ත්‍රික්කය සහ කුරුණෑගල දිස්ත්‍රික්කයේ මෙම පුහුණුව ලැබූවන් වඩාත් සාර්ථක ස්වයං රැකියාලාභීන් බවට පත් ව ඇති බව ද පෙනුණි.

විසිතුරු මල් හා පත්‍ර වගාව පිළිබඳ ලබා දුන් පුහුණුව ද ප්‍රයෝජනවත් වූ බව නියැදියෙන් 38% (20) සඳහන් කරන ලදී. දිස්ත්‍රික්ක නියැදීන් සැලකීමේ දී මෙම ක්ෂේත්‍රය ප්‍රයෝජනවත් වූ බව සඳහන් කළ කාන්තාවන් වැඩි ප්‍රමාණයක් අයත් වන්නේ, කුරුණෑගල දිස්ත්‍රික්කයට වේ. එය කුරුණෑගල දිස්ත්‍රික් නියැදියෙන් 11% (17) කි. අනෙකුත් දිස්ත්‍රික්කවල ද මෙම පුහුණුවීම් ලබා දී දි තිබුණ ද කුරුණෑගල දිස්ත්‍රික්කයේ නගරයට ආසන්න ප්‍රදේශයන් වූ උඩුබද්දාව ගොවිජන සේවා මධ්‍යස්ථානයට අයත් පබෝදා ගොවි කාන්තා සමිතිය, සුපිපි ගොවි කාන්තා සමිතිය (අමුණුවිල ඔකිඩ් වගා කරුවන්ගේ සංගමය), යක්විල ගොවිජන සේවා මධ්‍යස්ථානයට අයත් මිණිමුතු ගොවි කාන්තා සමිතිය වැනි සමිතිවල සාමාජිකාවන් මල් වගාවට හා විසිතුරු පත්‍ර වගාවට යොමු වීමට මෙම පුහුණුවීම් වැදගත් වූ බව සඳහන් කෙරිණි. අනුරාධපුර දිස්ත්‍රික්කයේ ද මල් වගාව හා පැළ තවාන් සාර්ථකව පවත්වාගෙන යන ගොවි කාන්තාවන් හමු විය.

පුහුණුව තවදුරටත් ලබාදිය යුතු ක්ෂේත්‍ර ලෙස පෙනී යන්නේ, ඉතිරි කිරීම් හා සකසුරුවම, බැංකු කටයුතු හා ආයෝජන හැකියා වර්ධනය වැනි ක්ෂේත්‍ර වේ. මෙම ක්ෂේත්‍ර සඳහා පවත්වා ඇති පුහුණුවීම් සංඛ්‍යාව අඩු අතර ඒ සඳහා සහභාගී වූවන් ද අඩු මට්ටමක පවතී. එසේ වුවත් සහභාගී වූ සියල්ලටම එම පුහුණුව 100%ක් ම ප්‍රයෝජනවත් වී ඇත. අනෙක් අතට, මී මැසි පාලනය, හතු නිෂ්පාදනය, ඉදල්/කොසු/පාපිසි නිෂ්පාදනය, වැනි ක්ෂේත්‍ර සඳහා පුහුණුවීම් ලබා දී සහභාගී වූවන් ඉහළ මට්ටමක පැවතියත්, ප්‍රයෝජනවත් වූ බව සඳහන් කරන්නේ සුළු පිරිසකි. ඒ අනුව ඔවුන්ට ලබාදෙන පුහුණුවීම් නවතාවයකට පත්කිරීම සහ පුහුණුවෙන් පසුව ස්වයං රැකියා ආරම්භ කිරීමට දිරිදීමක් ලෙස ද්‍රව්‍යාත්මක හ මූල්‍යමය ආධාර හෝ ණය පහසුකම් සැපයීමේ අවශ්‍යතාවයක් ඇති බවත් මෙහි දී පැහැදිලි වේ.

## 5.4 පුහුණුවීම් පිළිබඳ ගොවි කාන්තාවන්ගේ අදහස

විවිධ ආයතන, දෙපාර්තමේන්තු හා සම්බන්ධ කරමින් ගොවි කාන්තා සමිතිය හරහා කාන්තාවන්ට ලබාදෙන පුහුණුවීම් පිළිබඳ ඔවුන්ගේ අදහස් සැලකිල්ලට ගැනීමේ දී පුහුණුවීම් සඳහා සම්බන්ධ වූ ගොවි කාන්තාවන්ගෙන් 45% (136) සඳහන් කළේ, ලබාදෙන පුහුණුවීම් කාලීනව වෙනසකට ලක් කළ යුතු බවයි.ගොවි කාන්තා සමිති ආරම්භක අවධියේ දී මෙන් නොව වර්තමානයේ කාන්තාව ආර්ථික ලෙස බලගැන්වීමේ ක්‍රියාවලිය වඩාත් පුළුල් වූ අරමුණුවලින් යුක්ත වේ. පවතින වෙළඳපොළේ තරඟ කිරීමට ඇති හැකියාව හෝ එහි පවතින විෂමතාවය හඳුනාගෙන අභියෝගාත්මකව එයට මුහුණදීමේ පසුබිම සැලසීම වර්තමානය වන විට අත්‍යවශ්‍ය කාරණයක් බවට පත් වී ඇත (Alkire et al; 2012).

Buvinic et al, 2013 සඳහන් කරන පරිදි කාන්තාවන් ආර්ථික ලෙස බලගැන්වීම ලෙස හඳුන්වන්නේ, ඔවුන්ට නව රැකියා අවස්ථා ළඟා කරගැනීමට තිබෙන හැකියාව, ඵලදායිතා වර්ධනය කරගැනීම හෝ ආදායම් වැඩිකර ගැනීම පිළිබඳ ප්‍රමාණාත්මක සාක්ෂි (Quantifiable evidence) සපයාදීම බවයි. එසේ වුවත් Golla et al, 2011 සඳහන් කරන පරිදි අවස්ථා ළඟා කර ගැනීමේ හැකියාව වර්ධනය කිරීමෙන් පමණක් කාන්තාව ආර්ථික ලෙස බල ගැන්විය නොහැකි බවත් ඔවුන් තුළ උපායශීලී ලෙස ආර්ථිකමය අවස්ථාවන් සොයා යෑමේ හා තෝරාගැනීමේ ශක්තිය/හැකියාව වර්ධනය කළ යුතු බවයි.

අධ්‍යයන පුහුණුවීම්වල තත්ත්වය පිළිබඳ ගොවි කාන්තාවන්ගේ අදහස් හා නිලධාරීන්ගේ අදහස් ද සම්පිණ්ඩනය කිරීමේ දී පෙනී යන්නේ, වර්තමානයේ ගොවි කාන්තාවන්ට අවශ්‍ය වන්නේ ද

කුමන හෝ මට්ටමේ ආර්ථිකමය වාසියක් ළඟා කරගැනීමට සුදුසු පසුබිම හඳුන්වාදීමටත් වඩා පුද්ගලයින්ට සුදුසු, කාලයට සුදුසු ආර්ථිකමය කටයුතු සොයා ගැනීමේ හැකියාව වර්ධනය කිරීමත් එයට අවශ්‍ය මූල්‍යමය හා ද්‍රව්‍යාත්මක පහසුකිරීම් වෙත ළඟාවීමට මාර්ගය විවර කිරීමත් ය.

### 5.4.1 පුහුණුවීම් කාලීනව වෙනස් විය යුතු ආකාරය

ගොවි කාන්තාවන්ට ලබාදෙන පුහුණුවීම් කාලීනව වෙනස් විය යුතු යැයි සඳහන් කළ ගොවි කාන්තාවන් දැක් වූ අදහස්වලට අනුව ඔවුන් අපේක්ෂා කරන පුහුණුවීම් සඳහා දැක් වූ ප්‍රතිචාර පහත වගු සටහන් අංක 5.3න් පිළිබිඹු වේ.

වගු සටහන් අංක 5.3 : ගොවි කාන්තාවන් අපේක්ෂා කරන නව පුහුණු ක්ෂේත්‍රයන්

| පුහුණු ක්ෂේත්‍රයන් | සංඛ්‍යාව (N=136) | ප්‍රතිශතය (%) |
|---|---|---|
| නවීන ව්‍යවසායකත්ව ක්ෂේත්‍රයන් පිළිබඳ පුහුණුවීම් | 129 | 95.0 |
| ගුණාත්මක බීජ නිෂ්පාදනය පිළිබඳ පුහුණුවීම් | 98 | 72.0 |
| කාබනික පොහොර භාවිතය පිළිබඳ පුහුණුවීම් | 88 | 65.0 |
| ප්‍රදේශයට ආවේණික ස්වයං රැකියා සඳහා අවශ්‍ය පුහුණුවීම් | 103 | 76.0 |
| කෘමි හා දිලීර පාලනය පිළිබඳ නව දැනුම සම්බන්ධ පුහුණුවීම් | 64 | 47.0 |
| ආහාර කල්තබා ගැනීමේ තාක්ෂණය පිළිබඳ නව දැනුම පිළිබඳ පුහුණුවීම් | 53 | 39.0 |
| මූල්‍ය කළමනාකරණය, ණය මූලාශ්‍ර පිළිබඳ පුහුණුවීම් | 36 | 26.0 |

සටහන: ගොවි කාන්තාවන් විසින් ප්‍රතිචාර කිහිපයක් දැක්වීම නිසා ප්‍රතිශත එකතුව 100ට සමාන නොවේ.

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2014

වගු සටහන් අංක 5.3න් පෙන්නුම් කරන ආකාරයට ගොවි කාන්තා සමිති හරහා වර්තමානයේ කාන්තාවන්ට ලබා දිය යුතු වඩාත් සුදුසු පුහුණු ක්ෂේත්‍රයන් ලෙස ඔවුහු සඳහන් කරන්නේ නවීන ව්‍යාවසායකත්ව හැකියා වර්ධනය කිරීමට අදාළ පුහුණුවකි. ප්‍රතිචාර දැක් වූ කාන්තාවන්ගෙන් 95% (129)ක් සඳහන් කරනු ලැබුවේ වර්තමාන සමාජය තුළ ඉහළ ඉල්ලුමක් පවතින චීන ආහාර හා කෙටි ආහාර නිෂ්පාදනයට (රෝල්ස්, පීට්සා, චිලිපේස්ට්, චට්නි වර්ග, කොත්තු වර්ග) අදාළව ව්‍යවසායක කාර්යයන් පිළිබඳ පුහුණුවීම් ලබාදීම වඩාත් ඵලදායක විය හැකි බවයි (කාන්තා

කෘෂිකර්ම ව්‍යාප්ති සංවිධානවල ප්‍රධාන අරමුණු දේශීයත්වයට මූලිකත්වය දී සකස් කෙරී ඇති බැවින් ගොවි කාන්තාවන්ගේ මෙම අදහස ඊට පටහැනි විය හැකිය. නමුත් ඔවුන් දැක් වූ අදහස ඒ ආකාරයෙන් ම වාර්තාව තුළ ඉදිරිපත් කෙරිණි).

වර්තමාන සමාජය තුළ දේශීය ආහාරවලට මිනිසුන්ගේ වැඩි නැඹුරුවක් පවතින බව කතිකාවතක් නිර්මාණය වී තිබුණ ද එහි ප්‍රායෝගික තත්ත්වය විමසීමේ දී නගරය තුළ මෙන්ම ග්‍රාමීය සමාජය තුළ ද තවදුරටත් පවතින්නේ ආගන්තුක ආහාර වර්ග සඳහා වැඩි ප්‍රියතාවයකි. ගොවි කාන්තාවන් සඳහන් කළ පරිදි දේශීය ආහාර නිෂ්පාදනය කිරීම අතරතුර චීන ආහාර හා වෙනත් කෙටි ආහාර නිෂ්පාදනය ද සිදු කළහොත් ඔවුන්ට ව්‍යවසායකයෙක් ලෙස ඉදිරියට යාමේ හැකියාවක් පවතින බව සඳහන් කළ හැකිය. එසේම ඇඳුම් මැසීම, ජුකි, අත්කම් වැනි ක්ෂේත්‍ර සඳහා ද නවීන ක්‍රමයන් හරහා පුහුණුවීම් ලබා දෙන්නේ නම්, ඒ සඳහා හැකියාව පවතින කාන්තාවන්, ගොවි කාන්තා සමිති තුළ සිටින බව ඔවුන්ගේ අදහස් අතර විය.

පුහුණුවීම් කාලීනව වෙනස් විය යුතු බව සඳහන් කළ කාන්තාවන්ගෙන් 72% සඳහන් කළේ, ගුණාත්මක බීජ නිෂ්පාදනය සඳහා ද පුහුණුවීම් වැඩියෙන් අවශ්‍ය බවයි. එනම් රජයේ අවශ්‍යතාවයට බීජ සැපයීම සඳහා නිෂ්පාදනය කිරීමේ දී ප්‍රමිතිය ඉතා වැදගත් වන බැවින් එම ප්‍රමිතියට එය සිදුකිරීමට අවශ්‍ය නිර්දේශිත පියවරයන් පිළිබඳ දැනුම අත්‍යවශ්‍ය බව ඔවුහු සඳහන් කළහ.

දැනට ලබාදෙන කාබනික පොහොර නිෂ්පාදනය පිළිබඳ පුහුණුව තුළ ට එම පොහොර බෝග සඳහා යෙදීමේ දී එය නිවැරදිව භාවිතා කරන ආකාරය පිළිබඳව පුහුණුවක් ද ඇතුළත් කළ යුතු බව කාන්තාවන්ගෙන් 65%ක් සඳහන් කළහ.

පුහුණුවීම් කාලීනව වෙනස්විය යුතුය යන්නට ප්‍රතිචාර දැක් වූ පිරිසෙන් සැලකිය යුතු කණ්ඩායමක් එනම්, 76% (103) සඳහන් කළේ, ප්‍රදේශයට සුදුසු ස්වයං රැකියා ආරම්භ කිරීමට පුහුණුවක් ලබා දිය යුතු බවයි. එනම්, ප්‍රදේශය තුළ පහසුවෙන් සපයා ගත හැකි අමුද්‍රව්‍ය සඳහා වන නිෂ්පාදන පිළිබඳ පුහුණුවීම් ලබාදිය යුතු බවයි.

එසේම ගොවි කාන්තාවන්ට නිතරම තමන්ගේ දැනුම යාවත්කාලීන කර ගැනීමේ අවශ්‍යතාවය දැඩිව පවතින බව පෙනී යන්නේ, පුහුණුවීම් කාලීනව වෙනස් විය යුතුය යන්න පැවසූ පිරිසෙන් 47% (64) ක්, ශාකවලට වැළඳෙන රෝගවලට ඔරොත්තු දෙන හෝර්මෝන වර්ග හා නව ප්‍රභේද (ප්‍රතිරෝධී ප්‍රභේද) පිළිබඳ ඔවුන්ව දැනුවත් කළ යුතු බව පැවසීම හේතුවෙනි. ස්වාභාවික

පළිබෝධ පාලන ක්‍රම මෙන්ම නවීන පළිබෝධ පාලන ක්‍රම පිළිබඳ කෙරෙන පර්යේෂණ තොරතුරු ගොවි කාන්තාවන් වෙත ගලා නොයෑමේ ගැටලුව මෙහි දී මූලික වන බව කෘෂිකර්ම උපදේශකවරුන් ද සඳහන් කළ අතර එයට පිළියමක් ලෙස කෘෂිකර්ම උපදේශකවරුන් සඳහන් කළේ, නව පර්යේෂණ දත්ත පිළිබඳ බිම් මට්ටමේ නිලධාරීන් වෙත තොරතුරු ගලා ඒමේ ක්‍රමවේදයන් දියුණු කළ යුතු බවයි. එවිට පුහුණුවීම් හරහා අදාළ ගොවි කණ්ඩායම් දැනුවත් කිරීමේ හැකියාව වර්ධනය වන බව ඔවුහු සඳහන් කළහ.

පෝෂණීය ආහාර පරිභෝජනය හා සැකසුම පිළිබඳ ගොවි කාන්තාවන්ට ලබාදෙන පුහුණුවීම් තුළට ආහාර කල්තබා ගැනීමේ තාක්ෂණය ඇතුළත් නව දැනුම වැඩි වශයෙන් එක් කළ යුතු බවට 39% (53) ක් ප්‍රතිචාර දැක්වූහ. එසේම තමන් නියුතු ස්වයං රැකියාව තුළ හෝ ගොවි කාන්තා සමිතිය තුළ හෝ මූල්‍යමය පරිපාලනය සමබරව පවත්වා ගැනීමට අවශ්‍ය පුහුණුව සහ ණය මූලාශ්‍ර වෙත ළඟාවීමේ හැකියාව වර්ධනය කිරීමට අදාළ දැනුම තවදුරටත් සැපයීම වඩාත් සුදුසු බව කාන්තාවන්ගෙන් 24% (36) ප්‍රතිචාර දැක්වූහ.

ඉහත තොරතුරු අනුව, වර්තමානයේ ගොවි කාන්තා සමිති සාමාජිකාවන් වැඩි වශයෙන් අපේක්ෂා කරන්නේ, නව සමාජයට ගැළපෙන ආර්ථිකමය වශයෙන් ලාභදායී හෝ සමාජය තුළ වැඩි ඉල්ලුමක් සහිත ස්වයං රැකියා අවස්ථා ඇතිකරගැනීම පිළිබඳ පුහුණුවීම් බව පැහැදිලි වන අතර, පොදුවේ ගත් කළ, වර්තමාන රැකියා වෙළඳපළට ප්‍රවේශ විය හැකි මට්ටමේ පුහුණුවීම්වල අවශ්‍යතාවය ඔවුන්ට පවතින බව නිගමනය කළ හැකිය.

## 5.5 පුහුණුවීම්වලට අමතරව ලැබෙන ප්‍රතිලාභ

පුහුණුවීම්වලට අමතරව ගොවි කාන්තා සමිතියක සාමාජිකත්වය ලබන කාන්තාවන්ට මධ්‍යම රජය/පළාත් නිශ්චිත ප්‍රතිපාදන/දේශපාලන ප්‍රතිපාදන මඟින් සමිතියට ලැබෙන ද්‍රව්‍යාත්මක හෝ මූල්‍ය ප්‍රතිපාදන ලබාගැනීමේ හැකියාව පවතී. මේ යටතේ බීජ හෝ රෝපණ ද්‍රව්‍ය, ස්වයං රැකියා සඳහා උපකරණ, වෙනත් අමුද්‍රව්‍ය හා කෘෂිකාර්මික සතුන් සමිතිය හරහා ගොවි කාන්තාවන් වෙත ලබාදීම සිදු කර ඇත. මෙවැනි ප්‍රතිපාදන ලබාදීමේ දී සමිතිය තුළ සාමාජිකාවන් කණ්ඩායමක් ලෙස එක්ව ද්‍රව්‍යාත්මක ප්‍රතිලාභ (බීජ හා රෝපණ ද්‍රව්‍ය, කෘෂිකාර්මික සතුන්, පොලිතීන්, ටෙන්ට්, පාලිත ගෘහ (නෙට් හවුස්))ලබාගැනීමේ දී සමිතියේ සාමාජිකාවන් ඒ සඳහා දැරිය යුත්තේ, 30%ක දායකත්වයක් වන අතර ඉතිරි 70% මධ්‍යම රජය/පළාත් නිශ්චිත ප්‍රතිපාදන මඟින් දරනු ලබයි. සමිතිය තුළ සාමාජිකාවන් වුව ද තනි අයිතියට යම් ද්‍රව්‍යයක් (කෘෂිකාර්මික උපකරණ, යන්ත්‍ර සූත්‍ර, කෘෂිකාර්මික සතුන්) ලබා ගන්නේ නම්, ඇය විසින් 50% දායකත්වයක්

සැපයීම් කළ යුතු වේ. එසේ කරනු ලබන්නේ සමිතියේ සාමාජිකාවක් වුවත් එය පොදු අයිතියට නොව අදාළ සාමාජිකාවගේ තනි පරිහරණයට ලබා ගන්නා බැවිණි. සමිතිය වගකීමෙන් මිදෙන නිසා 50% දායකත්වයක් සැපයීම අනිවාර්ය වේ.

වගු අංක 5.4 : පුහුණුවීම්වලට අමතරව ලැබූ ප්‍රතිලාභ අනුව ගොවි කාන්තාවන්ගේ විසිරීම

| ලැබූ ප්‍රතිලාභය | කාන්තාවන් සංඛ්‍යාව | ප්‍රතිශතය (%) |
|---|---|---|
| නොමිලේ කෘෂිකාර්මික බීජ හා පැළ | 171 | 57.0 |
| 50% දායකත්වය යටතේ යන්ත්‍ර සූත්‍ර/උපකරණ | 112 | 37.0 |
| 50% දායකත්වය යටතේ කෘෂිකාර්මික සතුන් | 10 | 3.0 |
| 30% දායකත්වය යටතේ යන්ත්‍ර සූත්‍ර | 07 | 3.0 |
| එකතුව | 300 | 100.0 |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2014

පුහුණුවීම් සඳහා සහභාගී වූවන්ගෙන් බහුතරයකට (57%) ලැබී ඇත්තේ නොමිලේ කෘෂිකාර්මික බීජ හා පැළ වර්ගයි. මේ යටතේ ගෙවතු වගා බීජ කට්ටල, එළවළු සහ පලතුරු පැළ, අතිරේක ආහාර භෝග බීජ වර්ග සහ මිරිස් පැළ සහිත බඳුන් ලබාදීම සිදු කර ඇත. මෙම ප්‍රතිපාදන දිස්ත්‍රික්ක හතරෙහි ම බහුතරයක් කාන්තාවන්ට ලැබී ඇත. නියැදියෙන් 37 % සඳහන් කළේ 50% දායකත්වය යටතේ යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ ලැබුණු බවයි. අනුරාධපුරය සහ කුරුණෑගල යන දිස්ත්‍රික්කවලට වී තම්බන බැරල්, ධාන්‍ය ඇඹරුම් යන්ත්‍ර ලබා දී ඇත. ආහාර තාක්ෂණය සඳහා අවශ්‍ය නවීන උපකරණ (ශීතකරණ, ගෑස් උඳුන්, බ්ලෙන්ඩර්) මෙන්ම සාම්ප්‍රදායික උපකරණ (මුරුක්කු වංගෙඩි) කුරුණෑගල දිස්ත්‍රික්කයේ බොහොමයක් සමිති සඳහා ලබා දී ඇත. විසිතුරු මල් හා පත්‍ර වගාවට ද මල් බාල්දි සහ නෙට් හවුස් ලබාදීම සිදු කර ඇත.

අනුරාධපුර දිස්ත්‍රික්කයේ කාන්තා සමිති සඳහා බහුතරයකට මිරිස් පැළ සහිත බඳුන් ලබා දී ඇත. එසේම සාලියපුර කෘෂිකර්ම උපදේශක බල ප්‍රදේශයට ජංගම අලෙවිසැල් ද ලබා දී ඇති අතර ඒවා තෝරාගත් ගොවි කාන්තා සමිති සඳහා ලබා දී ඇත.

දිස්ත්‍රික්ක හතර පිළිබඳවම සැලකිලිමත් වීමේ දී, කුරුණෑගල සහ අනුරාධපුරය යන දිස්ත්‍රික්කයන් හි **IFAD**, වාරිපුබුදුව සහ **JAIKA**වැනි ව්‍යාපෘති ක්‍රියාත්මක වීම නිසා ගොවි කාන්තාවන්ට විශේෂ වාසියයක් සැලසී ඇත. මහනුවර, මොණරාගල වැනි දිස්ත්‍රික්කවලට සාපේක්ෂව කුරුණෑගල සහ අනුරාධපුරය යන දිස්ත්‍රික්කවල ගොවි කාන්තා සමිති මෙම ව්‍යාපෘති මඟින් ප්‍රතිලාභ වැඩි වශයෙන් ලබාගෙන ඇත. මේ අනුව පළාත්/අන්තර් පළාත් බල ප්‍රදේශයන්ට අයත්වීම යන කාරණය ප්‍රතිලාභ ලැබීමේ දී තීරණාත්මක සාධකයක් වී නොමැති වුවත්, රජයේ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක වීම සහ රාජ්‍ය නොවන සංවිධානයන් හි ක්‍රියාකාරීත්වය වැඩි ප්‍රදේශ වීම, යන කාරණා ගොවි කාන්තාවන්ට ප්‍රතිලාභ ලැබීම කෙරෙහි බලපා ඇති බව නිගමනය කළ හැකිය. දිස්ත්‍රික්ක හතරටම අයත් ගොවි කාන්තාවන් සඳහන් කළ පරිදි මෑත කාලීනව ඔවුන්ට ලැබුණු ප්‍රතිලාභ පිළිබඳ පෙළගැස්මක් ඇමුණුම් අංක 01න් පෙන්වා දී ඇත.

හයවැනි පරිච්ඡේදය

# ආදායම් උත්පාදන ක්‍රියාවන් සඳහා කාන්තාවන්ගේ සහභාගීත්වය සහ ගෘහස්ථ ජීවිතයට ඇති බලපෑම

## 6.1 හැඳින්වීම

කාන්තාව කේන්ද්‍ර වූ පවුල් පසුබිම ප්‍රවර්ධනය කිරීමට ගොවි කාන්තාවන්ට තිරසාර ආදායම් මාර්ගයන් උත්පාදනය කිරීම, කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහනේ මූලික අරමුණ වන බැවින් ඒ සඳහා ගොවි කාන්තා සමිති හරහා කෘෂි ව්‍යවසායකත්වය පිළිබඳ පුහුණුවීම් ලබා දීමේ කාර්යය සිදු කර ඇති බව පෙර පරිච්ඡේදයන් හි විමර්ශනය කෙරිණි.

ඒ අනුව ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් සඳහා කාන්තාවන්ගේ සහභාගීත්වය, ඔවුන් පවත්වාගෙන යන ස්වයං රැකියා පිළිබඳව සහ එම කටයුතු ඔවුන්ගේ ගෘහ ජීවිතයට බලපා ඇති ආකාරය මෙම පරිච්ඡේදයෙන් විශ්ලේෂණය කෙරේ.

## 6.2 ආදායම් උත්පාදන ක්‍රියාවන් හි කාන්තාවන්ගේ සහභාගීත්වය

අධ්‍යයනයට සහභාගී වූ ගොවි කාන්තාවන්ගෙන් සමිතිය හරහා අදායම් උත්පාදන ක්‍රියාවන් හි නියුක්ත වී සිටියේ 44% (144) ක් පමණි. 51% (165) ක් සමිතිය හරහා කිසිදු ආදායම් උත්පාදන කාර්යයක නියුක්ත නොවන අතර 5% (16) ක් මෙම අධ්‍යයනය සිදු කිරීමට පෙර ආදායම් උත්පාදන ක්‍රියාවන් හි නිරත වී ඇති අතර විවිධ පෞද්ගලික හේතු මත වර්තමානය වන විට ඉන් ඉවත් වී සිටියහ. වගු සටහන් අංක 6.1න් සමස්ත නියැදිය තුළ ආදායම් උත්පාදන ක්‍රියාවන් හි නියුතු කාන්තාවන් පිළිබඳ පෙන්වා දී ඇත.

වගු සටහන් අංක 6.1: ආදායම් උත්පාදන ක්‍රියාවන් හි නියුතු කාන්තාවන් පළාත් හා අන්තර් පළාත් අනුව විසිරීම

| | පළාත් බල ප්‍රදේශ | | අන්තර් පළාත් බල ප්‍රදේශ | | සමස්ත නියැදිය |
|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | |
| නියුක්ත වීම | 91 | 45.0 | 53 | 43.0 | 144 |
| නියුක්ත නොවීම | 106 | 53.0 | 59 | 48.0 | 165 |
| දැනට සිදු නොකිරීම | 05 | 2.0 | 11 | 9.0 | 16 |
| එකතුව | 202 | 100.0 | 123 | 100.0 | 325 |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2014

පළාත් හා අන්තර් පළාත් නියෝජනය කරන කාන්තා නියැදීන් පිරික්සීමේ දී පළාත් බල ප්‍රදේශයන්ට අයත් නියැදියෙන් 45%ක් ද, අන්තර් පළාත් නියැදියෙන් 43%ක් ද ආදායම් උත්පාදන කාර්යයෙහි නියුක්ත වේ. මෙම දත්ත අනුව ගොවි කාන්තාවන් ආදායම් උත්පාදන කාර්යයෙහි නියැළීම පළාත් හා අන්තර් පළාත් මට්ටමින් කැපී පෙනෙන වෙනසක් විද්‍යමාන නොකරයි.

වගු සටහන් අංක 6.2 : දිස්ත්‍රික් මට්ටමින් ආදායම් උත්පාදන ක්‍රියාවන් හි නියුක්ත වීම

| | හේතු | පළාත් බල ප්‍රදේශ | | | | අන්තර් පළාත් බල ප්‍රදේශ | | | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | කුරුණෑගල | | මොණරාගල | | අනුරාධපුරය | | මහනුවර | | | |
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 01 | ආදායම් උත්පාදන කාර්යයන් හි නියුක්ත වේ | 77 | 47.0 | 14 | 36.0 | 49 | 54.0 | 04 | 13.0 | 144 | 44.0 |
| 02 | ආදායම් උත්පාදන කාර්යයන් හි නියුක්ත නොවේ | 81 | 50.0 | 25 | 64.0 | 31 | 34.0 | 28 | 87.0 | 165 | 51.0 |
| 03 | පෙර සිදු කළ ද දැනට නොකරයි | 05 | 3.0 | 0 | 0.0 | 11 | 12.0 | 0 | 0.0 | 16 | 5.0 |
| | එකතුව | 163 | 100.0 | 39 | 100.0 | 91 | 100.0 | 32 | 100.0 | 325 | 100.0 |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2014

වගු සටහන් අංක 6.2ට අනුව දිස්ත්‍රික්ක නියැදීන් විශ්ලේෂණය කිරීමේ දී පළාත් බල ප්‍රදේශ නියෝජනය කරන කුරුණෑගල දිස්ත්‍රික්කයේත් (47%) අන්තර් පළාත් බල ප්‍රදේශ නියෝජනය කරන අනුරාධපුර දිස්ත්‍රික්කයේත් (54%) සැලකිය යුතු පිරිසක් ආදායම් උත්පාදන ක්‍රියාවන් හි නියැළී සිටිති. මොණරාගල සහ මහනුවර දිස්ත්‍රික්ක නියැදීන්වලට අනුව ප්‍රතිචාර දක්වා ඇත්තේ ඊට අඩු ප්‍රමාණයකි.

ඉහත 6.1 වගුව අනුව විශ්ලේෂණය කළ පරිදි ආදායම් උත්පාදන ක්‍රියාවන් ද පළාත් හා අන්තර් පළාත්වලට අයත්වීම යන නිර්ණායකය මත වෙනස්කම් පිළිබිඹු නොකරන අතර දිස්ත්‍රික්ක වෙනස්වීම මත ආදායම් උත්පාදන ක්‍රියාවයන් හි නියැළීම අඩු වැඩි බවක් පෙන්නුම් කරනු ලබයි. නිලධාරීන් සමඟ කළ සාකච්ඡාවල දී පෙනී ගිය කරුණක් වන්නේ, මේ සඳහා හේතු කිහිපයක් බලපා ඇති බවයි. එනම්, IFAD, JAIKA වැනි ව්‍යාපෘති මෙම දිස්ත්‍රික්කයන් හි ක්‍රියාත්මක

වීමෙන් කාන්තාවන් සඳහා පුහුණුවීම් ලබා ගැනීමට, ද්‍රව්‍යාත්මක/මූල්‍යමය ප්‍රතිලාභ ලැබීමට අවස්ථාව ලැබීමෙන් වැඩි වශයෙන් ආදායම් උත්පාදන ක්‍රියාවලින් සඳහා සහභාගී වී ඇති බවයි. එසේම තවත් කාරණයක් වන්නේ, මෙවැනි දිස්ත්‍රික්ක තුළ කාන්තාවන් ආදායම් ඉපැයීමේ අවශ්‍යතාව පවුල තුළින් ම පැණ නැංවීම හේතුවෙන් වැඩි වශයෙන් ආදායම් උත්පාදනයට යොමු වීමයි.

මහනුවර, මොණරාගල වැනි දිස්ත්‍රික්කයන් හි යට කී ව්‍යාපෘති අඩුවෙන් ක්‍රියාත්මක වීම හෝ එසේ නොමැති නම් නිලධාරීන්ගේ කාර්යක්ෂමතාව අඩුවීම හෝ යන කරුණු බලපෑ හැකි බව කණ්ඩායම් සාකච්ඡාවල දී තවදුරටත් පැහැදිලි විය. එසේම පුහුණුවීම් ලැබීම අඩු වැඩි වීමත් ආදායම් උත්පාදන කාර්යන්ට සම්බන්ධ වූ කාන්තාවන්ගේ අඩු වැඩි වීමත් අතර සම්බන්ධතාවයක් ද නොමැත. එනම් නියැදියෙන් 92% (300) ක් පුහුණුවීම් ලැබූවන් ආදායම් උත්පාදන කාර්යන් හි නියැළී ඇත්තේ පුහුණුව ලැබූවන්ගෙන් 44% (144) වැනි ප්‍රමාණයකි.

## 6.3 ගොවි කාන්තාවන් නියැළී ඇති ආදායම් උත්පාදන කාර්යයන් හි ස්වභාවය

වගු සටහන් අංක 6.3: ගොවි කාන්තාවන් නියැළෙන ආදායම් උත්පාදන ක්‍රියාවන්(ස්වයං රැකියා)

| | ස්වයං රැකියා වර්ගය | පළාත් බල ප්‍රදේශ | | | | අන්තර් පළාත් බල ප්‍රදේශ | | | | සමස්ත කාන්තාවන් ගේ එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | කුරුණෑගල | | මොණරාගල | | අනුරාධපුරය | | මහනුවර | | සංඛ්‍යාව | % |
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | | |
| 1 | ආහාර නිෂ්පාදනයේ යෙදීම | 17 | 22.0 | 08 | 57.0 | 14 | 29.0 | 0 | 0.0 | 39 | 27.0 |
| 2 | මල් වගාව හා විසිතුරු පත්‍ර වගාව | 19 | 25.0 | 0 | 0.0 | 04 | 8.0 | 0 | 0.0 | 23 | 17.0 |
| 3 | ගුණාත්මක සහල් නිෂ්පාදනය සහ අලෙවිය | 14 | 18.0 | 0 | 0.0 | 05 | 10.0 | 01 | 25.0 | 20 | 14.0 |
| 4 | ගෙවතු වගාව | 10 | 13.0 | 04 | 29.0 | 04 | 8.0 | 02 | 50.0 | 20 | 14.0 |
| 5 | ධාන්‍ය, කුළුබඩු සැකසුම හා අලෙවිය | 07 | 9.0 | 0 | 0.0 | 03 | 6.0 | 0 | 0.0 | 10 | 7.0 |
| 6 | ඇඳුම් මැසීම හා නිමි ඇඳුම් අලෙවිය | 04 | 5.0 | 01 | 7.0 | 04 | 8.0 | 0 | 0.0 | 09 | 6.0 |
| 7 | සිල්ලර වෙළඳාම | 03 | 4.0 | 0 | 0.0 | 05 | 10.0 | 0 | 0.0 | 08 | 6.0 |
| 8 | ඉදල්/කොසු/පාපිසි නිෂ්පාදනය | 01 | 1.0 | 0 | 0.0 | 04 | 8.0 | 0 | 0.0 | 05 | 3.0 |
| 9 | මීමැසි පාලනය | 02 | 3.0 | 01 | 7.0 | 02 | 4.0 | 0 | 0.0 | 05 | 3.0 |
| 10 | ගුණාත්මක බීජ නිෂ්පාදනය | 0 | 0.0 | 0 | 0.0 | 03 | 6.0 | 0 | 0.0 | 03 | 2.0 |
| 11 | බිම්මල් නිෂ්පාදනය | 0 | 0.0 | 0 | 0.0 | 01 | 2.0 | 01 | 25.0 | 02 | 1.0 |
| | එකතුව | 77 | 100.0 | 14 | 100.0 | 49 | 100.0 | 04 | 100.0 | 144 | 100.0 |

මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2014

6.3 වගු සටහන අනුව ආදායම් උත්පාදන කාර්යන් ලෙස විවිධ ස්වයං රැකියාවන් හි නියැළී ඇති බව පෙනී යයි. ස්වයං රැකියාවන් හි නියුතු කාන්තාවන්ගෙන් බහුතරය (27%) ආහාර නිෂ්පාදන කර්මාන්තයට අදාළ ව රසකැවිලි, බයිට් වර්ග, ඉදි ආප්ප, පිට්ටු වැනි ආහාර සහ වෙනත් විවිධ ආහාර වර්ග සකස් කර අලෙවි කිරීම මඟින් ආදායම් උත්පාදනයේ නිරත වන බව අනාවරණය විය.

ගොවි කාන්තා සමිති හරහා ව්‍යවසායකයින් ලෙස කටයුතු කිරීමට ගොවි කාන්තාවන් යොමු කිරීමේ දී කාන්තාවන් වැඩි නැඹුරුවක් දක්වා ඇත්තේ ද ආහාර නිෂ්පාදන ක්ෂේත්‍රයට බව පුහුණුවීම් පිළිබඳ සාකච්ඡාවල දී පැහැදිලි විය. විශේෂයෙන් බොහෝ ගොවි කාන්තා සමිතිවල කාන්තාවන් ග්‍රාමීය මට්ටමේ රාජ්‍ය ආයතනවල ආපනශාලා (ගොවිජන සේවා මධ්‍යස්ථානය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, රෝහල් ආපනශාලා, පාසැල් ආපනශාලා වැනි) සඳහා කණ්ඩායම් ලෙස සංවිධානය වී උදෑසන ආහාරය, දහවල් ආහාරය සහ සවස තේ පානයට අවශ්‍ය ආහාර සැපයීම සිදු කරනු ලබයි. ආදළ ප්‍රදේශය තුළ පවතින ගොවි කාන්තා සමිතිවල කාන්තා කණ්ඩායම් විසින් උදෑසන ආහාරය එක් කණ්ඩායමකටත්, දිවා ආහාරය තවත් කණ්ඩායමකටත්, සවස තේ පානය සඳහා වූ ආහාර සඳහා තවත් කණ්ඩායමකටත් බෙදාගැනීමසිදු කරන අතර කෘෂිකර්ම උපදේශකගේ ද සහාය ඇතිව එය සංවිධානාත්මක ස්වරූපයෙන් පවත්වාගෙන යනු ලබයි. ආහාර නිෂ්පාදන ක්ෂේත්‍රය තුළ අලෙවි ගැටලු අවම වීම සඳහා මෙම රාජ්‍ය අංශයේ හා පෞද්ගලික අංශයේ ආයතන සම්බන්ධ කරගෙන සිටීම විශාල පහසුවක් වී ඇත. මීට අමතරව බයිට් වර්ග සාදා පැකට් කර විවිධ මට්ටමේ අලෙවිසැල් සඳහා යොමු කිරීමට ද කාන්තාවන් වැඩි නැඹුරුවක් දක්වා ඇත. ප්‍රවාහනය සඳහා ත්‍රීවීල්, යතුරුපැදි භාවිතා කරන බව පෙනී ගියේය. මෙවැනි ස්වයං රැකියා සඳහා නිවසේ ස්වාමි පුරුෂයා සහ වැඩිහිටි දරුවන් සහය දක්වන බව ද සඳහන් විය.

ගොවි කාන්තාවන්ගෙන් 17%ක් මල් වගාව හා විසිතුරු පත්‍ර වගාව, එළවළු පලතුරු හා දැව ශාක ඇතුළත් පාත්ති පවත්වාගනිමින් ඒවා තොග මට්ටමින් සහ සිල්ලර මට්ටමින් අලෙවි කිරීමෙහි නියුක්ත වන්නාහ. කුරුණෑගල දිස්ත්‍රික්කයේ හොරොම්බාව ගොවිජන සේවා මධ්‍යස්ථානයට අයත් "තුරුලිය" ගොවි කාන්තා සමිතිය කේන්ෆාම්, සැන්ඩ්‍රියානා වැනි විසිතුරු පත්‍ර වගාව ඉතා සාර්ථකව සිදු කරනු ලබයි. ගොවි කාන්තා සමිතියට සම්බන්ධ වී සිටීම නිසා රජයෙන් ක්‍රියාත්මක කෙරෙන වෙනත් ව්‍යාපෘති (වාරි පුබුදුව, දිවි නැගුම) මඟින් ප්‍රතිලාභ ලබා ගනිමින් සාර්ථකත්වයට පත් ව්‍යවසායකත්ව හැකියාවන් දියුණු කර ගත් කාන්තාවන් අනුරාධපුර දිස්ත්‍රික්කයේ ශ්‍රාවස්තිපුර ගොවිජන සේවා බල ප්‍රදේශයේ හිඳෝගම "නවලිය" ගොවි කාන්තා

සමිතියේ දී හමු විය. පලතුරු, එළවළු හා වටිනා දැව පැළ වර්ග අලෙවිය මඟින් මෙම කාන්තාව ආදායම් උත්පාදනය කරයි. ගොවි කාන්තා සමිතියට සම්බන්ධවීම නිසා මෙවැනි තිරසාර ස්වයං රැකියාවක් පවත්වාගත හැකි වූ බව මෙම කාන්තාවන්ගේ අදහස විය. එසේ වුවත් ඔවුන්ට යම් යම් මට්ටමින් ගැටලු පවතින බව ද සඳහන් විය ( සිද්ධි අධ්‍යයන 01).

සිද්ධි අධ්‍යයනය 01: පැළ තවාන් පවත්වාගෙන යාම

අනුරාධපුර දිස්ත්‍රික්කයේ ශ්‍රාවස්තිපුර ගොවිජන සේවා බල ප්‍රදේශයේ හතේ ඇල හිදෝගම "නවලිය" ගොවි කාන්තා සමිලියට අයත් එස්.එම්.බී. මැණිකේ ගුණවර්ධන මහත්මිය විසින් 2008 වර්ෂයේ සිට "තුරුලිය" නමින් ලියාපදිංචි පැළ තවානක් පවත්වාගෙන යනු ලබයි. 2008 වර්ෂයේ දී ගොවි කාන්තා සමිතිය මඟින් ප්‍රදේශයේ ක්‍රියාත්මක වූ "වාරි පුබුදුව" ව්‍යාපෘතිය හරහා ලබා දුන් පුහුණුවීම්වලට යොමු කිරීමත්, ගන්නෝරුව, මහඉලුප්පල්ලම පැවැත්වූ පුහුණුවීම්වලට යොමු කිරීමත් නිසා ඇය මෙම පැළ තවාන ආරම්භ කිරීමට යොමු වී ඇත.මුළු පැළ තවාන අක්කර ½ක් වූ ඇයගේ ගෙවත්ත පුරාම පවත්වාගෙන යන අතර ඇයගේ ස්වාමි පුරුෂයා කුඹුරු අක්කර 2ක සිදු කරන වී වගාවට අමතරව මේ සඳහා සහයෝගය ලබා දෙන්නේ ය. ඇයගේ පුත්‍රයා විසින් නිවසේදී ම සකස් කළ පැළ බඳුන් ඇයට සැපයීමෙන් ඇයගේ ස්වයං රැකියාවට අත්වැලක් වී ඇත.

බඳුන්ගත මිරිස් වගාව කෙරෙහි වැඩි අවධානය යොමු කර ඇති ඇය මල් පැළ නිෂ්පාදනය (ඕකිඩ්, රෝස වර්ග, සයිප්‍රස්, ඉද්ද, බෝගන්විලා, ෆාම්ස් වර්ග (කේන්ෆාම්), ක්‍රෝටන්) හා පලතුරු පැළ නිෂ්පාදනයේ ද (දොඩම්, අඹ, පේර, ඇඹරැල්ලා, දෙළුම්, ඩ්‍රැගන්ෆෲට්, ජම්බෝල, ජම්බු, දෙහි) යෙදෙන්නී ය.පැළ සඳහා අවශ්‍ය ඇතැම් කොම්පෝස්ට් පොහොර ඇය විසින් නිවසේදී ම සකස් කර ගන්නා අතර ඒ සඳහා යොදා ගන්නා අමුද්‍රව්‍ය (ගොම) මාසකයට ගෝනි 6ක් (අත්ට්‍රැක්ටරයක ප්‍රමාණය)අවශ්‍ය බවත් ඒ සඳහා රු. 1000/= ක් ද ප්‍රවාහන වියදම් සඳහා රු. 500/= ක් ද වැය වන බව සඳහන් කළාය. ඊට අමතරව වගා මාධ්‍යය සඳහා අවශ්‍ය වැලි ප්‍රවාහනය ද මාස 6ට වරක් සිදු කරන අතර ඒ සඳහා රු. 4000/=ක් පමණ වැය වන බව සඳහන් විය. ඇය විසින් වාරියපොළ ප්‍රදේශයෙන් පැළ වර්ග රැගෙන විත් විකිණීම ද සිදු කරන අතර එය වසරකට දෙවරක් පමණ සිදු කරයි. එහි දී පැළ සඳහා රු. 25,000ක් පමණ වැය වන අතර ප්‍රවාහනයට රු. 4,000/= ක් වැය වන බව සඳහන් කළාය.

මෙය පවත්වාගෙනයාම සඳහා අවශ්‍ය පුහුණුවට අමතරව දිවිනැඟුම ව්‍යාපෘතිය හරහා ලබාදුන් ප්‍රතිලාභ සඳහාත් ඇයව යොමු කිරීම නිසා, ඇයට 50% දායකත්වයෙන් පැළ සඳහා ආරක්ෂිත ගෘහයක් (Poly tunnel) සහ පැළ තවාන් ආවරණ (Tent) කට්ටලයක් ලැබී ඇත.පවුලේ ශ්‍රමය භාවිතා කරන බැවින් ශ්‍රමය සඳහා පිරිවැයක් නොවන අතර, වැඩි පිරිවැයක් දැරිය යුත්තේ ප්‍රවාහනය සඳහාය. මාසයක් තුළ පැළ වර්ග 500ක් පමණ අලෙවි කරන අතර සියලු වියදම් ඉවත් වූ පසු මාසිකව ඇයගේ ශුද්ධ ලාභය රු. 19,300ක් පමණ වන බව ද ඇය සඳහන් කළාය.ප්‍රවාහන වියදම් අඩු කිරීම මඟින් කවදුරටත් ඇයට ලාභ ලබා ගත හැකි බවත් ඒ සඳහා කුඩා වාහනයක් මිල දී ගැනීමට ඇයට පහසු ගෙවීමේ ක්‍රමයට හෝ ආධාර බලාපොරොත්තු වන බව ඇය යෝජනා කළා ය. ඊට අමතරව වර්තමානයේ නාච්චදූව ව්‍යාපාරයට පැළ සපයාගනු ලබන්නේ වෙනත් ප්‍රදේශයකින් වන අතර මැණිකේ ගුණවර්ධන මහත්මිය සඳහන් කරන්නේ, එම පැළ සැපයුම තමාට කළ හැකි බවයි. එකවර පැළ 5000ක් වුව ද සැපයීමේ

ආදායම් උත්පාදන කාර්යන් හි නියුතු කාන්තාවන්ගෙන් 14%ක් තම ගෙවත්ත තුළ එළවළු සහ පලතුරු වගා කිරීම සිදු කරන අතර එම නිෂ්පාදන අලෙවි කිරීම මඟින් ආදායම් උත්පාදනය සිදු කරනු ලබයි. ගෙවත්තේ එළවළු හා පලතුරු අලෙවි කිරීම සඳහා ගොවි කාන්තා සමිති මඟින් විශේෂ "පොළ" ක්‍රමයක් අනුගමනය කරන බව අධ්‍යයනයේ දී නිරීක්ෂණය කළ හැකි විය. ස්වයං රැකියාවක් ලෙස තම ගෙවත්ත වගා කරන ගොවි කාන්තාවන් තම නිෂ්පාදන අලෙවි කිරීම් පහසු කරගැනීම සඳහා ගම්මානයේ පොදු ස්ථානයක පොළක් පැවැත්වීමට කටයුතු කර ඇත්තේ ඔවුන්ගේ නිෂ්පාදන අලෙවි කිරීමට පැවති ගැටලු නිසා ය. ග්‍රාමීය මට්ටමේ නිෂ්පාදන අලෙවි ගැටලුව අවම කරගැනීම සඳහා ගොවි කාන්තා සමිති හරහා හඳුනාගෙන ඇති උචිත ක්‍රමෝපායයක් ලෙස කුඩා පොළක් පැවැත්වීම සාර්ථක ක්‍රමයක් බව නිලධාරීන්ගේ ද අදහස විය. පැරණි ගැමි සමාජය තුළ පැවති භාණ්ඩ හුවමාරු ක්‍රමය තවදුරටත් පුළුල් කිරීමක් ලෙස මෙය හඳුනාගත හැකි අතර තම ගෙවත්තේ වැවෙන පලතුරු හෝ එළවළු තම අසල්වාසීන්ටම මුදලට අලෙවි කිරීමත් මෙහිදී දැකිය හැකිය. වස විසෙන් තොර වීමත්, පිරිසිදු භාවයත්, නැවුම් භාවයත් පිළිබඳ සහතිකයක් පවතින බැවින් මෙම ක්‍රමය සාර්ථකව සිදු කරගෙන යන බව ගොවි කාන්තාවන්ගේ අදහස් විය. මෙය සාර්ථකව සිදු කරනු ලබන ගොවි කාන්තා සමිතියක් ලෙස කුරුණෑගල දිස්ත්‍රික්කයේ යක්විල ගොවිජන සේවා බල ප්‍රදේශයට අයත් හොරවඩුන්න ග්‍රාමයේ "දිරිය" ගොවි කාන්තා සමිතිය හඳුනාගත හැකි විය. මෙම සමිතියේ සාමාජිකාවන් මෙම "කුඩා පොළක්" පැවත්වීමේ ක්‍රමය ඔවුන්ගේ ම ශක්තියෙන් වර්ධනය කරගැනීමේ ප්‍රතිඵලයක් ලෙස සාමාජිකාවකට අයත් හිස් ඉඩමක "අලෙවි කුටියක්" ගොඩනඟා ගෙන ඇත. සමිතියේ අරමුදල් භාවිතා කරමින් මෙසේ ගොඩනගාගෙන ඇති අලෙවි කුටිය තුළ සාමාජිකාවන් විසින් තමන් සතු ගෙවතු වගා නිෂ්පාදන දිනපතා අලෙවි කරනු ලබයි. ප්‍රධාන මාර්ගයක් අසල පවතින මෙම අලෙවි කුටිය තුළ ගෙවතු වගා නිෂ්පාදනවලට අමතරව කාන්තාවන් විසින් නිෂ්පාදනය කෙරෙන ආහාර වර්ග සහ අත්කම් භාණ්ඩ ද අලෙවිය සඳහා තබා ඇති බව ක්ෂේත්‍ර සමීක්ෂණයේ දී නිරීක්ෂණය කළ හැකි විය. මෙයින් ලබන ආදායම් අලෙවි කුටිය ආසන්නයේ ම පවතින සී/ර ස.ණ.ස. බැංකුවේ පවතින එක් එක් සාමාජිකාව සතු ගිණුම්වල තැන්පත් කරනු ලබයි. ස.ණ.ස. සමිතියෙන් ණය ලබාගැනීමේ දී ද තැන්පතු ඇපයක් ලෙස මෙම මුදල් භාවිතා කිරීම සිදු කරන බව ගොවි කාන්තාවෝ සඳහන් කළහ.

කුරුණෑගල දිස්ත්‍රික්කයටම අයත්, උඩුබද්දාව ගොවිජන සේවා බල ප්‍රදේශයේ අමුණුවෙල ග්‍රාමයේ සුපිපි ගොවි කාන්තා සමිතිය, කිරාවැව ග්‍රාමයේ "ප්‍රබෝදා" ගොවි කාන්තා සමිතිය,

යක්විල ගොවිජන සේවා බල ප්‍රදේශයේ කදිරපොළ ග්‍රාමයේ "නිල්දිය" ගොවි කාන්තා සමිතියත්" ගෙවතු වගාව ස්වයං රැකියාවක් ලෙස සිදු කරමින් එහි නිෂ්පාදන පොළ ක්‍රමය මඟින් සාර්ථකව අලෙවි කරගන්නා බව අධ්‍යයනයේ දී අනාවරණය විය.

වගු සටහනට අනුව ගොවි කාන්තාවන් නියැළෙන ස්වයං රැකියාවක් ලෙසින් ගුණාත්මක සහල් නිෂ්පාදනය ද සැලකිය යුතු මට්ටමක පවතී (14%). කුරුණෑගල (14 දෙනෙකු), අනුරාධපුරය (05 දෙනෙකු) යන දිස්ත්‍රික්කයන් හි වැඩි සාමාජික පිරිසක් මෙම ස්වයං රැකියාවන් හි නියැළෙන අතර මොණරාගල දිස්ත්‍රික්කයේ ස්වයං රැකියාවන් හි නියුක්ත කාන්තාවන් අතර, සහල් නිෂ්පාදනයේ යෙදෙන කාන්තාවන් හමු නොවුණි. මහනුවර දිස්ත්‍රික්කයේ එක් අයෙකු සහල් නිෂ්පාදනයේ යෙදෙන නමුත් සාර්ථක මට්ටමේ නොමැති බව නිරීක්ෂණය කළ හැකි විය.

වගු සටහන අනුව, ධාන්‍ය අඹරා ඇසුරුම් කර අලෙවි කිරීමත් කුළුබඩු ඇසුරුම් කිරීමත් ස්වයං රැකියාවක් ලෙස සිදු කරන ගොවි කාන්තාවන් සංඛ්‍යාවේ ප්‍රතිශතය 7% ක් නියැදිය තුළ හමු විය. ඔවුන්ව මේ සඳහා ගොවි කාන්තා සමිති හරහා පුහුණුවීම් සඳහා යොමු කිරීමක් සිදු නොවූ බව අධ්‍යයන නියැදියේ දත්ත අනුව පැහැදිලි වන නමුත්, ධාන්‍ය හා කුළුබඩු ඇඹරුම් යන්ත්‍ර, සීලර් යන්ත්‍ර, පොලිතීන් වැනි ප්‍රතිලාභ ගොවි කාන්තා සමිතිය හරහා ලබා දී ඇත. එබැවින් තමන් සතු දැනුමින් ගොවි කාන්තාවන් මෙම ස්වයං රැකියාවේ නියැළෙන බව ක්ෂේත්‍ර සමීක්ෂණයේ දී ගොවි කාන්තාවන් විසින් සඳහන් කරන ලදී. විශේෂ පුහුණුවීම් නොලැබුණ ද ප්‍රදේශයේ, කෘෂිකර්ම උපදේශක මහතා විසින් ධාන්‍ය හා කුළුබඩු නිෂ්පාදනවල ගුණාත්මකභාවය ආරක්ෂා වන පරිදි සකස් කිරීමටත්, ඇසුරුම් කිරීමටත් යෝග්‍ය උපදෙස් ලබාදෙන බව ඔවුහු සඳහන් කළහ. මෙම නිෂ්පාදන සඳහා සුපිරි වෙළඳසැල්වල ඉහළ ඉල්ලුමක් පවතින අතර එම වෙළඳසැල්වලට ගැළපෙන පරිදි ආකර්ෂණීය ඇසුරුම් ක්‍රම හා වෙනත් නව ක්‍රමවේදයන් පිළිබඳ දැනුම අවශ්‍ය බව මෙම කාන්තාවෝ සඳහන් කළහ. එසේම තරඟකාරී මට්ටමට යා හැකි පරිදි නිෂ්පාදන සකස් කිරීමට නම් ඒ සඳහා ඉහළ පිරිවැයක් දැරිය යුතු වුවත් මෙවැනි ස්වයං රැකියාවන් ප්‍රවර්ධනය කර ගැනීමට එම ඉහළ පිරිවැය අවම කරගැනීම සඳහා පහසු ගෙවීම් සහිත ණය හෝ ආධාර අවශ්‍ය බව සඳහන් විය.

**සිද්ධි අධ්‍යයනය 02 : ධාන්‍ය, කුළු බඩු හා බයිට් වර්ග නිෂ්පාදනය**

එච්. එම්. අසෝකා හේරත් මහත්මිය කුරුණෑගල දිස්ත්‍රික්කයේ උඩුබද්දව ගොවිජන සේවා මධ්‍යස්ථානයට අයත් කිරාවැව "ප්‍රබෝද" ගොවි කාන්තා සමිතියේ වසර ගණනාවක සිටම සක්‍රිය සාමාජිකාවක් ලෙස කටයුතු කරයි. අ.පො.ස. සා/පෙළ සමත් වූ වයස අවු. **35**ක් පමණ වන එක්දරු මවකි. බයිට් වර්ග, මුරුක්කු, තුනපහ කුඩු, ධාන්‍ය පිටි සහ හඳුන්කූරු ඇතුළත් නිෂ්පාදන **18**ක් වෙළඳපොළට ඉදිරිපත් කරන ඇය මෙම ස්වයං රැකියාව ආරම්භ කර ඇත්තේ වර්ෂ **2008** දී ය. මුල් කාලීනව සමිතියේ නමින් ලියාපදිංචි වී සුළු පරිමාණයෙන් වී නිෂ්පාදන අලෙවි කර ඇති අතර වර්තමානයේ "කේෂාන් නිෂ්පාදන" නමින් ඇයගේම වෙළඳනාමයක් යටතේ නිෂ්පාදන අලෙවි කෙරේ.

ගොවි කාන්තා සමිතිය මඟින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ආහාර තාක්ෂණය පිළිබඳ පුහුණුවටත්, පසු අස්වනු තාක්ෂණ ආයතනයේ පුහුණුවකටත්, කුඩා ව්‍යාපාර සංවර්ධන ආයතනයේ පවත්වනු ලැබූ පුහුණුවීමකටත් ඇයව යොමු කරවා ඇත. කුළු බඩු වර්ග සැකසීම හා ආහාර තාක්ෂණය නමින් ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණුවක් ලබා ඇති අසෝකා මහත්මියගේ සැමියා නිෂ්පාදන සකස් කිරීමට සහ ප්‍රවාහනයටත්, නිෂ්පාදන හා අලෙවිය පිළිබඳ පොත්පත් පවත්වාගැනීමටත් ඇයට විශේෂ සහයෝගයක් ලබාදෙන බව ඇය සඳහන් කළා ය.

පුහුණුවීම්වලට අමතරව ගොවි කාන්තා සමිතිය වෙත පොදු පරිහරණයට ලැබුණු සීලර් යන්ත්‍රය ඇයගේ ස්වයං රැකියාව සඳහා භාවිතා කරන අතර **50%** දායකත්වය යටතේ ධාන්‍ය ඇඹරුම් යන්ත්‍රය මිල දී ගෙන ඇත. ඊට අමතරව ගොවි කාන්තා සමිතිය මඟින් **5%** පොළී අනුපාතිකයක් යටතේ රු. **15,000**ක මුදලක් ලබාගෙන ඇත.

මුල් කාලීනව සමිති සාමාජිකාවන් ශ්‍රමයෙන් පවා ඇයට සහයෝගය සැපයූ බවත් නිලධාරීන්ගේ සහයෝගය ද උපරිමයෙන් ඇය ලබාගත්තා බවත්, විශේෂ තොරතුරු හා දැනුම ලබා ගත යුතු නිලධාරීන් පිළිබඳව ද ඇය පුළුල් දැනුමකින් කටයුතු කරන බව පෙනුණි.

අසෝකා මහත්මිය විසින් ගම තුළ සහ පිට පළාත්වල සිල්ලර කඩ **50**ට ආසන්න ප්‍රමාණයකට තම නිෂ්පාදන සපයනු ලබයි. ඇය එකවර අමුද්‍රව්‍ය විශාල ප්‍රමාණයක් මිල දී ගන්නා අතර මාසිකව බයිට් සහ මුරුක්කු සෑදීමට සහල් **50kg** ක් සහ තිරිඟු පිටි **30kg** ක් මිල දී ගනු ලබයි. කුලී ශ්‍රමිකයින් නොමැති අතර මාසයකට දෙවරක් නිෂ්පාදන සපයයි. සැමියා විසින් ඔහුගේ ත්‍රී වීලර් යන්ත්‍රයෙන් ප්‍රවාහනය සිදු කරනු ලබයි. ප්‍රවාහනය සහ ශ්‍රමය සඳහා කුලී ගෙවීමක් නොමැති අතර දළ වශයෙන් මාසිකව නිෂ්පාදන පිරිවැය රු. **108,000**ක් පමණ වන බවත් දළ ආදායම රු. **135,000**ක් පමණ වන අතර ශුද්ධ ලාභය ලෙස මාසිකව රු. **27,000-28,000** ලබන බව ඇය සඳහන් කළාය.

ව්‍යාපාරය කවදුරටත් පුළුල් කරගෙන පවුලේ ප්‍රධාන ආදායම් මාර්ගය බවට පත් කර ගැනීම ඇයගේ අරමුණ වන අතර ඇයට අත්‍යවශ්‍ය වන විජලන යන්ත්‍රයක් මිල දීගැනීමට ණය ආධාර ද, ඇය සතුව පවතින යන්ත්‍ර සූත්‍ර අලුත්වැඩියා කරගැනීමට අවශ්‍ය පුහුණුවක් ද ඇය බලාපොරොත්තු වේ.

ඇයගේ ව්‍යාපාරය ඉතාමත් ක්‍රමවත්ව වෙනම ගොඩනැගිල්ලක සිදු කරන අතර අමුද්‍රව්‍ය වෙළඳපොළට ඉදිරිපත් කෙරෙන නිෂ්පාදන, තවමත් නිෂ්පාදන ක්‍රියාවලියේ පවතින ද, ඉතාමත් සුරක්ෂිතව වෙන වෙනම ප්ලාස්ටික් බඳුන්වල අසුරා ඇත. සමාජීය හා ආර්ථික වශයෙන් ඇය තෘප්තිමත් බවත් ඒ සඳහා කාන්තා සමිතිය වඩාත් රුකුලක් වූ බවත් අසෝකා මහත්මිය සඳහන් කළාය.

යට කී ආදායම් උත්පාදන කාර්යයන්ට අමතරව මී මැසි පාලනය (3%) ද, ගුණාත්මක බීජ නිෂ්පාදනය (2%) සහ බිම්මල් නිෂ්පාදනය (1%) වැනි ක්ෂේත්‍ර සඳහා සම්බන්ධ වූ කාන්තාවන් ද අධ්‍යයනයේ දී හමු විය. ඊට අමතරව ඇඳුම් මැසීම හා නිමි ඇඳුම් අලෙවිය (6%), ඉදල්/කොසු/පාපිසි සෑදීම (3%), සිල්ලර වෙළඳාම (6%) වැනි සෘජුවම කෘෂිකර්මාන්තයට සම්බන්ධ නොවූ ස්වයං රැකියාවන් හි නියුතු කාන්තාවන් හමු වූ අතර මෙම ක්ෂේත්‍ර සඳහා කාන්තාවන් අතර ඉල්ලුම අවම මට්ටමේ පවතින බව පෙනී ගියේය. ගොවි කාන්තාවන් නියුතු ආදායම් උත්පාදන ක්‍රියාවන් පිළිබඳ කෙරුණු ඉහත විශ්ලේෂණය අනුව පෙනී යන්නේ, ආහාර නිෂ්පාදන කර්මාන්තයට අදාළ කටයුතු කෙරෙහි ගොවි කාන්තාවන්ගේ වැඩි නැඹුරුවක් පවතින බවයි. ඊට අමතරව, ගෙවතු වගා හා කොම්පෝස්ට් නිෂ්පාදනය, මල් වගාව හා විසිතුරු පත්‍ර වගාව, ගුණාත්මක සහල් නිෂ්පාදනය, ධාන්‍ය හා කුළු බඩු සැකසුම වැනි ක්ෂේත්‍ර ද ගොවි කාන්තාවන් වැඩි නැඹුරුවක් දක්වා ඇති බව පැහැදිලි වේ. ශිල්පීය දැනුම සහිතව සිදු කළ යුතු ස්වයං රැකියා (ඇඳුම් මැසීම, ගමන් මළු, පාවහන් නිෂ්පාදනය, ඉදල්/කොසු/පාපිසි නිෂ්පාදනය) සඳහා යොමු වීම යට කී ස්වයං රැකියාවලට සාපේක්ෂව සීමිත වී ඇත්තේ, ඒවාට අවශ්‍ය පුහුණුව අඩුවීම, එවැනි ස්වයං රැකියා සඳහා වැඩි කාලයක් වෙන් කිරීමට සිදුවීම, අමුද්‍රව්‍ය පිරිවැය සහ නඩත්තු පිරිවැය ඉහළ යාම සහ අලෙවි ගැටලු පැවතීම යන හේතු බව ගොවි කාන්තා සමිතිවලට අදාළ නිලධාරීන් සමඟ කෙරුණු සාකච්ඡාවල දී මෙන්ම කණ්ඩායම් සාකච්ඡාවල දී ද පැහැදිලි විය.

## 6.4 ආහාර නිෂ්පාදන කර්මාන්තයට කාන්තාවන් වැඩි නැඹුරුවක් දැක්වීමට හේතු

කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහන හරහා වැඩි කාන්තාවන් පිරිසක් ආහාර නිෂ්පාදන ක්ෂේත්‍රයට වැඩි නැඹුරුවක් දක්වා තිබීමත්, වෙනත් ව්‍යවසායකත්ව කාර්යයන්ට යොමු වීම සීමා සහිත වීමටත් හේතු සොයා බැලීමට කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහනට අදාළ ඉහළම මට්ටමේ නිලධාරීන්ගේ අවශ්‍යතාවයක් විය. එම අවශ්‍යතාවය අනුව ආහාර නිෂ්පාදනයේ යෙදුණු කාන්තාවන්ගෙන් මේ පිළිබඳ විමසා ඔවුහු දැක් වූ අදහස් සම්පිණ්ඩනය කිරීමේ දී පෙනී ගියේ, පවුල තුළ හා සමාජය තුළ කාන්තාවන් විසින් ඉටු කරනු ලබන තෙවැදෑරුම් කාර්යභාරයට හානියක් නොවීමත්, කාන්තාවට තමාගේ ජීවන රටාව තුළ ඉතා හුරුපුරුදු කාරණයක් ලෙසින් ආහාර සකස් කිරීමේ කාර්යයට වැඩි නැඹුරුවක් පැවතීමත් එයට හේතුන් වූ බවයි.

i. ගෘහයේ කාර්යභාරයට සහයක් ලැබීම

ii. පවුලේ සාමාජිකයින්ගේ (ස්වාමිපුරුෂයාට,දරුවන්ට) කාර්යයන්ට හා ආරක්ෂාවට හානියක් නොවීම

iii. පවුලේ මුළු ආදායමට දායකත්වයක් සැපයීමට හැකිවීම

iv. සමාජය තුළ සාම්ප්‍රදායික කටයුතු කිරීමට හැකියාවක් ලැබීම

v. සමාජය තුළ පිළිගැනීමක් (විශේෂ හඳුනාගැනීමක්) පැවතීම

මීට අමතරව අලෙවි ගැටලු අවම වීම, අමුද්‍රව්‍ය සපයාගැනීමේ දුෂ්කරතා නොමැතිවීම පවුලේ ශ්‍රමය භාවිතා කළ හැකි වීම ආදී කරුණු ද බලපා ඇත.

වර්තමානයේ කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති මූලස්ථානයට හා ප්‍රධාන කාර්යාලයට ආසන්නව මහනුවර දිස්ත්‍රික් පළාත් සභා බල ප්‍රදේශය තුළ ගන්නෝරුවට ආසන්නව සිටින ගොවි කාන්තා සමිති සාමාජිකාවන් සම්බන්ධ වී දේශීය බෝග ආශ්‍රිතව වස විසෙන් තොර ආහාර නිෂ්පාදනය කරමින් ආරම්භ කර ඇති කෘෂිකාර්මික ව්‍යාපාරය වන හෙළ බොජුන් වැඩසටහන ගොවි කාන්තා සමිතිවල ගොවි කාන්තාවන් නියැළී සිටින ආහාර නිෂ්පාදන ක්ෂේත්‍රයේ වර්ධනීය හා ඉතා ඵලදායී අවස්ථාවක් ලෙසින් අධ්‍යනයේ දී හඳුනා ගනු ලැබිණි. (හෙළ බොජුන් සංකල්පය සහ එහි ප්‍රායෝගික ක්‍රියාකාරීත්වය පිළිබඳව ඇමුණුම් අංක 02න් ඉදිරිපත් කර ඇත.)

### 6.5 ආදායම් උත්පාදන මාර්ගයන් පවුලේ ප්‍රධාන ආදායමට දක්වා ඇති දායකත්වය සහ ගෘහ ජීවිතයට කර ඇති බලපෑම

ක්ෂේත්‍ර සමීක්ෂණ දත්තවලට අනුව සමස්ත නියැදිය තුළ සිටින ස්වයං රැකියාවන් හි නියුතු සියලුම දෙනා විවිධ ආදායම් මට්ටම්වලින් තම පවුලේ ප්‍රධාන ආදායමට දායකත්වයක් සපයනු ලබන බව පැහැදිලි විය. වගු අංක 6.4ට අනුව පළාත් හා අන්තර් පළාත් බල ප්‍රදේශ දෙකට අයත් වන දිස්ත්‍රික්කයන් හි ස්වයං රැකියාවන් හි නියුතු කාන්තාවන්ගේ පවුලේ මුළු ආදායමේ සාමාන්‍ය සහ සහ ඔවුන් විසින් ස්වයං රැකියාවෙන් උපයන මුළු මාසික ආදායමේ සාමාන්‍ය අගයන් පෙන්වාදෙනු ලබයි. එහි දී දිස්ත්‍රික්ක හතරෙහි ම කාන්තාවන්ගේ පවුලේ මුළු ආදායමේ සාමාන්‍ය රු.35,830.06ක් වන අතර දිස්ත්‍රික් අතර ආදායම් පරාසය ගතහොත් උපරිමය රු.38,375.49ක් සහ අවමය රු.29,250.00ක් වන බව පෙනී යයි. ඔවුහු ස්වයං රැකියාවෙන් ලබන ආදායම් පිළිබඳ සැලකිලිමත්වීමේ දී දිස්ත්‍රික්ක හතරෙහිම කාන්තාවන්ගේ ස්වයං රැකියාවෙන් ලබන මාසික ආදායමේ සාමාන්‍ය අගය වන්නේ, රු.7,349.73ක් වේ. ආදායම් පරාසය ගතහොත් උපරිමය රු.9,765.45ක් සහ අවමය රු.2,360.00ක් වේ.

වගු සටහන් අංක **6.4:** ස්වයං රැකියාවන්ගෙන් ලබන මුළු මාසික ආදායම් සහ පවුලේ මුළු මාසික ආදායම්වල සාමාන්‍ය

| බල ප්‍රදේශය | දිස්ත්‍රික්කය | ස්වයං රැකියාවන් හි ආදායම් උපයන කාන්තාවන් සංඛ්‍යාව | පවුලේ මුළු මාසික ආදායමේ සාමාන්‍ය (රු.) | ස්වයං රැකියාවෙන් ලබන මුළු මාසික ආදායමේ සාමාන්‍ය (රු.) |
|---|---|---|---|---|
| පළාත් බල ප්‍රදේශ | කුරුණෑගල | **77** | **35,115.97** | **6,233.25** |
| | මොණරාගල | **14** | **32,728.57** | **6,461.00** |
| අන්තර් පළාත් බල ප්‍රදේශ | අනුරාධපුරය | **49** | **38,375.49** | **9,765.45** |
| | මහනුවර | **04** | **29,250.00** | **2,360.00** |
| | එකතුව | **144** | **35,830.00** | **7,349.73** |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2014

වගු සටහන් අංක 6.5න් පෙන්නුම් කරන්නේ, ස්වයං රැකියාවන් හි නියුතු කාන්තාවන් තම පවුලේ මුළු ආදායමට සැලකිය යුතු මට්ටමේ දායකත්වයක් සපයන බවයි.

දිස්ත්‍රික්ක හතරෙහි ම කාන්තාවන් තම ස්වයං රැකියාවෙන් පවුලේ මුළු ආදායමට දක්වන දායකත්වයේ සාමාන්‍ය අගය ගතහොත් එය 20.5%ක් වේ. කුරුණෑගල, අනුරාධපුර සහ මොණරාගල යන දිස්ත්‍රික්කයන් හි කාන්තාවන් තම පවුලේ මුළු අදායමට සැලකිය යුතු මට්ටමේ දායකත්වයක් සපයනු ලබන අතර මහනුවර දිස්ත්‍රික්කයේ කාන්තාවන්ගේ දායකත්වය සාපේක්ෂව අඩු මට්ටමක පවතී. අනෙකුත් දිස්ත්‍රික්කයන්ට සාපේක්ෂව මහනුවර දිස්ත්‍රික්කය සඳහා තෝරාගත් නියැදිය තුළ ස්වයං රැකියා පවත්වාගෙන යන කාන්තාවන් හමු වූයේ ඉතා සුළු ප්‍රමාණයක් වීම මේ සඳහා හේතුවක් ලෙස සඳහන් කළ හැකිය.

වගු සටහන් අංක 6.5: ස්වයං රැකියාවෙන් ලබාගන්නා මුළු මාසික ආදායමේ සාමාන්‍ය, පවුලේ මුළු මාසික ආදායමේ ප්‍රතිශතයක් ලෙස

| බල ප්‍රදේශය | දිස්ත්‍රික්කය | මුළු මාසික ආදායමේ සාමාන්‍ය (රු.) | ස්වයං රැකියාවෙන් ලබන මුළු මාසික ආදායමේ සාමාන්‍ය (රු.) | පවුලේ මුළු ආදායමේ ප්‍රතිශතයක් ලෙස (රු.) |
|---|---|---|---|---|
| පළාත් බල ප්‍රදේශ | කුරුණෑගල | **35,115.97** | **6,233.25** | **17.7%** |
| | මොණරාගල | **32,728.57** | **6,461.00** | **19.7%** |
| අන්තර් පළාත් බල ප්‍රදේශ | අනුරාධපුරය | **38,375.49** | **9,765.45** | **25.4%** |
| | මහනුවර | **29,250.00** | **2,360.00** | **8.0%** |
| | එකතුව | **35,830.00** | **7,349.73** | **20.5%** |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2014

ඉහත විශ්ලේෂණය අනුව දිස්ත්‍රික්ක හතරෙහි ම අධ්‍යයනයට සහභාගී වූ ගොවි කාන්තාවන්ගෙන් ආදායම් උත්පාදන ක්‍රියාවන් සඳහා යොමු වී සිටින්නේ අඩකටත් වඩා අඩු ප්‍රමාණයක් වන නමුත්, සුළුතරයක් වූ එම කණ්ඩායම සමිති තුළ සිටින අනෙකුත් සාමාන්‍ය ගොවි කාන්තාවන්ට වඩා සමාජීය හා ආර්ථික වශයෙන් ශක්තිමත් හා ආත්ම තෘප්තියක් සහිතව කටයුතු කරනු ලබන බව අධ්‍යයනයේ දී පැහැදිලි වූ විශේෂිත තත්ත්වයකි.

ක්ෂේත්‍ර සමීක්ෂණයට අමතරව ගොවි කාන්තාවන් හා කෙරුණු සාකච්ඡාවලදී ත් මෙම කරුණු නිරවද්‍ය බව පැහැදිලි වූ අතර ගොවි කාන්තා සමිතිවලට අදාළ නිලධාරීන් ද සඳහන් කළේ එක් එක් සමිති ගතහොත් ඒ සමිතිය තුළ වඩාත් කාර්යක්ෂම හා අවදානම් දැරීමට කැමති සුළු කොටසක් මෙම ස්වයං රැකියා දිරිමත්ව පවත්වාගෙන යන බවත්, සමාජීය කාර්යයන් තුළ දී ද ඉදිරියට පැමිණ අභියෝග සඳහා ඉදිරිපත් වන්නේ මෙම කණ්ඩායම බවත් ය.

### 6.5.1 ගෘහ ජීවිතයට පවතින බලපෑම (දියුණුව/පිරිහීම)

ගොවි කාන්තා සමිති හරහා සිදු කෙරෙන ස්වයං රැකියා නිසා ඔවුන්ගේ ආදායමට යම් දායකත්වයක් සැපයීම සිදු වන බව ඉහත විශ්ලේෂණ මඟින් පැහැදිලි විය. ගොවි කාන්තා සමිති හරහා ගොවි කාන්තාවන්ගේ ආදායම් මට්ටම ඉහළ දැමීමේ අරමුණ එක්තරා මට්ටමකින් සාර්ථක වී ඇති බව පෙනී යන අතර සමස්තයක් ලෙස ගොවි කාන්තා සමිතිවලට සම්බන්ධ වී

කටයුතු කිරීම නිසා තම පවුල තුළ සිදු වී ඇති දියුණුව හෝ පිරිහීම පිළිබඳව ද ගොවි කාන්තාවන්ගෙන් අදහස් විමසන ලදී. ඒ අනුව ඔවුන්ගේ ජීවන තත්ත්වයේ එක් එක් අංශවලට සිදු වූ වෙනස පිළිබඳ ඔවුන් දැක් වූ අදහස් ප්‍රතිශත විශ්ලේෂණයක් ලෙසින් පහත දැක්වේ.

වගු සටහන් අංක **6.6:** ජීවන තත්ත්වයේ පිරිහීම/දියුණුව පිළිබඳ අදහස්

| ප්‍රතිචාරයන් හි ස්වභාවය | ප්‍රතිචාර දැක් වූ ගොවි කාන්තාවන් සංඛ්‍යාව (%) **N=325** | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | **1** | **2** | **3** | **4** | **5** | **6** | **7** | **8** | **9** | **10** | **11** |
| ඉතා හොඳින් දියුණු වී ඇත | **32.0** | **34.0** | **10.0** | **54.0** | **7.0** | **12.0** | **4.0** | **30.0** | **10.0** | **31.0** | **31.0** |
| තරමක් හොඳින් දියුණු වී ඇත | **44.0** | **37.0** | **58.0** | **35.0** | **29.0** | **35.0** | **31.0** | **33.0** | **35.0** | **52.0** | **52.0** |
| වෙනසක් නැත | **24.0** | **29.0** | **32.0** | **11.0** | **64.0** | **53.0** | **65.0** | **37.0** | **55.0** | **17.0** | **17.0** |
| එකතුව | **100.0** | **100.0** | **100.0** | **100.0** | **100.0** | **100.0** | **100.0** | **100.0** | **100.0** | **100.0** | **100.0** |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2014

**1** පවුලේ ආදායම
**2** පවුලේ ආහාර සැපයුම හා පෝෂණය
**3** දරුවන්ගේ අධ්‍යාපනය
**4** ගොවි කාන්තාවන්ගේ දැනුම හා කුසලතාව
**5** නිවසේ පහසුකම් (ජලය/විදුලිය/දුරකතන/වැසිකිලි)*
**6** නිවසේ තත්ත්වය*
**7** ගෘහ උපකරණ*
**8** පවුලේ සෞඛ්‍ය
**9** පවුලේ ඇඳුම් පැළඳුම්*
**10** දරුවන් හා ගොවි කාන්තාව අතර සම්බන්ධතාව
**11** ස්වාමිපුරුෂයා හා ගොවි කාන්තාව අතර සම්බන්ධතාව

ඉහත වගුව අනුව ගොවි කාන්තා සමිතිවලට සම්බන්ධවීම නිසා ඔවුන්ගේ ජීවන තත්ත්වයේ යම් පිබිදීමක් සිදු වී ඇති බව පැහැදිලි වේ. විශේෂයෙන් ගොවි කාන්තාවන්ගේ දැනුම සහ කුසලතාවය

ඉතාමත් හොඳින් දියුණු වී ඇති බවට 54%ක් ප්‍රතිචාර දක්වා ඇත. එය මීට පෙර සාකච්ඡාවන්හි දී ද තහවුරු වීමට අදාළ සාක්ෂ්‍ය ඉදිරිපත් වී ඇත. ආහාර හා පෝෂණය, ස්වයං රැකියා පවත්වා ගැනීම, ණය සඳහා මූලාශ්‍ර සොයා ගැනීම, ගෙවතු වගා හා කොම්පෝස්ට් සෑදීම මෙන්ම විවිධ ක්ෂේත්‍ර ගණනාවක් ආවරණය වන පරිදි ගොවි කාන්තා සමිති හරහා ලබා දුන් පුහුණු තුළින් ඔවුන් තමන් තුළ පවතින දැනුම හා කුසලතා වර්ධනය වැඩි දියුණු කරගෙන ඇති බව මෙහි දී ද තහවුරු වේ. ගොවි කාන්තාවන්ගේ ජීවන තත්ත්වය තුළ ඇති වූ සාධනීය වෙනසට බලපෑ අනෙකුත් සාධක අතර, පවුලේ ආදායම, ආහාර සැපයුම හා පෝෂණය, මෙන්ම පවුලේ සෞඛ්‍ය තත්ත්වය ද විශේෂයෙන් බලපානු ලබන නිර්ණායක වේ. මෙම නිර්ණායක ද "ඉතා හොඳින් දියුණු වී ඇත" යන්නට ඉහළ මට්ටමේ ප්‍රතිචාර ගොවි කාන්තාවන් වෙතින් ලැබී ඇති බව විද්‍යමාන වේ.

දරුවන්ගේ අධ්‍යාපනය, දරුවන් හා ගොවි කාන්තාව අතර පවතින සම්බන්ධතාවය සහ ගොවි කාන්තාව හා ස්වාමි පුරුෂයා අතර පවතින සම්බන්ධතාව යන නිර්ණායක සඳහා "තරමක් හොඳින් දියුණු වී ඇත" යන ප්‍රතිචාරය ගොවි කාන්තාවන් වැඩි දෙනෙකුගෙන් ලැබී ඇත.

නිවසේ තත්ත්වය, නිවසේ පහසුකම්, ගෘහ උපකරණ, පවුලේ ඇඳුම් පැළඳුම් යන නිර්ණායකයන් සම්බන්ධයෙන් "වෙනසක් සිදු නොවූ" බවට ගොවි කාන්තාවන්ගෙන් වැඩි දෙනෙක් ප්‍රතිචාර දක්වා ඇත.

ඉහත විශ්ලේෂණය අනුව පෙනී යන්නේ, කාන්තාවන් ගොවි කාන්තා සමිතිවලට සම්බන්ධ වී ස්වයං රැකියා පවත්වා ගනිමින් තම නිවසේ ප්‍රධාන ආදායමට යම් දායකත්වයක් එක් කිරීමට ගොවි කාන්තාවන්ට හැකියාව ලැබී ඇති බවත්, ඒ හේතුවෙන් නිවසේ ආහාර හා පෝෂණය, දරුවන්ගේ අධ්‍යාපනය, සෞඛ්‍ය කටයුතු මෙන්ම බිරිඳ හා ස්වාමියා අතර දරුවන් හා දෙමවුපියන් අතරත් ඇති සම්බන්ධතාවය දියුණුවීම වැනි කරුණු අතින් ද සාධනීය වෙනසක් ළඟා කරගෙන ඇති බවත් ය.

## 6.6 චක්‍රීය ණය අරමුදල් සහ ඉතිරි කිරීම්

කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති සංවිධාන මඟින් ගොවි කාන්තා සමිති තුළ කාන්තාවන්ට පහසුවෙන් ණය ලබාගැනීමට හැකි පරිදි චක්‍රීය ණය ක්‍රම ඇති කිරීමත් කාන්තාව ඉතිරි කිරීමට සහ සකසුරුවමට හුරු කරවීමටත් අවශ්‍ය කටයුතු ද සිදු කෙරෙන බව සමීක්ෂණ දත්තවලින් පැහැදිලි විය. අධ්‍යයනයට සම්බන්ධ වූ ගොවි කාන්තාවන්ගෙන් බහුතරයක් (75.0%) සඳහන් කළේ, තම සමිතිය තුළ චක්‍රීය ණය අරමුදලක් ක්‍රියාත්මක නොවන බවයි. අධ්‍යයන නියැදිය තුළ අරමුදලක් ක්‍රියාත්මක වන බව සඳහන් කළේ 25% ක් පමණි.

පෙර පරිච්ඡේදයන් හි සඳහන් වන පරිදි ගොවි කාන්තා සමිති ස්ථාපිත කිරීමට මුල් වූ කරුණු අතර ගොවි කාන්තාවන් තුළ පැවති චක්‍රීය ණය අරමුදලක් ඇති කරගැනීමේ අභිලාෂය ද ඇතුළත් වේ (වගු සටහන් අංක 4.2). කෙසේ වුව ද පවත්වාගෙන යනු ලබන චක්‍රීය ණය අරමුදල් හරහා ගොවි කාන්තාවන් තම ණය අවශ්‍යතාවය ඉහළ මට්ටමින් සපුරාගෙන ඇති බව අධ්‍යයන දත්ත පැහැදිලි කරයි.

ගොවි කාන්තා සමිති තුළ චක්‍රීය ණය අරමුදල් ආරම්භ කිරීමට මුල් වී ඇත්තේ, රජයේ විවිධ ව්‍යාපෘති ප්‍රතිපාදන පොළී රහිත ණය අරමුදල් හා දේශපාලන ප්‍රතිපාදනයි. උදාහරණයක් ලෙස අනුරාධපුර දිස්ත්‍රික්කයේ, IFAD ව්‍යාපෘතිය, Peace ව්‍යාපෘතිය වැනි ව්‍යාපෘති හරහා ගොවි කාන්තා සමිති තුළ චක්‍රීය අරමුදල් ඇති කර තිබෙන බව ක්ෂේත්‍රයේ දී අනාවරණය විය. ශ්‍රාවස්තිපුර ගොවිජන සේවා බල ප්‍රදේශයට අයත් හිදෝගම ග්‍රාමයේ, පේමඩුව "රන්දිරිය" ගොවි කාන්තා සමිතිය, රඹෑව, මහකනදරාව "සෞභාග්‍යා" ගොවි කාන්තා සමිතියේත් මෙවැනි චක්‍රීය අරමුදල් ණය ක්‍රම ක්‍රියාත්මක වේ. එසේම කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දඹදෙනි කලාපයට අයත් ඉංගරදවුල ග්‍රාමයේ "මිණිමුතු" ගොවි කාන්තා සමිතිය, ඉබ්බාගමුව "විජය" ගොවි කාන්තා සමිතිය තුළත් චක්‍රීය අරමුදල් ණය ක්‍රමය හරහා ගොවි කාන්තාවන්ගේ ණය අවශ්‍යතා සපුරනු ලබයි. එසේම කුරුණෑගල දිස්ත්‍රික්කයේ හමංගල්ල ගොවිජන සේවා මධ්‍යස්ථානයට අයත් "විමංසා" ගොවි කාන්තා සමිතිය දැනට ආරම්භ වී ඉතා සුළු කාලයක් වුව ද පැවති රජය මැදිහත් වීමෙන් ග්‍රාමීය සංවර්ධන බැංකුව හරහා සැලකිය යුතු මට්ටමේ පොළී රහිත ණය මුදලක් මෙම සමිතියට ලැබුණු බවත් එය සාමාජිකාවන්ට ස්වයං රැකියා ආරම්භ කිරීමට ප්‍රයෝජනවත් වූ බවත් අනාවරණය විය. ඊට අමතරව රජයේ බැංකු (මහජන බැංකුව, ලංකා බැංකුව) මඟින්

රු.30,000ක උපරිම ණය සීමාවකට යටත්ව ගොවි කාන්තා සාමාජිකාවන්ට ණය ලබා ගැනීමේ හැකියාව ඔවුන් විසින් ම සලසාගෙන ඇති බව අනාවරණය විය.

අධ්‍යයන නියැදිය තුළ මෙවැනි ණය ක්‍රමයක් ක්‍රියාත්මක කරන්නේ ඉතා සුළු පිරිසක් වුව ද එය ඉතාමත් සාර්ථක ක්‍රමයක් බව අනාවරණය විය. ණය ලබාගත් ගොවි කාන්තාවන් විසින් ඔවුන් යෙදී සිටින කෘෂිකාර්මික කටයුතු සඳහා (60%), ළමුන්ගේ අධ්‍යාපනික අවශ්‍යතා සඳහා (1%), නිවසේ සුළු උත්සව අවස්ථා සැමරීමට හා නිවස අලුත්වැඩියා කිරීම (6%) මෙන්ම පාරිභෝජන කටයුතු සඳහා හදිසි අවශ්‍යතා (6%) වල දී සහ ඔවුන් පවත්වාගෙන යන ස්වයං රැකියා සඳහා (29%) සමිතිය මඟින් ණය ලබාගෙන ඇති බව පැහැදිලි විය. එසේම යට සඳහන් කළ ආකාරයට වෙනත් රජයේ බැංකු හරහා ණය ලබාගැනීමට පහසුකම් සලසාගෙන ඇති සමිති සාමාජිකාවන් සංඛ්‍යාව 11%ක් වැනි සුළු පිරිසක් බව අනාවරණය විය. ණය ලබාගෙන, ණය ආපසු ලබාදීම පැහැර හරින අවස්ථා ඉතාමත් විරල බව සාකච්ඡා තුළින් පැහැදිලි වූ අතර, ණය පැහැර හරින කාන්තාවන් සඳහා ව්‍යවස්ථානුකූලව කටයුතු කරන අතර, බොහෝවිට මෙම කාර්යය සිදු වන්නේ, අන්‍යෝන්‍ය අවබෝධය හා විශ්වාසය මත බව සමිති නිලධාරීන්ගේ අදහස විය.

අධ්‍යයනයට ලක් වූ දිස්ත්‍රික්ක හතරෙහි ම ගොවි කාන්තා සමිතිවල ඉතිරි කිරීම් පිළිබඳ සැලකිලිමත් වීමේ දී සමිති සාමාජිකාවන් විශේෂ වැඩසටහන් පවත්වා ඉතුරුම් සඳහා යොමු වී ඇති බව ද පැහැදිලි වේ. සීට්ටු ක්‍රම, සල්පිල් පැවැත්වීම, මෙහි දී විශේෂ විය. අනෙකුත් දිස්ත්‍රික්කයන්ට සාපේක්ෂව කුරුණෑගල දිස්ත්‍රික්කයේ සී/ර සමූපකාර හා සකසුරුවම් බැංකුව සමඟ පවතින සහයෝගීතාව විශේෂයෙන් පෙන්වා දිය හැකිය. යක්විල ගොවිජන සේවා මධ්‍යස්ථානය, ඉංගරදවුල ග්‍රාමයේ "මිණිමුතු" ගොවි කාන්තා සමිතියත් හොරවඩුන්න ග්‍රාමයට අයත් සමිති තුළත් විශේෂ "සීට්ටු ක්‍රමයක්" පවත්වනු ලබයි. රු.350/= ක් වැනි මුදලක් සීට්ටු ක්‍රමයට රැස් කර එය ස.ණ.ස. බැංකුවේ තැන්පත් කරයි. ඊට අමතරව තමන් විසින් නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩ (එළවළු, පලතුරු හෝ වෙනත් අත්කම් භාණ්ඩ) සාමාජිකාවන් විසින් පොළ ක්‍රමය තුළ හෝ අලෙවි කුටි තුළ හෝ අලෙවි කර ලබාගන්නා මුදලින් යම් කොටසක් සමිතිය තුළ සෑම සාමාජිකාවක්ම නමින් පවත්නා ගිණුමකට බැර කර එය වර්ධනය වූ පසු ස.ණ.ස බැංකුවේ සාමාජිකාව නමින් ඇති ගිණුමට නැවත බැර කරනු ලබයි. ස.ණ.ස බැංකුවේ පවතින මෙම තැන්පත් මුදල නිසා වර්ෂයක් පාසා සිංහල අවුරුදු සැමරීම සඳහා නිවසට අවශ්‍ය පාරිභෝජක

භාණ්ඩ ඇතුළත් "බඩු පැසක්" ලබා දීමේ කාර්යයක් ද ස.ණ.ස. බැංකුව හා සහයෝගයෙන් කාන්තා සමිතිය විසින් සිදු කරනු ලබයි.

සමිති මඟින් සෑම සමිති වාරයකට/දෙකකට වරක් සල්පිල් පවත්වා මුදල් උපයා ඉතිරි කිරීම් සඳහා යොමු වීම ද විශේෂත්වයකි. කුරුණෑගල දිස්ත්‍රික්කයේ උඩුබද්දාව ගොවිජන සේවා මධ්‍යස්ථානයේ "පබෝදා" ගොවි කාන්තා සමිතිය සෑම සමිති වාරයකදීම තම වගාවෙන් හෝ තමන්ගේ ස්වයං රැකියාවෙන් නිෂ්පාදිත භාණ්ඩ හෝ රැගෙනවිත් වෙන්දේසි කර මුදල් උපයා සමිතිය තුළ සාමාජිකාවන්ගේ ගිණුම් තුළ තැන්පත් කර එම මුදල රු.5000ක් වූ විට එය එකවර ලබාගැනීම හෝ එය ඇපයට තබා රු. 10,000-15,000 දක්වා ණය මුදලක් ලබාගැනීමේ හැකියාව ඇති කර ඇත. මේ සඳහා මාසික පොළියත් (5%) ද සමිතිය මඟින් අය කරගනු ලබයි.

මීට අමතරව සෑම සමිතියකම මාසිකව රැස්වන අවස්ථාවේ දී සාමාජික මුදලක් එකතු කරනු ලබයි. එය සමිති මට්ටමින් වෙනස් වන අතර, සාමාන්‍යයෙන් රු. 20.00-රු.50.00අතර මුදලක් එක් සාමාජිකාවක් සාමාජික මුදල් ලෙස භාණ්ඩගාරික වෙත ගෙවනු ලබයි. එසේම සාමාජිකාවක් අලුතින් බඳවාගැනීමේ දී කොටස් මුදලක් ද අය කරනු ලබයි. එය රු. 100/= වැනි මුදලක් වේ. මෙම සියලු මුදල් සමිතියේ භාණ්ඩාගාරික විසින් ක්‍රමානුකූලව පවත්වාගෙන යන අතර ග්‍රාමීය මට්ටමේ පවතින සී/ර ස.ණ.ස. බැංකුව ගොවි කාන්තා සමිති සමඟ ඉතාමත් සහයෝගීතාවයෙන් යුක්තව කටයුතු කරනු ලබන බව අධ්‍යයනයේ දී අනාවරණය විය. මෙම තත්ත්වය දිස්ත්‍රික්ක හතරෙහි ම දැකිය නොහැකි වූ අතර කුරුණෑගල දිස්ත්‍රිත්තය තුළ විශේෂිතව විද්‍යමාන විය. අනෙකුත් දිස්ත්‍රික්ක අතර මහනුවර දිස්ත්‍රික්කයේ මොරයාය ගොවිජන සේවා මධ්‍යස්ථානයේ "මිණිමුතු" ගොවි කාන්තා සමිතිය තුළ සෑම සමිති වාරයකදීම දෙදෙනෙක් තමන් නිෂ්පාදනය කරන භාණ්ඩ රැගෙනවිත් සමිතිය තුළ සාමාජිකාවන් අතර වෙන්දේසි කර මුදලක් උපයා ගනු ලබයි. මෙම මුදලින් 50%ක් සමිතියේ ඔවුන්ගේ ගිණුම් තුළ ඉතිරි කිරීම් සඳහා වෙන් කෙරෙන අතර ඉතිරි 50% අදාළ පුද්ගලයින්ගේ අවශ්‍යතාවලට තබා ගනී. මහනුවර දිස්ත්‍රික්කයේ අනෙකුත් සමිති මෙවැනි ක්‍රම සිදු කිරීමට බලාපොරොත්තුවෙන් සිටින බව සඳහන් විය.

ගොවි කාන්තා සමිති සාමාජිකාවන් සඳහා මෙවැනි චක්‍රීය ණය අරමුදල් ක්‍රම පවත්වාගැනීමත්, රජයේ බැංකු හා ප්‍රදේශයට අයත් වෙනත් බැංකු මඟින් ණය අරමුදල් සපයා ගැනීමේ පහසුව සැලසීමත් යන කාරණා අධ්‍යයනයට ලක් වූ සියලු සමිතිවල සිදු නොවූවත් එය ඉතා ප්‍රතිඵලදායක

කාර්යයක් බව පැහැදිලි විය. මෙවැනි සාධනීය තත්ත්වයන් ප්‍රතිඵලදායක බව අධ්‍යයනයේ දී පැහැදිලි විය.

## 6.7 සමාජීය බලගැන්වීම (සමාජ විද්‍යාත්මක දෘෂ්ටි කෝණයෙන්)

ගොවි කාන්තා සමිති සාමාජිකාවන් ආර්ථිකමය වශයෙන් බලගැන්වීම මෙන්ම සමාජීය වශයෙන් ද ශක්තිමත් කිරීම, වැඩසටහනෙ හි ප්‍රධාන අපේක්ෂාවයි.

අධ්‍යයනයට ලක් වූ දිස්ත්‍රික්ක හතරම පිළිබඳ සැලකිලිමත් වීමේ දී ග්‍රාමීය මට්ටමේ ස්ථාපිත මෙම ගොවි කාන්තා සමිති තුළ සාමාජිකාවන්ගේ සමාජීය බලගැන්වීම ඉහළ මට්ටමක පවතී. සමාජ විද්‍යාත්මක දෘෂ්ටි කෝණයෙන් විශ්ලේෂණය කිරීමේ දී මෙවැනි කණ්ඩායම් ප්‍රවේශයක් ග්‍රාමීය කාන්තා ප්‍රජාවගේ අභිවෘද්ධිය මෙන්ම සංතුෂ්ටිය ඇතිවීමට වඩාත් පුරෝගාමී වන බව පැහැදිලි වේ.

ග්‍රාමීය මට්ටමේ කාන්තාවන් කණ්ඩායම් ගත කිරීම මඟින් ඔවුන් අතර පවතින දරිද්‍රතාවය අඩු කිරීමත් සමාජයීය වශයෙන් බලගැන්වීමත් යන අරමුණු කරා ඵලදායකව ළඟාවිය හැකි බවට ඉන්දියාව වැනි රටවල මෙවැනි ස්වයං සහයෝගිතා කණ්ඩායම් බිහි කර ලබා ඇති සාර්ථක අත්දැකීම් ආශ්‍රයෙන් සඳහන් කළ හැකිය. මෙවැනි සහභාගීත්ව සංවර්ධන න්‍යායන් මඟින් කාන්තාවට නවමු ආකාරයේ ගරුත්වයක්, විශ්වාසයක් සහ ආර්ථික වශයෙන් ස්වාධීනත්වයක් ලැබෙන බවත් නිර්මාණශීලීත්වය කණ්ඩායම් ගතිකත්වය සහ ස්වයං කළමනාකාරීත්වය යන කරුණු සාක්ෂාත් වන බවටත් සාක්ෂ්‍ය ඔප්පු කර ඇත. **(Srikumar, B, 2001).** ග්‍රාමීය මට්ටමේ පවතින මෙවැනි කාන්තා සහයෝගීතා කණ්ඩායම් මුහුණ දෙන ගැටලු අතිවිශාල ප්‍රමාණයක් වුව ද ආර්ථික හා සමාජීය වශයෙන් ඔවුන්ට වෙනස්වීමට සහ වර්ධනය වීමට තිබෙන හැකියාව ද අතිමහත් බව සංවර්ධනවේදීන් පෙන්වා දී ඇත.

ඉතාමත් ඉහළ මට්ටමේ සමාජීය සත්කාර රාශියක් ගොවි කාන්තා සමිති හරහා සිදු වන බව අධ්‍යයනයේ දී පිළිබිඹු විය. ආර්ථික වශයෙන් ඵලදායී ක්‍රියාවන් හි නියුක්ත ගොවි කාන්තා සමිතිවල සාමාජිකාවන්ගේ සමාජයීය අංශය ද පුළුල් ලෙස වර්ධනීය තත්ත්වයක් පෙන්නුම් කරන අතර ආර්ථික කටයුතු අංශයෙන් ඵලදායී ප්‍රවේශයන්ට ළඟාවීම අවම මට්ටමේ පවතින මොණරාගල හා මහනුවර දිස්ත්‍රික්කයන්ට අයත් නියැදීන් පිරික්සීමේ දී එම සමිති සාමාජිකාවන් අතර ද අන්‍යොන්‍ය සමාජීය තත්ත්වයේ දියුණුවක් දැකිය හැකි විය.

ග්‍රාමීය කාන්තාවන්ට සමාජයට නිරාවරණය වීමට (Exposure) අවස්ථාව සැලසීම, ගොවි කාන්තා සමිති හරහා ලැබුණු ඉහළ මට්ටමේ සමාජීය බලයකි. එසේම ඉහත සඳහන් කළ පරිදි කාන්තාවන්ගේ ස්ව අභිමානය (self-esteem), ආත්ම ශක්තිය (self confidence) වර්ධනය වීම, ආර්ථිකමය හා ගෘහීය කාර්යයන්හි දී තීරණ ගැනීමේ හැකියාව වර්ධනය වීම ද සිදු වී ඇති බව අධ්‍යයනයේ දී අනාවරණය විය.

විශේෂයෙන් යට කී අංශයන් හි ප්‍රවර්ධනයත් සමග ඔවුන් තම කණ්ඩායම් තුළ සාමූහික කාර්යයන් රාශියක් සිදු කර ඇති බව පෙනී යයි. ඒ අනුව සාමාජිකාවක් අසනීප තත්ත්වයේ පසු වන විට හෝ සාමාජිකාවකගේ නිවසේ මරණයක් සිදු වූ විට සමිතියේ අරමුදලින් රු. 500/=ක වටිනාකමින් යුත් භාණ්ඩ එම නිවසට රැගෙන යාම, එසේම අවමංගල්‍ය නිවසේ වැඩකටයුතු සඳහා ස්වේච්ඡාවෙන් සම්බන්ධ වීම හා අවශ්‍ය ආහාරපාන සැපයීම තුළින් ඔවුහු තම සමාජීය බැඳීම සහ සහයෝගීතාවය සමිතිය හරහා වර්ධනය කරගෙන ඇත.

විශේෂයෙන් කෘෂිකාර්මික කටයුතුවල දී අනුරාධපුරය, කුරුණෑගල වැනි දිස්ත්‍රික්කවල නගරයට ඈත් වූ ප්‍රදේශයන් හි තවදුරටත් "අත්තම් ක්‍රමය" භාවිතා කිරීමට ගොවි කාන්තාවෝ හුරු වී සිටිති. සමිතියේ සාමාජිකාවන් එකිනෙකාගේ කෘෂිකාර්මික කටයුතු, විශේෂයෙන් වී වගා කටයුතුවල දී මෙම සහයෝගීතාව මැනවින් විද්‍යමාන කරයි. කුලියාපිටිය, උඩුබද්දාව වැනි ගොවිජන සේවා මධ්‍යස්ථානවල බුලත් වගාව සාර්ථකව සිදු කෙරෙන අතර, බුලත් ඇමිණීම වැනි ක්‍රියාවන්වල දී අන්‍යොන්‍ය සහයෝගීතාවය තුළ එය කාර්යක්ෂමව සිදු කරනුලබන බව නිරීක්ෂණය කළ හැකි විය.

ගමට අදාළ මාර්ගයන් පිළිසකර කිරීම, එසේම සාමාජිකාවන්ගේ ගෙවතු හෙළි පෙහෙළි කිරීම වැනි කටයුතු අදාළ සමිති රැස්වීම් වාර පැවැත්වෙන දිනවල දී යොදාගනිමින් ඒවා ඉටු කිරීම ද ඔවුන්ගේ අන්‍යොන්‍ය සහයෝගීතාවයට උදාහරණය වේ. ආගමික කටයුතුවල දී ද ගොවි කාන්තා සමිති සාමාජිකාවන් ඉදිරියෙන් සිටින බව පැහැදිලි විය. සෑම පොහොය දිනයක දී ම සහ විශේෂ පොහොය (වෙසක්/පොසොන්) දිනයන් හි දී උපාසක දානය සකස් කිරීම ගමේ ගොවි කාන්තා සමිතියේ අනුග්‍රහයෙන් සිදු කෙරේ. එසේම දන්සැල් පැවැත්වීම ද ගොවි කාන්තා සමිතිවල සාමාජිකාවන් ඉතාමත් අභිරුචියෙන් ඉටු කළ කාර්යයක් බව පෙනී ගියේ, ක්ෂේත්‍ර සමීක්ෂණය

අවස්ථාවේ දී පර්යේෂණ කණ්ඩායම්වලට ද ඒ සඳහා සහභාගී වීමට හැකියාවන් ලැබුණු බැවින් එම කණ්ඩායම්වල කාර්යයන් සහභාගීත්ව නිරීක්ෂණයෙන් ම අවබෝධ කරගත හැකි වූ බැවිණි.

ගොවි කාන්තා සමිති සාමාජිකාවන්ට සමාජය තුළ මෙන්ම රාජ්‍ය නිලධාරීන්ගේ පිළිගැනීම ද ලැබෙන බව අධ්‍යයනය තුළ දී පැහැදිලි විය. පෙර පරිච්ඡේදයන් හි සඳහන් කළ පරිදි ග්‍රාමීය මට්ටමේ ව්‍යාප්ති සේවය සැපයීමේ දී සහය කර ගත හැකි උචිත ප්‍රවේශයක් ලෙස ගොවි කාන්තා සමිති ඉතා වැදගත් වී ඇත. කෘෂිකර්ම උපදේශක නිලධාරීන් ද මේ බව සනාථ කළ අතර ව්‍යාප්ති සේවයට අදාළ කාර්යයන් කාර්යක්ෂමව කර ගැනීමටත් ව්‍යාප්ති පණිවුඩය ගම තුළට, පවුල තුළට ප්‍රවේශ කරවීමේ දී ගොවි කාන්තා සමිති සාමාජිකාවන්ගේ සාමූහිකත්වය ප්‍රබල වාහකයක් වී ඇති බව නිලධාරීහු සඳහන් කළහ. එය ගොවි කාන්තා සමිති සාමාජිකාවන් ලබා ඇති ඉහළ මට්ටමේ සමාජීය තත්ත්වයක් බව අධ්‍යයනයේ දී පැහැදිලි විය.

එසේම කලින් කලට දේශපාලන සංස්ථාව තුළ සිදුවන විවිධත්වයට හා දේශපාලන වේදිකාවට පැමිණෙන නව මුහුණු සමාජය තුළට ප්‍රවේශවීමට ගොවි කාන්තා සමිති වාහකයක් කර ගන්නා බව සාකච්ඡාවල දී පැහැදිලි විය. මෙම තත්ත්වය ආරම්භක අවධියේ ගොවි කාන්තා සමිතිවල පැවති අරමුණුවලට පටහැණි වුව ද ගොවි කාන්තාවන්ට සමාජීය අංශයෙන් පවතින පිළිගැනීම යන කාරණයේ දී ඉතා වැදගත් වේ.

ඉහත විශ්ලේෂණය අනුව කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති සංවිධානවල ප්‍රධාන අරමුණක් වන කාන්තාව සමාජීය වශයෙන් බලගැන්වීම යන කාරණය අධ්‍යයනයට ලක් වූ ගොවි කාන්තා සමිති තුළ සිටින සාමාජිකාවන්ගෙන් බහුතර පිරිසකට අත්විඳීමට හැකි වී ඇති බව පැහැදිලි වේ.

හත්වන පරිච්ඡේදය

# කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී ගොවි කාන්තාවන් සහ නිලධාරීන් විසින් මුහුණ දෙන ගැටලු

## 7.1 හැඳින්වීම

අධ්‍යයන අරමුණුවලට අනුව කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී මීට අදාළ කණ්ඩායම් (ගොවි කාන්තාවන් හා නිලධාරීන්) විසින් මුහුණ දෙනු ලබන ගැටලු පිළිබඳව අවධානය යොමු කරන ලදී. ඒ අනුව මෙම පරිච්ඡේදයේ දී යට කී පාර්ශවයන් මුහුණ දෙන ගැටලුවල ස්වභාවය විශ්ලේෂණය කෙරේ.

## 7.2 ගොවි කාන්තා සමිති තුළ කාන්තාවන් මුහුණ දෙන ගැටලු

අධ්‍යයනයේ දී අනාවරණය වූ පරිදි කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහන යටතේ ක්‍රියාත්මක වන ගොවි කාන්තා සමිති සාමාජිකාවන් විසින් මුහුණු දෙන ගැටලු මූලික වශයෙන් ප්‍රධාන අංශ කිහිපයක් යටතේ විග්‍රහ කළ හැකි වේ. එනම් පෞද්ගලික ගැටලු, පොදු සමාජීය ගැටලු සහ ආර්ථිකමය ගැටලු වශයෙනි.

### 7.2.1 පෞද්ගලික ගැටලු

**1. ලබාදෙන පුහුණුවීම් නවතාවයෙන් යුක්ත නොවීම**

කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහනට අදාළ ක්‍රියාකාරකම් මූලිකව ම සිදුවන්නේ ග්‍රාමීය මට්ටමේ ස්ථාපිත ගොවි කාන්තා සමිති හරහා වන අතර ඒ මඟින් සාමාජික කාන්තාවන්ට ලබාදෙන පුහුණුවීම් තවදුරටත් සාම්ප්‍රදායික මට්ටමේ පවතින බව පුහුණුවීම් සඳහා සහභාගී වූ කාන්තාවන්ගෙන් 45%ක් සඳහන් කළහ. අධ්‍යයනයට අනුව බහුතර කාන්තා සාමාජිකාවන් යෙදී ඇති ස්වයං රැකියා ක්ෂේත්‍ර වන, ආහාර නිෂ්පාදනය, කොම්පෝස්ට් නිෂ්පාදනය, ගෙවතු වගාව, මල් වගාව වැනි ක්ෂේත්‍රවලට අමතරව වර්තමාන සමාජය තුළ ඉල්ලුමක් පවතින, රූපලාවන්‍ය කර්මාන්තය, නිමි ඇඳුම් නිෂ්පාදනය, ගමන් මළු සහ පාවහන් නිෂ්පාදනය, අත්කම් නිෂ්පාදනය (සුබපැතුම් පත් නිර්මාණය, සිහිවටන නිර්මාණය) එසේම කෘෂිකාර්මික ක්ෂේත්‍රයට අදාළ ගුණාත්මක බීජ නිෂ්පාදන කර්මාන්තය, බිම්මල් නිෂ්පාදනය වැනි ක්ෂේත්‍ර සඳහාත්, ගොවි කාන්තාවන්ගේ කැමැත්ත හා හැකියාව පවතින නමුත් එවැනි ක්ෂේත්‍ර සඳහා ලැබෙන පුහුණුවීම් සීමිත වීම ගොවි කාන්තා සමිති සාමාජිකාවන් මුහුණ දෙන ගැටලුවක් වේ. මීට අමතරව

ප්‍රදේශයට ගැළපෙන ස්වයං රැකියා සඳහා පුහුණුවීම් නොලැබීම, එසේම පුහුණුව ලබාදීමෙන් අනතුරුව ස්වයං රැකියා ආරම්භ කිරීමට මූලික ධනයක් නොමැතිවීම සහ පුහුණුවෙන් පසුව අදාළ පුහුණුලාභියා පිළිබඳ පසු විපරමක් හෝ ඔවුන්ට යම් ව්‍යවසායකත්ව කාර්යයකට අවතීර්ණ වීමට සුදුසු මාර්ග එළිපෙහෙළිකර දීමටත් ඔවුන්ව ඉදිරියට රැගෙන යාමටත් අදාළ යාන්ත්‍රණයක් නොමැතිවීමත් ගැටලු ලෙස අධ්‍යයනයේ දී පැහැදිලි විය.

**2. තීරණ ගැනීමට පවතින නිදහස අවම වීම සහ අවදානම් දැරීම අපහසුවීම**

සමස්තයක් ලෙස කාන්තාවන්ට ගෘහස්ථ කාර්යභාරයන්ගෙන් පරිබාහිර වූ කාර්යයන් ඉටු කිරීමේ දී තීරණ ගැනීම පිළිබඳ ගැටලුවක් පවතින බව අධ්‍යයනයේ දී 82%ක් ප්‍රතිචාර දක්වමින් සඳහන් කළහ. මෙය ගොවි කාන්තා සමිති සඳහා වන සක්‍රීය දායකත්වය ඇණහිටීමට හේතු වන අතර ඔවුන්ගේ ආදායම් උත්පාදන කාර්යයන් බිඳවැටීමට ද බලපානු ලබයි. එසේම ස්වයං රැකියාවන් ආරම්භ කිරීමේ දී අවදානම් දැරීමේ කාර්යයට කාන්තාවට සහාය වීම පවුලේ සාමාජිකයන්ගෙන් සිදු නොවීම මෙම තත්ත්වය තුළ කාන්තාවගේ ධෛර්ය හීන කිරීමට හේතු වී ඇත.

**3. ගෘහස්ථ කාර්යයන් පිළිබඳ පවතින වගකීම**

කාන්තාවන් ආදායම් ඉපැයීමේ කාර්යයට ඵලදායක මට්ටමින් දායක වන විට ගෘහස්ථයේ කාර්යභාරය යම් පමණකින් අතපසුවීම ගැටලු සහගත බව ගොවි කාන්තාවන්ගෙන් 68%ක් සඳහන් කළහ. ගෘහස්ථයේ ආහාර හා පෝෂණය පවත්වාගැනීම, ආහාර සකස් කිරීම, ද්‍රව්‍ය රැස් කිරීම, දරුවන් රැකබලාගැනීම සහ ඔවුන්ගේ අධ්‍යයන කටයුතු පවත්වාගැනීම යන කාර්යයන්ට අමතරව ආදායම් උත්පාදන කාර්යයක නියැළීම අතිශය දුෂ්කර කාර්යයක් වන බවත් යම් යම් අවස්ථාවල දී ආරම්භ කරනු ලබන ස්වයං රැකියා අතරමග නතර කිරීමටත්, ඒවා පිරිහී යාමටත් මෙම තත්ත්වය හේතු වන බව පැහැදිලි විය. නමුත් ගෘහයේ පවතින සියලු රාජකාරී සතුටුදායක මට්ටමින් ඉටු කරන අතරම ස්වයං රැකියා කටයුතු ද ඉතා සාර්ථකව සිදු කරනු ලබන කාන්තාවන් ද අධ්‍යයනයේ දී හමු විය (සිද්ධි අධ්‍යයන ඉදිරිපත් කර ඇත). විශේෂයෙන් ආහාර නිෂ්පාදනය සම්බන්ධ රැකියා සිදු කරනු ලබන කාන්තාවන්ට අවම ලෙස බලපාන බව පෙර පරිච්ඡේදවල දී අනාවරණය විය. කෙසේ වුව ද, මෙම ගැටලුවේ බලපෑම පුද්ගලයා සහ ඔහු අවට ඇති පරිසරය හා බැඳුණු සාධක අනුව වෙනස්වන සාධකයක් බව අධ්‍යයනයේ දී පැහැදිලි විය.

### 7.2.2 පොදු සමාජීය ගැටලු

ගොවි කාන්තා සමිති තුළ අවස්ථාවන් හා කාර්යයන් වෙත ඉදිරිපත් වන කාන්තාවන් ඇත්තේ සුළුතරයක් බව පැහැදිලි විය. ක්ෂේත්‍ර සමීක්ෂණයේ දී නිරීක්ෂණය කළ විශේෂ ලක්ෂණයක් වූයේ ද සෑම සමිතියකම ඉදිරියෙන් සිටින්නේත් යම් අවදානමක් දැරීමට ද ඉදිරිපත් වන්නේත් එහි නිලතල දරන කාන්තාවන් පමණක් වීමයි. ව්‍යාප්ති නිලධාරීන් සමඟ මනා සම්බන්ධතාවක් පවත්වා ගනු ලබන්නේත්, අන්‍යෝන්‍ය වශයෙන් සාමාජිකාවන් අතර සුහදතාවය ගොඩනගාගෙන ඇත්තේත් එකම කණ්ඩායමක් බව ද නිරීක්ෂණය කළ හැකි විය. එසේම සමිති මට්ටමින් සැලකීමේ දී සමාජය තුළ වැඩි අවධානයක් දිනා ගැනීමට මෙම සුළුතරය සමත් වී ඇති බැවින් ප්‍රදේශයේ පවතින අනෙකුත් කාන්තා සමිති වල ද ඔවුන් නිලතල දැරීම දැකිය හැකි විය. මේ හේතුවෙන් ගොවි කාන්තා සමිතිවල ප්‍රවර්ධනයට එය යම් හානියක් ද වී ඇති බව පැහැදිලි විය.

ගොවි කාන්තාවන් මුහුණ දෙන තවත් ගැටලුවක් වන්නේ, යම් යම් ප්‍රතිලාභ බෙදා ගැනීමේදී ඔවුනොවුන් අතර සුහදතාවය පළුදු වීමයි. එසේ සිදු වීම සමිතියේ දියුණුවට ගැටලුවක් වන බව 38%ක් සඳහන් කළහ. කාන්තාවන් සඳහන් කරන්නේ, හැකියාව, අවශ්‍යතාවය හා පසුබිම පිළිබඳ සැලකිලිමත් වෙමින් නිලධාරීන් විසින් ප්‍රතිලාභ බෙදාහැරියද ප්‍රතිලාභ සඳහා හිමිකම් නොකියන කාන්තාවන් ඒ පිළිබඳ අසතුටුභාවයක් දැක්වීම නිසා සුහදතාවය අන්‍යෝන්‍ය වශයෙන් බිඳී යන බවයි.

### 7.2.3 ආර්ථිකමය ගැටලු

**1. ණය පහසුකම් ලබා ගැනීමේදී ගැටලු මතුවීම**

ගොවි කාන්තා සමිති සාමාජිකාවන්ගේ ආර්ථික සවිබල ගැන්වීම අපේක්ෂාවෙන් ස්වයං රැකියා ආරම්භ කිරීමට ලැබෙන උපදෙස්වලට අමතරව එම කාර්යයන් ආරම්භ කිරීමට මූලික ධනයක් නොමැතිවීම කාන්තාවන් මුහුණ දෙන ප්‍රධාන ගැටලුවක් වී ඇති බව අදහස් විමසීමේ දී සැලකිය යුතු ගොවි කාන්තාවෝ පිරිසක් ප්‍රකාශ කළහ. ගම්බද ප්‍රදේශවල ස්වයං රැකියා හා වෙනත් කටයුතු සඳහා ණය අරමුදල් සපයනු ලබන බොහෝ සංවිධාන හා ණය යෝජනා ක්‍රම පැවතියද ණය ලබා ගැනීමට තැබිය යුතු ඇප ඉහළ මට්ටමේ පැවතීම ගැටලුවක් වී ඇත.

අධ්‍යයනය තුළ ස්වයං රැකියා සඳහා යොමුවූවන් අතරින් 72% (104) ක් සඳහන් කළේ, පුහුණුවීම්වලට අමතරව ස්වයං රැකියා ආරම්භ කිරීමට සහයෝගයක් ලෙසින් අවශ්‍ය අවස්ථාවේ දී අමතර ප්‍රතිලාභයක් (යන්ත්‍ර සූත්‍ර/මූල්‍යමය ආධාර ණය පහසුකම්) හෝ දිරිගැන්වීමක් නොලැබුණු

බවයි. අධ්‍යයනයේ දී අනාවරණය වූ පරිදි පුහුණුවීම් ලැබූ කාන්තාවන්ට ස්වයං රැකියාවක් ආරම්භ කිරීමට අවශ්‍යතාවය පැවතියත් ඒ සඳහා මූලික ධනයක් සපයා ගැනීමේ දුෂ්කරතාවයන් පැවතීම මෙන්ම ඒ සඳහා සුදුසු මාර්ගයක් සපයා ගත නොහැකි වීම හේතුවෙන් ඔවුන් ස්වයං රැකියා සඳහා යොමු වී නොමැති බවයි. පුහුණුවීම් ලැබූ කණ්ඩායමෙන් (300) ස්වයං රැකියා සඳහා යොමු වී ඇත්තේ 44%ක් (144) පමණක් වීමෙන් ඒ බව සනාථ වේ.

2. අලෙවි ගැටලු සහ  අමුද්‍රව්‍ය සපයාගැනීම

එක් ගොවිජන සේවා බල ප්‍රදේශයක් තුළ ගොවි කාන්තා සමිති කිහිපයක් පවතී. එම සමිති සියල්ලටම බොහෝ අවස්ථාවල දී ලැබෙන පුහුණුවීම් එක හා සමානය. එවිට ආරම්භ කෙරෙන ස්වයං රැකියා ද එක සමාන වන විට නිෂ්පාදනය කෙරෙන (එළවළු, පලතුරු හෝ වෙනත් ආහාරමය නිෂ්පාදන) ද්‍රව්‍ය ද ප්‍රදේශය තුළ සුලබ වේ. එවිට එක් අයෙකුට අලෙවි කළ හැකි ප්‍රමාණය සීමිත වීම මෙන්ම මිල මට්ටම ද පහත බසී. මෙම තත්ත්වය ගොවි කාන්තා නිෂ්පාදන අලෙවිය සම්බන්ධයෙන් පවතින ගැටලුවකි. ස්වයං රැකියා ආරම්භ කළ සාමාජිකාවන්ගෙන් 40%ක් මෙම ගැටලුව පවතින බව සඳහන් කළහ.

අමුද්‍රව්‍ය සපයාගැනීම විශාල ගැටලුවක් නොවී ඇති බව පෙනී ගිය නමුත් අමුද්‍රව්‍ය ප්‍රවාහනයේ දී ඒ සඳහා වැඩි පිරිවැයක් දැරීමට සිදු වීම ඔවුන්ගේ ලාභය අවම වීමට හේතුවක් වන බව සඳහන් කළ පිරිස 23%කි.

3. තරඟකාරී වෙළඳපොළට ප්‍රවේශවීමට නොහැකිවීම

වර්තමානයේ පවතින තරඟකාරී වෙළඳපොළට සුදුසු පරිදි තම නිෂ්පාදන එළිදැක්වීමට නොහැකිවීම ස්වයං රැකියා සිදු කරන ගොවි කාන්තාවන්ට ගැටලුවක් වී ඇති බව පෙනී යයි. විධිමත් ඇසුරුම් සහිතව නිෂ්පාදන එළිදැක්විය යුතු ස්වයං රැකියාලාභීන්ගෙන් 76%ක් ම ඇසුරුම් භාවිතයක් නොමැතිව තම නිෂ්පාදන අලෙවි කරන බව අනාවරණය විය. එසේම වෙළඳනාමයක අවශ්‍යතාව පවතින නිෂ්පාදනයන් සිදු කරන ස්වයං රැකියා ලාභීන්ගෙන් 89%ක් තම නිෂ්පාදන වෙළඳනාමය හෝ ලියාපදිංචි අංකය හෝ මේ දෙකම නොමැතිව නිෂ්පාදන අලෙවි කරන බව ද අනාවරණය විය. මෙම තත්ත්වය නිෂ්පාදන අලෙවියේ දී පාරිභෝගිකයා තුළ ආකර්ෂණයක් හෝ විශ්වාසයක් ගොඩනැංවීමට බාධාවක් වන බව කාන්තාවන්ගේ අදහස විය. තම නිෂ්පාදන නීත්‍යානුකූල මට්ටමින් ලියාපදිංචි කර, විධිමත් ඇසුරුම් සහිතව හා වෙළඳනාමයක් සහිතව ආකර්ෂණීය මට්ටමින් වෙළඳපොළට ප්‍රවේශ කළහොත් ඉහළ ආදායමක් ලැබිය හැකි නමුත් එවැනි කටයුත්තක් සිදු කිරීමට ප්‍රමාණවත් දිරිගැන්වීමක් හා මඟපෙන්වීමක් මෙන්ම මූල්‍ය පහසුකම් නොමැති වීම ද ගැටලුවක් වී ඇත.

**4.** කුඩා මට්ටමේ ව්‍යවසායන් නිසා රාජ්‍ය බැංකුවලින් ණය පහසුකම් නොලැබීම

අධ්‍යයනයේ දී පැහැදිලි වූ ආකාරයට රාජ්‍ය බැංකු හරහා ණය පහසුකම් සපයා ගැනීමේ හැකියාව වර්ධනය කරගෙන ඇත්තේත් සමිතිය තුළ චක්‍රීය ණය ක්‍රමයක් ස්ථාපිත කරගෙන ඇත්තේත් ගොවි කාන්තා සමිති සීමිත ප්‍රමාණයකි (පෙර පරිච්ඡේදවල සඳහන් කර ඇත).අධ්‍යයනයට ලක් වූ අනෙකුත් සමිති සමාජිකාවන් එම තත්ත්ව ළඟාකර ගෙන නොමැත. එබැවින් ව්‍යවසායක කටයුතු ආරම්භයේ දී මූලික මූල්‍ය අවශ්‍යතාවන් සපුරා ගැනීමේදී ගැටලු මතුවන බව කාන්තාවන්ගෙන් **58%**ක් සඳහන් කළහ.

**5.** ගෘහස්ථ මට්ටමේ නිෂ්පාදන අලෙවි කිරීමට පොදු ස්ථානයක් නොමැතිවීම

අධ්‍යයනයේ දී අනාවරණය වූ පරිදි ගෘහස්ථ මට්ටමේ නිෂ්පාදන අලෙවි කිරීමට "පොළ ක්‍රමය" භාවිතා කිරීමට පොදු ස්ථානයක් නොමැතිවීම ගැටලුවක් බව ස්වයං රැකියා ලාභීන්ගෙන් **38%**ක් සඳහන් කළහ.

## 7.3 ගොවි කාන්තා සමිති ක්‍රියාත්මක කිරීමේ දී නිලධාරීන්ගේ කාර්යභාරය හා ඔවුන් මුහුණ දෙන ගැටලු

කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහනෙහි අපේක්ෂිත ගොවි කාන්තා සමිති ස්ථාපිත කර එහි ක්‍රියාකාරීත්වය පවත්වාගෙන යනු ලබන්නේ අදාළ කෘෂිකර්ම උපදේශක බල ප්‍රදේශය භාර කෘෂිකර්ම උපදේශක නිලධාරියා වේ. දිස්ත්‍රික්ක මට්ටමින් සහ කෘෂිකර්ම කලාප මට්ටමින් ගොවි කාන්තා විෂයභාර නිලධාරීවරු **(SMO)** සිටින අතර ඔවුන්ගේ සහයෝගයෙන් ගොවි කාන්තා සමිතිවල වගකීම දරන්නේ, අදාළ කෘෂිකර්ම උපදේශක නිලධාරියා වන අතර, ගොවි කාන්තාවන් සමඟ වඩාත් සමීප මට්ටමේ ක්‍රියාකාරීත්වයක් පවත්වාගෙන සිටින්නේ ද කෘෂිකර්ම උපදේශකවරයා බව ක්ෂේත්‍ර අධ්‍යයනයේ දී පැහැදිලි විය.

ඒ අනුව අධ්‍යයනය සඳහා තෝරා ගනු ලැබූ ගොවි කාන්තා සමිති පවත්වාගෙන යනු ලබන කෘෂිකර්ම උපදේශවරයා/ වරිය ගොවි කාන්තා සමිති ක්‍රියාත්මක කිරීමේ දී ගොවි කාන්තා විෂය සම්බන්ධයෙන් ඔහුට/ඇයට ඒ සඳහා පුහුණුවීම් ලැබෙන්නේ ද සමිතියේ ක්‍රියාකාරීත්වයට ප්‍රතිපාදන ලැබෙන ආකාරයන් කෙසේ ද සහ ගොවි කාන්තා සමිති පවත්වාගෙන යාමේ දී කෘෂිකර්ම උපදේශකවරයා විසින් මුහුණ දෙන ගැටලු කවරේ ද යන්න පිළිබඳ මෙහි දී අවධානය යොමු කෙරිණි. සමස්තයක් ලෙස සලකන විට පළාත් සහ අන්තර් පළාත් අනුව කෘෂිකර්ම උපදේශක නිලධාරීන් මුහුණු දෙන ගැටලුවල වෙනසක් විද්‍යමාන නොවූ අතර පහත වගු අංක **7.1**න් ගොවි කාන්තා සමිති පවත්වාගෙන යනු ලබන කෘෂිකර්ම උපදේශක නිලධාරීන් මුහුණු

දෙන පොදු ගැටලු කිහිපයක් සාකච්ඡා කර ඇත. (කෘෂිකර්ම උපදේශක නිලධාරීන් 36 දෙනෙකු මේ සඳහා ප්‍රතිචාර දැක්වූහ).

වගු සටහන් අංක 7.1: නිලධාරීන් මුහුණ දෙන ගැටලු

| ගැටලු | ප්‍රතිචාර සංඛ්‍යාව N=36 | ප්‍රතිශතය (%) |
|---|---|---|
| කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති මූලස්ථානයේ පෙර පැවති මූල්‍යමය හා ද්‍රව්‍යමය සහයෝගය අවම වීම | 31 | 89.0 |
| ගොවි කාන්තා විෂය වෙනුවෙන් පෙර ලබාදුන් පුහුණුවීම් නොලැබීම | 28 | 78.0 |
| වර්තමානයට ගැළපෙන නව ස්වයං රැකියා අවස්ථා හඳුන්වා දීමේ පහසුකම් නොමැතිවීම | 28 | 78.0 |
| ලැබෙන ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම සහ සීමිත වූ ප්‍රතිපාදන බෙදා හැරීමේ ගැටලුව | 25 | 69.0 |
| කාර්යබහුල වීම (විවිධ විෂයයන් ආවරණය කරන නිසා) නිසා නිවැරදි අධීක්ෂණයක් හා පසුවිපරමක් කිරීම අපහසු වීම | 24 | 67.0 |
| පළාත් සහ අන්තර් පළාත් වශයෙන් බල ප්‍රදේශ සීමාවන් නිර්ණය වීම පිළිබඳ අවිනිශ්චිතතාවන් නිසා ප්‍රතිපාදනයන් බෙදා හැරීමේ දී සහ වැඩසටහන් සංවිධානය කිරීමේ දී දුෂ්කරතා ඇති වීම | 18 | 50.0 |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2014

### 7.3.1 ප්‍රතිපාදන ලැබීම් සහ ඒ ආශ්‍රිත ගැටලු

අධ්‍යයනය සඳහා පළාත් බල ප්‍රදේශයන් මෙන්ම අන්තර් පළාත් බල ප්‍රදේශයන්ට අදාළ දිස්ත්‍රික්ක තෝරා ගනු ලැබූ අතර අන්තර් පළාත් බල ප්‍රදේශයන්ට (අනුරාධපුර, මහනුවර (හසලක)) මෙන්ම පළාත් බල ප්‍රදේශයන්ට අයත් දිස්ත්‍රික්කවල (කුරුණෑගල, මොණරාගල) ගොවි කාන්තා සමිති ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපාදන ලැබෙන ආකාර කිහිපයක් නිලධාරිහු පෙන්වා දුන්හ.

1) කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති මූලස්ථානය හරහා ලැබෙන ප්‍රතිපාදන (මධ්‍යම රජය)
2) පළාත් නිශ්චිත ප්‍රතිපාදන
3) රාජ්‍ය නොවන සංවිධාන සහ අනෙකුත් ජාත්‍යන්තර ආධාර සපයන ආයතන මඟින් ලැබෙන ප්‍රතිපාදන
4) රජයේ විවිධ සංවර්ධන ව්‍යාපෘති මඟින් ලැබෙන ප්‍රතිපාදන

අන්තර් පළාත් බල ප්‍රදේශයන්ට අයත් දිස්ත්‍රික්කවල කාන්තා ව්‍යාප්ති මූලස්ථානය සෘජුවම සම්බන්ධවන නමුත් පළාත් මට්ටමේ දී එම ගොවි කාන්තා සමිති පළාත් සභාව තුළ ද ලියාපදිංචි වීම අනිවාර්ය වේ. නිලධාරීන් විසින් සඳහන් කළ ආකාරයට පළාත් / අන්තර් පළාත් භේදයකින් තොරව කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති මූලස්ථානයේ පෙර පැවති මූල්‍යමය සහයෝගය වර්තමානය වන විට සීමා වී ඇති බව පැහැදිලි විය. මේ සම්බන්ධයෙන් කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරීන් හා කෙරුණු සාකච්ඡාවල දී ඔවුන් සඳහන් කළේ, කාන්තා විෂය වෙනුවෙන් වෙන් වූ විශේෂ ප්‍රතිපාදනයක් කෘෂිකර්ම අමාත්‍යාංශය මඟින් වෙන් වී නොමැති බවත් සමස්තයක් ලෙස ව්‍යාප්ති හා පුහුණු කටයුතු සඳහා වෙන්වන ප්‍රතිපාදනයන්ගෙන් පවතින තත්ත්වය ද ක්‍රියාත්මක කරන බවයි. ඊට අමතරව කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති මූලස්ථාන නිලධාරීන් විසින් දිස්ත්‍රික් මට්ටමින් අවශ්‍යතා සොයා බලා බාහිර ප්‍රතිපාදන මූලාශ්‍රයන්ට සැකසූ ව්‍යාපෘති වාර්තා **(Out Sources)** ඉදිරිපත් කිරීමෙන් ලබා ගන්නා ප්‍රතිපාදනයත්, ඊට අමතරව රජයෙන් ප්‍රජාව වෙනුවෙන් ක්‍රියාත්මක වන විවිධ ව්‍යාපෘති (අපි වවමු - රට නගමු, දිවිනැගුම වැනි) හරහා ලැබෙන ප්‍රතිපාදන කාන්තා සමිති සඳහා යොමු කරවීමටත් කටයුතු කරන බව සඳහන් විය.

එසේම රාජ්‍ය නොවන සංවිධාන **(Jaika, IFAD,** වාරි පුබුදුව වැනි) හරහා ලැබෙන ප්‍රතිපාදන මඟින් ද ගොවි කාන්තා විෂය සඳහා මූල්‍යමය සහ ද්‍රව්‍යමය (බීජ හා රෝපණ ද්‍රව්‍ය, යන්ත්‍ර සූත්‍ර, උපකරණ) ප්‍රතිපාදන ලබාදීම සිදු කරන බව පැහැදිලි විය. ප්‍රතිපාදන ලබාදීමේ දී නොමිලේ ලබාදීමෙන් වැළකී ඒ සඳහා වටිනාකමක් එක්කර අදාළ ගොවි කාන්තා සමිතියේ ප්‍රවර්ධනයට ද රුකුලක් වන සේ ප්‍රතිපාදනය ලබා ගන්නා ගොවි කාන්තාවන්ගෙන් අදාළ ද්‍රව්‍යයේ වටිනාකමින් **10%, 25% , 50%** යන මට්ටම්වලින් දායකත්වයක් සමිතිය වෙත සපයා ගනු ලබයි.

මීට අමතරව ගොවි කාන්තා සමිති ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපාදන ලැබෙන ප්‍රධාන ක්‍රමයක් වන්නේ පළාත් නිශ්චිත ප්‍රතිපාදනයි. අන්තර් පළාත් බල ප්‍රදේශ හා පළාත් බල ප්‍රදේශ ලෙස භේදයකින් තොරව පළාත් නිශ්චිත ප්‍රතිපාදන ගොවි කාන්තා සමිතිවල ක්‍රියාකාරීත්වය සඳහා යොමු කර ඇති බව අධ්‍යයනයේ දී පැහැදිලි විය. මෙහිදී කෘෂිකර්ම උපදේශකවරුන් මුහුණ දෙන ගැටලුවක් වන්නේ, පළාත් සභා තුළ ලියාපදිංචි නොකළ ගොවි කාන්තා සමිති සඳහා පළාත් නිශ්චිත ප්‍රතිපාදනයන් නොලැබීමයි. විශේෂයෙන් අන්තර් පළාත් බල ප්‍රදේශයන් හි ගොවි කාන්තා සමිති පළාත් සභාව තුළ ලියාපදිංචි නොවන අතර එහි දී කෘෂිකර්ම උපදේශක නිලධාරී ප්‍රතිපාදන බෙදාහැරීමේ ගැටලුවට මුහුණ දෙනු ලබයි. එසේම ලැබෙන ප්‍රතිපාදන සීමිත වීමෙන් පැනනැගෙන බෙදා හැරීමේ ගැටලුවකට ද නිලධාරීහු මුහුණ දෙති. එවැනි අවස්ථාවල නිලධාරීන් පිළිබඳ සමිති සාමාජිකාවන් තුළ පවතින විශ්වාසය බිඳ වැටීම ද ගැටලුවක් බව සඳහන් විය.

මීට අමතරව ගොවි කාන්තා සමිති ක්‍රියාත්මක කිරීමේ දී දේශපාලන ප්‍රතිපාදන ලැබීම් ද විශේෂත්වයක් ගනු ලබයි. අධ්‍යයනයට ලක් වූ ගොවි කාන්තා සමිති අතරින් සමහර ගොවි කාන්තා සමිති ඉතා සක්‍රීය මට්ටමේ පැවතීමටත්, එසේම ආරම්භ වී කෙටි කලකින් සමිතිය අක්‍රීය වීමටත් මෙම කලින් කලට මතු වී ප්‍රතිලාභ ලබාදෙන දේශපාලන ප්‍රතිලාභ ප්‍රධාන කාර්යයන් ඉටු කරන බව නිලධාරීන්ගේ සාකච්ඡාවලින් වඩාත් පැහැදිලි විය. මෙය ගොවි කාන්තා සමිති පවත්වාගෙන යන කෘෂිකර්ම උපදේශක නිලධාරීන්ට ගැටලුවක් වන අවස්ථා ද ඇත. සමස්තයක් ලෙස දේශපාලන ප්‍රතිලාභ හරහා සමිතිය තුළ චක්‍රීය ණය අරමුදල් ආරම්භ කිරීමේ හැකියාව

ලැබීම, යන්ත්‍ර සූත්‍ර හා උපකරණ සහ ණය ආධාර ලැබීම යන කරුණු නිසා ගොවි කාන්තා සමිති සඳහා කාන්තාවන්ගේ ආකර්ෂණය දිනා ගැනීමට සමත් වුව ද මෙම ප්‍රතිලාභ ලබා ගන්නේ, ඊට අදාළ ස්වයං රැකියා ආරම්භ කිරීමට සුදුසුකම් හෝ හැකියාව නොමැති පාර්ශවයන් වේ. මෙම තත්ත්වය කෙටි කලකින් සමිති අකර්මන්‍ය වීමට හේතු පාදක වන අතර සමිතිවල තිරසාරත්වයට ද ප්‍රබල හානියක් සිදු වේ.

### 7.3.2 පුහුණුවීම් ලබාදීම හා ඒ ආශ්‍රිත ගැටලු

කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහන් ආරම්භ කළ මුල් අවධියේ දී ගොවි කාන්තා විෂය වෙනම විෂයක් ලෙසින් ක්‍රියාත්මක විය. ඒ සඳහා විශේෂයෙන් පුහුණු කරන ලද නිලධාරීන් ද සිටින ලදී (සාහිත්‍ය විමර්ශනය). නමුත් වර්තමානයේ දී කාන්තා විෂය වෙනුවෙන් විශේෂයෙන් වෙන් වූ නිලධාරියෙක් නොවන අතර සාමාන්‍ය ව්‍යාප්ති සේවයේ එක් අංගයක් ලෙසින් මෙය ක්‍රියාත්මක වේ. එබැවින් කාන්තා විෂය වෙනුවෙන්ම විශේෂ පුහුණුවක් වර්තමානයේ දී ලබාදීමේ අඩුවක් පවතින බව කෘෂිකර්ම උපදේශක නිලධාරීහු සඳහන් කළහ. අනුරාධපුර දිස්ත්‍රික්කයේ නිලධාරීන් සඳහන් කළ ආකාරයට 2006 වර්ෂය වනතුරු, කෘෂිකර්ම උපදේශක නිලධාරීන් කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති මූලස්ථානයට කැඳවා කාන්තා විෂය සම්බන්ධයෙන් විවිධ පුහුණු වැඩසටහන් පවත්වා ඇත. නමුත් 2006න් පසුකාලීනව මූලස්ථානයට කැඳවා කාන්තා විෂය වෙනුවෙන් වූ පුහුණු වැඩසටහන් ඔවුන් හට ලබාදීම අවම වී ඇති බව සඳහන් විය. සාමාන්‍ය ව්‍යාප්ති සේවයට අයත් එක් අංගයක් ලෙසින් කාන්තා විෂය ද ඇතුළත් වී පොදුවේ ලැබෙන පුහුණුවීම්වලට පමණක් සීමා වී ඇත. එසේම වර්තමානයේ එම පුහුණුවීම් ද කාන්තා විෂයභාර නිලධාරීන්ට (SMO) පමණක් ලබාදෙන බව ද අනාවරණය විය.

මේ පිළිබඳව පේරාදෙණිය කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති මූලස්ථානයේ නිලධාරීන් දැක් වූ අදහස් වූයේ, එවැනි පුහුණුවීම් සිදු කිරීමට අදාළ සම්පත් දායකයින් සපයාගැනීම සඳහාත්, නිලධාරීන්ට අවශ්‍ය පහසුකම් සැපයීම (ආහාර, නේවාසික පහසුකම්) සඳහාත් අවශ්‍ය ප්‍රතිපාදන ප්‍රමාණවත් නොමැති බැවින් එම කටයුතු අවම වී ඇති බවයි. දිස්ත්‍රික්ක මට්ටමේ සිටින කාන්තා විෂයභාර නිලධාරීන්ට පවා පුහුණු වැඩසටහන් සිදු කිරීමේ දී මූල්‍යමය දුෂ්කරතාවලට මුහුණ දෙන බවත් එම පුහුණුවීම් සඳහා ද මූල්‍යමය ප්‍රතිපාදනයන් සපයා ගනු ලබන්නේ, සමස්තයක් ලෙස ව්‍යාප්ති සහ පුහුණුවීම් අංශයට ලබාදෙන ප්‍රතිපාදනයන්ගෙන් බව එම නිලධාරීන් සඳහන් කළහ. කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරීහු සඳහන් කරන අන්දමට ග්‍රාමීය මට්ටමේ ස්ථාපිත ගොවි කාන්තා සමිති පවත්වාගැනීමටත් ඒ හරහා කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහනේ කාර්යයන් ඉටු කිරීමටත් වෙන් වූ විශේෂ ප්‍රතිපාදනයක් පවතී නම් මෙම වැඩසටහනෙහි අපේක්ෂිත ප්‍රතිඵල කරා යාමට එය මහත් රුකුලක් වන බවයි.

ඉහත ප්‍රධාන ගැටලුවලට අමතරව ගොවි කාන්තා සමිති ක්‍රියාත්මක කිරීමේ දී කෘෂිකර්ම උපදේශක නිලධාරීන් මුහුණ දෙන ගැටලු ලෙසින් සඳහන් කළේ ග්‍රාමීය මට්ටමේ පවතින විශේෂ විභවයක් සහිත ඉහළ මට්ටමේ ශ්‍රමයක් (විශේෂයෙන් කාන්තාවන් තුළ) ඒකරාශී වී පවතින නමුත් ඒ සඳහා වටිනාකමක් ලබාදීමේ මූල්‍යමය හැකියාව නිලධාරීන් ලෙසින් ඔවුන් හට නොමැති නිසා වර්තමානයට ගැළපෙන නව ස්වයං රැකියා අවස්ථා හඳුන්වාදීමේ අපහසුතාවයක් පැවතීම, ලැබෙන ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හා සීමිත ප්‍රතිපාදන බෙදා හැරීම සහ ඒ යටතේ ලබාදෙන

ද්‍රව්‍යමය ආධාර ගුණාත්මයෙන් හා නිසි ප්‍රමිතියෙන් තොරවීම සහ කාර්ය බහුල වීම නිසා අධීක්ෂණයක් හා පසු විපරමක් කිරීම අපහසු වීමත්, එසේම ගොවි කාන්තාවන් තම නිෂ්පාදන "කුඩා පොළ" ක්‍රමය යටතේ අලෙවි කිරීමට උනන්දු වන නමුත් ඒ සඳහා ග්‍රාමය තුළ පොදු ස්ථානයක් නොමැතිවීමත් යන ගැටලු කෘෂිකර්ම උපදේශක මුහුණ දෙන ගැටලු අතර ප්‍රධාන වේ.

අටවැනි පරිච්ඡේදය

# සොයාගැනීම්, නිගමන හා නිර්දේශ

## 8.1 අධ්‍යයනයේ සොයාගැනීම්

පවුල තුළ කාන්තාව ආර්ථික හා සමාජීය වශයෙන් බලගැන්වීම හරහා පවුලේ ජීවන තත්ත්වය නගා සිටුවීමේ මූලික අපේක්ෂාවෙන් 1970 දශකයේ දී ආරම්භ කෙරුණු කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහනෙහි වර්තමාන ක්‍රියාකාරීත්වය සහ එහි පවතින ගැටලු හඳුනාගැනීමේ මූලික අරමුණු සහිතව, අනුරාධපුරය, කුරුණෑගල, මොණරාගල සහ මහනුවර යන දිස්ත්‍රික්ක හතරෙහි, තෝරා ගන්නා ලද ගොවි කාන්තා සමිති පනහකට (50) ට අයත් ගොවි කාන්තාවන් 325ක් පදනම් කරගෙන සිදු කරන ලද අධ්‍යයනයේ ප්‍රධාන සොයාගැනීම් පහත සඳහන් වේ.

- ❖ අධ්‍යයනයට සහභාගී වූ ගොවි කාන්තාවන්ගේ සමාජ-ආර්ථික පසුබිම විමර්ශනයේ දී අනාවරණය වූ පරිදි සාමාජිකාවන්ගෙන් 90%ක් විවාහකයින් වන 83%ක් මැදි වයස/මැදි වයසට ළඟා වූවන් වන අතර 45%ක් අ.පො.ස. සාමාන්‍ය පෙළ සමත් හා 28%ක් අ.පො.ස. උසස් පෙළ සමතුන් වේ. එසේම පවුලේ ශ්‍රමය සපයාගත හැකි පවුල් පසුබිමක් සහිත වූ මොවුන්ගේ රැකියා නියුක්තිය සැලකීමේ දී සාමාජිකාවන්ගෙන් 72%ක් ම ගෘහයේ කාර්යයන් ද සමඟින් කුමන හෝ ආදායම් උත්පාදන ක්‍රියාවක නියුක්ත වේ. ඔවුන්ගෙන් 70%කගේ ම මුළු මාසික ආදායම රු. 10,000 හෝ ඊට අඩු වන නමුත් එය පවුලේ ප්‍රධාන ආදායමට ඉහළ දායකත්වයක් සපයන අතර එය පවුලේ ප්‍රවර්ධනයට හා සහජීවනය තීව්‍ර කිරීමට සමත් වී ඇති බව අනාවරණය විය.

- ❖ ගොඩ සහ මඩ ඉඩම් ප්‍රමාණයන් පිළිබඳ විග්‍රහ කිරීමේ දී ගොඩ ඉඩම් අක්කර 0.25ට වඩා අඩු ප්‍රමාණයක් ඇති ගොවිපවුල්වලට අයත් ගොවි කාන්තාවන් ප්‍රතිශතය 10%ක් වැනි සුළු ප්‍රමාණයකි. බහුතරයක් (68%) අයත් වන්නේ, අක්කර 0.5 සිට අක්කර 2 අතර ප්‍රමාණයක් අයිති පවුල්වලට විය. මඩ ඉඩම් හිමි පවුල්වලට අයත් ගොවි කාන්තාවන් 66%ක් අයත් වන්නේ, මඩ ඉඩම් අක්කර 0.5 සිට අක්කර 2 අතර ප්‍රමාණයක් අයත් වන පවුල්වලට ය.

- ❖ වසර 15ක් වැනි කාලයක් ආපස්සට සලකා බැලීමේදී ගොවි කාන්තා සමිති වැඩි ප්‍රමාණයක් ස්ථාපිත වී ඇත්තේ, 2008-2013 අතර වර්ෂයන්හි හි බව සමස්ත නියැදියෙන්

69%ක් සඳහන් කර ඇති අතර ඊට බලපා ඇති ප්‍රධාන හේතුව වී ඇත්තේ, 2007-2008 වැනි කාල පරිච්ඡේදයන් හි ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වූ දිප ව්‍යාප්ත ආහාර ප්‍රවර්ධන වැඩසටහන ක්‍රියාත්මක වීමත් එයට ගොවි කාන්තා සමිති විශේෂ දායකත්වයක් සැපයීමත් වේ. ඒ අනුව 2007-2008 හා ඊට පසුකාලීනව ගොවි කාන්තා සමිති වැඩි වශයෙන් ස්ථාපිත වීමට රජයන් විසින් කාලීනව දියත් කළ සංවර්ධන වැඩසටහන් වඩාත් ඉවහල් වී ඇති බව කිව හැකිය.

❖ කාන්තාවන් සඳහන් කළ පරිදි තමන් අයත් සමිතිය ආරම්භ කිරීමට ප්‍රධාන ලෙස බලපෑ හේතූන් වී ඇත්තේ,ගෙවතු වගා වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහාත් (52%), සාමාජිකාවන්ට කෘෂිකාර්මික ව්‍යවසායක කටයුත්තක් ආරම්භ කිරීමේ පදනම සකසා ගැනීම සඳහාත් (35%) බවයි. පළාත් සහ අන්තර් පළාත් මට්ටමින් සැලකීමේ දී ද මෙම අරමුණුවල කැපීපෙනෙන වෙනස්කමක් නොපෙන්වයි.

❖ සමස්තයක් ලෙස එක් එක් ගොවි කාන්තා සමිති ස්ථාපිත කළ අවස්ථාවේ සිටි ගොවි කාන්තාවන් සංඛ්‍යාවේ සාමාන්‍ය අගය 15ක් වූ අතර වර්තමානයේ එම අගය 20 දක්වා වැඩි වී ඇත.එසේ වුවත් සමිති තුළ කාන්තාවන් අඛණ්ඩව රැදී නොසිට ඉන් ඉවත්වන අවස්ථා ද පවතී. ඊට බලපෑ හැකි හේතු වුයේ, පවුල තුළ හා සමාජය තුළ කාන්තාවන්ගේ තෙවැදෑරුම් කාර්යභාරයයි, එනම් නිෂ්පාදන සාධක, ප්‍රජනන සාධක සහ සමාජීය සාධකවල බලපෑම මත සමිති තුළ කාන්තාවන් අඛණ්ඩව රැදී සිටීම/නොසිටීම ඍජුවම බැදී පවතී.

❖ සමිතිය තුළ අඛණ්ඩව රැදී සිටීම හෝ නොසිටීමට නිෂ්පාදන සාධක බලපාන බව දිස්ත්‍රික්ක 4හි ම 45% කගේ අදහස විය. ගොවි කාන්තාවන්ගේ අවබෝධය අනුව ඔවුන් නිෂ්පාදන සාධක ලෙස සඳහන් කළේ, සමිතිය හරහා ඔවුන්ට ලැබෙන ප්‍රතිලාභ වේ. එම ප්‍රතිලාභ අඩු වන විට සමිතියට පැමිණෙන සාමාජිකාවන්ගේ සක්‍රීය දායකත්වය අඩු වේ.නියැදියෙන් 39%කගේ අදහස වූයේ සමිතිය සඳහා අඛණ්ඩ සහභාගීත්වය අඩුවීමට ප්‍රජනන කාර්යය, දරුවන් රැකබලාගැනීම හා පෝෂණය යන සාධකය බලපාන බවයි.

❖ ගොවි කාන්තා සමිතිවල සාමාජිකාවන් මසකට වරක් රැස් වී කෘෂිකාර්මික ගැටලු (68%), ව්‍යවසායකත්ව ගැටලු (46%) සහ ප්‍රතිලාභ බෙදා ගැනීම පිළිබඳව (45%) සාකච්ඡා කරනු

ලබන බවට ප්‍රතිචාර දැක් වූ අතර කෘෂිකර්ම උපදේශක සඳහන් කළ ආකාරයටත් අධ්‍යයනයේ දී පැහැදිලි වූ ආකාරයටත් කෘෂිකර්ම ව්‍යාප්ති සේවය සැපයීමේ දී ගොවි කාන්තා සමිති විශේෂ ප්‍රවේශයක් ලෙසින් දායකත්වය සපයන අවස්ථාවක් ලෙසින් මෙය හඳුනා ගත හැකි විය.

❖ නියැදියෙන් 92%ක් ව්‍යවසායකත්ව සංවර්ධනය, ගොවි කාන්තා පෝෂණය හා ආහාර තාක්ෂණය, ගෙවතු වගා සංවර්ධනය සහ සම්පත් කළමනාකරණය හා මූළුතැන්ගෙය කළමනාකරණය යනුවෙන් අංශ හතරක් යටතේ පුහුණුවීම් ද ද්‍රව්‍යාත්මක සහ මූල්‍යමය ප්‍රතිලාභ ද ලබාගෙන ඇත. ගොවි කාන්තාවන්ගෙන් 72%කගේ ම ජනප්‍රිය පුහුණු ක්ෂේත්‍රය වී ඇත්තේ ආහාර නිෂ්පාදනය පිළිබඳ ලබා දී ඇති පුහුණුවයි. කොම්පෝස්ට් නිෂ්පාදනයත් (62%), ගෙවත්ත කළමනාකරණයත්(48%), ගුණාත්මක සහල් සකස් කිරීමේ පුහුණුවත් (27%), මල් වගාව හා විසිතුරුපැළ වගාව(17%) පිළිබඳ පුහුණුවත් කාන්තාවන්ගේ වැඩි අවධානයට ලක් වී ඇත.

❖ සමිති හරහා ගොවි කාන්තාවන්ට ලබා දී ඇති මෙම පුහුණුවීම් සියල්ල රජයේ විවිධ කාලීන සංවර්ධන වැඩසටහන් හරහා ග්‍රාමීය අංශයට ලැබෙන පුහුණුවීම් මිස, ගොවි කාන්තා සමිතියට විශේෂයෙන් සකස් කළ පුහුණුවීම් නොවේ.

❖ පුහුණුව ලැබූ ගොවි කාන්තාවන්ගෙන් 45%ක ගේ අදහස වූයේ සාම්ප්‍රදායිකව පවතින පුහුණුවීම් කාලයට උචිත පරිදි වෙනසකට ලක් කළ යුතු බවයි. නවීන ව්‍යවසායකත්ව ක්‍රියාවන් පිළිබඳ (95%), ගුණාත්මක බීජ නිෂ්පාදනය පිළිබඳ (72%) ප්‍රදේශයට ආවේණික ස්වයං රැකියා සඳහා අවශ්‍ය පුහුණුවීම් පිළිබඳ(76%) සහ කාබනික පොහොර නිර්දේශිත අයුරින් භාවිතා කරන ආකාරය පිළිබඳ (65%) අදාළ පුහුණු ක්ෂේත්‍රයට එක් විය යුතු බවට ගොවි කාන්තාවෝ ප්‍රතිචාර දැක් වූහ.

❖ පුහුණුවීම්වලට අමතර ප්‍රතිලාභ වශයෙන් නොමිලේ 30% සහ 50% දායකත්වය යටතේ බීජ හා රෝපණ ද්‍රව්‍ය, උපකරණ, යන්ත්‍ර සූත්‍ර ලබා දී ඇත. පුහුණුව ලැබූ ගොවි කාන්තාවන්ගෙන් 57%ක් බීජ හා රෝපණ ද්‍රව්‍ය නොමිලේ ද 37%ක් 50% දායකත්වය යටතේ යන්ත්‍ර සූත්‍ර හා උපකරණ ද ලබාගෙන ඇත.

❖ පළාත්/අන්තර් පළාත් බල ප්‍රදේශයන්ට අයත්වීම යන කාරණය ප්‍රතිලාභ ලැබීමේ දී තීරණාත්මක සාධකයක් වී නොමැති වුවත්, රජයේ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක වීම සහ රාජ්‍ය නොවන සංවිධානයන් හි ක්‍රියාකාරීත්වය වැඩි ප්‍රදේශ වීම, යන කාරණා ගොවි කාන්තාවන්ට ප්‍රතිලාභ ලැබීම කෙරෙහි බලපා ඇති බව කුරුණෑගල සහ අනුරාධපුරය යන දිස්ත්‍රික්කයන් හි IFAD, වාරිපුබුදුව සහ JAIKA වැනි ව්‍යාපෘති ක්‍රියාත්මක වන ප්‍රදේශයන්හි පුහුණුවීම්වලට සහභාගීත්වය සහ ප්‍රතිලාභ ලැබීම් සාපේක්ෂව ඉහළ මට්ටමක පැවතීමෙන් පෙනී යයි.

❖ අධ්‍යයනයට සහභාගී වූ සමස්ත කාන්තාවන්ගෙන් 44%ක් ආදායම් උත්පාදන ක්‍රියාවන්හි (ස්වයං රැකියා) නිරතව සිටින අතර ආදායම් උත්පාදන ක්‍රියාවන්හි නිරත වීමපළාත් හා අන්තර් පළාත්වලට අයත්වීම යන කාරණය මත වෙනස්කම් පිළිබිඹු නොකරයි. නමුත් දිස්ත්‍රික්ක අනුව වෙනස්වීමක් පෙන්නුම් කරයි. ඒ සඳහා හේතු වී ඇත්තේ, IFAD, JAIKA වැනි ව්‍යාපෘති මෙම දිස්ත්‍රික්කයන් හි ක්‍රියාත්මක වීමෙන් කාන්තාවන් සඳහා පුහුණුවීම් ලබා ගැනීමට හා ද්‍රව්‍යාත්මක/මූල්‍යමය ප්‍රතිලාභ ලැබීමට අවස්ථාව ලැබීමෙන් වැඩි වශයෙන් ආදායම් උත්පාදන ක්‍රියාවලීන් සඳහා සහභාගී වීමට හැකි වීම සහ මෙවැනි දිස්ත්‍රික්ක තුළ කාන්තාවන් ආදායම් ඉපැයීමේ අවශ්‍යතාව පවුල තුළින් ම පැණ නැගීමවැනි සාධකයි. උදා: පවුලේ ප්‍රධාන ආදායම් උපයන්නා මියයාම, පවුලෙන් ඉවත් ව වෙනම ජීවත් වීම, වැනි කරුණු වල බලපෑම.

❖ ආදායම් උත්පාදන ක්‍රියාවන් හි නියුතු බහුතරයක්(27%)ආහාර නිෂ්පාදන සකස් කිරීමට අදාළ ස්වයං රැකියාවන්හි නියුක්ත වෙති. ආහාර නිෂ්පාදන සකස් කිරීමට වැඩි නැඹුරුවක් දක්වා ඇත්තේ, ඒ සඳහා පවුල තුළ හා සමාජය තුළ කාන්තාවන් විසින් ඉටු කරනු ලබන තෙවැදෑරුම් කාර්යභාරයට හානියක් නොවීමත් අලෙවි ගැටලු අවම වීම, අමුද්‍රව්‍ය සපයාගැනීමේ දුෂ්කරතා නොමැතිවීම හා පවුලේ ශ්‍රමය භාවිතා කළ හැකි වීම ආදී කරුණු වේ.

❖ මීට අමතරව මල් වගාව හා විසිතුරු පැළ වගාව(17%), ගුණාත්මක සහල් නිෂ්පාදනය හා අලෙවිය (14%), ගෙවතු වගාව හා කොම්පෝස්ට් නිෂ්පාදනය (14%), යන ස්වයං රැකියාවන් ද ගොවි කාන්තාවන් අතර ජනප්‍රිය කාර්යයන් බවට පත්ව ඇත.

❖ ස්වයං රැකියාවන් හි නියුක්ත කාන්තාවන් තම පවුලේ ප්‍රධාන ආදායමට විවිධ මට්ටම්වලින් දායකත්වය සපයනු ලබයි. දිස්ත්‍රික්ක හතරෙහි ම කාන්තාවන්ගේ පවුලේ මුළු මාසික ආදායමේ සාමාන්‍ය අගය වන්නේ, රු. 35,830.06ක් වන අතර දිස්ත්‍රික්ක අතර ආදායම් පරාසය වන්නේ, උපරිම අගය, රු. 38,375.49ක් සහ අවම අගය 29,250.00කි.

❖ දිස්ත්‍රික්ක හතරෙහිම කාන්තාවන් විසින් සිදු කරන ස්වයං රැකියාවන්ගෙන් ඔවුන් ලබන මාසික ආදායමේ සාමාන්‍ය අගය වන්නේ රු.7,349.73කි. දිස්ත්‍රික්ක අතර ආදායම් පරාසයේ සාමාන්‍ය අගයන් වන්නේ, උපරිම අගය රු.9,765.4ක් සහ අවම අගය රු. 2,360.00ක් විය.

❖ දිස්ත්‍රික්ක හතරෙහි ම කාන්තාවන් තම ස්වයං රැකියාවෙන් පවුලේ මුළු මාසික ආදායමට දක්වන දායකත්වයේ සාමාන්‍ය අගය වන්නේ, 20.5%කි. අනුරාධපුර, කුරුණෑගල සහ මොණරාගල යන දිස්ත්‍රික්කයන් හි කාන්තාවන් තම පවුලේ මුළු මාසික අදායමට සැලකිය යුතු මට්ටමේ දායකත්වයක් සපයනු ලබන අතර මහනුවර (හසලක) දිස්ත්‍රික්කයේ කාන්තාවන්ගේ දායකත්වය සාපේක්ෂව අඩු මට්ටමක පවතී. අනෙකුත් දිස්ත්‍රික්කයන්ට සාපේක්ෂව මහනුවර දිස්ත්‍රික්කය (හසලක) සඳහා තෝරාගත් නියැදිය තුළ ස්වයං රැකියා පවත්වාගෙන යන කාන්තාවන් හමු වූයේ ඉතා සුළු ප්‍රමාණයක් වීම මේ සඳහා හේතුවක් ලෙස සඳහන් කළ හැකිය.

❖ ගෘහ ජීවිතයට ඇති බලපෑම පිළිබඳව විවිධ නිර්ණායක යටතේ විශ්ලේෂණය කළ විට, සමිති සඳහා සහභාගී වූ නිසා ඔවුන්ගේ ගෘහ ජීවිතයේ විවිධ අංශ "ඉතා හොඳින් දියුණු වූ" බව ගොවි කාන්තාවන්ගෙන් 31%ක් සඳහන් කළහ. නියැදියෙන් 52%ක් සඳහන් කළේ, සියලුම අංශ "තරමක් හොඳින් දියුණු වූ" බවයි.

❖ ගොවි කාන්තා සමිතිවල ක්‍රියාකාරී වන කාන්තාවන් මුහුණ දෙන ප්‍රධාන ගැටලු වූයේ, තීරණ ගැනීමේ පවතින නිදහස අවමවීම සහ අවදානම් දැරීමේ අපහසුව(82%), ප්‍රමාණවත් ණය පහසුකම් නොමැතිවීම(72%), ගෘහස්ථ කාර්යයන් පිළිබඳ පවතින වගකීම(68%),රාජ්‍ය බැංකුවලින් ණය පහසුකම් නොලැබීම(58%),ලබාදෙන පුහුණුවීම් නවතාවයකින් යුක්ත නොවීම(45%), අලෙවි ගැටලු සහ අමුද්‍රව්‍ය සපයාගැනීම

අපහසුවීම(40%), ගෘහස්ථ මට්ටමේ නිෂ්පාදන අලෙවි කිරීමට පොදු ස්ථානයක් නොමැති වීම(38%) යන ගැටලු වේ.

❖ ගොවි කාන්තා සමිති පවත්වාගෙන යාමේදී, කෘෂිකර්මඋපදේශක නිලධාරී මුහුණ දෙන ප්‍රධාන ගැටලු වන්නේ, කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති මූලස්ථානයේ පෙර පැවති මූල්‍යමය හා ද්‍රව්‍යමය සහයෝගය අවම වීම (89%), ගොවි කාන්තා විෂය වෙනුවෙන් පෙර ලබාදුන් පුහුණුවීම් නොලැබීම (78%), වර්තමානයට ගැලපෙන නව ස්වයං රැකියා අවස්ථා හඳුන්වා දීමේ පහසුකම් නොමැතිවීම ( 78%), ලැබෙන ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම සහ සීමිත වූ ප්‍රතිපාදන බෙදා හැරීමේ ගැටලුව (69%) සහ ගොවි කාන්තා සමිති අන්තර් පළාත් බල ප්‍රදේශ හා පළාත් බල ප්‍රදේශ වශයෙන් බෙදා පැවතීම (50%) යනාදිය ප්‍රධාන ගැටලු වේ.

## 8.2 නිගමන හා නිර්දේශ

ග්‍රාමීය කෘෂිකාර්මික අංශය තුළ ගොවි කාන්තාව දැනුමින් මෙන්ම ආර්ථික හා සමාජීය වශයෙන් ද ඉහළ තලයක් කරා ප්‍රවේශ කරවීමේ මූලික අභිප්‍රායෙන් 1970 දශකයේ දී කෘෂිකර්ම අමාත්‍යාංශයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ, ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ පූර්ණ අනුග්‍රහය ඇතිව ගොවි කාන්තාවන්ට විශේෂ වූ වැඩසටහනක් ලෙසින් ගොවි කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහන ආරම්භ කෙරී ඇත.

සාහිත්‍ය විමර්ශනයන්ට අනුව ගොවි කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහනෙහි මූලික අරමුණ අදියර තුනක් යටතේ විකාශනය වී ඇති අතර වර්තමානය වන විට ගොවි කාන්තා විෂය හා එහි අරමුණු ආරම්භක අවිධියට වඩා වෙනස් වී ව්‍යවසායක කර්යයන් හි නියැළීමට කැමැත්ත ඇති සියලු කාන්තාවන්ට ගොවි කාන්තා සමිතිවලට සම්බන්ධ වීමේ අවස්ථාව ඇති බව සඳහන් විය. නමුත් අධ්‍යයනයේ දී පැහැදිලි වූයේ තවදුරටත් මෙම සමිතිවල ක්‍රියාකාරී වන්නේ ගොවි පවුල්වලට අයත් වූ කාන්තාවන් පමණක් බවයි.

කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහන ආරම්භ කළ මුල් අවධියේ දී ගොවි කාන්තා විෂය සඳහා විශේෂිත පුහුණුවක් ලද වෙනම නිලධාරියෙක් කලාපය තුළ සිටි අතර එම නිලධාරියාට ඉහළින් දිස්ත්‍රික්කය තුළ ද විශේෂ පුහුණුවීම් ලද වෙනම නිලධාරියෙක් ස්ථාපිත කර තිබිණි. වර්තමානයේ මෙම තනතුරු නාම පැවතිය ද පෙර පැවති විශේෂ පුහුණුවීම්වල අඩුවක් හා ගොවි කාන්තා විෂයටම වෙන් වූ කාර්යයන් සිදු කිරීමේ පහසුකම් ද අඩු වී ඇත.

ගොවි කාන්තා සමිති ස්ථාපිත කිරීමේ මුල් කාලීන අරමුණු ද කාලීනව වෙනස් වී ඇත. මුල් කාලීනව කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති මූලස්ථානය මඟින් ක්‍රියාත්මක වූ ගොවි කාන්තා සමිති වර්තමානයේ ක්‍රියාත්මක වන්නේ, පළාත් නිශ්චිත ප්‍රතිපාදන, රජයේ විවිධ කාලීන සංවර්ධන ව්‍යාපෘති (අපි වවමු - රට නගමු, දිවි නැගුම වැනි) හරහා ලැබෙන ප්‍රතිපාදන හා රාජ්‍ය නොවන සංවිධාන ඇතුළු  වෙනත් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල් මත සිදු කෙරෙන සංවර්ධන වැඩසටහන් හරහා ලැබෙන ප්‍රතිපාදන ගොවි කාන්තා සමිති වෙත යොමු කිරීමෙනි. මෙම තත්ත්වය නිසා කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහන මෙන්ම ගොවි කාන්තා සමිතිය ද කාලීනව රජය මඟින් ක්‍රියාත්මක වන සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේ දී ප්‍රජාව වෙත සමීප විය හැකි ප්‍රධාන ප්‍රවේශයක් ලෙසින් වැදගත් වී ඇත.

කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහනට අදාළ කාර්යයන් ගොවි කාන්තා සමිති හරහා ඉටු කිරීමේ දී කෘෂිකර්ම උපදේශකවරයා විශාල කාර්යභාරයක් ඉටු කරනු ලබයි. ඔහු විසින් තමන්ට අයත් බල ප්‍රදේශයේ කාන්තාවන්ට ගැළපෙන පරිදි පුහුණු වැඩසටහන් සැලසුම් කරන අතර, ගොවි කාන්තාවන් ආදායම් උත්පාදන ක්‍රියාවන්ට ද යොමු කරවා ඇත. කෙසේ වුව ද පුහුණුවීම් ලබාගැනීම හා ස්වයං රැකියා ආරම්භ කිරීම අතර විශේෂ සම්බන්ධතාවයක් නොමැති බව පෙනී යන්නේ, ගොවි කාන්තා සමිති හරහා පුහුණුවීම් ලැබූ පිරිස 92%ක් වුව ද ස්වයං රැකියා ආරම්භ කර ඇත්තේ 44%ක් වැනි සුළු පිරිසක් වීමෙනි.එසේ වුවත් සුළුතරයක් වූ එම කණ්ඩායම සමිතියේ සිටින අනෙකුත් සාමාජිකාවන්ට සාපේක්ෂව සමාජීය හා ආර්ථික වශයෙන් පවුල තුළ මෙන්ම බාහිර සමාජය තුළ ද ශක්තිමත් හා ආත්ම තෘප්තියක් සහිතව කටයුතු කරන පිරිසක් බවට පත් වී සිටිති.

එසේම ලැබූ පුහුණුවීම් අතරින් වැඩිම ප්‍රයෝජනයක් ලැබූ පුහුණු ක්ෂේත්‍ර  ගෙවතු වගාව හා කොම්පෝස්ට් නිෂ්පාදනය පිළිබඳව වූ පුහුණුව ලෙස සඳහන් කළ ද වැඩිම ස්වයං රැකියා ප්‍රමාණයක් ආරම්භ කර ඇත්තේ, ආහාර වර්ග සකස් කිරීමට අදාළව ලබාදුන් පුහුණුව උපයෝගී කොට ගෙන වේ.

ඊට හේතු ලෙස ගොවි කාන්තාවන් සඳහන් කරන්නේ, ඔවුන්ගේ ජීවන රටාවට හුරුපුරුදු කාර්යයක් වීමත් වැඩි පිරිවැයක් අවශ්‍ය නොවෙන අලෙවි ගැටලු ද අවම මට්ටමක පවතින, එසේම නිවසේ කාර්යභාරයද ඉටු කරමින් සිදු කළ හැකි ස්වයං රැකියාවන් ලෙසින් ආහාර වර්ග සකස් කිරීමේ කර්මාන්තයට ඔවුන් වැඩි නැඹුරුවක්  දක්වන බවයි. එසේ වුවත් ශිල්පීය දැනුම සහිතව සිදු කළ යුතු ස්වයං රැකියාවන්ට අවශ්‍ය පුහුණුව හා මූල්‍යමය සහයෝගීතාව ලබාදෙන්නේ

නම් එවැනි අංශ වෙත යොමු විය හැකි කාන්තාවන් ද සිටින බැවින් වෙනත් ශිල්පීය රැකියාවන්ට යොමු වීමට අවස්ථාව සහ ඒ සඳහා මූල්‍ය සහයෝගය ලබාදීමට පහසුකම් සැපයීම ඵලදායක වන බව අධ්‍යයනය විසින් නිගමනය කෙරේ.

කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහන, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කාන්තාවන් වෙනුවෙන් පවතින ඉතා සුවිශේෂී වැඩසටහනකි. මේ මගින් ග්‍රාමීය කාන්තාවන් අතුරින් සුළුතරයක් වුව ද ආර්ථික හා සමාජයීය වශයෙන් ඉහළ තලයක් කරා යොමු කිරීමේ හැකියාවක් පවතින බවට අධ්‍යයනය විසින් සාක්ෂ්‍ය සැපයේ.

මේ අනුව මෙම වැඩසටහන වඩාත් ඵලදායී ලෙසින් තවදුරටත් වර්ධනය කිරීමේ ඉඩ ප්‍රස්ථා පවතින බැවින් එය ඉටුවීමට, ග්‍රාමීය අංශය තුළ සිටින ඉහළ විභවයක් සහ කැපවීමක් මෙන්ම උද්‍යෝගයක් ද සහිත ගොවි කාන්තාවන් නිවැරදිව හඳුනාගැනීමත්, ගොවි කාන්තා සමිති හරහා ඔවුන්ව නව තාක්ෂණික දැනුමින් සන්නද්ධ කිරීමත් නව සමාජයට ගැළපෙන ස්වයං රැකියා හා නිෂ්පාදන සිදුකිරීමට අවශ්‍ය නව පුහුණු සැසි සකස් කිරීමත්, පුහුණුවෙන් අනතුරුව පුහුණුලාභියා අත්නොහැර ඇය ව්‍යසායක කාර්යයක නියුක්ත කර පසු විපරමක් කිරීමත් සිදු කළ හැකිය. ඔවුන්ගේ පළමු පියවර සඳහා රාජ්‍ය අංශයෙන් පොදු මූල්‍යමය සහයෝගයක් ලබාදීමත් එසේම එය නිවැරදි ක්‍රමවේදයක් යටතේ සිදු කළ යුතු බවට අධ්‍යයනය විසින් නිගමනය කරනු ලබයි. ක්‍රියාත්මක තත්ත්වයේ පවතින දුර්වලතා එනම්, ප්‍රතිපාදන වෙන් කිරීම, ප්‍රතිපාදන ලබා දීමේ සීමාවන්, පුහුණු ක්ෂේත්‍රය සම්බන්ධයෙන් පවතින ගැටලු මඟහරවා නව වෙළෙඳපොළ අවශ්‍යතාවන්ට ගැළපෙන ස්වයං රැකියාවන් හි නියුක්ත වීමට ඉඩ ප්‍රස්ථා ඇති කිරීමත් නව පුහුණුවීම් ලබාදීම එනම් දැනට පවතින සම්ප්‍රදායික පුහුණු මොඩියුලයන් වෙනස් කිරීමත්, අවශ්‍යතාවයන් හඳුනා ගෙන නවතාවයක් ඇති කළහොත් වඩාත් ප්‍රතිඵලදායක මට්ටමකට මෙම වැඩසටහන් ප්‍රවේශ කළ හැකි බව අධ්‍යයනය විසින් පෙන්වා දෙනු ලබයි.

ග්‍රාමීය ප්‍රදේශයන්හි කාන්තාවන්ට ආදායම් උත්පාදන කාර්යයන් හි වඩාත් සාර්ථකව නියැළීමට මෙන්ම සමාජීය වශයෙන් බලගැන්වීමට ඉහළ පිටිවහලක් සැපයිය හැකි උචිත ප්‍රවේශයක් ලෙසට මෙම වැඩසටහන වැදගත් වන අතර ග්‍රාමීය අංශය තුළ සුලභව පවතින කාන්තා ශ්‍රමය හඳුනා ගැනීමටත් ප්‍රදේශයට සුදුසු ස්වයං රැකියා නිර්ණය කර ඒ සඳහා අවශ්‍ය පුහුණු වැඩසටහන් තුළින් කාන්තාව ව්‍යවසායිකාවන් බවට පත් කළ හැකි පුහුණුවීම් ලබාදීම හා චක්‍රීය ණය වැඩසටහන් සැලසුම් කිරීමටත්, (අධ්‍යයනයේ දී චක්‍රීය ණය අරමුදල් තිබෙන බව ප්‍රකාශ කරන ලද්දේ 25%කි. ඔවුන් එ සාර්ථකව කරගෙන යයි) කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහන උපයෝගී

කරගත හැකි බව අධ්‍යයනයෙන් පැහැදිලි වූ විශේෂිත තත්ත්වයක් වේ. ඒ අනුව රජයේ ප්‍රතිපත්ති සකස් කිරීමේ දී සැලකිලිමත් විය යුතු විශේෂිත කරුණු ලෙසින් අධ්‍යයනය නිර්දේශ කරනු ලබන්නේ,

කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහන මඟින් ග්‍රාමීය මට්ටමින් ස්ථාපිත ගොවි කාන්තා සමිතිවලට අයත් ගොවි කාන්තාවගේ ආර්ථික හා සමාජීය ප්‍රවර්ධනයට මහත් වූ සේවාවක් සිදු කිරීමට හැකි වැඩසටහනක් ලෙසින් ඵලදායක මට්ටමට ගෙන ඒම සඳහා එහි ක්‍රියාකාරීත්වයේ පවතින ප්‍රායෝගික ගැටලු මඟහරවා සාර්ථක වූ නව ක්‍රමවේදයක් ඇති කිරීමයි. මේ සඳහා,

- ග්‍රාමීය මට්ටමේ දියත් කෙරෙන සංවර්ධන ව්‍යාපෘති සහ වැඩසටහන් සඳහා හැකි සෑම අවස්ථාවකදී ම ගොවි කාන්තා සමිති සහභාගීත්වය ලබාගැනීමට කටයුතු කිරීම.

- එම සංවර්ධන ව්‍යාපෘති සහ වැඩසටහන් හරහා රජය විසින් ලබාදෙන ප්‍රතිපාදන (පුහුණුව, ණයආධාර, ද්‍රව්‍යාධාර) වලින් යම් ප්‍රතිශතයක් (අවම ලෙස 5%ක්) කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහනට අයත්ගොවි කාන්තා සමිති සාමාජිකාවන්ට ලබා දීමට කටයුතු කිරීම.

- රජයේ වෙනත් ආයතන හා අමාත්‍යාංශ මගින් ක්‍රියාත්මක කෙරෙන කාන්තා වැඩසටහන් සමග ගොවි කාන්තා සමිති සම්බන්ධ කිරීම. එනම්, කාන්තා කාර්යාංශය, සමාජසේවා දෙපාර්තමේන්තුව මගින් ග්‍රාමීය මට්ටමේ ක්‍රියාත්මක කරන වැඩසටහන්වල දී ගොවි කාන්තා සාමාජිකාවන්ට මුලිකත්වය ලබා දීම.

- කාන්තාවන්ට සුදුසු හා උචිත ස්වයං රැකියා ප්‍රවර්ධනයට මෙන්ම තරුණ දායකත්වය ඉහළ නැංවීම සඳහා සම්ප්‍රදායික පුහුණුවීම් නොවන නවීන දැනුම හා ව්‍යවසායකත්ව හැකියාවන් සහිත පුහුණු වැඩසටහන් සකස් කිරීම හා එම පුහුණු වීම් ලබාදීමෙන් අනතුරුව පුහුණුව ලැබූ කාන්තාවන් දිරිගැන්වීම හා පසු විපරම සිදු කිරීම, පුහුණුවීම් සකස් කිරීමේ දී අවශ්‍යතා හඳුනාගැනීම (Need Identification) සහ දැනුම පමණක් පදනම් කරගත් පුහුණු වීම් නොව ප්‍රායෝගිව යොදා ගත හැකි පුහුණුවීම් පිළිබඳ සැලකිලිමත් වෙමින් පුහුණු සැසි සකස් කළ යුතු වීම (මල් හා විසිතුරු පත්‍ර වගාව, කොම්පෝස්ට් නිෂ්පාදනය හා අලෙවිය, කාබනික වගාව).

- පුහුණුවීම් හා අඩු පොළී ණය ආධාර ලබාදීම සමිති හරහා විධිමත් ක්‍රමවේදයකට ක්‍රියාත්මක කිරීම. මේ සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ පවතින ගොවි භාරකාර අරමුදලේ ඇති මුදල් 2% වැනි අඩු පොළියට ගොවීන්ට ණය සැපයීම සඳහා ගොවි බැංකු වෙත ලබා දීමේ ක්‍රමවේදය වැනි ක්‍රමවේදයක් කාන්තා ව්‍යාපෘති සංවිධාන සඳහා ද ක්‍රියාත්මක කිරීමේ හැකියාව සොයා බැලීම (ගොවි කාන්තාවන් ස්වයං රැකියා ඇතුළු වෙනත් ආර්ථික කටයුතු සඳහා උනන්දු කරවීම ගොවි ගෘහයේ සංවර්ධනය සඳහා හේතුවන බැවින් එසේ අරමුදල් ලබාදීම මඟින් භාරකාර අරමුදලේ අරමුණු ද සැපිරේ).

- ව්‍යවසායකත්ව කටයුතු සඳහා අවශ්‍ය මූල්‍ය පහසුකම් සපයා ගැනීමට අඩු පොළී අනුපාතිකයන් යටතේ ණය ලබා ගැනීමට "ගොවි කාන්තා සමිති සාමාජිකාවක්" යන නාමයට වැඩි වැදගත්කමක් දීමට රාජ්‍ය බැංකු දැනුවත් කිරීම හා සෑම සමිතියකම චක්‍රීය ණය අරමුදල් ක්‍රමය ස්ථාපිත කිරීමට කාන්තාවන් දැනුවත් කිරීම.

- ගොවි කාන්තා ව්‍යවසායකයින්ගේ නිෂ්පාදන අලෙවි කිරීම සඳහා ගමට ආසන්නම නගර තුළ ඉඩ ප්‍රස්ථා ලබාදීමේ ක්‍රමයක් ඇති කිරීම සහ නිෂ්පාදනය, අලෙවිය හා අලෙවි රටාවන් හා වෙළඳපොළ වෙනස්වීම් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් සිදු කිරීම.

- වර්තමානයේ ක්‍රියාත්මක වන ගොවි කාන්තා සමිති සාමාජිකාවන්ගේ සංවර්ධනීය කාර්යයක් වූ "හෙළ බොජුන් අලෙවි සැල් සංකල්පය" ග්‍රාමීය අංශයේ තරුණ කාන්තාවන් අතර ව්‍යාප්ත කිරීමට රජයේ වැඩි අවධානයක් යොමු කිරීම හා එය ආදර්ශනයක් ලෙසින් භාවිතා කිරීම.

- පසු විමර්ශනය, දිරිගැන්වීම්, නව පුහුණු සකස් කිරීම් පිළිබඳව සහ ව්‍යවසායකයින් රැකබලා ගනිමින් ඉදිරියට ගෙනයාමට මේ සඳහාම වෙන් වූ පර්යේෂණ හා සංවර්ධන ඒකකයක් ස්ථාපිත කිරීම.

# ආශ්‍රිත ග්‍රන්ථ


1. කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති මූලස්ථානයට අයත් විවිධ ලිපි ලේඛන, කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති මූලස්ථානය, ව්‍යාප්ති හා පුහුණු අංශය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව.
2. කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති සංවිධාන ව්‍යවස්ථාව, කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති මූලස්ථානය, ව්‍යාප්ති හා පුහුණු අංශය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව.
3. Alkire, S Meinzen_Dick, R., Peterman, A., Quisumbing, A. , Seymour, G. , and Vaz, A. , (2012). The Women's Empowerment in Agriculture Index. IFPRI Discussion paper, Washington DC: International Food Policy Research Institute.
4. Buvinic, M. , Frust_Nichols, and Country Pryor, E. , (2013) A Road Map for Promoting Women's Economic Empowerment, New York, NY:UN Foundation/ Exxon Mobil.
5. Golla, A.M., Malhothra, A., Nanda, P. and Mehera, R. (2011) Understandig and Measuring Women's Economic Empowerment: Definition, Framwork and Indicators, Washington DC: International Center for Research on Women.
6. Kusumkumara Sharmini, Weerakkody P.R, 2011. Changing Role of Women in Ruaral Agriculture Communities, HARTI,Colombo 07.
7. Rupasinghe, Rose, Samuel, 1996. Agricultural Extension and Entrepreneurship: A Focus in the Performance of the Rural Women, the M.Sc. Thesis, Submitted to Wageningen Agricultural University, Netherland
8. Sreekumar, B., 2001. Women in Agriculture: An Evaluation of the central scheme in Palakkad District (Kerala), Kerala Research Programme on Local Development, Centre for Development Studies, Thiruvananthapuram,
9. Wanasundara, Leelangi, 2006. Rural Women in Sri Lanka's post-conflict rural Economy, Centre for Women's Research; Colombo.

10. **Women's Economic Empowerment and Collective action in Agriculture: New Evidence and Measuarement Challenges, 2014. Policy Brief, April 2014, Available at www.future.agriculture.com, Accessed on 20th August 2014.**

ඇමුණුම් අංක **01 :** පුහුණුවීම්වලට අමතරව ලැබූ ප්‍රතිලාභ

| පුහුණුවට අමතරව ලැබූ දෑ | | | |
|---|---|---|---|
| කුරුණෑගල | අනුරාධපුරය | මොණරාගල | මහනුවර |
| **1.** ශීතකරණය | **1.** වී තම්බන බැරල් | **1.** බිම්මල් වගා කට්ටල | **1.** ගෙවතු වගා බීජ කට්ටල |
| **2.** ගෑස් උඳුන් | **2.** ගෙවතු වගා බීජ කට්ටල | **2.** පලතුරු පැළ හා බීජ | **2.** පලතුරු පැළ |
| **3.** බ්ලෙන්ඩර් | **3.** කොම්පෝස්ට් කට්ටල | **3.** පොලිතීන් කවර | **3.** බිම්මල බීජ |
| **4.** ඉඳි ආප්ප වංගෙඩි | **4.** මිරිස් බඳුන් සහ පොලිතීන් | **4.** ගෙවතු වගා බීජ කට්ටල | **4.** පොලිතීන් බෑග් |
| **5.** මුරුක්කු වංගෙඩි | **5.** ජංගම අලෙවි සැල් | **5.** සීලර් යන්ත්‍ර | |
| **6.** තාච්චි සහ සෝස්පෑන් | **6.** ජල විසුරුම් පද්ධති | | |
| **7.** මල් බාල්දි සහ නෙට් හවුස් | **7.** කොම්පෝස්ට් පොහොර ආවරණ (ටෙන්ට්) | | |
| **8.** මී මැසි පෙට්ටි | **8.** තවාන් තැටි | | |
| **9.** ධාන්‍ය ඇඹරුම් යන්ත්‍ර | **9.** අතිරේක ආහාර බෝග බීජ | | |
| **10.** ගෙවතු වගා බීජ කට්ටල | **10.** කුළුබඩු රාක්ක | | |
| **11.** වී තම්බන බැරල් | | | |

මූලාශ්‍රය**:** ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත**, 2014**

ඇමුණුම් අංක 02

කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටනෙහි ක්‍රියාකාරීත්වය පිළිබඳ අධ්‍යයනයේදී කාන්තා සමිති සාමාජිකාවන් ව්‍යවසායකයින් ලෙස සම්බන්ධ වී කටයුතු කරන වඩාත් විධිමත් කාර්යයක් ලෙසින් හෙළ බොජුන්හල් සංකල්පය හඳුන්වාදිය හැකි අතර අධ්‍යයන අරමුණුවලට පරිබාහිර වුව ද එම සංකල්පයේ ආරම්භය හා විකාසනය පිළිබඳව හා දැනට එහි නියුක්ත වූ කාන්තාවන් පිළිබඳ සිද්ධි අධ්‍යයන දෙකක් ද අධ්‍යයන වාර්තාවට ඇතුළත් කරනු ලැබිණි.

හෙළ බොජුන්හල් සංකල්පයේ ආරම්භය හා විකාසනය

දේශීය බෝග ඇසුරින් කෘෂි ව්‍යාපාර ආරම්භ කිරීමත් ඒ මඟින් ශක්තිමත් කාන්තා ව්‍යවසායකයින් බිහි කර කාන්තාවන්ගේ ජීවන තත්ත්වය උසස් කිරීම මඟින් පවුලේ දියුණුවත් ඒ හරහා රටේ ආර්ථික තත්ත්වය දියුණු කිරීමට සහයෝගය දැක්වීම යන ප්‍රධාන අරමුණ මත ක්‍රියාකාරී වීමේ ප්‍රතිඵලයක් ලෙස වර්තමාන හෙළ බොජුන්හල් සංකල්පය පෙන්වා දිය හැකිය. හෙළ බොජුන්හල් සංකල්පයේ තවත් වැදගත් අරමුණු කිහිපයක් වී ඇත්තේ, දේශීය ආහාර බෝග ආශ්‍රිතව නිෂ්පාදනය කෙරෙන වස විසෙන් තොර ආහාර ජනතාව අතර ප්‍රචලිත කිරීමත් දේශීය ආහාර බෝග ආශ්‍රිත නව ආහාර වර්ග ජනතාවට හඳුන්වාදීමත්, විශේෂයෙන් දරුවන් දේශීය ආහාර සඳහා හුරු කරවීමත් ඔවුන්ට දැනුම ලබා දීමත් ය.

කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහනට අදාළ ප්‍රධාන අරමුණු අතරින් එක් ප්‍රධාන අරමුණක් වූ යට කී ව්‍යවසායකත්වය ප්‍රවර්ධනය හා දේශීය ආහාර සඳහා තිරසාර වෙළඳපළක් කාන්තාවන්ට ලබාදීම සම්බන්ධයෙන් කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති මූලස්ථානයේ නිලධාරීන් සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති හා පුහුණු අංශයේ ප්‍රධානීන් සමඟ සාකච්ඡා කිරීම සිදු කළ අතර මෙම හෙළ බොජුන්හල් සංකල්පය ක්‍රියාකාරී මට්ටමට ගෙන ඒමේ පුරෝගාමී මෙහෙවරට දායකත්වය සැපයූ එවකට කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති ඒකකයට අදාළ ව කටයුතු කළ ඉහළ මට්ටමේ නිලධාරීන් මෙන්ම කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති ඒකකයේ එවකට රාජකාරී කළ අනෙකුත් කෘෂිකර්ම උපදේශක මහත්මීන් ද මෙම සංකල්පය ක්‍රියාත්මක කිරීමට දායකත්වය සපයා ඇත.

ඒ අනුව කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැසටහන ක්‍රියාත්මක වන දිස්ත්‍රික්කයන් හි ගොවි කාන්තා සමිති සාමාජිකාවන් වරින් වර අලෙවි කුටි ස්ථාපිත කර ඇති අතර විශේෂයෙන් කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති මූලස්ථානය හා ප්‍රධාන කාර්යාලයට ආසන්නව මහනුවර දිස්ත්‍රික් පළාත් සභා බල ප්‍රදේශයේ සිටින ගොවි කාන්තා සමිති සාමාජිකයින් ඔවුන්ගේ කැමැත්ත හා හැකියාව අනුව තෝරා ගනිමින් මෙය ආරම්භ කෙරී ඇත. ඒ අනුව පළමුවෙන් ම එනම් වර්ෂ 2004 දී උද්‍යාන බෝග සංවර්ධන ආයතන පරිශ්‍රයේ "උද්‍යාන කුඩ" ස්ථාපිත කොට දේශීය බෝග ආශ්‍රිතව සකසන ලද ආහාර අලෙවිය සිදු කෙරිණි. මේ සඳහා ව්‍යවසායකයින් ලෙස කාන්තාවන් 10ක් හා පිරිමි දෙදෙනෙක් තෝරා ගැනිණි. පිරිමි 02ක් සහභාගී වූයේ ඔවුන්ගේ භාර්යාවන් ගොවි කාන්තා සමිතියේ සාමාජිකාවන් වූ බැවිණි.

ඉහත අලෙවිකුටි ආරම්භ කිරීමට අදාළ ව්‍යවසායිකාවන්ට පෙර කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති සංවිධානයේ කාර්ය මණ්ඩලය විසින් පහත සඳහන් කාර්යයන් සිදු කර ඇත.

- ❖ මහනුවර පළාත් සහා  බල ප්‍රදේශය තුළ ගන්නෝරුවට සමීපව ගොවි පවුල් හා මෙම කාර්යයට කැමැත්තක් සහ හැකියාවක් ඇති කාන්තාවන් තෝරා ගැනීම සඳහා ක්ෂේත්‍ර චාරිකා සිදු කිරීම

- ❖ තෝරාගත් කාන්තාවන්ට  මෙම සංකල්පය හා එය ක්‍රියාත්මක කිරීම පිළිබඳ දැනුවත් කිරීම සහ දැනුම ලබාදීම (ප්‍රායෝගික/දේශන) මෙහි දී  කාන්තා කාෂිකර්ම ව්‍යාප්ති සංවිධානය අපේක්ෂා කරන අරමුණු සහ කොන්දේසි ලෙස, ආහාර සකස් කිරීමේ දී පාන් පිටි භාවිතා නොකිරීම, රසකාරක හා වර්ණකාරක අඩංගු නොකිරීම, දේශීය බෝග ආශ්‍රයෙන් ම පමණක් වීම යන කරුණු හඳුන්වා දෙනු ලබයි. අමුද්‍රව්‍ය වියදම ඔවුන් දරා ගත යුතු අතර ලබන ආදායම ඔවුන් සතු වේ. බිම් කුලිය  ලෙස එක් අයෙකුට මාසයකට රු. 1,500ක් ද වතුර හා විදුලි බිල ද (රු. 200ක් පමණ) කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට ඔවුන් විසින් ගෙවිය යුතු ය. එක් දිනයක දී ඉඩ ප්‍රමාණ අනුව පෙ.ව. 7.00 - ප.ව. 1.00 දක්වා එක් කණ්ඩායමකටත් ප.ව 1.00-ප.ව.7.00 දක්වා තවත් කණ්ඩායමකටත් මෙම ස්ථානය ලබා දීමට කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති මූලස්ථානයේ නිලධාරීන් කටයුතු කරනු ලබයි.

- ❖ ආහාර සැකසීමේ දී ඒ සඳහා අමුද්‍රව්‍ය තෝරාගැනීමේ සිට පාරිභෝගිකයා අතට පත්වන තුරු පවතින සියලුම පියවරයන්ට අදාළ දැනුම, පුහුණුවීම්  නිලධාරීන් විසින් අදාළ කාන්තාවන්ට ලබාදීම
- ❖ ආරම්භක අවස්ථාව බැවින් අවශ්‍ය අමුද්‍රව්‍ය, උපකරණ කට්ටල නොමිලේ සහ නැවත භාරදීමේ පදනම මත ලබාදීම
- ❖ අලෙවි කිරීමට අපේක්ෂිත සියලුම ආහාරවලට අදාළව ආහාර වට්ටෝරු ඇතුළත් පොත් මුද්‍රණය කර ලබාදීම (උදා: ධාන්‍ය ආහාර, අල බෝග, පලතුරු බෝග, එළවළු බෝග, රනිල බෝග)
- ❖ නිෂ්පාදන අලෙවිය සඳහා උද්‍යාන කුඩ ලබාදීම
- ❖ නිෂ්පාදිත ද්‍රව්‍ය සාර්ථක ලෙස අලෙවි කිරීම සඳහා දෙපාර්තමේන්තු නිලධාරීන්ව සහ ඔවුන්ගේ හිත මිතුරන්ව දැනුවත් කිරීම

උද්‍යාන කුඩ ස්ථාපිත කර අලෙවි කටයුතු ආරම්භ වූ දින සිට මාස 03ට අධික කාලයක් කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති මූලස්ථානයේ සහකාර අධ්‍යක්ෂිකා සහ එහි රාජකාරී කළ කෘෂිකර්ම උපදේශක මහත්මීන් මෙම උද්‍යාන කුඩ තුළ ඇති ආහාර ද්‍රව්‍ය අලෙවි කිරීමේ පහසුව ඇති කිරීම සඳහා එම අලෙවිසැල් තුළ රාජකාරී සිදු කිරීම විශේෂත්වයක් වී ඇත.

අව්ව, වැස්ස, සුළඟ, දූවිලි වැනි ස්වාභාවික උපද්‍රවයන්ගෙන් උද්‍යාන කුඩවලට සිදු වන හානිය නිසා අලෙවිය සඳහා යම් ස්ථිර ස්ථානයක අවශ්‍යතාවය ඇති වීම මත ඉන් වසර 03ට පසුව මැටි හා පොල් අතු ආශ්‍රයෙන් සකස් කළ අලෙවි කුටි 03ක් ස්ථාපිත විය. මෙම අලෙවි කුටි  සකස් කිරීම කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ශ්‍රව්‍ය-දෘශ්‍ය ඒකකය මඟින් සිදු කෙරී ඇත.

ක්‍රමයෙන් මෙම සංකල්පය වඩාත් ව්‍යාප්ත වී දේශීය ආහාර ජනතාව අතර ප්‍රචලිත වීමත් සමඟ ආහාර ද්‍රව්‍ය මිලට ගැනීමට පැමිණෙන පිරිස වැඩි වූ අතර මෙම ස්ථානයේ ඉඩ ද ප්‍රමාණවත් භාවයෙන් අඩු විය. මෙම බොජුන්හල් සංකල්පයේ ප්‍රගතිය හඳුනාගනිමින් මෙම තත්ත්වයට විසඳුම් ලෙස කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වර්තමාන කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා විසින් එය තවදුරටත් ප්‍රවර්ධනය කිරීමේ අභිලාෂය පෙරදැරි කරගනිමින් නව අලෙවි පියසට අදාළ ගොඩනැගිල්ල ස්ථාපිත කිරීමට ක්‍රියාකාරී විය. එහි ප්‍රතිඵලයක් ලෙස වර්ෂ 2012 දී "හෙළ බොජුන්හල" ගන්නෝරුවේ දී නව ගොඩනැගිල්ලක නව ආකාරයකින් ස්ථාපිත විය. දැනට ලංකාවේ හෙළ බොජුන්හල් 03ක් ස්ථාපිත කර ඇත. එනම්, ගන්නෝරුව, ගලහ පේරාදෙණිය (කෘෂිකර්ම පීඨය ඉදිරිපස) සහ බට අත කෘෂි තාක්ෂණ උද්‍යානයයි. කෘෂිකර්ම අමාත්‍යාංශය මඟින් වර්තමානයේ නව බොජුන්හල් 05කට ප්‍රතිපාදන වෙන් කර තිබීම මෙම කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති අංශයේ දියුණුවට මහත් වූ රුකුලකි. ඒ අනුව යෝජිත ස්ථාන වන්නේ කුණ්ඩසාලේ, රුවන්වැල්ල, ලබුදූව, පැල්වැහැර සහ බට අත කෘෂි තාක්ෂණ උද්‍යානයයි.

හෙළ බොජුන්හල වැඩසටහන මඟින් සැලසෙන වාසි

වර්තමානයේ දේශීය ආහාර ප්‍රවර්ධනය හරහා ආහාර සුරක්ෂිතභාවය අපේක්ෂා කිරීම පිළිබඳ වැඩි අවධානයක් යොමු වී ඇත්තේ, දිනෙන් දින ශීඝ්‍රයෙන් ඉහළ යන ආහාර විස වීම් හා ඒ ආශ්‍රිතව ජනතාව මුහුණ දෙන සෞඛ්‍යමය ගැටලු හේතුවෙනි. ජනතාවගේ ආහාර අවශ්‍යතාවය වඩාත් සුරක්ෂිතව හා ලාභදායී අයුරින් සැපයීමේ ඉඩප්‍රස්ථා මෙවැනි වැඩසටහන් මඟින් ඉතාමත් ඉහළ මට්ටමින් ඉටු වන බව පෙනී යන අතර, ග්‍රාමීය මට්ටමේ කාන්තා ශ්‍රමය ඵලදායක අයුරින් උපයෝජනය කිරීමට ද මෙය කදිම අවස්ථාවක් වී ඇත.

එසේම දේශීය විදේශීය සංචාරකයින් සුලභ ලෙස ගැවසෙන පරිසරයකට මෙවැනි ව්‍යවසායක කාර්යයන් වඩාත් උචිත බව ද පෙනී යයි. විශේෂයෙන් විදේශීය සංචාරකයින්ට දේශීය අමුද්‍රව්‍ය යොදා සකස් කළ දේශීය ආහාර පරිභෝජනය කිරීමේ අවස්ථාව සැලසීම ද ආර්ථිකයට විශාල රුකුලකි. එසේම දේශීය ජනතාව නැවුම් පලතුරු බීම වැඩි නැඹුරුවක් නොමැති වුවත් මෙම ස්ථානයේ දී ජනතාව අතර වඩාත් ජනප්‍රිය වී ඇත්තේ නැවුම් පලතුරු යුෂ අලෙවියයි. ඉතාමත් පිරිසිදුව අත්දැකීම් සහිත විශ්‍රාමික කෘෂි උපදේශිකාවන් දෙදෙනෙකු විසින් පලතුරු යුෂ අලෙවිය ක්‍රියාත්මක කරනු ලබයි. විශේෂයෙන් ජනතාව මීට පෙර අඩුවෙන් පරිභෝජනය කළ දේශීය පලතුරු වූ නෙල්ලි, ඇඹරැල්ලා, කටුඅනෝදා, ලොවි වැනි පලතුරු යුෂ ඖෂධීය ලෙස වැදගත් නිසා නැවුම්ව පානය කිරීමට වැඩි කැමැත්තක් දක්වති. එසේ ම කුරක්කන්, කඩල, මුං ඇට, උඳු සහ දේශීය සහල් වර්ග යොදා සකස් කළ ආහාර සඳහා ද වර්තමානයේ දැඩි ඉල්ලුමක් පවතී. එසේම දේශීය පලතුරු වර්තමානය වන විට ක්‍රමයෙන් ජනතාව අතරින් ඈත් වී යන මොහොතක ඔවුන්ව ඒ සඳහා යොමු කිරීමට හා ඒවා හඳුන්වාදීමට මෙම අලෙවිසැල් උචිත මාධ්‍යයක් වී ඇත. ආර්ථිකමය ලෙස දේශීය පලතුරුවලට වැඩි ඉල්ලුමක් ජනනය වීමෙන් ඒවා වගා කිරීමේ කාර්යය ද ඉහළ යනු ඇත. ඒ අනුව, දිනෙන් දින ඉහළ යන ආනයනික පලතුරු සඳහා වන ඉල්ලුම අවම කිරීමටත් විදේශ විනිමය වර්ධනය කිරීමටත් බොජුන්හල් සංකල්පය වක්‍රව ඉහළ මට්ටමේ බලපෑමක් සිදු කරනු ලබයි.

දේශීය හෙළ බොජුන්හල් සංකල්පය නිසා ඇති වූ තවත් එක් අතිරේක වාසියක් වන්නේ, වෙනත් ප්‍රදේශවල ගොවි කාන්තා සමිති සාමාජිකාවන් මෙන්ම කාන්තා කාර්යාංශය හෝ වෙනත් ආයතන මඟින් ගම් මට්ටමින් ඇති කර තිබෙන කාන්තා සමිතිවල සාමාජිකාවන් මෙම ස්ථානයට පැමිණ මෙය නැරඹීමෙන් සහ මෙම ස්ථානයේ සිටින පළපුරුදු ව්‍යවසායිකාවන්ගෙන් අවශ්‍ය තොරතුරු ලබාගැනීමයි. ඊට අමතරව මෙම පළපුරුදු ව්‍යවසායිකාවන් නව ව්‍යවසායිකාවන්ට නිරන්තර මඟපෙන්වීම හා දැනුම සැපයීම ද සිදු කරනු ලබයි.

එසේම හෙළ බොජුන්හල තුළ වසර 1 ½ක් පමණ ව්‍යවසායිකාවන් ලෙස කටයුතු කිරීමෙන් පසුව මෙම ව්‍යවසායිකාවෝ තමන්ගේ පෞද්ගලික ස්ථානයක මෙවැනි කටයුත්තක් ආරම්භ කිරීමට අවශ්‍ය පළපුරුද්ද හා දැනුම ද මේ හරහා ලබා ගනියි.

පවතින තොරතුරු අනුව වර්තමානයේ දේශීය හෙළ බොජුන්හල් සංකල්පය වඩාත් වර්ධනීය අවස්ථාවක පසුවන බැව් පෙනී යන අතර එහි ක්‍රියාකාරීත්වය හා බලපෑම සම්බන්ධයෙන් තව දුරටත් අධ්‍යයනය කිරීමේ අවශ්‍යතාවක් ද පවතී.

(සාකච්ඡා කිරීම : මධුමාලි සුබුද්ධිකා මිය - කෘෂිකර්ම උපදේශිකා, ගොවි කාන්තා මූලස්ථානය ව්‍යාප්ති හා පුහුණු අංශය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, අයි.කේ.රත්නායක මිය - විශ්‍රාමික කෘෂිකර්ම උපදේශිකා, රම්‍යා ජයසිංහ මිය - විශ්‍රාම කෘෂිකර්ම උපදේශිකා - දැනට හෙළ බොජුන් හලේ නැවුම් පලතුරු යුෂ අලෙවිය භාරගෙන කටයුතු කරයි.)

පහත දැක්වෙන්නේ කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති සමිත හරහා බොජුන්හල් වැඩසටහනට දායක වී ව්‍යවසායිකාවන් ලෙසින් ක්‍රියාකාරී වී ආදායම් උපයන කාන්තාවන් දෙදෙනෙකු පිළිබඳ සිද්ධීන් දෙකකි.

ඇමුණුම් අංක 03 :

බොජුන්හල් සංකල්පය -සිද්ධි අධ්‍යයනය අංක 01

කමනි උදයංගනී මහත්මිය මහනුවර දිස්ත්‍රික්කයේ හමන්ගොඩ ග්‍රාමයේ "එකමුතු" ගොවි කාන්තා සමිතියට අයත් ගොවි කාන්තාවකි. ඇයගේ ස්වාමිපුරුෂයා ගුරුවරයෙකු වන අතර දරුවන් තිදෙනාගෙන් දෙදෙනෙකු පාසැල් යන වයසේ වන අතර අනෙක් දරුවා වයස අවුරුදු 2 ½ක් පමණ වේ. මීට පෙර රැකියාවක් කර නොමැති අතර රැකියාවක් ලෙස පළමුව සම්බන්ධ වී ඇත්තේ මෙම බොජුන්හලට ය. වයස අවුරුදු 35ක පමණ වන අතර උසස් පෙළ දක්වා අධ්‍යාපනය හදාරා ඇත.

කමනී මහත්මියව හෙළ බොජුන් සඳහා යොමුකර ඇත්තේ ප්‍රදේශයේ කෘෂිකර්ම උපදේශක නිලධාරිනිය විසිනි. ඇය පවසන අන්දමට මුල් අවධියේ දැන් පවතින තරම් ව්‍යවසායකත්ව සංවර්ධනය හෝ ඒ පිළිබඳ ආකල්පයක් මිනිසුන් තුළ නොතිබී ඇති අතර සම්මුඛ පරීක්ෂණයකට මුහුණ දී මෙයට සම්බන්ධ වී ආරම්භයේ දී පෝෂණ රොටි හා බිම්මල් සුප් යන නිෂ්පාදන දෙක පමණක් අලෙවිකර ඇත.

බිම්මල් සුප් සාදන පුහුණුව ලබා දී ඇත්තේ හෙළ බොජුන්හල් සංකල්පයේ සමාරම්භක කෘෂිකර්ම උපදේශක නිලධාරීන් දෙදෙනෙකු මඟිනි. එසේම වෛද්‍යවරියක් මාර්ගයෙන් ආහාර සකස් කිරීම, කල්තබාගැනීම, පිරිසිදුව සකසන අයුරු පිළිබඳව පුහුණුවීමක් ලැබී ඇති අතර කෘෂිකර්ම උපදේශක මඟින් සාර්ථක ව්‍යවසායකයෙක් වශයෙන් සාර්ථක විය හැක්කේ කෙසේ ද යන්න පිළිබඳව පුහුණුවීමක් ලබා දී ඇත. එය සංවිධානය කර ඇත්තේ කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති ඒකකය මඟිනි.

අලෙවිසැලේ සමිති 5-6ක සාමාජිකාවන් ඔවුන්ගේ නිෂ්පාදන අලෙවි කිරීම සිදු කරන අතර අලෙවි කටයුතු පෙරවරුවේ හා පස්වරුවේ ලෙස වරු දෙකකට සිදු කරනු ලබති. උදේ වරුවේ සාමාජිකාවන් 16 දෙනෙක් හා සවස් වරුවේ සාමාජිකාවන් 17 දෙනෙක් සේවය කරති. කමනි මහත්මිය ද අයත්"එකමුතු" ගොවි කාන්තා සමිතියෙන් සාමාජිකාවෝ හත් දෙනෙක් මෙම අලෙවිසැලේ වැඩකටයුතු කරගෙන යති. උදේ වරුවේ සාමජිකාවෝ 05 දෙනෙක් හා සවස් වරුවේ සාමජිකාවෝ දෙදෙනෙක් වශයෙන් ඔවුහු මෙහි සේවය කරති. කමනි මහත්මිය මෙහි සේවය කරන්නේ උදේ වරුවේ ය. උදේ වරුවේ සේවය කරන කාලය පෙරවරු 7.00 සිට පස්වරු 1.00 දක්වාත් සවස් වරුවේ වැඩ කරන කාලය පස්වරු 1.00 සිට පස්වරු 6.30 දක්වාත් කාලයන් ය. ඇය උදේ වරුවේ සේවය කිරීමට යොදාගෙන ඇත්තේ අවුරුදු 2 ½ කුඩා දරුවාත් සමඟ සවස් වරුවේ වැඩකිරීම අපහසු බැවිනි. ඇය දරුවා පුහුණු කර ඇත්තේ රාත්‍රී වනතුරු අවදිව සිට උදේ වරුවේ නිදාගැනීමටය. එම නිසා ඇයට මෙහි කටයුතු කරගෙන යාමට ඉතා පහසුවක් වී ඇත. එසේම ඇගේ වැඩ කටයුතු ඉදිරියට ගෙන යාමට ස්වාමියා හා දරුවන්ගෙන් ඉතා හොඳ සහයෝගයක් ඇයට ලැබෙන බව ඇය පැවසුවාය. සෙනසුරාදා හා ඉරිදා දිනයන් හි දී ඉතා හොඳ අලෙවියක් මෙම ස්ථානයේ සිදුවන බැවින් එම දිනයන්වලට අවශ්‍ය නිෂ්පාදනය සිදුකර ගැනීමට දිනක වැටුප රු. 500/= ක මුදලක් ලබා දී කාන්තාවන් යොදවා ගෙන ඇත.

**මුල් අවධියේ දී ඇය පෝෂණ රොටී 20ක් පමණ නිෂ්පාදනය කර ඇති අතර ඇතැම් දිනවලදී එයින් ද 10ක් පමණ ඉතිරිවන අවස්ථා තිබී ඇත. නමුත් කාලයත් සමඟ ඇයගේ නිෂ්පාදනවලට ඉතා ඉහළ ඉල්ලුමක් ලැබී ඇත. පොල් අතු පැළ ඉවත් කරන කාලය පමණ වන විට ඇය පෝෂණ රොටී 150ක් පමණ නිෂ්පාදනය කර ඇත. නමුත් දැන් ඇය නිෂ්පාදනය කරන්නේ සමබල රොටී, දොදොල් හා කුරක්කන් කැඳ පමණි. පෝෂණ රොටී හා සමබල රොටී සමාන ආහාර දෙවර්ගයකි. ඒවාට යොදාගන්නේ මුකුණුවැන්න, ගොටුකොළ, කැරට් හා හාල් පිටි ය. නමුත් සමබල රොටීවලට ප්‍රෝටීන එකතු වියයුතු නිසා එයට සෝයා පිටි එකතු කිරීම සිදු කරන්නී ය.**

**වර්තමානයේ දී ඇය සතියේ දිනයන්හි සමබල රොටී 250ක් පමණ ද සතියේ දිනවල දී ද සති අන්ත දින දෙකේ දී සමබල රොටී 400ක් පමණ ද නිෂ්පාදනය කරන්නී ය. දොදොල් කිලෝ 18-20 ත් අතර ප්‍රමාණයක් ද කුරක්කන් කැඳ වීදුරු 180-200 පමණ නිෂ්පාදනය කරනු ලබයි.**

දෛනික පිරිවැය හා ආදායම

| වර්ගය | අවශ්‍ය ද්‍රව්‍ය | වියදම (රු) | නිෂ්පාදිත ඒකක ගණන/ඒකකයක මිල | ආදායම් (රු) |
|---|---|---|---|---|
| සමබල රොටී | හාල් පිටි 5kg<br>පොල් ගෙඩි 10<br>මුකුණුවැන්න මිටි 5<br>ගොටුකොළ මිටි 5<br>සෝයා 250g<br><br>ලුණු මිරිස් සඳහා අවශ්‍ය ද්‍රව්‍ය | 1600<br><br>250 | 250 x රු.20 | රු.5,000 |
| දොදොල් | හාල් පිටි 3kg<br>සීනි 9kg<br>පොල් ගෙඩි 24 | 2500 | 20 kgx රු. 300 | රු. 6,000 |
| කුරක්කන් කැඳ | කුරක්කන් පිටි 2 ½kg<br>සීනි 2 kg<br>පොල් ගෙඩි 10 | 1600 | වීදුරු 200 x රු. 20 | රු. 4,000 |
| මුළු පිරිවැය හා ආදායම | | රු.5,950 | | රු.15,000 |

**කුරක්කන් පිටි ආදිය බගවන්තලාව, ගාල්ල ආදී ප්‍රදේශවලින් දුම්රියෙන් 40-50 kg පමණ එකවර ගෙන්වා ගනී. නමුත් වර්ෂා කාලයට අමුද්‍රව්‍ය සපයාගැනීමේ අපහසුවක් ඇත.**

ඇය පවසන අන්දමට මෙම කර්මාන්තයෙන් දිනකට ඇය රු. 10,000-13,000ක පමණ ආදායමක් ලැබෙන අතර සති අන්තයේ දී එය රු. 15,000 ඉක්මවන බව සඳහන් කෙරිණි. මෙම ස්ථානයේ කටයුතු කිරීමේ දී බිම් කුලිය ලෙස රු. 1500ක මුදලක් හා ජලය හා විදුලිය සඳහා රු. 200ක පමණ මුදලක් මාසිකව ඔවුන් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු ය.

බොජුන්හල් සංකල්පයේ පැවැත්මට වඩාත් සුදුසු යෝජනාවක් ලෙසින් පෙන්වා දෙන්නේ බොජුන්හල් ක්‍රියාත්මක කිරීමේ දී එහි කාලයක් තිස්සේ අලෙවි කටයුතු සිදු කරන කාන්තාවන් ඉවත් කර නව කණ්ඩායම් සඳහා ඉඩප්‍රස්ථා සැපයීම සාමාන්‍යයෙන් සිදු කෙරෙන අතර එවැනි අවස්ථාවල පැරණි කණ්ඩායම ඉවත් වීමට ප්‍රථම නව කණ්ඩායම බඳවා ගත යුතු බව ඇයගේ අදහසයි. එයින් නව කණ්ඩායමට පැරණි කාන්තාවන්ගේ අත්දැකීම් අනුසාරයෙන් ඉතා ඉක්මනින් එම ස්ථානයට අනුගත විය හැකි බව ඇය සඳහන් කරයි.

ඇමුණුම් අංක 04 :

බොජුන්හල් සංකල්පය -සිද්ධි අධ්‍යයනය අංක 02

අම්ලා පිටියගොඩ මහත්මිය මහනුවර දිස්ත්‍රික්කයේ හමන්ගොඩ ග්‍රාමයේ "එකමුතු" ගොවි කාන්තා සමිතියට අයත් ගොවි කාන්තාවකි. 28 හැවිරිදි කාන්තාවක් වන ඇය උසස් පෙළ දක්වා අධ්‍යාපනය හදාරා ඇත. ඇයගේ සැමියා පේරාදෙණිය ලකී යෝගට් ආයතනයේ රියදුරෙකු වශයෙන් සේවය කරන්නේ ය. දරුවන් දෙදෙනා වයස අවුරුදු 5ක් හා 1 ½ වයසැති ය. සුපිරි වෙළඳසැලක මුදල් අයකැමි ලෙස සේවයේ යෙදී ඇති ඇය විවාහයත් සමඟ එයින් ඉවත් වී ඇත. නමුත් පසුව ඇති වූ ආර්ථික ගැටලුත් සමඟ රැකියාවක අවශ්‍යතාවය ඉතා තදින් දැනුන නිසා මෙවැනි ස්වයං රැකියාවක් සිදු කිරීමට තීරණය කර ඇත.

මෙම අලෙවිසැල් සඳහා තෝරාගනු ලබන්නේ ඒ සඳහා කැමති සාමාජිකාවන්ගෙන් ඉල්ලුම් පත් කැඳවනු ලැබීමෙනි. පසුව ගොවිජන සේවා මඟින් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් පසුව ඉතාමත් සුදුසු කාන්තාවන් තෝරාගැනීම සිදුකරයි. අම්ලා ඇතුළු ගොවි කාන්තා සමිතියේ සාමාජිකාවන් පස් දෙනෙකු "එකමුතු" ගොවි කාන්තා සමිතියෙන් තෝරාගෙන ඇත. සමිතියකින් තෝරාගන්නා නිශ්චිත සාමාජිකයින් ප්‍රමාණයක් නොමැත. ඉතා හොඳ ප්‍රමිතියකින් ආහාර නිෂ්පාදනය කරන සුදුසු සාමාජිකාවන් ඕනෑම සංඛ්‍යාවක් අවශ්‍ය ප්‍රමාණයට බඳවා ගැනීම සිදු කරයි. මෙම තෝරාගැනීම් සඳහා ප්‍රදේශයේ කෘෂිකර්ම උපදේශක නිලධාරී සක්‍රීයව කටයුතු කරන අතර කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරගේ ද සහාය ඔහු ලබා ගන්නේ ය.

අම්ලා මහත්මිය විසින් කොළ කැඳ හා අලුවා යන ආහාර දෙවර්ගය පමණක් අලෙවි කිරීම සිදු කරනු ලබයි. ඒ සඳහා ගොවිජනසේවා මධ්‍යස්ථානයෙන් දින 02ක ආහාර සම්බන්ධ පුහුණුවීමක් ලැබී ඇත. එය ලබා දී ඇත්තේ එම දිනවල මෙම අලෙවිසැලේ පාලන කටයුතු කරගෙන ගිය ජයන්ති ඉලංගකෝන් මහත්මිය මඟිනි. මෙම බොජුන්හල්වල තිබෙන විශේෂත්වය නම් මේවායෙහි සාදන සියලුම ආහාර ද්‍රව්‍ය හාල් පිටි පමණක් යොදාගෙන සෑදීමයි. මැය සාදන අලුවා සඳහා වෙළඳසැලේ ඇති හාල් පිටි මිල දී නොගනී. ඒවා භාවිතයෙන් නියමිත ප්‍රමිතිය ලබාගත නොහැකි නිසා තමන් විසින්ම හාල් දියේ දමා මෝලකින් කොටාගනු ලබයි.

අම්ලා මහත්මියගේ මෙම ස්වයං රැකියාව ඉදිරියට පවත්වාගෙන යාමට පවුලේ සාමාජිකයන්ගෙන් ඉතා හොඳ සහයෝගයක් ලැබෙන බව ඇය පවසයි. බොජුන්හලට සම්බන්ධ වූ කාලයේ සිටම අද දක්වා අලුවා හා කැඳ නිෂ්පාදනය පමණක් සිදු කර ඇත. මෙයට සම්බන්ධ වූ මුල් අවදියේ දී අලුවා කෑලි 250ක් නිෂ්පාදනය කර ඇති අතර දැන් 120ක් පමණ ප්‍රමාණයක් නිෂ්පාදනය කරයි. එම ප්‍රමාණය අඩු වී ඇත්තේ තවත් සාමාජිකාවන් තුන් දෙනෙක්ම අලුවා නිෂ්පාදනය සිදු කරන බැවිණි. කොළ කැඳ වීදුරු 250ක් පෙර සිට අද දක්වාම නිෂ්පාදනය කරනු ලබයි.

ඇයගේ දිනක ආදායම හා වියදම

| වර්ගය | ද්‍රව්‍ය | වියදම | ඒකක ගණන සහ ඒකකයක මිල | ආදායම |
|---|---|---|---|---|
| අලුවා | හාල් පිටි 3Kg<br>සීනි 2.5Kg<br>හකුරු ස්වල්පයක් | රු. 600 | රු.15 x120 | රු. 1,800.00 |
| කොළ කැඳ | හාතවාරියා<br>පෙනෙල<br>කෝවක්කා<br>මුකුණුවැන්න<br>පොල්<br>හාල් | රු. 2800 | රු. 20 x 250 | රු.5,000.00 |
| | | රු. 3,400.00 | | රු.6,800 |

කොළ වර්ග දිනපතා වෙළඳසැලෙන් මිල දී ගැනීම සිදු කරයි. ඇය පැවසූ අන්දමට අලුවා නිෂ්පාදනයෙන් එතරම් ලාභයක් ලැබීමට නොහැක. එයට හේතු ලෙස ඇය සඳහන් කළේ සීනි, හකුරුවල මිල ඉහළ නිසා එයින් එතරම් ලාභයක් ලැබීමට අපහසු බවයි. නමුත් කොළ කැඳ නිෂ්පාදනයෙන් ඉතා ඉහළ ආදායමක් හා ලාභයක් ලැබිය හැකි බව ඇය පවසන්නී ය.

කොළ කැඳ වැනි ආහාර සකස් කිරීමේදී අවශ්‍ය අමුද්‍රව්‍ය කොටා ගැනීම වංගෙඩියක් භාවිතා කරන අතර වඩාත් කාර්යක්ෂමව එය ඉටුකර ගැනීමට ඇඹරුම් යන්ත්‍රයක් මිලට ගැනීමට සහන පොළියක් යටතේ ණය ආධාරයක් ලබා ගැනීමට ද ඇය අදහස් කරයි.

මෙම ස්ථානයේ අලෙවි කටයුතු කරන බැවින් බිම් කුලියක් ලෙස රු. 1500ක මුදලක් හා විදුලිය සඳහා රු. 180-200ක මුදලක් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට ගෙවනු ලබයි. එසේ වුවත් මෙම බොජුන්හල් සංකල්පය ඔවුන්ගේ ආර්ථිකයට ඉතා ප්‍රයෝජනවත් වූ බවත් එයින් ඔවුන්ගේ ආර්ථිකය ශක්තිමත් කිරීමට ඇයට ඉතා හොඳ අවස්ථාවක් ලැබී ඇති බවත් නිවසේ කටයුතු සඳහා ඇයට උසස් දායකත්වයක් ලබාදිය හැකි බවත් අමිලා මහත්මිය සඳහන් කළා ය.

මෙම බොජුන්හල පවත්වාගෙන යන ස්ථානයේ පාරිභෝගිකයන්ට ආහාර භුක්ති විඳීමට අවශ්‍ය ඉඩකඩ හා වෙළෙඳාමේ නියුතු සාමාජිකාවන්ට තිබෙන ඉඩකඩ ප්‍රමාණය වැඩි කළහොත් පාරිභෝගිකයින් විශාල ප්‍රමාණයක් ගෙන්වා ගත හැකි බව ද ඇය යෝජනාවක් ලෙසින් ඉදිරිපත් කළාය.